## සිව්වැනි කොටස

## මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම්වලට අදාළ

## 1988 ප්‍රධාන නීති අනපනත්


පිටුව

1. 1988 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත ... ... I

2. 1988 අංක 7 දරන මුදල් නීති (සංශෝධන) පනත ... ... II

3. 1988 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ... ... IV

4. 1988 අංක 30 දරන බැංකු පනත ... ... XX

5. 1988 අංක 31 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ... ... LXV

6. 1988 අංක 42 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත LXXIII

7. 1988 අංක 57 දරන බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සි පනත LXXVI

8. 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ... ... C

9. අංක 510/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රය ... ... CXXXI

# 1988 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1988 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (4අ) (5) වන උපවගන්තියේ සහ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, භාණ්ඩ සෑදීමේ හා නිපදවීමේ ව්‍යාපාරය කරගෙන යන (" සැපයුම්කරු " යනුවෙන් මේ වගන්තියෙහි මින් මතු සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු විසින්, යම් අපනයනකරුවකුට ඒ භාණ්ඩ සපයනු ලබන්නා වූ බවට සහ ඒ භාණ්ඩ සැපයීමට අදාළ අපනයනවල විදේශ විනිමය වටිනාකම ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම සඳහා වූ ජාත්‍යන්තර ණයවර ලිපියක් මත අනුයාත පදනම උඩ ශ්‍රී ලංකාවේ බැංකුවක විවෘත කරන ලද ණයවර ලිපියකින් ඒ සැපයීම ආවරණය කර ඇති බවට, සහ

(i) එසේ සපයන ලද භාණ්ඩ සෑදීමෙහි ලා හෝ නිපදවීමෙහි ලා ඒ සැපයුම්කරු විසින් ප්‍රයෝජනයට ගන්නා ලද අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ඒ සැපයුම්කරු විසින් සත්‍ය වශයෙන්ම ප්‍රධාන රේගු අයකැමිවරයාට ගෙවා ඇති බවට ; හෝ

(ii) (අ) ඒ භාණ්ඩ සෑදීම හෝ නිපදවීම සම්බන්ධයෙන් යොදන ලද ලෙස ආරෝපනය කළ හැකි අමු ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ඒ සැපයුම්කරු විසින් ගෙවන ලද මිල, ඒ අමු ද්‍රව්‍ය මිලට ගනු ලැබුවේ යම් සාදන්නකුගෙන් නැතහොත් නිපදවන්නකුගෙන් ද ඒ සාදන්නාට හෝ නිපදවන්නාට ගෙවන ලද බවට ; සහ

(ආ) එම අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් ආරෝපනය කළ හැකි තම ව්‍යාපාරයේ පිරිවැටුම් සම්බන්ධයෙන් එම අමු ද්‍රව්‍ය සාදන්නා හෝ නිපදවන්නා විසින් පිරිවැටුම් බද්ද සත්‍ය වශයෙන් ම ගෙවා ඇති බවට

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ භාණ්ඩ සෑදීමෙහිලා හෝ නිපදවීමෙහිලා ප්‍රයෝජනයට ගන්නා ලද අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් ආරෝපනය කරනු ලබන, සැපයුම්කරු විසින් ගෙවන ලද පිරිවැටුම් බදු මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සැපයුම්කරුට ගෙවනු ලැබිය යුතු ය.".

(2) ඒ වගන්තියෙහි (5) වන උපවගන්තියේ " (3) වන හා (4) වන උපවගන්තිවල "යන යෙදුම වෙනුවට "(3) වන, (4) වන සහ (4අ) වන උපවගන්තිවල " යන යෙදුම ආදේශ කිරීමෙන් : තවද

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (6) අපනයනය කරනු ලබන හෝ සපයනු ලබන යම් භාණ්ඩයක් හෝ යම් භාණ්ඩයක් සහ එම භාණ්ඩය බහා අපනයනය කරනු ලබන හෝ සපයනු ලබන භාජනය හෝ දවටනය සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ, (4) වන උපවගන්තිය යටතේ හෝ (4අ) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු ගෙවීමක් කිරීම, ඒ ගෙවීම සඳහා ලියවිල්ලකින් වූ හිමිකම් පෑමක් ඒ භාණ්ඩය අපනයනය කිරීමෙන් හෝ සැපයීමෙන් මාස තුනකට පෙර නොවන සේ ද මාස නවයකට පසුව නොවන සේ ද ඒ භාණ්ඩයේ අපනයනකරු හෝ සැපයුම්කරු විසින්, ඉදිරිපත් කළහොත් මිස, නොකළ යුතු ය.".

3. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධන 1988 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියෙහි "පන් දහසක්" යන වචන වෙනුවට "පනස් දහසක්" යන වචන ද "දඩ" යන වචනය වෙනුවට "දණ්ඩනය" යන වචනය ද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## 1988 අංක 7 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]

**මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1988 අංක 7 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් නීති පනතේ 10 වන වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ආආ) 117 වන වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ උකසක් හෝ අන්‍යාකාර ඇපයක් මත මහ බැංකුවේ නිලධරයන්ට සහ සේවකයන්ට නිවාස ඉදිකිරීමේ කාර්යය සඳහා ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ හැකිය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

" වැටුප හෝ පාරිශ්‍රමිකය පොදු අරමුදලින් ගෙවනු ලබන යම් ධුරයක හෝ තත්ත්වයක සේවය කිරීමට තාවකාලිකව මුද හරින ලද හෝ රාජ්‍ය සංස්ථාවක් වන යම් බැංකු ආයතනයක අධ්‍යක්ෂවරයකු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු

හෝ සේවකයකු නියෝජ්‍ය අධිපතිවරයකු වශයෙන් පත් කිරීමෙහි ලා (ආ) හෝ (ඇ) ඡේදවල අඩංගු කිසිවකින් හෝ නුසුදුස්සකු නොකරන ලෙස සැලකිය යුතු ය.'' ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

'' (ඇ) මණ්ඩලයේ මතය අනුව තම කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් ;

එසේ වුවද වැටුප හෝ වෙනත් පාරිශ්‍රමිකය පොදු අරමුදලින් ගෙවනු ලබන යම් ධුරයක හෝ තත්ත්වයක සේවය කිරීමට හෝ රාජ්‍ය සංස්ථාවක් වන බැංකු ආයතනයක, ඒ බැංකු ආයතනයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කිරීමට හෝ (3) වන උප වගන්තිය යටතේ තාවකාලිකව මුදා හරිනු ලැබූ යම් නියෝජ්‍ය අධිපතිවරයකු, ඔහු ඒ ධුරය හෝ තත්ත්වය දරන නිසාම හෝ ඒ අධ්‍යක්ෂවරයා වන නිසාම අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඔහු ධුරයෙන් ඉවත් කිරීමට මේ උපවගන්තියේ කිසිවකින් මුදල් මණ්ඩලයට බලය පැවරෙන්නේ යයි තීරණය නොකළ යුතුය.'' ;

(ඇ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

'' (3) මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් මණ්ඩලය විසින් සමාන එකඟත්වය ඇතිව තීරණය කරනු ලබන යම් නියමයන් මත—

(අ) වැටුප හෝ වෙනත් පාරිශ්‍රමිකය පොදු අරමුදලින් ගෙවිය යුතු යම් ධුරයක හෝ තත්ත්වයක සේවය කිරීමට ;

(ආ) රාජ්‍ය සංස්ථාවක් වන බැංකු ආයතනයක ඒ බැංකු ආයතනයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කිරීමට ;

නියෝජ්‍ය අධිපතිවරයකු තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකි ය.

මේ වගන්තියේ කාර්යය සඳහා '' රාජ්‍ය සංස්ථාව '' යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවෙහි දී ඇති අර්ථයම ඇත්තේ ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 120අ වගන්තිය වශයෙන් බල සහිත විය යුතු ය :—

**'' මහ බැංකුවේ නිලධරයන් සහ සේවකයන් මුදා හැරීම.**

120අ. 23 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, මුදල් මණ්ඩලය විසින්, මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව මහ බැංකුවෙන් පිටත යම් නිලයක හෝ ධුරයක සේවය කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් නියමයන් සහ කොන්දේසි මත ආණ්ඩුවේ ඉල්ලීම පිට හෝ නොඑසේව තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකි ය.''.

# 1988 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 25 වන දින]

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහාවූ පනතකි.**

**1.** මේ පනත 1988 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "(ඌ) ඡේදයෙහි හා (ඕ) ඡේදයෙහි " යන වචන වෙනුවට " (ඌ) ඡේදයෙහි, (ඕ) ඡේදයෙහි සහ (ක) ඡේදයෙහි " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයේ " මුදල් ප්‍රමාණයක් විය යුතු ය ; තව ද," යන වචන වෙනුවට " මුදල් ප්‍රමාණයක් විය යුතුය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම " අගයට සමාන මුදලක් විය යුතු ය :" යන වචන වෙනුවට " අගයට සමාන මුදලක් විය යුතු ය ; තව ද " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ක) දේපළ නිශ්චල දේපළක් වන අවස්ථාවක, 1977 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසුව ඒ දේපළ අත්කර ගත් යම් තැනැත්තකුගෙන් ත්‍යාගයක් වශයෙන් හෝ උරුමයක් වශයෙන් 1977 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ඒ දේපළ ඒ ලාභය අත්වුන තැනැත්තා විසින් අත්කර ගනු ලැබුවේ නම් ඉහත දෙවනුව කී තැනැත්තා විසින් ඒ දේපළ එසේ අත්කර ගනු ලැබූ අවස්ථාවේ දී ඒ දේපළෙහි වටිනාකම—

(i) පළමු කී තැනැත්තා විසින් දේපළ අත්කර ගන්නා ලද්දේ මිලට ගැනීමෙන් නම්, එකී මිලට ගැනීමේ වියදමට සමාන මුදල් ප්‍රමාණයට ; සහ

(ii) පළමු කී තැනැත්තා විසින් මිලට ගැනීමෙන් නොවන අන්‍යාකාරයකින් ඒ දේපළ අත්කර ගන්නා ලද්දේ නම්, එකී අත්කර ගන්නා අවස්ථාවේ දී එම දේපළෙහි වෙළෙඳ වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයට

පළමු කී තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගනු ලැබීමෙන් පසු ඔහු විසින් කරනු ලැබූ යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම්වල වියදම ද එකතු වූ ප්‍රමාණය විය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ (XLIX) අනුඡේදයේ " 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල පනතින් පිහිටුවන ලද ජනාධිපති අරමුදල ; සහ " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල පනතින් පිහිටුවන ලද ජනාධිපති අරමුදල ;" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (L) අනුඡේදයේ " 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදල, " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදල ; සහ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ ඡේදයේ (L) අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :—

" (LI) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය ;

(LII) 1982 අංක 22 දරන ශ්‍රී ලංකා මිනින්දෝරුවරයන්ගේ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරුවරයන්ගේ ආයතනය ; සහ

(LIII) 1972 අංක 15 දරන රසායන විද්‍යා ආයතන (ලංකා) පනතින් සංස්ථාගත කරන ලද රසායන විද්‍යා (ලංකා) ආයතනය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ක) ඡේදයේ " නිදහස් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට " නිදහස් කරනු ලැබිය යුතු ය ; සහ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ග) යම් අර්ථසාධක අරමුදලකින් හෝ විශ්‍රාම වැටුප් අරමුදලකින් යම් සේවා නියුක්තයකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ගෙවනු ලැබුවා වූ මුදලෙහි, ඒ අරමුදලෙන් කරනු ලැබූ ආයෝජනවලින් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා ඒ අරමුදලට ව්‍යුත්පන්න වූ ආදායම නියෝජනය කරනු ලබන කොටස ;".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ " 20 වන, 20අ වන, 21 වන," යන ඉලක්කම් සහ වචන වෙනුවට " 20 වන, 20අ වන, 20ආ වන, 20ඇ වන, 21 වන," යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඇඇ) (අ) හෝ (ආ) ඡේදවල සඳහන් ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත්තේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව තුළ හෝ ඉන්පසු අවුරුදු දෙකක් ඇතුළත කෙලින්ම හෝ අතරමැදි සමාගම් දෙකක් හෝ වැඩි

ගණනක් මගින් යම් සමාගමකට ලැබුණු (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් වන යම් ලාභාංශයකින් ඒ සමාගමේ කොටස් හිමියකුට 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ගෙවන ලද යම් ලාභාංශයක්.''.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ '' ඒ නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සහ '' යන වචන වෙනුවට ''1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර ඒ නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කරනු ලැබුවේ නම් නැතහොත් සම්පූර්ණ කරනු ලබන්නේ නම් ඒ නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සහ'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ආආ) යම් නිවාසයක් ඉදිකිරීම 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු සම්පූර්ණ කරනු ලැබ ඇතොත් සහ එය හුදෙක් වාසය කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් සහ—

(i) ඒ නිවාසයෙහි එහි අයිතිකරු පදිංචිව සිටින්නේ නම් ; හෝ

(ii) ඒ නිවාසයෙහි (බිත්තිවල ඝනකම ද ඇතුළුව) වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නා වූ බිම් ප්‍රමාණයක් ඇත්නම්

ඒ නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කරනු ලැබූ තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හය සඳහා ඒ නිවාසයේ අයිතිකරුට උපචිත වන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කළ යුතුය :

එසේ වුවද, නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක් දහස් පන් සියයක් හෝ ඊට අඩුවන අවස්ථාවක, ඒ නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂයක සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ නවය සඳහා ඒ නිවාසයෙහි අයිතිකරුට උපචිත වන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.''.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (xvi) වන අනුඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (xvi) යම් තැනැත්තකු විසින්, යම් දේපළක් අත්කර ගැනීමෙන් පසුව අවුරුදු විසිපහකට නොඅඩු කාලයකට පසුව 1986 නොවැම්බර් මස 12 වන දින හෝ ඉන්පසු ඒ දේපළෙහි අයිතිය සම්බන්ධයෙන් ඇතිවන වෙනස් වීමෙන් ;''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 20ඇ වගන්තිය වශයෙන් බල සහිත විය යුතුය :—

"ඇතැම් ව්‍යවසායන්ට සැපයීම් කිරීමෙන් උද්ගතවන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

20ඇ. (1) යම් ව්‍යවසායක අපනයන ලාභ වලින් සහ ආදායමෙන් සමන්විත වන ඒ ව්‍යවසායේ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම් නොවන) ලාභ සහ ආදායම් කොටස 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ—

(අ) '' අපනයන ලාභ සහ ආදායම '' සහ '' මුළු පිරිවැටුම '' යන්නෙහි 20 වන වගන්තියේ (2) වන උපවගන්තිය අනුව පිළිවෙලින් ඒවාට නියම කර ඇති අර්ථයන් ඇත්තේ ය.

(ආ) මේ වගන්තිය අදාළ වන ව්‍යවසායක් සම්බන්ධයෙන් '' අපනයන පිරිවැටුම '' යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹ ඇත්තා වූ යම් ව්‍යවසායකට, ඒ ගිවිසුමේ නියමයන් යටතේ ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කාල සීමාව ඇතුළත, ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක විදේශ විනිමය බැංකු ඒකකයක ඒ ව්‍යවසාය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකින් ලබාගන්නා අරමුදල්වලින් ගෙවීම් කරනු ලබන, බඩු විකිණීමක් සඳහා,—

(i) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණ හෝ ලැබිය යුතු යම් මුදලක් ;

(ii) මැණික් විකිණීමෙන් ලැබුණ හෝ ලැබිය යුතු මුදලක් ;

(iii) තොග වශයෙන් කලු තේ, ක්‍රෙප් රබර්, ෂීට් රබර්, ඔට්ටපාලු, පොල් තෙල්, කපාපු පොල්, කොප්පරා, ගෙඩි පොල් හෝ පොල් කෙඳි විකිණීමෙන් හෝ අපනයනය කිරීමෙන් ලබන හෝ ලැබිය යුතු යම් මුදලක් ;

(iv) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම නොවන යම් ලාභ සහ ආදායම

හැර, ඒ ව්‍යවසායට ලැබුණු හෝ ලැබිය යුතු මුළු මුදල අදහස් වේ.''.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් ඒ වගන්තිය නැවත අංක කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියේ '' යම් නිවාසයක් හෝ තට්ටු නිවාසයක් ඒ තැනැත්තා විසින් විකුණනු ලබන අවස්ථාවක,'' යන වචන වෙනුවට '' යම් නිවාසයක් හෝ තට්ටු නිවාසයක් 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර ඒ තැනැත්තා විසින් විකුණනු ලබන අවස්ථාවක,'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; තවද,

(3) ඒ වගන්තියේ නැවත අංක කළ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (2) ආණ්ඩුවේ නිවාස ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිල්ල ඇතිව, ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් අනුමත කරන ව්‍යවසායක් වන නිවාස හෝ තට්ටු නිවාස ඉදිකිරීම් සහ විකිණීම සඳහා ව්‍යවසායක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින්, බිම් ප්‍රමාණය වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නා වූ සහ එය ඉදිකිරීම 1977 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ඒ තැනැත්තා විසින් ආරම්භ කරනු ලැබුවා වූ යම් නිවාසයක් හෝ තට්ටු නිවාසයක් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව විකුණන අවස්ථාවක ඒ විකිණීම ඒ නිවාසයේ හෝ තට්ටු නිවාසයේ පළමුවන විකිණීම වනවිට ඒ විකිණීමෙන් උද්ගතවන ලාභවලින් සහ ආදායමෙන් සියයට හැත්තෑ පහක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) ඒ වගන්තියේ (ඉඉ) ඡේදයෙහි " අනුප්‍රමාණ අනුව දීමනාවක් " යන වචන වෙනුවට " අනුප්‍රමාණ අනුව දීමනාවක් :—

එසේ වුවද ඉහතින් වූ තක්සේරු වර්ෂවලදී ක්ෂයවීම සඳහා ප්‍රදානය කරනු ලැබූ දීමනාවක එකතුව අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ පිරිවැයට හෝ ඉදිකිරීමේ පිරිවැයට සමාන වෙතොත් ඒ සම්බන්ධයෙන් මේ ඡේදයේ (i) වන අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි හෝ (iii) වන අනුඡේදයෙහි හෝ සඳහන් යම් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් තැනැත්තකුට මේ ඡේදයෙහි සඳහන් ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිම අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු නොලැබිය යුතුය." ;

(ආ) ඒ උපවගන්තියේ (ඌඌ) ඡේදයෙහි " බොල් ණය හෝ සැක සහිත ණය සම්බන්ධයෙන් විශේෂ සංචිතයකට " යන වචන වෙනුවට " ආදායම් ස්වභාවයකින් වූ වියදම් පියවීම පිණිස සාමාන්‍ය සංචිතයකට " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ත) ඡේදයෙහි " 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) (ආආආ) ඡේදයෙහි " අත්කර ගැනීමේ පිරිවැය " යන වචන ඒ ඡේදයෙහි යෙදෙන කවර හෝ අවස්ථාවක, ඒ වෙනුවට " අවස්ථාවෝචිත පරිදි ඒ අත්කර ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීමේ පිරිවැය " යන වචන එහි ව්‍යාකරණ ප්‍රභේදවලට යටත්ව ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආආආ) ඡේදයේ අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

" එසේ වුවද ඒ වෙනස බැහැර කිරීමෙන් ලත් මුදල ඉක්මවන්නා වූ අවස්ථාවක, එම අතිරික්තය ආදායම උපදවීමෙහි ලා දරනු ලැබූ වියදමක් වශයෙන් (1) වන උපවගන්තියේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත් මේ ඡේදයේ කිසිවක්—

(අ) පුද්ගලයකු විසින් තනිවම හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් සමාගමකට පරිවර්තනය කිරීම මත, 14 (අ) සහ (xv) වන වගන්තියෙහි සඳහන් ඒ සමාගමට ඒ ප්‍රාග්ධන වත්කම් කිසිවක් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු පැවරීමට ; හෝ

(ආ) යම් තැනැත්තකු විසින්, කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක හෝ සේවා නියුක්තියක ආදායම උපදවීම සඳහා, ඔහු විසින් පාවිච්චි කරනු ලබන ප්‍රාග්ධන වත්කම් කිසිවක් ප්‍රතියෝජනය කර ගැනීම සඳහා, ප්‍රාග්ධන වත්කම් බැහැර කිරීමෙන් ලත් සම්පූර්ණ මුදල ඒ තැනැත්තා විසින් බැහැර කිරීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ප්‍රයෝජනයට ගනු ලබන්නේ නම්, ඒ තැනැත්තා විසින් එවැනි යම් ප්‍රාග්ධන වත්කම් කිසිවක් බැහැර කිරීමට අදාළ නොවිය යුතු ය.".

(3) ඒ වගන්තියේ 5 වන උපවගන්තියේ " (1) (ඉ) හෝ (1) (ඊ) උපවගන්ති යටතේ " යන ඉලක්කම් සහ වචන වෙනුවට " (1) (ඉ), (1) (ඉඉ) හෝ (1) (ඊ) උපවගන්තිය යටතේ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ, " හෝ (ඉ) ඡේදය යටතේ හෝ " යන වචන වෙනුවට " හෝ (ඉ) ඡේදය හෝ (ඉඉ) ඡේදය යටතේ හෝ " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ (i) වන අනුඡේදයේ " ඒ විකිණීමෙන් ලත් මුදල අතර වෙනස ලෙස සලකනු ලැබිය යුතු ය ;" යන වචන වෙනුවට " විකුණනු ලබන්නා වූ වත්කම විකිණීමෙන් ලබන ලාභ අතර වෙනස ලෙස සලකනු ලැබිය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ (i) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

" මේ අනුඡේදයේ කාර්ය සඳහා විකුණනු ලබන්නා වූ වත්කමක් විකිණීමෙන් ලබන ලාභ—

(i) ඒ වත්කම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි අත්කර ගැනීමේ පිරිවැය හෝ ඉදි කිරීමේ පිරිවැය ; සහ

(ii) ඒ ප්‍රාග්ධන වත්කම් සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද ක්ෂයවීම සඳහා වූ සම්පූර්ණ දීමනාව

අතර වෙනස ඉක්මවන ඒ වත්කම විකිණීමෙන් ලත් මුදලෙහි අතිරික්තය විය යුතු ය.".

DISCARDED

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (2) වන උපවගන්තියේ " 23 (1) (අ) හෝ 23 (1) (ඉ) හෝ 23 (1) (ඊ) වගන්තිය යටතේ " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 23 (1) (අ) හෝ 23 (1) ( ඉ) හෝ 23 (1) (ඉඉ) හෝ 23 (1) (ඊ) වගන්තිය යටතේ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1අ) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් වූ ගිණුම්, විධානයෙහි නිශ්චිත වශයෙන් නියම කරනු ලබන යම් කාලසීමාවක් සඳහා සකස් කළ යුතු බවට මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක, 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ප්‍රභවයෙන් උද්ගතවන ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂය තුළ දී අවසන් වන කාලසීමාවේ ලාභවල මුදල් ප්‍රමාණය මත ආගණනය කළ යුතු බවට ඔහු විසින් වැඩිදුරටත් විධාන කළ හැකිය. එසේ වුවද වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් යම් තැනැත්තකුගේ ව්‍යවස්ථාපිත ආදායම යම් නිශ්චිත කාල සීමාවක් සඳහා සාදන ලද ගිණුමකට යොමු කිරීමෙන් ආගණනය කරනු ලැබ ඇත්තා වූ සහ ඉන් අනතුරුව එළඹෙන වර්ෂයේදී අනුරූප කාලසීමාව සඳහා ගිණුමක් සෑදීමට ඒ තැනැත්තා පැහැර හරින අවස්ථාවක, ඒ පැහැර හැරීම සිදුවූයේ යම් තක්සේරු වර්ෂයක් සඳහාද එම තක්සේරු වර්ෂය සහ ඉන් අනතුරුව එළඹෙන තක්සේරු වර්ෂ දෙක යන අවස්ථා දෙකම සඳහා ඒ ප්‍රභවයෙන් උද්ගත වූ, ව්‍යවස්ථාපිත ආදායම, විෂයය සම්බන්ධයෙන් වූ අවස්ථාගත කරුණු අනුව, සාධාරණ සහ යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල් වරයා විසින් සලකනු ලබන යම් පදනමක් මත ආගණනය කරනු ලැබිය යුතු ය ;

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙන ලද විධානයක් කවර හෝ අවස්ථාවක දී වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත් එවැනි යම් විධානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් වෙනස් කරනු ලැබ ඇත්තා වූ හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක ඒ විධානය දෙනු ලැබුවේ යම් ප්‍රභවයක් සම්බන්ධයෙන් ද, ඒ ප්‍රභවයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂයේ මාර්තු මස තිස්එක් වන දිනට ගිණුම් සාදනු ලැබූ ලෙසට ආගණනය කරනු ලැබිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (4අ) උපවගන්තියේ " 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ 20 (අ) වගන්තියෙහි," යන වචන සහ ඉලක්කම් වෙනුවට " 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ 20අ වගන්තියෙහි හෝ 20ආ වගන්තියෙහි හෝ 20ඇ වගන්තියෙහි" යන වචන එහි ව්‍යාකරණ ප්‍රභේදවලට යටත්ව ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ අන්තිමට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

" (iv) මේ පනතේ 22 වන වගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරණ දේශීය ආදයම් පනතේ 10 වන වගන්තිය යටතේ හෝ ආදායම් බදු ආඥපනතේ 11 වන වගන්තිය යටතේ හෝ යම් වත්කමක් සම්බන්ධයෙන් ක්ෂය වීම සඳහා අඩු කිරීමකට ඉඩදී ඇත්නම්, යම් තැනැත්තකු විසින් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ සහ ආදායම් උපදවීම සඳහා ඒ තැනැත්තා විසින් පාවිච්චි කරනු ලබන ප්‍රාග්ධන වත්කම් කිසිවක් බැහැර කිරීමෙන් උද්ගතවන ප්‍රාග්ධන පාඩු කිසිවක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමක් නොකළ යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "(5) වන උප වගන්තියේ සහ (5අ) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව" යන ඉලක්කම් සහ වචන වෙනුවට " (5) වන වගන්තියේ, (5අ) වන උපවගන්තියේ, (5ආ) වන උපවගන්තියේ සහ (5ඇ) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) (ඉ) ඡේදයේ—

(i) (i) වන අනුඡේදයේ " නිවාසයක් ඉදිකිරීම සඳහා හෝ, 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව පළමුවන නිවාසය මිල දී ගැනීම සඳහා හෝ නිවාසයක් තැනීම සඳහා පළමුවන බිම් කොටස මිල දී ගැනීම සඳහා හෝ 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව " යන ඉලක්කම් සහ වචන වෙනුවට " නිවාසයක් ඉදිකිරීම සඳහා හෝ, 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පළමුවන නිවාසය මිල දී ගැනීම සඳහා හෝ නිවාසයක් ඉදිකිරීම පිණිස පළමුවන බිම් කොටස මිල දී ගැනීම සඳහා හෝ 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ " 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඉඉ) යම් පුද්ගලයකු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ මුදල් නීති පනතේ අර්ථානුකූලව යම් බැංකු ආයතනයකට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ නිවාස ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිලිමත්ව අනුමත කරන ලද වෙනත් යම් ආයතනයකට හෝ—

(i) 1978 අප්‍රේල් මස 1 වන හෝ ඉන්පසු එම පුද්ගලයා විසින් ඉදිකරන ලද පළමුවන නිවාසය වන, ඉදිකිරීමේ පිරිවැය රුපියල් දශ ලක්ෂයක් නොඉක්මවන නිවාසයක් ඉදිකිරීම සඳහා, හෝ 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එම පුද්ගලයා විසින් මිලට ගන්නා ලද, පළමුවන නිවාසය වන හෝ නිවාසයක් තැනීම සඳහා පළමු බිම් කොටස වන, මිලට ගැනීමේ පිරිවැය රුපියල් දශ ලක්ෂය නොඉක්මවන නිවාසයක් හෝ නිවාසයක් තැනීම සඳහා බිම් කොටසක් මිලට ගැනීම සඳහා, 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ප්‍රදානය කරනු ලැබූ ණයක මුල් මුදල, ඔහු ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි අයිතිකරුව සිටින අතර තුර හෝ—

(අ) ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි හෝ අයිතිය ඒ පුද්ගලයාගෙන් ත්‍යාගයක ආකාරයෙන් අත්කර ගනු ලැබුවා වූ ; සහ

(ආ) මේ පනතේ කාර්යය සඳහා ඒ තක්සේරු වර්ෂයේ දී ඒ පුද්ගලයාගේ ආදායම සමග තම ආදායම එකතු කරනු ලැබුවා වූ

වයස දහ අටට අඩු ඒ පුද්ගලයාගේ දරුවකු හෝ ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි හෝ අයිතිකරුව සිටින අතරතුර ඒ පුද්ගලයා විසින් ආපසු ගෙවනු ලැබීමේ දී ;

(ii) කුලියට සින්නවීමේ නියමයන් මත 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව මිලට ගනු ලැබූ පළමුවන නිවාසය සම්බන්ධයෙන් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ඇතුළත් වූ, ප්‍රතිෂ්ඨාව රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන්නා වූ කුලියට සින්නවීමේ යම් ගිවිසුමක නියමයන් අනුව මාසික ගෙවීම් වශයෙන් ඔහු විසින් එසේ ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ '' නිවාසයක් ඉදිකිරීම සඳහා පුද්ගලයකු විසින් වියදම් කරනු ලැබූ '' යන වචන වෙනුවට '' නිවාසයක් ඉදිකිරීම සඳහා 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර පුද්ගලයකු විසින් වියදම් කරනු ලැබූ '' යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) එහි (ඊ) ඡේදයට ඉක්බිතිව ම ,පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (ඊඊ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඉදි කරනු ලැබූ පළමු නිවාසය වන්නා වූ ද පිරිවැය රුපියල් දශ ලක්ෂය නොඉක්මවන්නා වූ ද, 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඉදිකරනු ලබන්නා වූ ද, නිවාසයක්, ඉදිකරනු සඳහා යම් පුද්ගලයකු විසින් වියදම් කරනු ලැබූ ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හෝ (ඉ) ඡේදයෙහි සඳහන් යම් ආයතනයකින් හෝ අධිකාරියකින් යම් ණයක් මත ලබාගන්නා ලද මුදලක් නොවන, යම් මුදලක් ;'' ;

(ඉ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ '' 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව '' යන වචන සිට '' වියදම් කරන ලද යම් මුදලක් '' තෙක් වූ සියලු ඉලක්කම් සහ වචන වෙනුවට '' 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව මිලට ගනු ලැබූ පළමු නිවාසය, හෝ එම දින හෝ ඉන් පසුව මිලට ගනු ලැබූ නිවාසයක් තැනීමට පළමු බිම් කොටස,

මිලට ගැනීම සඳහා 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1989 මාර්තු මස 31 දින හෝ ඉන් පෙර, යම් පුද්ගලයකු විසින් වියදම් කරන ලද යම් මුදලක් ;'' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (උඋ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු මිලට ගන්නා ලද පළමු නිවාසය හෝ නිවාසයක් තැනීම සඳහා වන පළමු බිම් කොටස වන්නා වූ ද, 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු රුපියල් දශ ලක්ෂය නොඉක්මවන පිරිවැයකට මිලට ගන්නා වූ ද, නිවාසයක් හෝ බිම් කොටසක් මිලට ගනු සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හෝ (ඉ) ඡේදයෙහි සඳහන් ආයතනයකින් හෝ අධිකාරියකින් ණයක් මත ලබාගන්නා ලද මුදලක් නොවන යම් මුදලක් ;'';

(උ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයෙහි—

(i) '' යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදිකිරීමෙහි ලා '' යන වචන සිට '' යම් මුදල් ප්‍රමාණයක් '' දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට '' 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදිකිරීමෙහිලා හෝ (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද) නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය ඇතිව ඉදිකරන ලද්ද වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළක් සංයුක්ත වන්නා වූ ද, වාසික ඉඩකඩ පිළිබඳ යම් ඒකකයක් 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර මිලට ගැනීම වශයෙන් හෝ ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදල් ප්‍රමාණයක් ;'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ '' 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ හෝ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ හෝ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉඉ) ඡේදයේ (iii) වන අනුඡේදය යටතේ හෝ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඌ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (ඔඔ) (i) යම් නිවාසයක්, මහල් නිවාසයක් හෝ ඒකකයක් යම් තැනැත්තකු විසින් සේවයෙහි නියුක්ත කරන ලද කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු වාසය කරන නිවාසයක් වශයෙන් පදිංචිය සඳහා නම් ;

(ii) ඒ නිවාසයේ, මහල් නිවාසයේ හෝ ඒකකයේ බිම් ප්‍රදේශය වර්ග අඩි දෙදහසක් නොඉක්මම වන්නේ නම් ; සහ

(iii) ඒ නිවාසය මහල් නිවාසය හෝ ඒකකය වෙනුවෙන් 23 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ හෝ 23 වන වගන්තියේ (i) වන උපවගන්තියේ (ඉඉ) ඡේදයේ (iii) වන අනුඡේදය යටතේ හෝ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ කිසිම දීමනාවක් අඩුකරනු ලැබිය නොහැකි නම්

1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව රුපියල් දශ ලක්ෂයක් නොඉක්මවන්නා වූ මුදලකට යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදිකිරීමෙහි ලා, හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය ඇතිව ඉදිකරන ලද්ද වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළක් සංයුක්ත වන්නා වූ ද, වාසික ඉඩකඩ පිළිබඳ යම් ඒකකයක් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව මිලට ගැනීමෙහි ලා, හෝ ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක් ;''

(එ) ඒ උපවගන්තියේ (ච) ඡේදයට ඉක්බිතිව ම එළඹෙන ඡේදයෙහි '' මේ උපවගන්තියේ (ඉ) සහ (උ) ඡේදවල '' යන වචන වෙනුවට '' මේ උපවගන්තියේ (ඉ), (ඉඉ), (උ), (ඌ) ඡේදවල '' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ '' (ඊ) ඡේදයෙහි හෝ (උ) ඡේදයෙහි සඳහන් නිවාසයක් '' යන වචන වෙනුවට '' (ඊ) ඡේදයෙහි හෝ (ඊඊ) ඡේදයෙහි හෝ (උ) ඡේදයෙහි හෝ (ඌ) ඡේදයෙහි සඳහන් නිවාසයක් '' යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (5ආ) උපවගන්තියේ '' 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' 1986 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (5ආ) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්: —

'' (5ඇ) 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම—

(i) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද හෝ කරන ලද්දයි සලකනු ලබන, (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක), (ග) ඡේදවල සඳහන් ගෙවීම් නොවන සුදුසුකම් ලබන සියළු ගෙවීම් සම්බන්ධයෙන්, ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එක් පංගුවක් හෝ රුපියල් පනස් දහසක් යන ප්‍රමාණ දෙකින් කවර හෝ වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය ;

(ii) ඔහු විසින් කරන ලද හෝ කරන ලද්දයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ඇ), (ක), (ග) ඡේදවල සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් රුපියල් පනස් දහසක් නොඉක්මවිය යුතු ය ;

(iii) (i) වන සහ (ii) අනුඡේදවල සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම්වල සමස්තය සම්බන්ධයෙන් රුපියල් පන් දහසක් නොඉක්ම විය යුතු ය ;'' තවද

(6) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ අතුරු වගන්තියේ අන්තිමට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

" එසේම තවදුරටත් එම කොටස් මිළට ගනු ලැබූ තැනැත්තා විසින්, එම කොටස් සම්බන්ධයෙන් යම් මුදල් ප්‍රමාණයක් අස්කර ගනු ලැබීමට හෝ උපලබ්ධ කර ගනු ලැබීමට හෝ ඔහුට ගෙවනු ලැබීමට ආනුෂංගිකව යම් අතිරේක තක්සේරුවක් උද්ගත වන අවස්ථාවක —

(i) ඒ තැනැත්තා විසින් අස්කර ගනු ලබන හෝ උපලබ්ධ කරගනු ලබන හෝ ඔහුට ගෙවනු ලබන සම්පූර්ණ මුදලට ආරෝපණය කරනු ලැබිය හැකි ඒ දීමනාවේ ඒ කොටස ඔහුට ප්‍රදානය කරනු නොලැබුවේ නම් ද, දීමනාව ප්‍රදානය කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා යටතේ විය යුතු ආදායම් බද්ද, සහ

(ii) ඒ තක්සේරු වර්ෂය සඳහා අය කරනු ලැබූ බදු මුදල් ප්‍රමාණය

අතර වෙනසින් සමන්විත වන යම් අතිරේක තක්සේරුවක්, මේ පනතේ කුමක් සඳහන් ව ඇත ද ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු අතර, ඒ අනුව තක්සේරුව පිළිබඳ දැන්වීමට, අභියාචනයට සහ වෙනත් නඩු කටයුතුවලට අදළ මේ පනතේ විධිවිධාන ඒ අතිරේක තක්සේරුව සම්බන්ධයෙන් අදළ විය යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ—

(අ) (v) වන අනුඡේදයේ " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (v) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (vi) 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ (ඇ) කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ;" ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) (ඉ) ඡේදයෙහි " යම් මුදලක් " යන වචන වෙනුවට " යම් මුදලක්, හෝ " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියෙහි (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඊ) යම් සේවා නියුක්තියකින් ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් ඔහුට ගෙවන ලද යම් මුදලක් ;"

(ඇ) ඒ වගන්තියේ " ඉහත සඳහන් මුදල ඒ පුද්ගලයාගේ සේවායෝජක විසින් ගෙවනු ලැබ ඇත්නම් " යන වචන වෙනුවට " ඉහත සඳහන් මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණයන් ඒ පුද්ගලයාගේ සේවායෝජක විසින් ගෙවනු ලැබ ඇත්නම්, හෝ ඒ සේවායෝජක විසින් ඒ අරමුදලට හෝ අරමුදල්වලට දායක වී ඇත්නම් ", යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3අ) උපවගන්තියෙහි " යම් තැනැත්තකු විසින් යම් දේපළක් අත්කර ගැනීමෙන් වර්ෂ දෙකකට වැඩි එහෙත් වර්ෂ පහකට අඩු කාලයක් ගතවීමෙන් පසුව " යන වචන වෙනුවට " යම් තැනැත්තකු විසින් යම් දේපළක් අත්කර ගැනීමෙන් වර්ෂ දෙකකට වැඩි එහෙත් වර්ෂ පහකට වැඩි නොවන්නා වූ කාලයක් ගතවීමෙන් පසුව " යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (3ආ) උපවගන්තියෙහි—

(අ) " යම් දේපළක් අත්කර ගනු ලැබීමෙන් පසු මෙහි 1 වන තීරයේ සඳහන් කාල පරිච්ඡේදයක් තුළ දී " යන වචන වෙනුවට " යම් දේපළක් අත්කර ගැනීමේ දිනට පසුව, මෙහි 1 වන තීරයේ සඳහන් කාල පරිච්ඡේදය තුළ දී " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ I වන තීරයේ—

(i) " අවුරුදු පහකට වැඩි එහෙත් අවුරුදු පහළොවකට අඩු කාල පරිච්ඡේදයක් " යන වචන වෙනුවට " අවුරුදු පහකට වැඩි එහෙත් අවුරුදු පහළොවකට වැඩි නොවන කාල පරිච්ඡේදයක් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) " අවුරුදු පහළොවකට වැඩි එහෙත් අවුරුදු විස්සකට අඩු කාල පරිච්ඡේදයක් " යන වචන වෙනුවට " අවුරුදු පහළොවකට වැඩි එහෙත් අවුරුදු විස්සකට නොවැඩි කාල පරිච්ඡේදයක් " යන වචන ආදේශ කිරීමෙන් ; තවද,

(5) ඒ වගන්තියේ (3ආ) උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (3ඇ) 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඕ) හෝ (ක) ඡේදයේ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින්, යම් දේපළක් අත්කර ගැනීමේ සැබෑ දිනයට වඩා කලින් දිනයකට යොමු කිරීමෙන් ඒ දේපළෙහි වටිනාකම තීරණය කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගැනීමේ දිනය මේ වගන්තියේ කාර්ය සඳහා ඒ ඡේදයේ දෙවනුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගනු ලැබූ දිනය ලෙස සලකනු ලැබිය යුතුය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1ආ) වන උපවගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ :—

" (1ඇ) 1986 නොවැම්බර් මස 12 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා සමාගමක බදු අයකළ හැකි ආදායමෙහි යම් දේපළක අයිතිය වෙනස් වීමෙන් උද්ගත වන යම් ප්‍රාග්ධන ලාභයක් ඇතුළත් වන අවස්ථාවක 32 වන වගන්තියේ (3අ) වන සහ (3ආ) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ප්‍රාග්ධන ලාභය සම්බන්ධයෙන් බදු අයකිරීමට අදාළ විය යුතු ය.''.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(ආ) 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ධන බද්ද, ඒ තක්සේරු වර්ෂ සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම සහ (මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස්, නිවාස ස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ යම් සහනාධාරයක් නොවන) මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා වූ ද මේ නිදහස් කිරීම නිසා නොවේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීමේ දී ගණන් ගනු ලබන ලාභ සහ ආදායම් වන්නා වූ ද ලාභවල සහ ආදායමේ සමස්තයෙන් සියයට හැටක් නොඉක්ම විය යුතු ය.'' ; තවද

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඇ) 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ධන බද්ද, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම සහ (මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස්, නිවාස ස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ යම් සහනාධාරයක් නොවන) මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා වූ ද මේ නිදහස් කිරීම නිසා නොවේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීමේ දී ගණන් ගනු ලබන ලාභ සහ ආදායම වන්නා වූ ද ලාභවල සහ ආදායමේ සමස්තයෙන් සියයට පනහක් නොඉක්මවිය යුතු ය.''.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ (2) වන, (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(2) යම් තක්සේරු වර්ෂයක් තුළ දින එකසිය අසූතුනක් හෝ ඊට වැඩි ගණනක් ශ්‍රී ලංකාවෙහි කායික වශයෙන් පෙනී සිටින පුද්ගලයෙකු ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේම ශ්‍රී ලංකාවේ වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය.

(3) අනුගාමී තක්සේරු වර්ෂ දෙකක් හෝ වැඩි ගණනක් සඳහා වාසිකයකු ලෙස සලකනු ලැබූ පුද්ගලයකු දින තුන්සිය හැට පහක අඛණ්ඩ කාලසීමාවක් සඳහා ඔහු ශ්‍රී ලංකාවෙන් නොකඩවා බැහැරව සිටිනතාක් කල් වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය. ඒ තැනැත්තා එසේ බැහැරව සිටින විට (2) වන උපවගන්තියේ

විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද ඒ බැහැරව සිටීම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයකදී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය.

(4) යම් තැනැත්තකු නිර්වාසිකයකු වූ බවට (3) වන උපවගන්තිය යටතේ සලකනු ලැබූ අවස්ථාවක, සමස්තයක් වශයෙන් ගත් කල දින තිහක් නොඉක්මවන යම් කාලසීමාවක් හෝ කාල සීමාවන් සඳහා ඔහු ශ්‍රී ලංකාවේ සිටිය නමුදු දින තිහක් නොඉක්මවන එම කාලසීමාව හෝ කාලසීමාවන් ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගත කරනු ලැබූ කාලසීමාවක් හෝ කාලසීමාවන් ලෙස සලකනු ලැබිය යුතු ය.''.

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ '' 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1988 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්—

'' (3) (අ) 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකු යටත් වන ධන බද්දේ, සහ

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා යටත් වන ආදායම් බද්දේ

සමස්තය ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ සහ මේ පනත යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායම වන සහ ඒ නිදහස් කිරීම නිසා නොවේ නම් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමට ආගණනය කිරීමේ දී ගණන් ගනු ලැබිය යුතු (මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් නිවාස ස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ යම් සහනාධාරයක් නොවන) යම් ලාභවල සහ ආදායමේ සමස්තයෙන් සියයට පනහක් ඉක්මවන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු යටත් වන ධන බද්දට ප්‍රතිපක්ෂව ඒ අතිරික්තය හිලව් කරනු ලැබිය යුතු ය.''.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තියේ '' 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ '' 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ හෝ (ඉඉ) ඡේදයේ '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (2) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (2අ) ඉහතින් වූ උපවගන්තිවල කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කොට දක්වනු ලබන ආකෘතිය අනුව නොවන්නා වූ සහ ඉදිරිපත් කළ යුතු ලෙස එසේ දක්වනු ලබන තොරතුරු ඇතුළත් නොවන්නා වූ ආදායම් හා ධනය පිළිබඳව

වාර්තාවක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකුම, මේ පනතේ කාර්ය සඳහා තම ආදායම හෝ ධනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් නොකළ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.''.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (5) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි '' කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය. තවද '' යන වචන වෙනුවට '' කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතුය ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි '' කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය.'' යන වචන වෙනුවට '' කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතුය, තවද,'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (ඇ) 62 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව 1988 අප්‍රේල් මාසයේ 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් ඉකුත්වීමෙන් පසුව එළඹෙන ඊළඟ නොවැම්බර් මාසයේ 30 වන දිනට පසුව, එහෙත් ඊළඟට එළඹෙන වර්ෂයේ මාර්තු මාසයේ 31 වන දින හෝ ඉන් පෙර, අවස්ථාවෝචිත පරිදි, තමාගේ ආදායම හෝ ධනය පිළිබඳ වාර්තාවක් එකී තක්සේරු වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු, එකී තක්සේරු වර්ෂය සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු, අවස්ථාවෝචිත පරිදි, ආදායම් බද්ද හෝ ධන බද්ද සම්බන්ධයෙන්, එකී වාර්තාව කරන ලද තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ පහක් ඉකුත්වීමෙන් පසුව, කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය.''.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ '' ලේකම්වරයකු '' යන වචනය ඒ වගන්තියෙහි යෙදෙන කවර හෝ විටෙක ඒ වෙනුවට '' ලේකම්වරයකු '' යන වචනය ව්‍යාකරණ ප්‍රභේදයන්ට යටත්ව ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඈ) ඡේදයෙහි ''ලේකම්වරයා '' යන වචනය වෙනුවට '' ලේකම්වරයා '' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තියේ (1) වන උප වගන්තියේ '' ලේකම්වරයා '' යන වචනය වෙනුවට '' ලේකම්වරයා '' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තියේ (1) වන උප වගන්තියේ '' ලේකම්වරයා '' යන වචනය වෙනුවට '' ලේකම්වරයා '' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ '' විධායක නිලධරයා '' යන්නෙහි අර්ථකථනයේ '' රුපියල් එක් දහස් පන්සියයකට '' යන වචන වෙනුවට '' රුපියල් පන්දහසකට '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයේ II ඇ කොටසෙහි " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ IIඇ වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

**' II ඈ වන කොටස**

1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

| | |
|---|---|
| බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන රු. 21,000 සම්බන්ධයෙන් සියයට | 10 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000 සම්බන්ධයෙන් සියයට | 20 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000 සම්බන්ධයෙන් සියයට | 30 |
| ඉතිරි බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් සියයට | 40 |

**29.** (අ) මේ පනතේ 15(3) වන වගන්තියෙන් සහ 15(4) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1986 නොවැම්බර් මස 12 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(ආ) මේ පනතේ 10(2) වන වගන්තියෙන්, 10(3) වන වගන්තියෙන්, 10(4) (අ) වන වගන්තියෙන්, 11 වන වගන්තියෙන්, 14(2) (උ) (II) වන වගන්තියෙන් සහ 20 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1987 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනතේ 2 වන වගන්තියෙන් සහ 15(5) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1987 නොවැම්බර් මස 17 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

## 1988 අංක 30 දරන බැංකු පනත

[සහතිකය සටහන් කළේ 1988 අගෝස්තු මස 25 වන දින]

**බැංකු ව්‍යාපාර කරගෙන යනු ලබන තැනැත්තන්ට බලපත්‍ර දීම සඳහා කාර්ය පටිපාටියක් ඉදිරිපත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද බැංකු ව්‍යාපාරයට අදාළ වූ කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** (1) මේ පනත 1988 අංක 30 දරණ බැංකු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) V වන කොටස හැර මේ පනතේ අනිකුත් විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක ක්‍රියාත්මක වන්නේය.

(3) V වන කොටසේ විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පසු දිනයක ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන තැනැත්තන්ට බලපත්‍ර දීම

**2.** (1) නියමිත දින හෝ ඉන් පසුව, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වූ සමාගමක් විසින් හැර බැංකු ව්‍යාපාර කටයුතු කරනු නොලැබිය යුතු ය.

(2) ඒ සමාගම ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද සමාගමක් වන අවස්ථාවක, ඒ සමාගම 1982 අංක 17 දරන සමාගම් පනතේ XIII වන කොටසේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇත්තේ නම් මිස බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් සමාගමක් මෙහි මින් මතු'' බලපත්‍රලාභී වාණිජ බැංකුව'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

(4) මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සහ මේ පනතේ 3 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද නියමිත දිනයේ දී බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන ලද මේ පනතේ I වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සියලු වාණිජ බැංකු වලට මේ පනතේ විධිවිධානවලට අනුකූලව බල පත්‍ර නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියට පටහැනිව බැංකු ව්‍යාපාරික කටයුතු කරගෙන යන යම් සමාගමක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා ''සමාගම'' යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සහ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වන අතර, ශ්‍රී ලංකාවෙන් බැහැරව යථා පරිදි සංස්ථාගත කරන ලද හෝ යම් විදේශ රටක යම් ව්‍යවස්ථාවකට අනුකූලව හෝ රාජකීය අධිකාරි පත්‍රය හෝ පේටන්ට් බලපත්‍ර අනුව පිහිටුවන ලද සමාගමක් හෝ යම් ලිඛිත නීතියකින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද සංස්ථාපිත මණ්ඩලයක් ඇතුළත් වුව ද මහ බැංකුව හෝ – වන උපලේඛනයේ නිශ්චිත දක්වා ඇති බැංකු හැර, ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කර ඇති පුද්ගලික සමාගමක් එයට ඇතුළත් නොවන්නේ ය.

**3.** (1) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන ආකාරයට ලියවිල්ලකින් මුදල් මණ්ඩලය වෙත කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයකටම—

(අ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ සහ ව්‍යවස්ථාවලියේ හෝ සමාගමේ ව්‍යවස්ථාවේ හෝ ඒ හා සම්බන්ධිත වෙනත් යම් ලියවිල්ලක හෝ පිටපතක් ;

(ආ) බලපත්‍රය ලබාගැනීමට ඉල්ලුම් කර ඇති අවුරුද්දට ඉහතින්ම වූ අවුරුද්ද වෙනුවෙන් වූ සමාගමේ ශේෂ පත්‍රයේ පිටපතක් සහ ලාභාලාභ ගිණුමක් වේ නම්, එහි පිටපතක් ; සහ

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද සමාගමක් විසින් කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ශ්‍රී ලංකාව තුළ බැංකු කටයුතු හෝ භාර ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී දරන්නට සිදු වූ සියලු වගකීම් සහ බැරකම් ආවරණය කිරීමට අවශ්‍ය විය හැකි අරමුදල් මහ බැංකුව විසින් ඉල්ලා සිටි විට ලැබීමට සලස්වන බව සඳහන් කරන ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකින් සහතික කරනු ලැබූ ඒ සමාගමේ සභාපති වරයාගෙන් වූ දිවුරුම් පෙත්සමක්

අමුණා තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, බලපත්‍රයක් දිය යුතු ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා අවශ්‍ය යයි මුදල් මණ්ඩලය සලකන අවස්ථාවක, වෙනත් ලියකියවිලි හෝ විස්තර සපයන ලෙස මුදල් මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(4) යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද කිසිම සමාගමක් විසින්—

(අ) ඒ සමාගම ජනතා සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත්තේ නම් මිස ;

(ආ) ඒ සමාගමේ මූලික පරමාර්ථ ලෙස, චෙක්පත්, අණකර, ඇණවුම් මගින් හෝ අන්‍යාකාරයෙන් ඉල්ලා සිටි විට ආපසු ගැනීමට යටත්ව මුදල් තැන්පතු භාරගැනීමේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම, ඒ සමාගමේ සංස්ථා පත්‍රයේ සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස ; සහ

(ඇ) සමාගමේ සංස්ථා පත්‍රයෙහි යම් වෙනත් ආකාරයක ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා විධිවිධාන සලසා තිබේ නම්, ඒ ආකාරයේ ව්‍යාපාර කටයුතු, සමාගමේ සංස්ථා පත්‍රයෙන් මේ පනතෙහි II උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති එක් හෝ ඊට වැඩි ආකාරයක ව්‍යාපාර කටයුතු වලට සීමා කරනු ලැබ ඇත්තේ නම් මිස

බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන (2) වන හා (3) වන උපවගන්ති යටතේ ඉල්ලුම් පත්‍රයක් සහ වෙනත් ලේඛන ඉදිරිපත් කරන යම් තැනැත්තකු දන දනම එහි ඇතුළත් තොරතුරුවල යම් විස්තරයක අසත්‍ය හෝ නොමග යවන සුළු කරුණක් ඇතුළත් කරමින් එය ඉදිරිපත් කරනු ලැබුවේ නම්, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

**4.** (1) 3 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද යම් සමාගමකට, ඒ සමාගම ශ්‍රී ලංකාවේ ස්වකීය ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් එක්සත් ජනපද ඩොලර්වලින් හෝ ඒ එක්සත් ජනපද ඩොලර්වලට සමාන වූ මුදල් ප්‍රමාණයක්, යම් නම් කළ විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමට පොරොන්දු වන ලෙස මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ය. එසේ ප්‍රේෂණය කරනු ලබන මුදල් ප්‍රමාණය, ඒ සමාගමේ පැවරූ ප්‍රාග්ධනයෙහි කොටසක් විය යුතු අතර, තැන්පතුවක් ලෙස මහ බැංකුවෙහි හෝ මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන වෙනත් ආකාරයකින් තැන්පතු කරනු ලැබිය යුතු ය.

(2) මුදල් මණ්ඩලය විසින් අවසන්වරට කරන ලද තීරණයේ දිනයේ සිට මාස හයක කාල සීමාවක් ඉකුත්වීමෙන් පසු මුදල් ප්‍රේෂණය කිරීමට අදාළව ජාතික ආර්ථිකයේ යහපත උදෙසා එසේ කිරීමට අවශ්‍ය යයි හෝ ප්‍රයෝජනවත් යයි මුදල් මණ්ඩලය විසින් කලින් කල සලකනු ලබන අවස්ථාවක තවදුරටත් තීරණයක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ කරන ලද තීරණයක්, එවැනි එක් එක් තීරණයක් කිරීමෙන් පසුව ඉල්ලීමක් කරන ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද සියලුම සමාගම්වලට සමානව අදාළ වන්නේය.

**5.** (1) 3 වන වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ඒ ඉල්ලුම් පත්‍රය සමග වූ ලියකියවිලි සහ විස්තර සලකා බැලීමෙන් පසු සහ බලපත්‍රයේ නියම සහ කොන්දේසි ඉල්ලුම්කරු විසින් ඉටු කරනු ලබන බවට සෑහීමට පත්වීමෙන් පසු, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ඉල්ලුම්කරුට ශ්‍රී ලංකාවෙහි බැංකු ව්‍යාපාර කරගෙන යාම පිණිස බලය දෙමින් මුදල් මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රයෙහි—

(අ) බැංකුව කරගෙන යා යුත්තේ මෙරට බැංකු ව්‍යාපාරයක් ද නැතහොත් අක් වෙරළ බැංකු ව්‍යාපාරයක් ද නොඑසේ නම් ඒ දෙවර්ගයේම ව්‍යාපාර ද යන වග ; සහ

(ආ) යම් බැංකුවක් ව්‍යාපාරය කරගෙන යායුතු ස්ථානය හෝ ස්ථාන නැතහොත් යම් ප්‍රදේශයක් ඇතුළත නම් ඒ ප්‍රදේශය

නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම, (1) වන උප වගන්තිය යටතේ ඒ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ පිටපතක්, ඒ බැංකුවේ පරිශ්‍රය තුළ හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

**6.** 17 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්—

(අ) බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ව්‍යාපාරය හැර වෙනත් යම් බැංකු ව්‍යාපාරයක් කරගෙන යාම ; හෝ

(ආ) මේ පනතේ II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයේ ව්‍යාපාරයක් හැර වෙනත් යම් ආකාරයේ ව්‍යාපාරයක් කරගෙන යාම

නොකළ යුතු ය.

**7.** පිළිවෙලින් (397 වන අධිකාරය වන) ලංකා බැංකුව ආඥා පනතින් සහ 1961 අංක 29 දරන මහජන බැංකුව පනතින් පිහිටුවන ලද ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් සහ 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද යම් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් විසින් ඒ එක් එක් බැංකුවට පිළිවෙලින් අදාළ වූ ඒ ව්‍යවස්ථාවලින් සහ ඒ යටතේ ඒ ඒ බැංකුව වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීම 6 වන වගන්තියේ සඳහන් විධිවිධානවලින් සීමා කරනු ලැබේ යයි තේරුම් නොගත යුතු ය.

**8.** (1) බලපත්‍රලාභී සෑම වාණිජ බැංකුවක් විසින් ම ඒ බැංකුව විසින් කරගෙන යනු ලබන විවිධ බැංකු ව්‍යාපාර වර්ග සැලකිල්ලට ගෙන මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් මහ බැංකුවට ගෙවනු ලැබිය යුතු ය.

(2) එක් එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් බලපත්‍ර ගාස්තු වශයෙන් ගෙවිය යුතු මුදල සහ ඒ ගාස්තුව ගෙවිය යුතු ආකාරය මුදල් මණ්ඩලය විසින් ඒ ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත දැනුම් දිය යුතුය.

(3) බැංකු ව්‍යාපාර වර්ග සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තුවක් තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යාපාර වර්ග කරගෙන යනු ලබන සියලුම බැංකුවලට ඒ ගාස්තුව අදාළ විය යුතුය.

9. (1) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්—

(අ) 5 වන වගන්තිය යටතේ බලපත්‍රය නිකුත් කොට මාස නවයක් ඇතුළත ව්‍යාපාරය ආරම්භ නොකර ඇති බව ; හෝ

(ආ) එය විසින් දැරීමට යෙදුනු යම් ණයක් ඒ ණය ගෙවිය යුතු වූ විට ගෙවීමට නොහැකි වී ඇති බව ; හෝ

(ඇ) ඒ බැංකුවට විරුද්ධව පෙත්සමක් හෝ නඩු කටයුත්තක් පැවරීමට යෙදුනු අවස්ථාවක, යම් බංකොලොත්භාවය පිළිබඳ නීතියක් හෝ ණයකරුවන්ට සහන සැලසීම සඳහා වූ හෝ ණයකරුවන්ට අදළ වූ හෝ වෙනත් යම් නීතියක් යටතේ, ඒ බැංකුව වෙනුවෙන් භාරකරුවකු හෝ ලැබුම්කරුවකු පත්කිරීමට යෙදී ඇති බව ; හෝ

(ඈ) බැංකු ව්‍යාපාරය කරගෙන යාම අවසන් කරන ලද බව

සම්බන්ධයෙන් වූ මුදල් මණ්ඩලය සෑහීමට පත් වූ අවස්ථාවක මුදල් මණ්ඩලය විසින් ඒ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරන බවට දැන්වීමක් කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීම බලපත්‍රලාභී වාණිජ බැංකුවට දන්වා යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අවලංගු කිරීමේ දැන්වීමකට විරුද්ධව ඒ දැන්වීම දැනුම් දුන් දිනයේ සිට දින තිහක් ඇතුළත 5 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම හෝ නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වමින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ලියවිල්ලකින් මුදල් මණ්ඩලය වෙත විරෝධතාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) අවලංගු කිරීම පිළිබඳ දැන්වීම දැනුම් දුන් දිනයේ සිට දින හැටක් ඉකුත්වීමෙන් පසු සහ (2) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලද විරෝධතා විභාග කිරීමෙන් පසු, මුදල් මණ්ඩලය විසින් ඒ දැන්වීම ඉල්ලා අස්කර ගැනීම හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම හෝ කරනු ලැබිය යුතු ය ; තවද ඒ බව බැංකුව වෙත දන්වනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ අවලංගු කිරීමක්—

(අ) අභියාචනයන් ඉදිරිපත් කිරීම සඳහාවූ කාලය අවසන් වීමෙන් පසු (5) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමට විරුද්ධව අභියාචනයක්, ඉදිරිපත් කර නොමැති අවස්ථාවක ; හෝ

(ආ) අභියාචනාධිකරණය විසින් අවලංගු කිරීම ස්ථිර කිරීමෙන් පසු, (5) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක

ක්‍රියාත්මක විය යුතු අතර, එවැනි අවලංගු කිරීමක් පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(5) 3 වන උපවගන්තිය යටතේ කිසියම් අවලංගු කිරීමක් පිළිබඳව මුදල් මණ්ඩලයේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම අවලංගු කිරීම පිළිබඳව මණ්ඩලය විසින් ඔහුට දැනුම් දෙනු ලැබීමෙන් දින දහහතරක් ඇතුළත දී, එම තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකිය.

(6) මේ වගන්තිය යටතේ අභියාචනවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තුරු, අභියාචනාධිකරණය වෙත ප්‍රතිශෝධන මගින් ඉල්ලුම් කිරීම් වලට අදාළව ඒ ව්‍යවස්ථාව යටතේ සාදන ලද රීති, මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම අභියාචනයකටම අදාළ විය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන්, ඒ අභියාචනය කරන ලද්දේ යම් තීරණයකට විරුද්ධව ද, ඒ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම නැතහොත් මඳක් වෙනස් කිරීම හෝ එය අවලංගු කර, යුක්තිය ඉටු වීම පිණිස අවශ්‍ය වෙනත් යම් ආඥාවක් කිරීම හෝ අභියාචනාධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

**10.** (1) 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රයක් අවලංගු කිරීම සඳහා දැන්වීමක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවට—

(අ) ඒ විධානයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති යම් ආකාරයකට, එහි වත්කම් පිළිබඳව කටයුතු කිරීම හෝ ඒවා බැහැර කිරීම තහනම් කරමින් ;

(ආ) නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති යම් ගණුදෙනුවකට හෝ ගණුදෙනු වර්ගයකට ඇතුළත්වීම ඒ බැංකුවට තහනම් කරමින් ;

(ඇ) ඒ බැංකුව විසින් තැන්පතු ලබාගැනීම තහනම් කරමින් ;

විධාන දෙනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන ඉටු නොකරන අවස්ථාවක, මුදල් මණ්ඩලය විසින් තවදුරටත්—

(අ) ඒ බැංකුව ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාර කටයුතු කරගෙන යාම වහාම අත්හිටුවන මෙන් සහ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බැංකුවක් සම්බන්ධයෙන් වූ විට, ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් බැහැර එහි ව්‍යාපාර කටයුතු අත්හිටුවන මෙන් ඒ බැංකුවට විධාන කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ඒ බැංකුවේ සියලු පොත්, ලේඛන සහ වත්කම් සහ එහි ව්‍යාපාර කටයුතු සිය භාරයට ගන්නා ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂට විධාන කරනු ලැබිය හැකි ය. තවද, මුදල් මණ්ඩලයේ විධානය ඉටු කිරීම සඳහා තමාට අවශ්‍ය විය හැකි පියවර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ගැනීම නීත්‍යානුකූල වන්නේය.

(3) (2) වන උප වගන්තිය යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් සියලු පොත්, ලේඛන සහ වත්කම් සිය භාරයට ගන්නා වූ සහ මුදල් මණ්ඩලය විසින් ඒ අවලංගු කිරීම කොන්දේසි රහිතව අස්කර ගන්නා වූ අවස්ථාවක, සිය භාරයට ගන්නා ලද පොත්, ලේඛන සහ වත්කම් ඒ බැංකුවට වහාම භාර දෙන ලෙස මුදල් මණ්ඩලය විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂට විධාන කරනු ලැබිය යුතු ය.

(4) තත් කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද එවැනි විධානයක් කිරීමේ හේතුව නිසා සිදු වූ හෝ සිදු විය හැකි හෝ සිදුවිය හැකි යයි චෝදිත පාඩු හෝ අලාභ හානි සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ගන්නා වූ යම් ක්‍රියාවක් වෙනුවෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් යම් අධිකරණයක් කිසිදු නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතුය.

**11.** (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක, බලපත්‍රලාභී වාණිජ බැංකුවට ශ්‍රී ලංකාව තුළ ද, ඒ වාණිජ බැංකුව ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන විට ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් බැහැර ද සිය ව්‍යාපාර කටයුතු වහාම අත්හිටුවන ලෙස මුදල් මණ්ඩලය විසින් විධාන කරනු ලැබිය යුතු අතර, එහි සියලු පොත්, ලේඛන සහ වත්කම් සමග එහි ව්‍යාපාර කටයුතු භාර ගන්නා ලෙසත් ඒ බැංකුව විසින් ව්‍යාපාර කටයුතු තවදුරටත් කරගෙන යාම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගන්නා ලෙසත් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂට විධාන කරනු ලැබිය යුතුය. තව ද, මුදල් මණ්ඩලයේ විධානය ඉටු කිරීම සඳහා තමාට අවශ්‍ය විය හැකි යම් පියවර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ගැනීම නීත්‍යානුකූල වන්නේය.

(2) තත් කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියකින් හෝ ඒයටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වූ බලපත්‍රයක් අවලංගු කරන ලද අවස්ථාවක, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්, ඒ බැංකුවේ ව්‍යාපාර කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා නඩු කටයුතු ආරම්භ කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත වහාම ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, මේ පනතේ VIII වන කොටසේ විධිවිධාන ප්‍රකාර, බැංකුව ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා ඇවරකරු ලෙස ඔහු පත් කරනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වූ බලපත්‍රයක් අවලංගු කිරීම කරන ලද අවස්ථාවක, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් වහාම ඒ බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත, ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද එහි ශාඛාවෙහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී දරනු ලැබූ බැඳීම් සහ වගකීම් එය විසින් ගරු කළ යුතු බව දන්වා සිටිය යුතු අතර, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව මේ සම්බන්ධයෙන් දෙනු ලැබිය හැකි එවැනි යම් පොරොන්දුවක් බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විය හැකි පියවර ගනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන, (2) වන හා (3) වන උපවගන්ති වල සඳහන් කර ඇති ක්‍රියා මාර්ගයට අමතරව, මුදල් මණ්ඩලය විසින්, ඊට අවශ්‍ය යයි හැඟෙන අන්දමට, බලපත්‍රලාභී වාණිජ බැංකුව සම්බන්ධයෙන්—

(අ) ඒ බැංකුවේ ව්‍යාපාර කටයුතුවලට අදාළව අවශ්‍ය යයි මුදල් මණ්ඩලය සලකන, යම් පියවරක් වහාම ගන්නා ලෙස හෝ යම් ක්‍රියාවක් හෝ දෙයක් වහාම කරන ලෙස ඒ බැංකුවට නියම කිරීමෙන් ;

(ආ) ඒ බැංකුවේ ව්‍යාපාර කටයුතු නිසි ලෙස කරගෙන යාම සම්බන්ධයෙන් ඒ බැංකුවට උපදෙස් දීම පිණිස සුදුසු හා නිසි තැනැත්තකු පත් කිරීමෙන් ;

(ඇ) ඒ බැංකුවේ ව්‍යාපාර කටයුතු පාලනය සියතට ගැනීමෙන් සහ කරගෙන යාමෙන් හෝ මුදල් මණ්ඩලය විසින් සියතට ගත් පාලනය, බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම පිණිස වෙනත් තැනැත්තකුට පැවරීමෙන් ;

(ඈ) ඒ බැංකුවේ ප්‍රාග්ධනය වැඩිකිරීමෙන්, අළුත් කොටස්කරුවන් සඳහා කටයුතු පිළියෙල කිරීමෙන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් ඒ බැංකුව ප්‍රතිසංවිධානය කිරීමෙන් ; සහ

(ඉ) ඒකාබද්ධ කිරීමට කැමැත්ත පළකරන වෙනත් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය වන වැඩ පිළිවෙලක් ඇති කිරීමෙන්

වෙනත් පියවර ගනු ලැබිය හැකි ය.

**12.** (1) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ශාඛාවක්, නියෝජිතායතනයක් හෝ එහි කාර්යාලයක් ශ්‍රී ලංකාවේ යම් කොටසක විවෘත කිරීම හෝ වසාදැමීම සඳහා හෝ යම් ව්‍යාපාර කටයුතු කරන පවත්නා ස්ථානයක පිහිටීම වෙනස් කිරීම සඳහා ද ;

(ආ) යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ ව්‍යවස්ථාගත කළ හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර යම් ස්ථානයක එහි ශාඛාවක්, නියෝජිතායතනයක් හෝ කාර්යාලයක් විවෘත කිරීම සඳහා ද, වසා දැමීම සඳහා ද ;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක යම් ශාඛාවක ව්‍යාපාර කටයුතු අත්පත් කර ගැනීම සඳහා ද ;

(ඈ) යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් සමාගමක් හෝ සංස්ථාවක් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් දරන්නේ වී නමුත්, එවැනි තැනැත්තකුගේ නාමිතයා විසින් යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක ද්‍රව්‍යමය ප්‍රතිලාභ අත්පත්කර ගැනීම සඳහා ද ;

මේ ඡේදයේ කාර්ය සඳහා ''ද්‍රව්‍යමය ප්‍රතිලාභ'' යන්නෙන්, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි ප්‍රාග්ධනයක් දැරීම අදහස් වේ ;

(ඉ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බැංකු විසින් ශ්‍රී ලංකාව තුළ නියෝජිත කාර්යාලයක් හෝ එවැනි වෙනත් ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම සඳහා ද

අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් මණ්ඩලය විසින් දෙන ලද ලිඛිත අනුමතිය අවශ්‍ය වන්නේය.

(2) මේ වගන්තිය යටතේ වූ අනුමතය අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව දෙනු ලැබිය හැකි ය.

**13.** (1) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් කරනු ලබන වාර්තාවක් උඩ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ශාඛාවක්, නියෝජිතායතනයක් හෝ කාර්යාලයක් වසා දැමීම ඇතුළුව, අනුමතිය අස් කර ගැනීම හෝ 12 වන වගන්තිය යටතේ දෙන ලද අනුමතයක නියම සහ කොන්දේසි මුදල් මණ්ඩලය විසින් වෙනස් කිරීම ලියවිල්ලකින් කරනු ලබන නියමයක් මගින් කරනු ලැබිය හැකිය. මුදල් මණ්ඩලයේ තීරණය පිළිබඳ දැන්වීම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් බැංකුව වෙත දැනුම් දිය යුතු අතර, ඒ බැංකුව විසින් බැඳීම් ක්‍රියාත්මක කිරීම සහ ශාඛාවේ, නියෝජිතායතනයේ හෝ කාර්යාලයේ සියලු වගකීම් ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇති යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ඒ නියමයේ දින සිට දින තිහක් ඇතුළත, ඒ අනුමතය ඉල්ලා අස්කර නොගත යුත්තේ හෝ නියම සහ කොන්දේසි වෙනස් නොකළ යුත්තේ කුමක් නිසාදැයි හේතු දක්වමින් මුදල් මණ්ඩලය වෙත ලියවිල්ලකින් විරෝධතා දැක්වීමක් කරනු ලැබිය හැකි ය.

(3) දැන්වීමේ දින සිට දින හැටක් ඉකුත්වීමෙන් පසු සහ (2) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලද විරෝධතා සලකා බැලීමෙන් පසු අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මුදල් මණ්ඩලය විසින්—

(අ) ලියවිල්ලකින් කරනු ලබන නියමයක් මගින්, අස්කර ගැනීමේ හෝ වෙනස් කිරීමේ දැන්වීම කොන්දේසි විරහිතව අවලංගු කිරීම ; හෝ

(ආ) ලියවිල්ලකින් කරනු ලබන නියමයක් මගින් හා එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන්, සුළු වෙනස් කිරීම් සහිතව හෝ රහිතව අස්කරගැනීම හෝ වෙනස් කිරීම ස්ථිර කිරීම

කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වසා දැමීම සඳහා නියමයක් කරන ලද අවස්ථාවක, ඒ ශාඛාවේ, නියෝජිතායතනයේ හෝ කාර්යාලයේ මුදල් තැන්පත් කර ඇති සියලු තැනැත්තන්ට හැකි තරම් ඉක්මණින් සිය මුදල් ආපසු ගැනීමට අවස්ථාවක් දෙන බවට ද ඒ තැන්පත්කරුවන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම පිණිස ගත යුතු ක්‍රියාවන් ගන්නා බවට ද බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සෑහීමට පත්වීම පිණිස අවස්ථානුකූලව අවශ්‍ය යයි පෙනීයන සියලු පියවර ගන්නා මෙන් මුදල් මණ්ඩලය විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත විධාන කරනු ලැබිය යුතු ය. තව ද, ඒ අනුව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**14.** (1) යම් තැනැත්තකු හෝ යම් වාණිජ බැංකුවක් බලපත්‍රයක් නොමැතිව බැංකු ව්‍යාපාර ගණුදෙනු කිරීමෙහි යෙදෙන බව විශ්වාස කිරීමට මහ බැංකු අධිපතිට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඒ තැනැත්තා හෝ බැංකුව මේ පනතේ විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩකර ඇත්තේ දැයි හෝ කඩ කරන්නේ දැයි සොයා බැලීමේ කාර්යය සඳහා පොත්, වාර්තා, ගිණුම්, මුදල්, ඇප කාර වවුචර් හෝ වෙනත් ලියවිලි හෝ ලේඛන පරීක්ෂාකර බලන ලෙස මහ බැංකුවේ අධිපති විසින්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂට හෝ මහ බැංකුවේ වෙනත් යම් නිලධරයකුට විවෘත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර මහ බැංකුවේ අධිපති විසින් එසේ බලය පවරන ලද බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ හෝ වෙනත් එවැනි නිලධරයකු විසින් ඒ උපවගන්තියේ කාර්ය සඳහා, පරීක්ෂණයේ කාර්ය සඳහා තමාට ලබා ගැනීමට අවශ්‍ය යයි සලකනු ලබන තොරතුරු තමාට සපයන ලෙස හෝ යම් පොත්, වාර්තා, ගිණුම්, මුදල්, ඇපකර, වවුචර, වෙනත් ලියකියවිලි සහ ලේඛන, පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස, ඒ තැනැත්තාට හෝ බැංකුවට නියම කරනු ලැබිය හැකි අතර, එසේ නියම කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ඒ තොරතුරු සැපයීම සහ පරීක්ෂණය සඳහා ඒ පොත්, වාර්තා, ගිණුම්, මුදල්, ඇපකර, වවුචර්, වෙනත් ලියකියවිලි සහ ලේඛන ඒ නිලධරයාට ඉදිරිපත් කිරීම, ඒ තැනැත්තාගේ හෝ බැංකුවේ කාර්යය විය යුතු ය.

(3) එවැනි තොරතුරු සැපයීම හෝ (2) වන උපවගන්තිය යටතේ එසේ නියම කරනු ලැබූ කල්හි යම් පොත්, වාර්තා, ගිණුම්, මුදල්, ඇපකර, වවුචර්, වෙනත් ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කිරීම නොකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් තැනැත්තකු හෝ වාණිජ බැංකුවක් විසින් ඒ පොත්, වාර්තා, ගිණුම්, මුදල්, ඇපකර, වවුචර්, වෙනත් ලියකියවිලි හෝ ලේඛන ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම, බලපත්‍රයක් නොමැතිව ඒ තැනැත්තා විසින් හෝ ඒ බැංකුව විසින් බැංකු ව්‍යාපාර ගණුදෙනුවල යෙදෙන බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේය.

**15.** මුදල් නීති පනත යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ බැංකු ව්‍යාපාර කටයුතුවලට අදාළව මුදල් මණ්ඩලයට පිරිනැමුණු, පැන වූ හෝ පැවරුණු බලතල, කාර්ය හෝ කර්තව්‍ය මුදල් මණ්ඩලය විසින් හෝ මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා **5** වන වගන්තිය යටතේ බලපත්‍රයක් හෝ 12 වන වගන්තිය යටතේ අනුමතයක් හෝ අවශ්‍ය වන්නේ යයි මේ කොටසේ විධිවිධානවලින් අදහස් කරන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

## II වන කොටස

### බැංකු නම් සහ විස්තර කිරීම්

**16.** (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හැර වෙනත් කිසිම ප්‍රසිද්ධ සමාගමක් විසින්, එහි නමේ කොටසක් හෝ එහි විස්තර කිරීමක් වශයෙන්, '' බැංකුව '', '' බැංකුකරු '' හෝ '' බැංකු ව්‍යාපාර '', යන වචන හෝ ඉන් සෑදුණු වචන හෝ එහි අන්වක්ෂරීකරණ හෝ වෙනත් භාෂාවක ඒවාට සමාන වචන හෝ භාවිත නොකළ යුතු අතර, කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් සිය නමේ කොටසක් ලෙස ඒ වචනවලින් යටත් පිරිසෙයින් එකක් වත් භාවිතා කරන්නේ නම් මිස, ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කටයුතු කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන්නා වූ ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද, සිය නමට '' බැංකුව '', '' බැංකුකරු '' හෝ '' බැංකු ව්‍යාපාර '' යන වචන කවර හෝ භාෂාවකින් ඇතුළත් කර නොමැත්තා වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි නමෙහි මෙම වචන බැහැර කරනු ලැබ ඇත්තේ වී නමුදු, ශ්‍රී ලංකාවෙහි එකී කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය.

(2) කිසිදු ව්‍යාපාර ආයතනයක්, පුද්ගලයකු හෝ පුද්ගලයින් කණ්ඩායමක් විසින්, යම් ව්‍යාපාරයක් කර ගෙන යාමේ කාර්ය සඳහා, එහි හෝ ඔහුගේ නමේ කොටසක් වශයෙන් හෝ එහි විස්තර කිරීමක් වශයෙන් '' බැංකුව '' '' බැංකුකරු '' හෝ '' බැංකු ව්‍යාපාර '', යන වචන හෝ ඉන් සෑදුනු යම් වචන හෝ එහි අන්වක්ෂරීකරණ හෝ වෙනත් භාෂාවකින් ඒවාට සමාන වචන හෝ භාවිත කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කිසිවක්—

(අ) මේ පනතේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද කාර්ය එකක් හෝ වැඩි ගණනක් සඳහා ඇති කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක පාලිත සමාගමක් ;

(ආ) සිය සම්බන්ධතාවන් ආරක්ෂා කරගැනීම සඳහා ඇති කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවල යම් සංගමයක් ;

(ඇ) මුදල් නීති පනතේ 127 වන වගන්තියේ අර්ථය ඇතුළත බැංකු ආයතනයක හෝ මහ බැංකුවේ සේවා නියුක්තයන් වන සේවකයන්ගේ සංගමයක් හෝ ඒකරාශිවීමක් වන වෘත්තීය සමිති ආඥාපනත (138 වන අධිකාරය) යටතේ ලියාපදිංචි කළ වෘත්තීය සමිතියක් ;

(ඈ) මුදල් නීති පනතේ 127 වන වගන්තියෙහි ඇතුළත්වන, '' බැංකු ව්‍යාපාර ආයතන '' යන්නෙහි විග්‍රහයෙහි (ආ) සහ (ඇ) ඡේදවල සඳහන්වන අර්ථය ඇතුළත සැලසෙන නියෝජිතායතනයක්, ආයතනයක්, තැනැත්තෙක් හෝ තැනැත්තන් කාණ්ඩයක්;

(ඉ) සමාගමක් ලෙස සංස්ථාගත කර එක් සතියක් ඇතුළත (2) වන උප වගන්තිය ප්‍රකාර බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කර ඇත්තා වූ ද ඒ ඉල්ලීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ තීරණය ඒ සමාගම වෙත දන්වනතෙක් සිටින්නා වූ ද සමාගමක් ;

(ඊ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද වාණිජ බැංකුවක නියෝජිත කාර්යාලයක්

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**17.** (1) ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් බලපත්‍රලාභී නොවන වාණිජ බැංකුවක්, එහි පාලිත සමාගමක් ලෙස තබා නොගත යුතු ය :

එසේ වුව ද එවැනි බැංකුවක් විසින් මුදල් මණ්ඩලයේ ලිඛිත අවසරය පිට—

(අ) සිය එකම ව්‍යාපාරය වශයෙන් බැංකු ව්‍යාපාර, ගණකාධිකරණය, තක්සේරු කිරීම, ව්‍යාපෘති අගැයීම හා ණය අගැයීම යන කරුණුවලට සම්බන්ධ යම් එක් විෂයයක් ගැන හෝ ඒ සියලු විෂයයන් ගැන පුහුණුවීම සලසාලීම කරගෙන යන පාලිත සමාගමක් ;

(ආ) සිය එකම ව්‍යාපාරය වශයෙන් කුලී සින්නක්කර ගණුදෙනුවල නියැලි පාලිත සමාගමක් ;

(ඇ) සිය එකම ව්‍යාපාරය ලෙස සංවර්ධනය සඳහා මධ්‍යම කාලීන සහ දීර්ඝ කාලීන ණය ලබාදීමේ ව්‍යාපාරය කරගෙන යන පාලිත සමාගමක් ;

(ඈ) එකම ව්‍යාපාරය ලෙස ගබඩා කිරීමේ, බදුදීමේ සහ ගුදම් කිරීමේ සේවාවන් කරගෙන යන පාලිත සමාගමක් ;

(ඉ) එකම ව්‍යාපාරය ලෙස කළමනාකාරිත්ව උපදේශක සේවාවන් කරගෙන යන පාලිත සමාගමක් ;

(ඊ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ප්‍රදානය කරන ලද ණය මත, සමාගමක් විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවට නොගෙවන ලද ප්‍රාග්ධනය සහ ඒ මත එකතු වූ පොළිය ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් ප්‍රාග්ධනගත කිරීමේ හේතුවෙන්, ඒ සමාගමේ කොටස් බලපත්‍රලාභී වාණිජ බැංකුවට අත්පත් කර ගැනීමට යෙදීමේ හේතුව නිසා පමණක් ඇතිවන පාලිත සමාගමක් ;

(උ) මේ පනතේ II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් නොකරන ලද ආකාරයක ව්‍යාපාරයක් කරන පාලිත ව්‍යාපාරයක්

සමාගමක් ලෙස තබාගනු ලැබිය හැකි ය.

තවදුරටත් එසේ වුවද, නියමිත දිනයට කලින්, ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ඇති කරනු ලැබූ පාලිත සමාගමක් කෙරෙහි මේ උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, එහි යම් පාලිත සමාගමකට, එවැනි යම් පාලිත සමාගමක් විසින් කරගෙන යන්නා වූ ව්‍යාපාරයට සමාන ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ ඒ බැංකුවේ අනිකුත් ගණුදෙනුකරුවන්ට පිරිනමා ඇති සැලකිල්ලට වඩා වැඩි සැලකිල්ලක් නොපිරිනැමිය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා, මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක්, වෙනත් සමාගමක පාලිත සමාගම ලෙස සලකනු ලැබිය යුත්තේ—

(i) ඒ වෙනත් සමාගම එහි ස්කන්ධ කොටස් ප්‍රාග්ධනයේ නාමික අගයෙන් හරි අඩකට වඩා දරන්නේ නම් ; හෝ

(ii) ඒ වෙනත් සමාගම එහි කොටස් හිමියකු වේ නම් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පාලනය කරන්නේ නම් ; හෝ

(iii) පළමු සඳහන් කළ සමාගම, ඒ වෙනත් සමාගමේ පාලිත සමාගමක් වන්නා වූ යම් පාලිත සමාගමක් වන්නේ නම්

පමණ ය.

(4) එක් සමාගමක්, වෙනත් සමාගමක පාලිත සමාගමක් වන්නේදැයි තීරණය කිරීමේ දී—

(අ) ඒ වෙනත් සමාගම විසින් විශ්වසනීය තත්ත්වයක ලා දරන කොටස් හෝ ක්‍රියාත්මක කළ හැකි බලය එය විසින් නොදරන හෝ ක්‍රියාත්මක නොකරන ලෙස සැලකිය යුතු ය.

(ආ) (ඇ) සහ (ඈ) ඡේදවල විධිවිධානවලට යටත් ව ;

(i) ඒ වෙනත් සමාගම (ඒ වෙනත් සමාගම විශ්වසනීය තත්ත්වය ගැන පමණක් සලකා ගෙන) සඳහා නාමිකයකු ලෙස යම් තැනැත්තකු විසින් ; හෝ

(ii) විශ්වසනීය තත්ත්වය පමණක් අදාළ වන පාලිත සමාගමක් නොවන්නා වූ, ඒ වෙනත් සමාගමේ පාලිත සමාගමක් විසින් හෝ පාලිත සමාගම සඳහා නාමිකයකු විසින්

දරන කොටස් හෝ ක්‍රියාත්මක කළ හැකි බලය ඒ වෙනත් සමාගම විසින් දරන ලෙස හෝ ක්‍රියාත්මක කළ හැකි ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) පළමු සඳහන් කළ සමාගමේ ණයපත්‍රවල විධිවිධාන ප්‍රකාර හෝ එවැනි ණයපත්‍රවල නිකුත් කිරීමක් සතුකර ගැනීම සඳහා වූ භාර ඔප්පුවක් ප්‍රකාර, යම් තැනැත්තකු විසින් දරනු ලබන යම් කොටස් හෝ ක්‍රියාත්මක කරනු ලබන බලය නොසලකා හරිනු ලැබිය යුතු ය.

(ඈ) අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනත් සමාගමේ හෝ එහි පාලිත සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලට මුදල් ණයට දීම ඇතුළත් වූ සමාගමක් විසින් හුදෙක් එහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී ඇපයක් වශයෙන් ඉහත කී පරිදි කොටස් දරනු ලබන හෝ බලය ක්‍රියාත්මක කරන අවස්ථාවක් වේ නම්, ඒ වෙනත් සමාගම හෝ එහි පාලිත සමාගම විසින් හෝ ඒ වෙනුවෙන් එහි නාමිකයකු විසින්

දරනු ලබන කොටස් හෝ ක්‍රියාත්මක කරන බලය (ඇ) ඡේදයේ සඳහන් කළ පරිදි දරනු නොලබන හෝ ක්‍රියාත්මක නොකරන ඒ වෙනත් සමාගම විසින් දරනු නො ලබන සේ හෝ ක්‍රියාත්මක නොකරන සේ ගණන් ගත යුතු ය.

(5) මේ පනතේ කාර්යයන් සඳහා යම් සමාගමක්, වෙනත් සමාගමක පාලිත සමාගම වන්නේ නම් පමණක්, ඒ වෙනත් සමාගම, එකී පාලිත සමාගමේ පාලක සමාගම ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ කොටසේ " ස්කන්ධ කොටස් ප්‍රාග්ධනය " යන යෙදුමෙන්, සමාගමක් සම්බන්ධයෙන් වූ විට, බෙදදීමක දී නිශ්චිත ප්‍රමාණයකට වඩා සහභාගිවීමේ යම් අයිතියක් ගෙන දෙන ලාභය වශයෙන් හෝ ප්‍රාග්ධනය වශයෙන් හෝ ලැබෙන කොටස් ප්‍රාග්ධනයෙන් යම් කොටසක් ඇතුළත් නොවන, ඒ සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය අදහස් කෙරේ.

## III වන කොටස

### ප්‍රාග්ධන අවශ්‍යතාවයන්, සංචිත අරමුදල් සහ ද්‍රවශීල වත්කම් නඩත්තුව

**18.** තත්කාලයෙහි බලාත්මකව පවත්නා වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, නියමිත දින හෝ එදිනට පසුව මේ කොටසේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සියලු නියමයන් ඉටු කරන්නේ නම් මිස, කිසිම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු, ආරම්භ කිරීම හෝ කරගෙන යාම නො කළ යුතු ය.

**19.** (1) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම සියලු කල්හිම රුපියල් මිලියන විසිපහකට නොඅඩු ප්‍රමාණයක අවල ප්‍රාග්ධනයක් පවත්වා ගෙන යා යුතු ය.

(2) අවල ප්‍රාග්ධනය—

(අ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව, යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන්නේ නම්, ගෙවා නිමකර තිබිය යුතු ය ;

(ආ) එය ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් නම් ප්‍රධාන කාර්යාලය මගින් පවරනු ලැබ තිබිය යුතු ය , :

එසේ වුව ද නියමිත දින සිට අවුරුදු පහක කාලසීමාවකට පසු, මුදල් මණ්ඩලය විසින් බැංකුවක තැන්පතු වගකීම් හෝ ආපතික වගකීම් ද ඇතුළු මුළු වගකීම් හෝ මුළු වත්කම් හෝ ඒ වත්කම්වල යම් නිශ්චිත වත්කම් වර්ග ගැන සැලකිල්ලට ගෙන අවල ප්‍රාග්ධනය වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත අවම ප්‍රමාණය ලෙස නියම කරනු ලැබ ඇති ප්‍රමාණය කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය. බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් පවත්වා ගෙන යායුතු අවල ප්‍රාග්ධනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් කරනු ලබන යම් වෙනස් කිරීමක් මුදල් මණ්ඩලය විසින් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ලියවිල්ලකින් දන්වා යවනු ලැබිය යුතු ය. යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එවැනි වෙනස් කිරීමක් උඩ සිය ප්‍රාග්ධනය වැඩිකිරීමට නියම කරන අවස්ථාවක, ඒ බැංකුව විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ නියමයන් ඉටු කිරීම පිණිස, මාස දෙළහක කාලසීමාවක් හෝ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ඊට වඩා දීර්ඝ කාලසීමාවක් ඒ බැංකුවට ලබාදෙනු ලැබිය යුතුය.

(3) අවම නියමිත ප්‍රාග්ධනය වගකීම්වලට හා වත්කම්වලට අදාළවන සේ නියම කරනු ලබන කල්හි එය ගණන් බැලීමේ කාර්ය සඳහා ප්‍රාග්ධනය සහ වගකීම් යන දෙකම හෝ වත්කම් ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන, මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරන පරිදි වූ වර්ගයක සහ ගණන් බැලීමේ ආකාරයක විය යුතු ය.

(4) යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වන විට, ඒ බැංකුවේ ප්‍රාග්ධනය කෙරෙහි විදේශීය සහභාගිත්වයේ සීමාව, මුදල් මණ්ඩලය විසින් කලින් කල, පිහිටුවනු ලබන සීමාවන් කිසි විටෙකත් නොඉක්ම වනු ලැබිය යුතු ය.

(5) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්—

(අ) එහි ගෙවා නිම කළ ප්‍රාග්ධනය ; හෝ

(ආ) එම බැංකුවට පැවරූ ප්‍රාග්ධනය

මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව අඩු කරනු නොලැබිය යුතු ය.

(6) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි යම් නොගෙවූ ප්‍රාග්ධනය මත යම් අයභාරයක් ඇති නොකළ යුතු අතර, මේ විධිවිධාන කඩකරමින් ඇති කරන ලද යම් අයභාරයක් ශූන්‍ය සහ බලරහිතවේ.

(7) (අ) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ද ගෙන මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි පරිදි, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම, සෑම කල්හිම, පෙරාතුවෙහි ම වූ මාස දෙළහ ඇතුළත එය විසින් මාසය අවසානයේ දැරීමට යෙදුනු සම්භාව්‍ය වගකීම් ද ඇතුළුව වගකීම්වල සාමාන්‍ය ශේෂයේ සියයට අනු ප්‍රමාණයකට සමාන, එකතු වූ මුදල් ප්‍රමාණයකින් ප්‍රාග්ධන අරමුදල් පවත්වාගෙන යා යුතුය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කරන ලද සියයට අනුප්‍රමාණයෙහි යම් වෙනස් කිරීමක් මුදල් මණ්ඩලය විසින් ලියවිල්ලකින් සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත ම දන්වා සිටිය යුතුය. එසේ වුවද ඒ වෙනස් කිරීමෙන් සිය ප්‍රාග්ධන අරමුදල් වැඩි කිරීමට නියම කෙරෙන සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකටම, ඒ නියමය ඉටු කිරීම සඳහා මාස දෙළහක කාලසීමාවක් හෝ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ඊට වඩා දීර්ඝ කාලසීමාවක් දෙනු ලැබිය යුතු ය.

(8) (1) වන සහ (7) වන උපවගන්තිවල සඳහන් වන කිසිවකින්, මේ පනතේ I වන උපලේඛනයෙහි සඳහන් කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු විසින්, නියමිත දිනය සිට මාස දෙළහක් ගතවීමට ප්‍රථම ඉහත සඳහන් උපවගන්තිවල විධිවිධාන ඉටු කිරීමට නියම කරන්නේ යයි තේරුම් නොගත යුතුය.

(9) ඉහතින් සඳහන් උපවගන්තිවල විධිවිධාන ප්‍රකාර බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධන අරමුදල් ඌණ වූ අවස්ථාවක, එවැනි ඌණතාවයන් නිවැරදි කිරීම සඳහා සාධාරණ කාලසීමාවක් මුදල් මණ්ඩලය විසින් දෙනු ලැබිය හැකි ය.

**20.** (1) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම සංචිත අරමුදලක් පවත්වාගෙන යා යුතු අතර, බදු ගෙවීමෙන් පසුවත් එක් එක් අවුරුද්දේ ශුද්ධ ලාභවලින් යම් ලාභයක් ප්‍රකාශයට පත් කිරීමට හෝ ප්‍රධාන කාර්යාලයට හෝ අන් ස්ථානයකට යම් ලාභ මාරුකිරීමට ප්‍රථමයෙන්, ඒ සංචිත අරමුදලට—

(අ) එකී සංචිත අරමුදලේ ප්‍රමාණය, ඒ බැංකුවේ, අවස්ථාවෝචිත පරිදි, ගෙවා නිම කළ හෝ පැවරූ ප්‍රාග්ධනයෙන් සියයට පනහකට සමානවනතුරු, ඒ ලාභවලින් සියයට පහකට අඩු නොවන ප්‍රමාණයකට සමාන වූ මුදලක් ; සහ

(ආ) එකී සංචිත අරමුදලේ ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, ඒ බැංකුවේ ගෙවා නිම කළ හෝ පැවරූ ප්‍රාග්ධනයට සමාන වන තුරු ඒ ලාභවලින් සියයට දෙකකට අඩු නොවන ප්‍රමාණයකට සමාන වූ මුදලක්

මාරු කරනු ලැබිය යුතු ය :

එසේ වුවද සංචිත අරමුදලට ඒ ලාභ මාරු කිරීමට ප්‍රථම, මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන අන්දමට, ශුද්ධ ලාභවලින් සියයට විසිපහකට නොඅඩු ප්‍රමාණයක මුදලක් අස්ථානගත වත්කම් පියවීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය.

(2) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක සංචිත අරමුදල අඩු කිරීම හෝ දුබල කිරීම කරනු නො ලැබිය යුතු ය:

එසේ වුවද, සංචිත අරමුදල අඩු කරනු ලැබිය හැකි කරුණු මුදල් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි, ගෙවා නිම කළ හෝ පැවරූ ප්‍රාග්ධනය වැඩි කිරීමේ කාර්ය සඳහා මුදල් මාරු කිරීමක් කරනු ලැබූ විට, අඩු කිරීමකට අවසර දිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ගෙවා නිම කළ හෝ පැවරූ ප්‍රාග්ධනයෙහි දුබලවීමක් වළක්වාලීමේ එකම මාර්ගය සංචිත අරමුදල දුබල කිරීම පමණක් වන විට, ඉඩදෙනු ලබන කාලසීමාවක් ඇතුළත ඌණතාව පිළිසකර කරන කොන්දේසියට යටත්ව, සංචිත අරමුදලෙහි දුබල කිරීමකට මුදල් මණ්ඩලය විසින් ඉඩදෙනු ලැබිය යුතු ය.

**21.** (1) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම, එවැනි බැංකුවක් විසින් කරගෙන යන ව්‍යාපාර කටයුතුවල ස්වභාවය සැලකිල්ලට ගෙන මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි පරිදි, ඒ බැංකුව මහ බැංකුවට සහ කොටස් හිමියන්ට ඇති බැරකම් අඩු කිරීමෙන් පසු, එක් එක් මාසයේ දෛනික සාමාන්‍ය ගණනට අඩු නොවිය යුතු, එහි බැරකම්වලට මුළු ප්‍රමාණයක වූ ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යා යුතු ය, :

එසේ වුවද, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සියයට ප්‍රමාණය, මහ බැංකුවට සහ කොටස් හිමියන්ට ඇති බැරකම් අඩු කිරීමෙන් පසු මුළු බැරකම්වලින් සියයට විස්සකට අඩු හෝ සියයට හතලිහකට වැඩි හෝ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ඉටුකර ඇති බවට තමා සෑහීමකට පත්වීමේ කාර්ය සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් අවශ්‍ය යයි සලකනු ලබන වාර්තාවක් හෝ වාර්තා තමා වෙත සපයන ලෙස, ඔහු විසින් සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකටම ; ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකිය : එසේ දැන්වීමක් කරනු ලැබූ සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම නියම කරනු ලැබිය හැකි වාර්තාව හෝ වාර්තා සපයනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන ඉටු කිරීමට නොහැකිවන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, මුදල් මණ්ඩලයක් විසින් තීරණය කරනු ලබන කාලයක් තුළදී මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයක් අනුව ගණන් බලන ලද ඒ ඌණතාව මුදල මත වූ අයභාරයක් මහ බැංකුවට ගෙවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන ඉටු කිරීම පැහැර හරින යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

**22.** යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද කිසිම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි කොටස් මත යම් ලාභාංශයක් ගෙවීම ද, ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද කිසිම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ශ්‍රී ලංකාවේ දී උපයන ලද යම් ලාභයක් පිටරටකට මාරුකිරීම ද, එහි මූලික වියදම් ඇතුළු සියලු ප්‍රාග්ධන වියදම් සහ ස්පෘශ්‍ය වත්කම් වලින් නියෝජනය නොවන වෙනත් වියදම් ශීර්ෂ ද සම්පූර්ණයෙන් කපා හරිනතුරු කරනු නො ලැබිය යුතු ය.

## IV වන කොටස

### අක් වෙරළ බැංකු ව්‍යාපාර

**23.** අක් වෙරළ බැංකු ව්‍යාපාර කරගෙන යාමට බලපත්‍ර ලබාඇති වාණිජ බැංකුවක් විසින් හැර අක් වෙරළ බැංකු ව්‍යාපාර කරගෙන නොයා යුතු අතර, මුදල් මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලබන අක් වෙරළ බැංකු ගණුදෙනු ක්‍රමයකට අනුකූලව, ඒ බැංකුව විසින් එහි ව්‍යාපාරික කටයුතු කරනු ලැබිය යුතු ය ;

එසේ වුවද, මුදල් මණ්ඩලය විසින් පිහිටුවන ලද විදේශීය මුදල් බැංකු ගණුදෙනු ක්‍රමය යටතේ නියමිත දිනයේ දී අක් වෙරළ බැංකු ගණුදෙනු ව්‍යාපාරවල යෙදෙමින් සිටින I වන උපලේඛනයෙහි සඳහන් බැංකුවලට, මේ කොටස යටතේ අක් වෙරළ බැංකු ව්‍යාපාරවල යෙදීමට හැකිවනු පිණිස 5 වන වගන්තියේ ප්‍රකාර බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

**24.** මේ කොටස යටතේ වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක සියලු අක් වෙරළ මෙහෙයුම් එහි අක් වෙරළ ඒකකය මගින් පමණක් කරගෙන යනු ලැබිය යුතු අතර III වන, V වන සහ VI වන කොටස් මේ කොටස යටතේ අක් වෙරළ බැංකු ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**25.** අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන, මුදල් මණ්ඩලය විසින් කරනු ලබන නියමයක් මගින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අක් වෙරළ ඒකකයකට, මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පනවනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව, පහත දැක්වෙන යම් ව්‍යාපාර කටයුත්තක් හෝ ඒ සියල්ලම කරගෙන යන ලෙස බලය දෙනු ලැබිය හැකි ය :—

(අ) යම් අනේවාසිකයකුගෙන් යම් විදේශ ව්‍යවහාර මුදල් වලින් කාලීන සහ ඉල්ලීම පිට ආපසු ගෙවන තැන්පතු භාරගැනීම ; එසේ වුව ද, කාලීන තැන්පතු සම්බන්ධයෙන් වන විට, එවැනි තැන්පතු ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් දස දහසකට හෝ ඊට සමාන මුදලකට හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ඊට වැඩි මුදලකට අඩු නොවිය යුතු ය. එසේ වුවද ඒ අක් වෙරළ ඒකකය විසින් චෙක්පත් මගින් අරමුදලින් ආපසු ගැනීමට හැකි ඉතිරි කිරීමේ ගිණුම් විවෘත නොකළ යුතු ය ;

(ආ) කවර හෝ අනේවාසිකයකුගෙන් ඕනෑම ප්‍රමාණයක ව්‍යවහාර විදේශ මුදල් ණයට ගැනීම ;

(ඇ) යම් ව්‍යවහාර විදේශ මුදලින් යම් අනේවාසිකයකුට ණය ලබා ගැනීමේ පහසුව ඇති කිරීම ;

(ඈ) වෙනත් යම් අක් වෙරළ ඒකකයක් සමග යම් ව්‍යවහාර විදේශ මුදලින් යම් ගණුදෙනුවක නිරතවීම ; සහ

(ඉ) අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, මුදල් මණ්ඩලය විසින් බලය දෙනු ලබන, යම් ව්‍යවහාර විදේශ මුදලින් වෙනත් යම් ගණුදෙනුවක නිරතවීම.

**26.** ජාතික ආර්ථිකයෙහි යහපත සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා ගේ අනුමතය ඇතිව, මුදල් මණ්ඩලය විසින් විශේෂයෙන් නියම කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව, වාණිජ බැංකුවල බලපත්‍ර ලබා ඇති 25 වන වගන්තිය යටතේ නියමිත කටයුතු සියල්ලෙහිම හෝ ඉන් යම් ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් අක් වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව නියමයක් මගින් මුදල් මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි ය.

**27.** සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම, එහි අක් වෙරළ ඒකකය වෙනුවෙන්—

(අ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ එක් එක් මුදල් වර්ෂයේ වැඩ කරන අවසාන දිනයට ශේෂ පත්‍රයක් ; සහ

(ආ) ඒ වර්ෂය වෙනුවෙන් ලාභාලාභ ගිණුමක්

පිළියෙල කරනු ලැබිය යුතු ය.

**28.** 27 වන වගන්තියේ සඳහන් කරන ලද ශේෂ පත්‍රයේ සහ ලාභාලාභ ගිණුමේ ආකෘතිය මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි අතර, ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම් එසේ නියම කරන ලද ආකෘතියට අනුව පිළියෙල කරනු ලැබිය යුතු ය.

**29.** වාණිජ බැංකුවල සංචිත, ණය සහ විදේශ විනිමය මෙහෙයුම් විධිමත් කිරීම සඳහා විධිවිධාන සලසා ඇති මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ III වන, VI වන සහ VII වන කොටස්වල විධිවිධාන අක් වෙරළ ඒකක සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**30.** (1) අක් වෙරළ බැංකු ගණුදෙනු ව්‍යාපාරවල යෙදෙන සෑම වාණිජ බැංකුවක් විසින්ම, අවුරුද්දකට වරක්, ඒ අක්වෙරළ ඒකකයේ ගිණුම් විගණනය කිරීම පිණිස සුදුසුකම්ලත් විගණක වරයකු පත් කර ගතයුතු අතර, ඒ විගණකවරයා විසින්, ඒ අක් වෙරළ ඒකකයේ ගිණුම්, ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම් සම්බන්ධයෙන් වාර්තාවක් ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය. විගණකවරයා සිය වාර්තාවෙහි, සිය මතයේ හැටියට, ශේෂපත්‍රය සහ ලාභාලාභ ගිණුම, සම්පූර්ණ හා සාධාරණ ද යන බවත්, ඒවා විධිමත් ලෙස සකස් කර ඇත්තේ ද යන බවත් බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කටයුතුවල සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් ඉන් පෙන්නුම් කරන්නේ ද යන බවත් සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) වාර්තාවේ සහතික කළ පිටපතක් මුදල් මණ්ඩලය වෙත යැවිය යුතු අතර, විගණකවරයා විසින් සිය කාර්ය ඔහුගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් ඉටු කර නොමැති බව මුදල් මණ්ඩලයේ අදහස වේ නම්, අළුත් වාර්තාවක් සකස් කිරීමේ කාර්ය සඳහා වෙනත් විගණකවරයකු පත් කරන ලෙස මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවට නියම කරනු ලැබිය හැකි ය.

**31.** විගණකවරයාගේ වාර්තාවේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ, විගණකවරයා විසින් වාර්තාවක් නොසැපයීම නිසා හෝ අක් වෙරළ ඒකකය ස්ථිරසාර ආර්ථික තත්ත්වයක නොපවත්නා බව හෝ එය වංචනික, අනාරක්ෂිත හෝ නුසුදුසු බැංකු ගණුදෙනු පිළිවෙත්වල යෙදෙන බව මුදල් මණ්ඩලයට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති කරවන වෙනත් අදාළ තොරතුරු ලැබීම නිසා හෝ එහි ව්‍යාපාරික කටයුතු ඉටුකිරීමේ දී මේ කොටසේ නියමයන් ඉටු නොකිරීම නිසා යම් අක් වෙරළ ඒකකයක් සම්බන්ධයෙන්, මුදල් මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා නිසිපරිදි බලය දෙන ලද එහි නිලධරයන් මගින් පරීක්ෂණයක් පැවැත්වීම කරනු ලැබිය හැකි ය.

**32.** අක් වෙරළ ඒකකය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාර කටයුතුවල ස්වභාවය සැලකිල්ලට ගෙන ඒ අක් වෙරළ ඒකකය පවත්වාගෙන යා යුතු බවට මුදල් මණ්ඩලය විසින් තීරණය කෙරෙන පොත් වාර්තා, ගිණුම්, මුදල් ඇපකර, වවුචර වෙනත් ලියකියවිලි සහ ලේඛන සෑම අක් වෙරළ බැංකු ගණුදෙනු ඒකකයක් විසින්ම පවත්වාගෙන යා යුතු ය.

**33.** (1) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් හෝ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ 31 වන වගන්තිය යටතේ බලය පවරන ලද යම් නිලධරයකු විසින්—

(අ) යම් අක් වෙරළ ඒකකයක කටයුතුවල සත්‍ය තත්ත්වය නිර්ණය කිරීමේ කාර්ය සඳහා ලබාගැනීම අවශ්‍ය යයි තමා සලකනු ලබන යම් තොරතුරක් තමා වෙත සපයන ලෙස යම් අක් වෙරළ ඒකකයක යම් අධ්‍යක්ෂවරයකුට, නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට නියම කිරීම ;

(ආ) තමා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වේලාවක දී එවැනි තොරතුරු ඇතුළත් වූ හෝ ඇතුළත් විය හැකි සිය සන්තකයෙහි පවත්නා යම් පොත්, වාර්තා, ගිණුම්, මුදල්, සුරැකුම්පත්, වවුචර්, වෙනත් ලියකියවිලි සහ ලේඛන තමා විසින් පරීක්ෂාකර බැලීම, සඳහා ඉදිරිපත් කරන ලෙස එවැනි අධ්‍යක්ෂවරයකුට, නිලධරයකුට හෝ සේවකයකුට හෝ නියම කිරීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර ඉල්ලා සිටි විටෙක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ 31 වන වගන්තිය යටතේ බලය පවරන ලද යම් නිලධරයකු විසින් ඒකකයක පොත්, වාර්තා, ගිණුම්, මුදල්, සුරැකුම්පත්, ලියකියවිලි, වවුචර් සහ එවැනි යම් තොරතුරු අඩංගු හෝ අඩංගු විය හැකි ඔවුන්ගේ සන්තකයේ ඇති වෙනත් ලියකියවිලි පරීක්ෂා කර බැලීම පිණිස සම්පූර්ණ අවස්ථාව ලබාදීම ඒ අක් වෙරළ ඒකකයේ සෑම අධ්‍යක්ෂවරයකුගේම, නිලධරයකුගේම හෝ සේවකයකුගේම කාර්ය වන්නේය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් පොත් වාර්තා, ගිණුම්, මුදල් සුරැකුම්පත්, වවුචර්, වෙනත් ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් නොකළොත් හෝ තොරතුරු නොසැපයුව-හොත් ඒ පැහැර හැරීම කරන නිලධරයා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

**34.** මේ කොටසේ විධිවිධානවලට යටත්ව, මුදල් මණ්ඩලය විසින් කලින් කල මේ කොටසේ කාර්ය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන තොරතුරු, ලේඛන සහ වාර්තා ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, තනි තනිවම වූ ගණුදෙනු එළිදරව් නොවන තොරතුරු සහ දත්ත එය විසින් පළ කරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### ගිණුම්, විගණනය, තොරතුරු සහ පරීක්ෂා කිරීම

**35.** සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම, එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු—

(අ) ඒ මුදල් වර්ෂයේ අවසාන වැඩ කරන දිනය තෙක්වූ ශේෂ පත්‍රයක් ; සහ

(ආ) ඒ වර්ෂය වෙනුවෙන් ලාභාලාභ ගිණුමක්

පිළියෙල කරනු ලැබිය යුතු ය.

**36.** (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශේෂ පත්‍රයෙහි, ඒ ශේෂ පත්‍රය අදාළ වන මුදල් වර්ෂය අවසානයෙහි ඒ බැංකුවෙහි කටයුතු අඩංගු විය යුතු ය.

(2) ශේෂ පත්‍රයෙහි හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක—

(අ) වෙන වෙනම වූ ශීර්ෂ යටතේ, ස්පෘශ්‍ය වත්කම් වලින් නියෝජනය නොවන ප්‍රාග්ධන වියදම කපා නොහරින ලද්දේ නම්, ඒ වියදම් ;

(ආ) ආයෝජනවල වෙළෙඳ අගය ;

(ඇ) මුදල් වර්ෂය තුළ ස්ථාවර වත්කම් තක්සේරු කරන්නට යෙදුනේ නම්, ඒවා තක්සේරු කිරීමට යොදගත් ක්‍රමය ;

(ඈ) බොල් ණය සහ සැක සහිත ණය සඳහා ඉඩ සලසා ඇති අඩුකිරීම් වලින් පසු අත්තිකාරම් වල එකතු මුදල ;

(ඉ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂයවීම, අළුත් කිරීම හෝ අඩුවීම සඳහා වූ ප්‍රතිපාදනයෙහි වැඩිවීමක් හෝ අඩුවීමක් ;

(ඊ) අරමුදල් මාර්ග සහ යෙදවීම් ;

(උ) සංචිත ප්‍රතිපාදන සහ එකිනෙකින් වෙනස් වූ බැරකම් ;

(ඌ) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමෙන් පසුව වූ පළමුවන ශේෂ පත්‍රය සම්බන්ධයෙන් හැරෙන්නට, ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති සියලු ශීර්ෂ සඳහා, ඊට ඉහතින් ම වූ මුදල් වර්ෂය අවසානයේ ඒ ඒ ශීර්ෂ යටතේ තිබූ ප්‍රමාණයන්

පෙන්වනු ලැබිය යුතු ය.

**37.** ලාභාලාභ ගිණුමේ හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක—

(අ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂයවීම, අළුත් කිරීම හෝ අඩුවීම සඳහා වූ ප්‍රතිපාදනය මගින් ආදයමින් ගෙවනු ලැබූ මුදල ;

(ආ) ලාභ මත ශ්‍රී ලංකා ආදයම් බද්ද සහ වෙනත් ශ්‍රී ලංකා බදු සඳහා ආදයමින් ගෙවූ මුදල සහ ඒ ගිණුමෙන් පැහැදිලිවම වෙනස්ව, පවත්නා බදු වර්ෂය වෙනුවෙන් හෝ අනුප්‍රාප්තික වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු බදු බැරකම් සඳහා වෙන් කළ හෝ වෙන් කිරීමට යෝජිත මුදල් ;

(ඇ) ගෙවන ලද හෝ ගෙවීමට යෝජිත ලාභාංශවල මුළු එකතු මුදල ;

(ඈ) විගණකයන්ගේ පාරිශ්‍රමික ප්‍රමාණය ;

(ඉ) අධ්‍යක්ෂවරයන්ගේ වේතනවල මුළු එකතුව නියෝජනය වන ආදයමින් ගෙවූ මුදල ;

(ඊ) සංචිතවලට වෙන්කල හෝ වෙන්කිරීමට යෝජිත හෝ ඉන් ආපසු ගන්නා ලද මුදල ;

(ඇ) බැංකු සමාගම් විසින් සාමාන්‍යයෙන් භාර නොගන්නා සහ සුවිශේෂ හෝ පුනරාවර්තන නොවන ස්වභාවයේ කරුණු හේතුකොටගෙන සාමාන්‍යයෙන් භාර නොගන්නා ගණුදෙනු වලින් පැන නගින හෝ ගිණුම් තැබීමේ පදනමෙහි වෙනස් කිරීමක් නිසා ඇති වන ලාභයක් හෝ පාඩුවක් හෝ ආදයම සහ වියදම් ;

(ඈ) මේ පනතේ මේ කොටස බලාත්මක වීම ආරම්භ වීමෙන් පසුව වූ පළමුවන ලාභාලාභ ගිණුම සම්බන්ධයෙන් හැරෙන්ට, ලාභාලාභ ගිණුමේ පෙන්වා ඇති සියලු ශීර්ෂ සඳහා ඊට ඉහතින් ම වූ මුදල් වර්ෂය අවසානයේ ඒ ඒ ශීර්ෂ යටතේ වූ ප්‍රමාණයන්

පෙන්වනු ලැබිය යුතු ය.

**38.** (1) යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම එහි මුදල් වර්ෂය අවසානවී මාස පහක් ඇතුළත, ඒ මුදල් වර්ෂය අවසානයට වූ ශේෂ පත්‍රය සහ මුදල් වර්ෂය සඳහා වූ එහි ලාභාලාභ ගිණුම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත යවනු ලැබීම හා පළ කරනු ලැබීම කළ යුතු අතර ඒවා එහි ව්‍යාපාරික කටයුතු කරන එක් එක් ස්ථානයෙහි හොඳින් පෙනෙන ස්ථානයක, ඊළඟ අවුරුද්දේ ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම පිළියෙල කොට ප්‍රදර්ශනය කරන තෙක්, ප්‍රදර්ශනය කරවනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම එහි එක් එක් මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඇතුළත එය ශ්‍රී ලංකාව තුළ කරගෙන යන ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන්, එහි මුදල් වර්ෂය අවසානයට වූ ශේෂ පත්‍රය සහ ඒ මුදල් වර්ෂය සඳහා වූ එහි ලාභාලාභ ගිණුම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත යවනු ලැබිය යුතු ය.

(3) මුදල් මණ්ඩලය, විසින්, මේ කොටසෙහි සඳහන් කරන ලද ශේෂ පත්‍ර සහ ලාභාලාභ ගිණුමෙහි ආකෘතිය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අතර, එසේ ආකෘතිය නිශ්චිතව සඳහන් කර ඇති අවස්ථාවක, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකම ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම, එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ ආකෘතියෙහි පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍ර ලබා ඇති සෑම වාණිජ බැංකුවක් විසින් ම, මුදල් වර්ෂය පියවා හය මාසයක් ඇතුළත—

(අ) එහි අක් වෙරළ ඒකකයේ ව්‍යාපාර කටයුතු ද ඇතුළත් ශ්‍රී ලංකාව තුළ වූ එහි ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ඒ මුදල් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම ; සහ

(ආ) ඒ වාණිජ බැංකුවේ සහ ඊට අනුබද්ධ සමාගම්වල සහ එහි පාලිත සමාගම්වල ද කටයුතුවල තත්ත්වය සඳහන් කරමින් ඒ මුදල් වර්ෂයේ අවසානය තෙක් වූ ඒකාබද්ධ ශේෂ පත්‍රය, එහි ඊළඟ ලාභාලාභ ගිණුම සහ ශේෂ පත්‍රය ප්‍රදර්ශනය කරනු ලබන තෙක්

ඒ වාණිජ බැංකුවේ ව්‍යාපාරික ස්ථානය ඇතුළත හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

**39.** (1) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම එහි ගිණුම් විගණනය කිරීම පිණිස සුදුසුකම් ලත් විගණකවරයකු අවුරුදු පතා පත් කරගත යුතු ය.

(අ) යම් ලිඛිත නීතියක් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථා ගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වන විට, තමා විසින් පරීක්ෂා කරන ලද ගිණුම්, ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම් පිළිබඳව, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ එක් එක් කොටස්හිමියා වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් පිළියෙල කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වන විට, තමා විසින් පරීක්ෂා කරන ලද ගිණුම්, ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම් පිළිබඳව, එහි ප්‍රධාන කාර්යාලයට වාර්තාවක් සැපයීම

ඒ විගණකවරයාගේ කාර්ය විය යුතු ය.

(2) මුදල් වර්ෂය අවසානවී මාස තුනක් ඇතුළත සම්පූර්ණ කළයුතු ඒ වාර්තාවෙහි, විගණකවරයාගේ මතය අනුව ශේෂපත්‍රය සහ ලාභාලාභ ගිණුම්වල සම්පූර්ණ සහ සාධාරණ වූ ද විධිමත්ව සකස් කරන ලද්ද වූ ද ප්‍රකාශයක් ඇතුළත් වන්නේ ද යන වගත්, ඒවායින් බැංකුවේ වැඩ කටයුතු පිළිබඳ සත්‍ය වූ ද නිවැරදි වූ ද තත්ත්වය විදහා දක්වන ප්‍රකාශයක් නියෝජනය කරන්නේ ද යන වගත්, විගණකවරයා විසින් ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නිලධරයන්ගෙන් හෝ අනුයෝජිතයන්ගෙන් පැහැදිලි කිරීමක් හෝ යම් තොරතුරක් කැඳවා සිටින ලද්දේ නම් ඒ පැහැදිලි කිරීම හෝ තොරතුරු සතුටුදායක වන්නේ ද යන වගත්, සඳහන් විගණකවරයාගේ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය.

(3) (1) වන හා (2) වන උපවගන්ති අනුව විගණකවරයා විසින් සාදන ලද වාර්තාව, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව සමඟ, යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක නම් ඒ බැංකුවේ කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී කියවිය යුතු අතර, ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වන විට, ඒ ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත යවනු ලැබිය යුතු ය. ඒ වාර්තාවේ පිටපතක් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත යවනු ලැබිය යුතුය. විගණක වාර්තාව ගැන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා සෑහීමට පත් නොවූ අවස්ථාවක, අළුත් වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස අළුත් විගණකවරයකු පත් කරන ලෙස ඔහු විසින් මුදල් මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විගණකවරයකු පත්කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අපොහොසත් වුවහොත්, හෝ (3) වන උපවගන්තියේ ප්‍රකාර, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් මුදල් මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබුවහොත්, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව සඳහා විගණකවරයකු පත්කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත්තේ ය.

(5) (1) වන හෝ (4) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සෑම විගණකවරයකුටම, සිය කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වේ යයි ඔහු විසින් සලකනු ලබන හෝ පොත්, සහ ගිණුම් ද වවුචර් සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවට අයත් වූ සියලු ලියකියවිලි සහ ලේඛන ද සියලු වේලාවන්හි දී ම ලබාගැනීමේ අයිතිය තිබිය යුතු අතර, විගණකවරයා වශයෙන් සිය කාර්ය සහ කර්තව්‍ය නිසි ලෙස ඉටුකිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි තමා කල්පනා කරන තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දෙන ලෙස ඒ බැංකුවේ නිලධරයන්ට නියම කිරීමට හිමිකම් ද තිබිය යුතුය.

(6) විගණකවරයාගේ පාරිශ්‍රමිකය, ඒ විගණකවරයා පත් කරන ලද්දේ බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ මුදල් මණ්ඩලය යන දෙකින් කවරක් විසින් වුව ද බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් ගෙවනු ලැබිය යුතු ය. (4) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පත්කරන ලද විගණකවරයකු සම්බන්ධයෙන් වනවිට, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මුදලක් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

(7) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක සම්බන්ධතාවයක් ඇති කිසිම තැනැත්තකු හෝ ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකු, අනුයෝජිතයකු ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ විගණකවරයකු ලෙස පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ නොවේ. විගණකවරයකු වශයෙන් පත්කරනු ලැබූ යම් තැනැත්තකු ඒ පත්වීම කරනු ලැබීමෙන් පසු, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් සම්බන්ධතාවක් අත්පත් කරගන්නා ලදහොත් හෝ එහි අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු වුවහොත් ඔහු විගණකවරයා ලෙස ක්‍රියා කිරීම වහාම අවසන් විය යුතු ය.

(8) රාජ්‍ය සංස්ථාවක් වන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ගිණුම් විගණනය කිරීමෙහි ලා මේ වගන්තියේ ඇතුළත් කිසිවක් අදාළ නොවිය යුතු ය.

**40.** යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට, තමාට පාලනය කරගත නොහැකි කරුණු හේතුකොටගෙන, 35 වන වගන්තියේ විධිවිධාන ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් පත් කරන ලද විගණකවරයකුට, තමාට පාලනය කරගත නොහැකි කරුණු හේතුකොටගෙන, නියමිත පරිදි විගණන වාර්තාව සම්පූර්ණ කර ගැනීමට නොහැකිවන අවස්ථාවක, ඒ වාණිජ බැංකුව විසින් කරනු ලබන ඉල්ලීමක් උඩ මේ කොටසේ පෙරාතුව වූ විධිවිධාන ඉටුකිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් සාධාරණ කාල සීමාවක් ලබා දිය හැකි ය.

**41.** (1) මුදල් මණ්ඩලය විසින් කලින් කල, ප්‍රශ්නයට අදළ බලපත්‍රලාභී වාණිජ බැංකුව ස්ථිරසාර ආර්ථික තත්ත්වයකින් තිබෙන්නේ ද සහ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යාම මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව පවත්නේ ද යන වග තීරණය කිරීම පිණිස ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව පරීක්ෂාකර බැලීම අවශ්‍ය බව හෝ අවස්ථානුකූල බව මුදල් මණ්ඩලයට පෙනී ගිය විට, එය විසින් යථා පරිදි බලය පවරන ලද නිලධරයකු මගින් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ එහි යම් පාලිත සමාගමක් පරීක්ෂාකර බැලීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම සහ එවැනි බලපත්‍රලාභී වාණිජ බැංකුවක යම් පාලිත සමාගමක් ම මුදල් මණ්ඩලය විසින් බලය පවරන ලද නිලධරයාට, ඒ නිලධරයා විසින් නියම කරන වේලාවන්හි දී එහි ව්‍යාපාරික කටයුතුවලට අදළ සියලු පොත්, වාර්තා, ගිණුම්, මුදල්, සුරැකුම්පත් වවුචර්, වෙනත් ලියකියවිලි සහ ලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩ දෙනු ලැබිය යුතු අතර, ඒ නිලධරයා විසින් ඉල්ලා සිටිය හැකි පරිදි, එහි ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් වූ තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් පොත්, වාර්තා, ගිණුම්, මුදල් සුරැකුම්පත්, ලේඛන සහ වවුචර් වෙනත් ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් නොකළහොත් හෝ තොරතුරු නොසැපයුවහොත් නැතහොත් සැපයූ තොරතුරුවල හෝ ඉදිරිපත් කළ විෂයයෙහි යම් වැදගත් විස්තරයක් අසත්‍ය වේ නම්, අවස්ථාවෝචිත පරිදි පැහැරහැරීම කළ බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ පාලිත සමාගම නැතහොත් ඒ දෙකම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

## VI වන කොටස

### බලපත්‍රලාභී වාණිජ බැංකුවල අධ්‍යක්ෂ, ලේකම් ආදීන් ලෙස පත් කරනු ලැබීමට නුසුදුසුකම්

**42.** (1) යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකාවෙහි යම් නීතියක් යටතේ බුන්වත්වූවකු ලෙස හෝ බංකොලොත්වූවකු ලෙස නැතහොත් වෙනත් යම් රටක නිදහස් නොවූ බුන්වත්වූවකු හෝ බංකොලොත්වූවකු ලෙස ප්‍රකාශයට පත්වූවකු ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ විඳ සිටින්නා වූ තැනැත්තකු නම් ; හෝ

(ඇ) වංචාකාරී හෝ නීති විරෝධී ස්වභාවයේ යම් ක්‍රියාවක් වෙනුවෙන් වරදකරු කරනු ලැබ ඇත්නම්

බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමට හෝ තෝරාපත්කරගනු ලැබීමට නුසුදුසු වන්නේ ය.

(2) බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති නුසුදුසුකම් වලින් යම් නුසුදුසුකමකට ඔහු යටත් වන්නේ නම් ; හෝ

(ආ) සිය කාර්යයන් ඉටුකිරීමට ඔහුට සදහටම නොහැකි වන්නේ නම් ; හෝ

(ඇ) ඔහු වංචාකාරී හෝ නීති විරෝධී ස්වභාවයේ යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති නම් ; හෝ

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පරමාර්ථවලට සහ සම්බන්ධතාවන්ට මූලිකව ප්‍රතිවිරුද්ධ වූ යම් ක්‍රියාවක් හෝ දෙයක් කරනු ලැබ ඇත්තේ නම්

ඔහු අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

**43.** කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ සේවා නියුක්තයකු හැර වෙනත් යම් තැනැත්තකු එහි ලේකම්වරයා ලෙස තබා නොගත යුතුය.

**44.** (1) යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකාවෙහි යම් නීතියක් යටතේ බුන්වත්වූවකු හෝ බංකොලොත්වූවකු ලෙස නැතහොත් වෙනත් යම් රටක නිදහස් නොකළ බුන්වත්වූවකු හෝ බංකොලොත් වූවකු, ලෙස ප්‍රකාශයට පත් කරන ලද තැනැත්තකු නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින්නේ නම් හෝ විඳ ඇති නම් ; හෝ

(ඇ) වංචාකාරී හෝ නීතිවිරෝධී ස්වභාවයේ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති නම්

ඒ තැනැත්තා යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක කළමනාකාරවරයා, ලේකම්වරයා හෝ වෙනත් නිලධරයකු ලෙස පත් කරනු නොලැබිය යුතු අතර, පත් කරනු ලැබූ එවැනි යම් කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් නිලධරයකු වේ නම්, ඔහු ඒ ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණයේ ආඥාවක් මගින් ගණන් බේරා වසාදමන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස සිටි හෝ ප්‍රධාන විධායක නිලධරයකු ලෙස සිටි කිසිදු තැනැත්තකු, මුදල් මණ්ඩලයේ ලිඛිත අනුමතිය නොමැතිව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස හෝ ප්‍රධාන විධායක නිලධරයකු ලෙස දිගටම කටයුතු නො කළ යුතු ය.

(3) බලපත්‍රලාභී වාණිජ බැංකුවක සේවානියුක්තයකු නොවන්නා වූ කළමනාකාර නියෝජිතයකු ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් සේවා නියුක්තියෙහි යෙදවීම හෝ ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව පාලනය කරනු ලැබීම හෝ නොකළ යුතු ය.

## VII වන කොටස

### බලපත්‍රලාභී වාණිජ බැංකු විෂයයෙහි පාලනය

**45.** (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් සිය ව්‍යාපාරික කටයුතු කිරීමේ දී—

(අ) (i) එකී මුදල් තැන්පත්කරුවන් කෙරෙහි වූ ඒ බැංකුවේ බැඳීම්වලට හානියක් සිදුවිය හැකි ; හෝ

(ii) ඒ බැංකුවේ බැඳීම් ඉටුකිරීමට ඒ බැංකුවට නොහැකිවන ප්‍රතිඵලයක් ඇතිවිය හැකි

අනාරක්ෂිත හෝ අස්ථිර ක්‍රියාවලියක නිරතව සිටින බව ; හෝ

(ආ) මුදල් නීති පනතේ විධිවිධාන හෝ මේ පනතේ විධිවිධාන කඩ කරන බව හෝ ඉටු නොකරන බව ;

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ මතය වූ අවස්ථාවක, ඒ බලපත්‍රලාභී බැංකුව වෙත—

(අ) එවැනි යම් ක්‍රියාවලියක හෝ කඩ කිරීමක නොයෙදෙන ලෙස හා යෙදීමෙන් වලකින ලෙස ; හෝ

(ආ) මුදල් නීති පනතේ විධිවිධාන හෝ මේ පනතේ විධිවිධාන ඉටු කරන ලෙස ; හෝ

(ඇ) එවැනි ක්‍රියාවලියක හෝ කඩකිරීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන තත්ත්වයන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියා ගන්නා ලෙස

විධාන කරමින් නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද නියමයක් සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවුණු යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, ඒ නියමය නිකුත් කරනු ලැබීමෙන් දින තිහක් ඉකුත්වීමට ප්‍රථමයෙන් මුදල් මණ්ඩලය වෙත ලියවිල්ලකින් වූ අභියාචනයක් කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය ලැබී දින පහළොවක් ඇතුළත මුදල් මණ්ඩලයේ තීරණය ලැබීමට සලස්වනු ලැබිය යුතු ය.

**46.** (1) මුදල් මණ්ඩලය විසින් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ ඒ බැංකු සියල්ලටම හෝ—

(අ) ගෙවීම් කළ හැකි හෝ නොකළ හැකි නිශ්චිත අත්තිකාරම් පංතිය හෝ පංති සම්බන්ධයෙන් ;

(ආ) ආරක්ෂිත අත්තිකාරම් සම්බන්ධයෙන් පවත්වාගත යුතු සීමාවන් සම්බන්ධයෙන් ;

(ඇ) ගෙවා ඇති ප්‍රාග්ධනය, සංචිත සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පතු ගැන ද වෙනත් අදාළ කරුණු ද සැලකිල්ලට ගෙන නිශ්චිත බලපත්‍රලාභී වාණිජ බැංකු වර්ග විසින් යම් එක් සමාගමකට, ව්‍යාපාර ආයතනයකට, තැනැත්තන්ගේ හෝ පුද්ගලයන්ගේ සමිතියකට නැතහොත් ඔහුට සැලකිය යුතු සම්බන්ධතාවයක් තිබෙන පුද්ගලයකුට, ඔහුගේ කිට්ටු ඥාතීන්ට හෝ සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට එකතුවක් වශයෙන් සැලකිය හැකි ණය පහසුකම්වල උපරිම මුදල සම්බන්ධයෙන් ;

(ඈ) (i) සමාගමක්, සංස්ථාගත කරන ලද මණ්ඩලයක් හෝ පුද්ගලයකු විසින් ;

(ii) (අ) සමාගමක් සහ—

(අඅ) එහි පාලිත සමාගම් ;

(ආආ) එහි පාලන සමාගම ;

(ඇඇ) එහි පාලන සමාගමේ පාලිත සමාගමක් ; හෝ

(ඈඈ) ඒ සමාගමේ සැහෙන සම්බන්ධතාවක් ඇති සමාගමක් හෝ එහි පාලිත සමාගමක් හෝ එහි පාලන සමාගම හෝ එහි පාලන සමාගමේ පාලිත සමාගමක් වන

එක් සමාගමක්, හෝ ඊට වැඩි ගණනක එකතුවක් විසින් ; හෝ

(ආ) පුද්ගලයකු සහ—

(අඅ) ඔහුගේ කිට්ටු ඥාතියකු ;

(ආආ) ඔහුගේ සැහෙන සම්බන්ධතාවක් ඇත්තාවූ හෝ ඔහුගේ කිට්ටු ඥාතියාගේ සැහෙන සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක් ;

(ඇඇ) ඒ සමාගමේ පාලිත සමාගමක් ;

(ඈඈ) ඒ සමාගමේ පාලන සමාගමක් ;

(ඉඉ) ඒ සමාගමේ පාලන සමාගමේ පාලිත සමාගමක් ;

(ඊඊ) ඒ සමාගමේ සැහෙන සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක් හෝ එහි පාලිත සමාගමක් හෝ එහි පාලන සමාගම හෝ එහි පාලන සමාගමේ පාලිත සමාගමක් ; හෝ

(උඋ) ඒ පුද්ගලයාගේ හෝ ඔහුගේ කිට්ටු ඥාතියාගේ සැහෙන සම්බන්ධතාවක් ඇත්තා වූ, සමාගමක් හැර සංස්ථාගත කරන ලද මණ්ඩලයක්

වන එකක් හෝ ඊට වැඩි ගණනක එකතුවක් විසින් ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක කොටස් මගින් දරනු ලැබිය හැකි උපරිම ප්‍රතිශතය සම්බන්ධයෙන්

එය විසින් අවශ්‍යයයි සලකනු ලබන විධාන දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයක් මගින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර හෝ පසුව අත්කර ගන්නා ලද නැතහොත් දරන ලද එහි වත්කම් හෝ බැරකම් කිසිවක ස්වභාවය හෝ ප්‍රමාණය වෙනස් කරනු ලැබිය යුතු යයි නියම කරනු ලැබුවද ඒ විධාන බලපැවැත්විය යුතු ය. එසේ වුවද වෙනසක් කිරීමට නියම කරනු ලැබූ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එම නියමය අනුව කටයුතු කිරීම පිණිස, එම විධානයේ දින සිට මාස දෙළහක කාල සීමාවක් හෝ මුදල් මණ්ඩලය විසින් ඉඩ දෙනු ලබන වැඩිදුර කාලසීමාවක් හෝ ලබා දෙනු ලැබේ.

(3) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ එය වෙත නිකුත් කරන ලද විධානයක් අනුව කටයුතු කිරීම සඳහා, එම බැංකුවේ කොටස් දරන තැනැත්තකුට, එම බැංකුවේ එම තැනැත්තා විසින් දරන ලබන කොටස් සංඛ්‍යාව, එම තැනැත්තා විසින් නියමිත දිනයට පෙර හෝ පසුව අත්කර ගනු ලැබුයේ වුවද, එම විධානයේ නිශ්චිත කාලසීමාව ඇතුළත දී අඩු කරන ලෙස එම බැංකුව විසින් විධාන කරනු ලැබිය හැකි අතර, එම විධානය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත් වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, දහ අට මාසයකට නොවැඩි කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ, එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**47.** (1) මේ වගන්තියේ විධිවිධාන මෙරට බැංකු ව්‍යාපාරික කටයුතුවල නියුක්තව සිටින බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පමණක් අදාළ විය යුතු ය.

(2) කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අනුග්‍රහයක් ලෙස—

(අ) එහිම කොටස් ; හෝ

(ආ) එහි සැහෙන සම්බන්ධතාවක් ඇති සමාගම්වල කොටස් ; හෝ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් කරන ලද සමාගම්වල සැහෙන සම්බන්ධතාවයක් ඇති සමාගම්වල කොටස්

ඇපයට තබා ගෙන යම් ණය මුදලක් ප්‍රදානය නොකළ යුතු ය.

(3) මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලබන ඇප දෙනු ලබන්නේ නම් මිස සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නා වූ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී (අදාළ අධ්‍යක්ෂවරයා හැර) ඒ අනුග්‍රහවලට කැමති බවට ඡන්දය දීමෙන් අනුමත කරනු ලැබුවේ නම් මිස, කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකුට හෝ ඒ අධ්‍යක්ෂවරයාගේ කිට්ටු ඥාතිවරයකුට අනුග්‍රහ නොසලසනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අධ්‍යක්ෂවරයකුට හෝ ඒ අධ්‍යක්ෂවරයාගේ කිට්ටු ඥාතිවරයකුට සලස්වනු ලැබූ අනුග්‍රහය රුපියල් පන් ලක්ෂය හෝ අධ්‍යක්ෂවරයාට හෝ අනුග්‍රහයක් සලසා තිබුනේ නම්, ඔහුගේ කිට්ටු ඥාතිවරයාට ඒ අනුග්‍රහයෙන් ඔහු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබූ දිනයට ප්‍රථමයෙන් වූ දිනය හෝ නියමිත දිනයට ප්‍රථමයෙන් වූ දිනය යන දෙකෙන් කලින් එළඹෙන දිනයේ දී ඉතිරිව තිබූ ප්‍රමාණය යන දෙකෙන් වැඩි ගණන නොඉක්මවිය යුතු අතර, ඒ අනුග්‍රහය මුදල් මණ්ඩලය විසින් මේ වගන්තියේ කාර්ය සඳහා කලින් කල අනුමත කරනු ලබන ඇපවලින් ආරක්ෂිත කරනු ලැබිය යුතුය.

(5) මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලබන ඇපයක් දෙනු ලබන්නේ නම් මිස සහ ඒ අනුග්‍රහය බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නා වූ අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් (අදාළ අධ්‍යක්ෂවරයා හැර) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී ඒ අනුග්‍රහයට කැමැත්ත ප්‍රකාශ කරමින් ඡන්දය දීමෙන් ඒ අනුග්‍රහය අනුමත කරන ලද්දේ නම් මිස, අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබූ දිනයට ප්‍රථමයෙන් වූ දිනය හෝ නියමිත දිනයට ප්‍රථමයෙන් වූ දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයේ දී ඒ අධ්‍යක්ෂවරයාට සැහෙන සම්බන්ධතාවක් තිබෙන යම් ව්‍යාපාරයකට කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අනුග්‍රහ සලස්වනු නොලැබිය යුතු ය.

(6) තැනැත්තකුට හෝ තැනැත්තකුගේ කිට්ටු ඥාතිවරයකුට හෝ තැනැත්තාට සැහෙන සම්බන්ධතාවක් තිබෙන ව්‍යාපාරයකට යම් අනුග්‍රහයක් ප්‍රදානය කර ඇති අවස්ථාවක සහ නියමිත දිනයේ දී ඒ තැනැත්තා බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු වන්නේ නම් හෝ නියමිත දිනයෙන් පසු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරන ලද්දේ නම්, නියමිත දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත හෝ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට යෙදුණු දිනය යන දෙකින් අදාළ වන දිනයේ දී තත් කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ඇප පවත්වා ගැනීම පිණිස පියවර ගනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ නියම කරනු ලැබ ඇති පරිදි එවැනි ඇප තබා නැති අවස්ථාවක යම් අනුග්‍රහයක් හේතු කොට ගෙන බලපත්‍රලාභී වාණිජ බැංකුවට අයවිය යුතු යම් මුදලක්, ඒ මත ලැබියයුතු පොළියක් වේ නම් ඒ පොළිය ද සමග—

(අ) අනුග්‍රහය ප්‍රදානය කරන අවස්ථාවේ දී නියම කරන ලද කාලසීමාව ඇතුළත හෝ (6) වන උපවගන්තියේ නියම කරඇති කාල සීමාව අවසාන වී හය මයක කාල සීමාව ඉකුත්වීම යන දෙකින් කලින් එළඹෙන සිදුවීමේ ද ;

(ආ) කාල සීමාවක් නියම කර නොමැති අවස්ථාවක, (6) වන උපවගන්තියේ නියම කරන ලද කාල සීමාව අවසාන වී එක් අවුරුද්දක කාලයක් ඉකුත්වීමේ දී

බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් ආපසු අයකර ගැනීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය :

එසේ වුවද බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් යම් හෙයකින් තත් කාර්ය සඳහා මුදල් මණ්ඩලය වෙත ලියවිල්ලකින් කරන ලද ඉල්ලීමක් උඩ, අනුග්‍රහය ආපසු අයකර ගැනීමේ කාල සීමාව, (අ) ඡේදයේ නියම කර ඇති හය මසක ඉකුත්වීමෙන් ආරම්භව අවුරුදු තුනක කාල සීමාවකට නොවැඩි දිනයක් වන දිනයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය :

තවදුරටත් එසේ වුවද අදාළ අධ්‍යක්ෂවරයා සිය මරණය, විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම නිසා හෝ අන්‍යාකාරයකින් ඒ ධුරය අත්හැරීමට යෙදුණු අවස්ථාවක් වූ කල්හි, මේ උපවගන්තියේ සහ (6) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(8) අධ්‍යක්ෂවරයකුට හෝ අධ්‍යක්ෂවරයාගේ සැහෙන සම්බන්ධතාවක් ඇති ව්‍යාපාරයකට ප්‍රදානය කරන ලද යම් අනුග්‍රහයක් වෙනුවෙන් (6) වන උපවගන්තියේ නියම කරන ලද කාලසීමාව තුළ ඇප තබනු නොලැබූ අවස්ථාවක, හෝ (7) වන උපවගන්තිය ප්‍රකාර අයවිය යුතුව ඇති මුදල ආපසු නොගෙවූ අවස්ථාවක, (7) වන උපවගන්තියේ නියම කරන ලද කාලසීමාව ඉකුත්වීමේදී අධ්‍යක්ෂවරයා විසින් සිය ධුරය අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් යම් අනුග්‍රහයක් හෝ යෝජිත අනුග්‍රහයක් කෙරෙන කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් කවර ආකාරයක හෝ සම්බන්ධතාවක් ඇති ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු විසින් ම, ක්‍රියාත්මක කළ හැකි පමණ ඉක්මණින්, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට, ලේකම්වරයාට හෝ කළමනාකරුට සිය සම්බන්ධතාවයේ ස්වභාවය ප්‍රකාශ කළ යුතු අතර, ඒ ප්‍රකාශය සියලුම අධ්‍යක්ෂවරයන් අතර වහාම සංසරණය කරවනු ලැබීමට සැලැස්විය යුතු ය.

(10) බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂවරයාගේ කිට්ටු ඥාතිවරයකු හෝ අධ්‍යක්ෂවරයාගේ සැහෙන සම්බන්ධතාවක් ඇති ව්‍යාපාරයක් සම්බන්ධතාවක් දක්වන ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් ව්‍යාපාරික ගණුදෙනුවක් හෝ යෝජිත ගණුදෙනුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණ ගැනීමකට ඒ අධ්‍යක්ෂවරයා සහභාගී නොවිය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයා ඒ ව්‍යාපාරය සාකච්ඡා කරන හෝ ගණුදෙනු කරන මණ්ඩලයේ රැස්වීමෙන්, ඒ සාකච්ඡා කරන හෝ තීරණ ගැනීම සිදු වෙමින් පවත්නා අවස්ථාවේ දී, බැහැර වී සිටිය යුතු ය.

(11) අධ්‍යක්ෂවරයකුට හෝ ඔහුගේ කිට්ටු ඥාතියකුට හෝ අධ්‍යක්ෂවරයාගේ සැහෙන සම්බන්ධතාවක් ඇති ව්‍යාපාරයකට බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ප්‍රදානය කෙරුණු අනුග්‍රහයක් හෝ ඉන් කොටසක් මුදල් මණ්ඩලයේ පූර්ව අනුමතය නොමැතිව නොගෙවිය යුතු අතර, එවැනි අනුමතිය නොමැතිව කරන ලද යම් ගෙවීමක් ශූන්‍ය හා බල රහිත විය යුතු ය.

(12) (9) වන සහ (10) වන උපවගන්තිවල විධිවිධාන කඩකරන යම් අධ්‍යක්ෂවරයෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(13) මේ වගන්තියේ කාර්ය සඳහා—

" සමාගමක් " යන්නට, ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථා ගත කරන ලද සමාගමක් ඇතුළත් නොවිය යුතු ය ;

" අධ්‍යක්ෂවරයකු " යන්නට, ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ඇතුළත් නොවිය යුතු ය.

**48.** (1) වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් ගිවිසුමක කුමක් සඳහන්ව තිබුණද, ඊට දී ඇති හෝ එය විසින් දරන ඇප මුදල් කිරීම සම්බන්ධයෙන් හැර කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් විකිණීමෙහි, මිලට ගැනීමෙහි හෝ බදු හුවමාරු කිරීමෙහි කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් නිරත නොවිය යුතු අතර, එකතු කිරීම හෝ ගණුදෙනු කිරීම සඳහා ලැබුණු විනිමය හුවමාරු බිල්පත් සම්බන්ධයෙන් හැර නැතහොත් II වන උපලේඛනයේ හෝ වෙනත් යම් නීතියක හෝ (397 වන අධිකාරය වන) ලංකා බැංකුව ආඥපනතෙහි හෝ 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි විධිවිධාන අදාළවන අවස්ථාවක හැර වෙනත් ආකාරයක යම් වෙළෙඳාමක, මිලට ගැනීමක, විකිණීමක හෝ බදු හුවමාරු කිරීමක නිරත නොවිය යුතු ය.

(2) මීට කලින් වූ උපවගන්තියේ සඳහන් විධිවිධාන, නියමිත දිනයේදී බැංකුවක් විසින් ගණුදෙනු කිරීමෙහි යෙදෙමින් පැවැති ඉහත කී යම් ව්‍යාපාරයක් කෙරෙහි අදළ නොවිය යුතු ය :

එසේ වුවද, එකී ව්‍යාපාරය, නියමිත දිනයේ සිට එක් අවුරුද්දක් ඉකුත්වීමට පෙරාතුව සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

**49.** මුදල් මණ්ඩලයේ ලියවිල්ලකින් ලබා ගන්නා ලද පූර්ව අනුමතිය නොමැතිව, කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, වත්කම්වල වෙළෙඳ අගයට අඩුව එහි යම් නිශ්චල වත්කමක් විකිණීම, පැවරීම, සතු කිරීම හෝ නියාදනය කිරීම නොකළ යුතු අතර, වත්කම්වල වෙළඳ අගයට වැඩියෙන් බැංකුවේ පොත්වල සඳහන් කර ඇති ඒවායේ අගය වැඩි කිරීම ද කරනු නොලැබිය යුතුය.

## VIII වන කොටස

**ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු ඇවර කිරීම සහ ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශාඛා වසා දැමීම.**

**50.** මේ කොටසේ කාර්ය සඳහා ඇවරකරු ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා පත් කරනු ලැබිය යුතු ය.

**51.** ලියවිල්ලකින් ලබාගන්නා ලද මුදල් මණ්ඩලයේ පූර්ව බලය දීම නොලබා, යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ස්වේච්ඡාවෙන් ඇවර කරනු නොලැබිය යුතු ය. මුදල් මණ්ඩලයට—

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුව නුබුන්වත් බව සහ එහි තැන්පත්කරුවන්ට සහ අනිකුත් ණය හිමියන්ට අප්‍රමාදව ආපසු ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් ඒ සතුව ඇති බව ; සහ

(ආ) තත් කාර්ය සඳහා ප්‍රකාශිතව ම කැඳවන ලද රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති, ඉතිරි කොටස්වලින් යටත් පිරිසෙයින් හතරෙන් තුන් පංගුවක් දරන කොටස් හිමියන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන ඡන්දයකින්, ඇවර කිරීම අනුමත කර ඇති බව

පෙනීයන්නේ නම් පමණක් බලයදීම දෙනු ලැබිය යුතු ය :

එසේ වුව ද ඇවර කිරීම සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් කරනු ලබන්නේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ වත්කම්වලින් යම් වත්කමක් වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට විකිණීමෙන් සහ එහි තැන්පතු බැරකම් ඒ බැංකුව විසින් භාර ගැනීමෙන් නම්, බුන්වත්කමේ නොවැලැක්විය හැකි අන්තරාය ගැන සොයා බැලීමෙන් පසු කොටස් හිමියන්ගේ අනුමතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය මුදල් මණ්ඩලය විසින් නිදහස් කරනු ලැබිය හැකි ය :

තවදුරටත් එසේ වුවද 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන එවැනි බැරකම් භාර ගැනීමකට අදළ නොවිය යුතු ය.

**52.** ඇවර කිරිම පිණිස මුදල් මණ්ඩලයේ බලයදීම බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත ලැබුණු විට, ඒ බැංකුව විසින්—

(අ) විධිමත් ඇවර කිරීමක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන බලතල පමණක් ක්‍රියාත්මක කරමින් ව්‍යාපාරික කටයුතු කරගෙනයාම වහාම අවසන් කිරීමත් ;

(ආ) එහි මුදල් තැන්පත්කරුවන්ට සහ වෙනත් ණයහිමියන්ට අයවිය යුතු මුදල් ආපසු ගෙවීමත් ;

(ඇ) බලයදීම ලැබීමක් කලින් භාරගෙන තිබුණු සියලු මෙහෙයුම් කාර්යයන් බේරුම් කිරීමත්

කරනු ලැබිය යුතු ය.

**53.** ස්වේච්ඡාවෙන් ඇවර කිරීමට යටත් වූ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, 51 වන වගන්තියෙහි සඳහන් කරන ලද බලයදීම ලැබී දින තිහක් ඇතුළත ස්වේච්ඡාවෙන් ඇවර කිරීම පිළිබඳ දැන්වීමක් සියලුම තැන්පත්කරුවන්, ණයහිමියන් සහ පීත කොමිස් භාරකරු ලෙස හෝ ආරක්ෂිත තැන්පතු පෙට්ටියක බදු දෙන්නා හෝ උපනිධානලාභියා ලෙස ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරනු ලබන අරමුදල්වලට හෝ දේපළවලට අන්‍යාකාරයෙන් හිමිකම් ඇති තැනැත්තන් වෙත ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබිය යුතු ය. දැන්වීමේ අඩංගු කළ යුතු තොරතුරු මුදල් මණ්ඩලය විසින් නියම කළ යුතු ය. මුදල් මණ්ඩලයට එසේ කිරීම සුදුසු යයි හැඟෙන අවස්ථාවක, බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් තත් කාර්යය වෙනුවෙන් නිදහසට කරුණු දැන්වීමකින් පසු, නියම කරනු ලබන තැනැත්තන්ට එම දැන්වීම යැවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය. බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පරිශ්‍රය ඇතුළත හොඳින් පෙනෙන ස්ථානයක දැන්වීම බලාගැනීම පිණිස තැබිය යුතු අතර මුදල් මණ්ඩලය විසින් විධාන කරනු ලබන අන්දමට ඒ සඳහා වෙනත් ප්‍රචාරයක් දෙනු ලැබිය යුතු ය.

**54.** ස්වේච්ඡාවෙන් ඇවර කිරීම කරගෙන යාම සඳහා බලයදීම තැන්පත්කරුවන්ගේ හෝ වෙනත් ණයහිමියකුගේ හෝ අයිතිකරුවකුගේ ඉල්ලීම් සම්පූර්ණයෙන් ගෙවනු ලැබීම සඳහා ඔහුට ඇති අයිතිවාසිකම්වලට සහ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරනු ලබන අරමුදල්වල හෝ වෙනත් දේපළක අයිතිකරුවන්ගේ අයිතිවාසිකම්වලට හානියක් නොවිය යුතු ය. සියලු නීත්‍යානුකූල ගෙවීම් සඳහා වූ ඉල්ලීම් අප්‍රමාදව ගෙවනු ලැබිය යුතු අතර බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරනු ලබන සියලු අරමුදල් සහ වෙනත් දේපළ ඒවායේ නිසි අයිතිකරුවන්ට මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන උපරිම කාලසීමාවක් තුළ දී ආපසු දෙනු ලැබිය යුතු ය.

**55.** යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් 54 වන වගන්තියේ සඳහන් එහි සියලු යුතුකම් ඉටුකර ඇති බව මුදල් මණ්ඩලයේ මතය වූ අවස්ථාවක, ඒ බැංකුවේ නම, බලපත්‍රලාභී වාණිජ බැංකු ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, එහි වත්කම්වල ඉතිරිය, ඒ බැංකුවේ නිසි අයිතිකරුවන් අතර, ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ප්‍රමාණානුකූලව බෙදා දෙනු ලැබිය යුතු ය. එසේ බෙදදීම—

(අ) තැන්පත්කරුවන්ගේ හෝ වෙනත් ණයහිමියන්ගේ හෝ අයිතිකරුවන්ගේ සියලු ගෙවීම් සඳහා වූ ඉල්ලීම් ගෙවනතුරු සහ ආරාවුල් සහිත ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, අධිකරණමය තීරණයකින් පසුව පැන නැගිය හැකි යම් වගකීමක් පියවීම පිණිස ප්‍රමාණවත් මුදලක් බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් මහ බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට මත්තෙන් ;

(ආ) තැන්පත්කරුවකුට, ප්‍රතිලාභී අයිතිකරුවකුට හෝ ඉල්ලීම් ඉදිරිපත් කරනු නොලැබූ වෙනත් යම් ණයහිමියකුට ගෙවිය යුතු වූ යම් මුදල්, මහ බැංකුව වෙත ප්‍රේෂණය කරනතුරු ;

(ඇ) මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර, නිසි අයිතිකරු වෙත ආපසු දීමට නොහැකි වූ, බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරනු ලබන වෙනත් යම් අරමුදල් හෝ දේපළ ගැන 72 වන වගන්තිය ප්‍රකාර කටයුතු කරනතුරු

කරනු නොලැබිය යුතු ය.

**56.** (අ) ස්වේච්ඡාවෙන් ඇවර කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් බලය දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවේ වත්කම් එහි සියලු යුතුකම් සම්පූර්ණයෙන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව ; හෝ

(ආ) ස්වේච්ඡාවෙන් ඇවර කිරීම සම්පූර්ණ කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද වන බව

මුදල් මණ්ඩලයේ මතය වූ අවස්ථාවක, ඒ බැංකුව වෙත නිකුත්කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට මුදල් මණ්ඩලය වහාම පියවර ගනු ලබන අතර, මෙහි යට සඳහන් කරනු ලබන ක්‍රියා පරිපාටියට අනුකූලව ඒ බැංකුව අනිවාර්යයෙන් ඇවර කිරීම සඳහා කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

**57.** ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගු කිරීම, 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර අවසානාත්මක වූ විට, බලපත්‍රලාභී වාණිජ බැංකුව ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් බැහැර සිය ව්‍යාපාරික කටයුතු වහාම අත්හිටුවිය යුතු අතර, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් මේ පනතේ විධිවිධාන ප්‍රකාර ඇවර කිරීමේ කටයුතු පටන් ගන්නා ලෙස විධාන කරනු ලැබිය යුතු ය. ඇවර කිරීමේ කටයුතු පටන් ගැනීමෙන් පසු හැකි තරම් ඉක්මණින්ම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ වත්කම්වල සහ සම්භාව්‍ය වගකීම්වල ලේඛනයක් සැදිය යුතු අතර එහි පිටපතක් මුදල් මණ්ඩලය වෙත යවනු ලැබිය යුතු ය. ඒ බැංකුවේ ව්‍යාපාරික කටයුතු කෙරෙහි සම්බන්ධතාවක් ඇති පාර්ශ්වයන් විසින් පරීක්ෂාකර බැලීම සඳහා ඒ පිටපත මුදල් මණ්ඩලයේ කාර්යාලයේ තබනු ලැබිය යුතු ය.

**58.** අනිවාර්ය ඇවර කිරීමේ කාර්ය සඳහා යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක වැඩ කටයුතු වල පූර්ණ හා ඒකාන්ත කළමනාකරණය සහ පාලනය බැංකු අධීක්ෂණය අධ්‍යක්ෂ වෙත පවරනු ලැබිය යුතු අතර—

(අ) ඇවර කිරීමේ කටයුතු අධිකරණයෙහි පැවැරීමෙන් ඒ බැංකුවේ මෙහෙයුම් වසා දැමීම ;

(ආ) එහි ණයතුරුස් ගෙවීම නැවැත්වීම හෝ සීමා කිරීම ;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නමින් යම් සාධන පත්‍රයක් අත්සන් කිරීම ; සහ

(ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකුව පාර්ශ්වයක් විය හැකි යම් නඩුවක් හෝ නඩු කටයුත්තක්, ඒ නමින් පැවරීම වග උත්තර බැඳීම සහ පවත්වාගෙන යාම

පිණිස ඔහුට බලය තිබිය යුතුය.

**59.** ඈවර කිරීමේ කටයුතු කරගෙනයාම යටතේ—

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ඉල්ලීමක් හෝ අයිතිවාසිකමක් අවසන් වන්නා වූ හෝ අහෝසි වන්නා වූ යම් ව්‍යවස්ථාමය ගිවිසුමකින් බැඳුණු හෝ අන්‍යාකාර නියමයක්, මේ වගන්තිය ක්‍රියාත්මකවීම මගින් ඒ කටයුතු ආරම්භවීමේ දිනයේ සිට හය මාසයක, කාලයකින් දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ නියම කර ඇති දිනයට පෙරාතුව හය මාසයක් පැවතුනා වූ කැප අයිතියක් හැර, යම් කැප අයිතියක් හෝ තහනමක් හිස් කරනු ලැබිය යුතු අතර, මේ කොටසේ විධිවිධාන අදාළ කිරීමෙන් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ඇති කරන ලද කැප අයිතියක් හැර, තහනමක් හෝ කැප අයිතියක්, ඈවර කිරීමට භාජනව ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් දේපළකට හෝ වත්කමකට අදාළ නොවිය යුතු ය.

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ බුන්වත්වීමට පසුව හෝ බුන්වත්බව බලාපොරොත්තු-වෙන් එහි යම් වත්කම් පැවරීමක් නීත්‍යානුකූල නොවිය යුතු ය.

**60.** (1) බලපත්‍රයක් අවලංගු කිරීම අවසානාත්මක වූ දිනයේ සිට හය මාසයක කාලසීමාවක් තුළ දී, එවකට බලපවත්නා වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්—

(අ) ඒ බැංකුව සමග ඇතුළත් වී ඇති යම් සේවා නියුක්ති ගිවිසුමක් ;

(ආ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව පාර්ශ්වයක් වූ සේවාවන් සඳහා වූ යම් ගිවිසුමක් ; හෝ

(ඇ) බදු හිමියා වශයෙන් යම් වගකීමක් වේ නම් ඒ වගකීම් ද ඇතුළු බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් වගකීමක්

අවසන් කරනු ලැබිය හැකි ය.

(2) බද්ද අවසන් කිරීම පිණිස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් අභිමත බලතල භාවිත කරන බව දන්වමින් දින අනූවක දැන්වීම ලැබුණු බදුකරුවකුට, බද්ද අවසන් කරන්නා වූ දින්‍ය තෙක් එකතු වූ බදු කුලිය හැරෙන්නට අන් බදු කුලියක් සඳහා හෝ එවැනි අවසන් කිරීමක් හේතු කොටගෙන අලාභ සඳහා ඉල්ලීමක් නොතිබිය යුතු ය.

**61.** බලපත්‍රයක් අවලංගු කිරීම අවසානාත්මක වූ පසු හැකි පමණ ඉක්මණින්, බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් පීත කොමිස් භාරකාර තත්ත්වයෙන් ඉටු කරන ලද සියලු කර්තව්‍යයන් අවසන් කිරීම පිණිස අවශ්‍ය වන පියවර ගැනීමේ මාර්ගයෙන් අවසාන බෙදහැරීමක් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් කළ යුතු අතර, පීත කොමිස් භාරකාර තත්ත්වයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරන ලද සියලු වත්කම් හා දේපළ ඒවායේ අයිතිකරුවන්ට ආපසු භාර දී ඔහු පීත කොමිස් භාරකාර ගිණුම් සමථයට පත් කරනු ලැබිය යුතු ය.

**62.** බලපත්‍රයක් අවලංගු කිරීම අවසානාත්මක වූ පසු හැකි පමණ ඉක්මණින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්, සියලු තැන්පත්කරුවන්, ප්‍රතිලාභී අයිතිකරුවන්, වෙනත් ණය හිමියන්, ආරක්ෂිත තැන්පතු පෙට්ටි, බදුහිමියන් සහ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරන දේපළවල උපනිධායකයන් වෙත, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පොත්වල දැක්වෙන ඔවුන්ගේ ඉල්ලීම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ ප්‍රකාශයක් ලියාපදිංචි කළ තැපැලෙන් යවනු ලැබිය යුතු ය. ඒ ප්‍රකාශය නිකුත් කොට දින හැටකට වඩා ප්‍රමාද නොවී නියම කෙරුණු දිනයකට

මත්තෙන්, යම් විරුද්ධතාවක් ඇත්නම්, ඒ විරුද්ධතාව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු බව ඒ ප්‍රකාශයෙහි නියම කරනු ලැබිය යුතු අතර, ආරක්ෂිත තැන්පතු පෙට්ටි බදුහිමියන්ට සහ උපනිධායකයන්ට පුද්ගලිකව පැමිණ සිය දේපළ ආපසු ගන්නා ලෙස ආරාධනය කළ යුතු ය. දින හැටේ කාලසීමාව ආරම්භ වීමට කලින් ලබා ගන්නා ලද මුදල් මණ්ඩලයේ ස්ථිර කිරීමට යටත්ව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්, බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් තත් කාර්යය සඳහා සාධාරණ හේතු දැන්වීමකින් පසු විශේෂයෙන් සඳහන් කෙරුණු තැනැත්තන්ට තැපැල් මගින් ප්‍රකාශය යැවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

**63.** (1) නියම කරන ලද දිනයට පෙරාතුව ආපසු ගනු නොලැබූ ද්‍රව්‍ය අඩංගු යම් ආරක්ෂිත තැන්පතු පෙට්ටියක්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන ආකාරයකට විවෘත කරනු ලැබිය යුතු ය. එහි අඩංගු ද්‍රව්‍ය සහ යම් ඉල්ලුම් නොකළ දේපළ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් උපනිධානලාභියා ලෙස දැරිය යුතු අතර—

(අ) මුදල් මණ්ඩලයේ විධානය මත සියලු මුදල් මහ බැංකුවේ ඇති විශේෂ ගිණුමකට මාරු කරනු ලැබිය යුතු ය ;

(ආ) මුදල් මණ්ඩලයේ විධානය මත මුදල් හැර වෙනත් යම් භාණ්ඩයක් ඒ භාණ්ඩය නියාදනය කිරීම පිණිස විධානයක් සඳහා අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) (අ) ඡේදයේ සඳහන් මුදල්වල සහ (ආ) ඡේදයේ සඳහන් භාණ්ඩවල අයිතිකරු අවස්ථාවෝචිත පරිදි එකී මුදල් හෝ භාණ්ඩ තැන්පත් කළ දිනයේ සිට අවුරුදු දහයක කාලයක් තුළ ඒවා කෙරෙහි සම්බන්ධතාවක් දක්වා නොමැත්තේ නම්, ඒ මුදල සහ භාණ්ඩ IX වන කොටසේ විධිවිධාන ප්‍රකාර අත්හළ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ ද්‍රව්‍ය මාරුකිරීමට යෙදුණු දිනයේ සිට, ඒවා සම්බන්ධයෙන් 72 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**64.** විරුද්ධතා ඉදිරිපත් කිරීම සඳහා වූ දැන්වීමේ නියම කරන ලද දිනයෙන් පසු මාස තුනක් ඇතුළත හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ඊට වැඩි දීර්ඝ කාලයක් ඇතුළත බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්—

බලපත්‍රලාභී වාණිජ බැංකුවක ගණන් බේරා වසා දැමීමේ කටයුතු සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ කාර්යය.

(අ) යම් ඉල්ලීමක වලංගු භාවය ගැන තමා සැක කරන්නේ නම් ඒ ඉල්ලීම ඉවත දැමිය යුතු ය.

(ආ) එක් එක් හඳුනාගතහැකි තැන්පත්කරුට හෝ වෙනත් හිමියකුට අයවීමට ඇති යම් මුදලක් වේ නම්, ඒ මුදල ද, මේ පනතේ විධිවිධාන යටතේ ඔහුගේ ඉල්ලීමට ලබාදිය යුතු ප්‍රමුඛතාවය ද තීරණය කළ යුතු ය.

(ඇ) තමා විසින් ගැනීමට යෝජනා කරන වැඩ යෝජනා ක්‍රමය පිළිබඳ උපලේඛනයක් සකස් කරනු ලැබිය යුතු ය.

(ඈ) සිය ඉල්ලීම්වලට සම්පූර්ණයෙන් අවසර නොදුන් ඉල්ලීම් කළ එක් එක් තැනැත්තාට ඒ බව දැනුම් දිය යුතු අතර, අනුපිළිවෙලින් සති තුනක් සතියකට එක් වරක් බැගින් දිනපතා පුවත්පත් තුනක සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින්, තමා විසින් ගැනීමට යෝජනා කරන වැඩ යෝජනා ක්‍රමය පිළිබඳ උපලේඛනය පරීක්ෂාකර බැලීම පිණිස තබනු ලබන දිනය සහ ස්ථානය පිළිබඳ දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය ; තවද

ප්‍රවෘත්ති පත්‍රයේ තුන්වන වරට කෙරෙන පළ කිරීමේ දින සිට දින තිහකට කලින් වූ දිනයක් නොවන, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ඒ උපලේඛනය අධිකරණය වෙත ඉදිරිපත් කරන දිනය ද ඒ දැන්වීමෙහි පළකරනු ලැබිය යුතු ය.

**65.** 64 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් උපලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු දින විසි එකක් තුළ මේ තැන්පත් කරුවකු, ණයහිමියකු, කොටස්කරුවකු හෝ වෙනත් සම්බන්ධතාවක් දක්වන තැනැත්තකු විසින් ගැනීමට යෝජනා කර ඇති යම් පියවරකට විරුද්ධතා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එසේ ඉදිරිපත් කරනු ලබන යම් විරුද්ධතා, ඒවා සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂට සහ අධිකරණය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සම්බන්ධතාවක් ඇති පාර්ශ්වයන්ට දැනුම්දීමෙන් පසු අධිකරණය විසින් සලකා බලනු ලැබිය යුතු ය. යම් විරුද්ධතාවක් පිළිගනු ලැබුවහොත් උපලේඛනයට සුදුසු වෙනස් කිරීමක් කරන ලෙස අධිකරණය විසින් විධාන කළ යුතු ය. උපලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්, ආරාවුල් සහිත ඉල්ලීම් ගෙවීම සඳහා විධිමත් සංචිතයක් පිහිටුවීමේ කොන්දේසිය පිට, කලින් කල නිරවුල් හෝ අධිකරණය විසින් ඉඩ දෙන ලද ඉල්ලීම්වල හිමි කරුවන්ට කොටස් වශයෙන් කෙරෙන බෙදදීමක් කරනු ලැබිය හැකි ය. සියලු විරුද්ධතා ගැන තීරණය කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් අවසාන බෙදදීම කරනු ලැබිය යුතු ය.

**66.** (1) මෙහි යට සඳහන් කරනු ලබන ඉල්ලීම් එහි දක්වා ඇති අනුපිළිවෙල අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පොදු වත්කම්වලට එරෙහිව ප්‍රමුඛත්වය තිබිය යුතු ය :—

(අ) මේ කොටසේ විධිවිධාන අදාළ කිරීමේ දී බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් දරන ලද අවශ්‍ය වූ ද සාධාරණ වූ ද වියදම් ;

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ බලපත්‍රය අවලංගු කිරීමට පෙරාතුව මාස තුනක කාලයක් සඳහා ඇවර කිරීමට යටත් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නිලධරයන්ගේ හා සේවා නියුක්තයන්ගේ වේතන සහ වැටුප් ;

(ඇ) ආණ්ඩුවට සහ පළාත් පාලන ආයතනවලට අයවිය යුතු බදු, වරිපනම් සහ තැන්පතු ;

(ඈ) මුදල් මණ්ඩලයට ලැබිය යුතු ගාස්තු සහ තක්සේරු ;

(ඉ) රුපියල් පන්දහ දක්වා හෝ ඊට අඩු ඉතිරි කිරීම් සහ කාල තැන්පතු ;

(ඊ) වෙනත් තැන්පතු.

(2) ඉදිරිපත් කර ඇති අනිකුත් සියලු ඉල්ලීම්, අධිකරණයේ අනුමැතිය ඇතිව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන පොළී ප්‍රමාණයක් අනුව ගණන් බලනු ලැබූ ඒ මත වූ පොළිය ද සමග ගෙවීමෙන් පසුව නියමිත කාලය තුළ ඉදිරිපත් නොකරන ලද යම් ඉතිරි ඉල්ලීම් වේ නම් එවැනි ඉල්ලීම් ගෙවනු ලැබිය යුතු ය.

(3) විශේෂ ඉල්ලීම් වර්ගයක් වෙනුවෙන් තිබෙන මුදල් ප්‍රමාණය ඒ ඉල්ලීම්වල ගෙවීම් සම්පූර්ණයෙන් ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවේ නම්, ඒ මුදල ඒ ඉල්ලීම්වල පාර්ශ්වයන් අතර ප්‍රමාණානුකූලව බෙද දිය යුතු ය.

**67.** සියලු ඉල්ලීම් ගෙවා දැමීමෙන් පසු ඉතිරිවන යම් වත්කමක් සියලු කොටස්කරුවන් අතර ඔවුන්ගේ සහභාගිත්වයට අනුව බෙදදෙනු ලැබිය යුතු ය.

**68.** 61 වන වගන්තියේ සඳහන් කරන ලද අවසාන බෙදහැරීමෙන් පසු ඉල්ලුම් නොකර ඉතිරිවන්නා වූ ද, මේ පනත යටතේ වූ වෙනත් විධිවිධානවලට යටත් නොවන්නා වූ අරමුදල්, මුදල් මණ්ඩලයේ විධානය පිට, මහ බැංකුවේ ඇති විශේෂ ගිණුමකට මාරුකරනු ලැබිය යුතු ය. ඒ අරමුදල් අමාත්‍යවරයා සමග සාකච්ඡා කිරීමෙන් පසු, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය. 61 වන වගන්තිය යටතේ වූ අවසාන බෙදහැරීමේ දිනයට ඉක්බිතිවම වූ අවුරුදු දහය තුළ ඒ අරමුදල් කෙරෙහි අයිතිකරු විසින් යම් සම්බන්ධතාවක් නොපෙන්වන ලද්දේ නම්, මේ පනතේ IX වන කොටස අනුව, ඒ අරමුදල් අත්හළ දේපළ විය යුතු ය. මේ වගන්තිය යටතේ මාරු කිරීමට යෙදුණු දිනයේ සිට ඒ අරමුදල් කෙරෙහි 72 වන වගන්තිය අදාළ විය යුතුය.

**69.** මේ පනතේ විධිවිධානවලට අනුකූලව සියලු වත්කම් බෙද හැරීමෙන් ඉක්බිති බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් විගණනය කළ ගිණුම් ප්‍රකාශයක් අධිකරණය වෙත භාරදෙනු ලැබිය යුතු ය. ඒ ගිණුම් ප්‍රකාශය අධිකරණය විසින් අනුමත කිරීමෙන් පසු සහ ඈවර කිරීම අවසන් කරන ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබූ අවස්ථාවක ඈවර කිරීම හා සම්බන්ධ යම් වගකීමකින් මුදල් මණ්ඩලය නිදහස් කරනු ලැබිය යුතු ය. බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්, 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව සහ මේ පනතේ විධිවිධාන සමග පටහැනි නොවන ඊට අදාළ වන විධිවිධානවලට අනුකූලව අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නෛතික පැවැත්ම අවසන් කිරීම පිණිස කටයුතු කරනු ලැබිය යුතු ය.

**70.** (1) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ශ්‍රී ලංකාවෙහි සිය ව්‍යාපාරික කටයුතු වසා දැමීමට අදහස් කරන විට, මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව, එසේ වසා දැමීම සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය දිය යුතු ය. මණ්ඩලය විසින් අනුමැතිය දෙනු ලැබූ අවස්ථාවක, ශ්‍රී ලංකාව තුළ වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කටයුතු (4) වන උපවගන්තියේ සඳහන් කර ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව ගණන් බේරා වසා දැමිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීම අවසානාත්මක කරනු ලැබූ කල්හි, බලපත්‍රලාභී වාණිජ බැංකුව එහි ලංකාවේ ව්‍යාපාරික කටයුතු අවසන් කළ යුතු අතර, එහි කටයුතු (4) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ගණන් බේරා වසා දැමිය යුතු ය.

(3) විදේශයක සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යාලය පිහිටි ස්ථානයේ දී ඒ ප්‍රධාන කාර්යාලය සම්බන්ධයෙන් ඈවර කිරීමේ වැඩ කටයුතු පටන් ගන්නා ලද විට, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුව වසා දමන ලෙස මුදල් මණ්ඩලය විසින් නියෝග කරනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යාපාර කටයුතු (1) වන හෝ (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ වසා දැමීමට යෙදුණු කල්හි, වසා දැමීමේ විෂයය වූ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින්, ශ්‍රී ලංකාව තුළ කරගෙන යන කටයුතු වසා දැමීම සඳහා අවශ්‍ය කරන බලතල පමණක් එය සතුව රඳවා ගත යුතු අතර, එසේ වසා දැමීම, හැකිතරම් ඉක්මණින් සහ විධිමත් ආකාරයට කරනු ලැබිය යුතු ය. 11 වන වගන්තියේ (1) වන හා (3) වන උපවගන්තිවල සඳහන් කර ඇති විධිවිධානවලට අනුකූලව මේ වගන්තියේ (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ වූ ගණන් බේරා වසා දැමීම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් අධීක්ෂණය කළ යුතු අතර, ගණන් බේරා වසා දැමීමට විෂය වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවට අයිති වත්කම් කිසිවක්, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් කරන ලද ව්‍යවසාය පිණිස ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරන ලද සියලු වගකීම් සහ බැරකම් ඒ ව්‍යවසායට

අනුකූලව පියවනු ලබන තෙක් ශ්‍රී ලංකාවෙන් ඉවත් කර නොගැනීමට අවශ්‍ය වන සියලු පියවර ගනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ කටයුතු ගණන් බේරා වසා දැමීම පිණිස 63 වන හා 68 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(5) බලපත්‍රලාභී වාණිජ බැංකුව, මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධානවල සඳහන් වන වගකීම් සියල්ලක්ම ඉටු කර ඇති බව මුදල් මණ්ඩලයේ මතය වූ අවස්ථාවක, ඒ බැංකුවේ නම, බලපත්‍රලාභී වාණිජ බැංකු නම් ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

**71.** මේ පනතේ මේ කොටසේ විධිවිධාන සහ මුදල් නීති පනතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන අතර පරස්පර විරෝධී බවක් හෝ පටහැනිතාවක් ඇති විටක මේ කොටසේ විධිවිධාන අභිබවා සිටිය යුතු ය.

## IX වන කොටස

## අත්හැර දමූ දේපළ

**72.** (1) අවස්ථාවෝචිත පරිදි, තැන්පත් කිරීමේ හෝ කොටස් හෝ වෙනත් සම්බන්ධතා මිලට ගැනීමේ අරමුණින් අරමුදල් ගෙවීමේ හෝ සාධන පත්‍ර නිකුත් කිරීමේ දිනෙන් පසුව නැතහොත් පීත කොමිස් භාරකාර තත්ත්වයෙන් දරන ලද අරමුදල් ගෙවිය යුතු හෝ බෙද හැරීමට හැකිවන දිනයෙන් පසුව හෝ ආරක්ෂිත තැන්පතු පෙට්ටිය, බද්දට ගත් දිනය අවසන් වීමෙන් පසුව ඉක්බිතිවම අවුරුදු දහයක කාල සීමාවක් ඇතුළත අයිතිකරු විසින්—

(අ) තැන්පතුවේ හෝ අරමුදලේ ප්‍රමාණය වැඩි කිරීමට හෝ අඩු කිරීමට නොයෙදී ඇති හෝ මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් කර ඇති භාණ්ඩ සම්බන්ධයෙන් පොළිය හෝ ලාභාංශ බැර කිරීම සඳහා පාස්පොත හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කර නැති අවස්ථාවක ;

(ආ) පීත කොමිස් භාරකාර තත්ත්වයෙන් දරන අරමුදල්වල මුල් මුදල වැඩි කිරීමට හෝ අඩු කිරීමට නොයෙදුණු හෝ ඒ සම්බන්ධයෙන් මුල් මුදල හෝ පොළිය ගෙවීම් භාර ගැනීමට නොයෙදුණු අවස්ථාවක ;

(ඇ) ඒ භාණ්ඩ සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව සමග යම් ලිපි ගණුදෙනුවක් කර නොමැති අවස්ථාවක ;

(ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් තත් කාර්ය පිළිබඳව කරන ලද සංදේශයකින් පැහැදිලි වන අයුරු ඒ භාණ්ඩ කෙරෙහි සම්බන්ධතාවක් අන්‍යාකාරයෙන් පෙන්නුම් කර නොමැති අවස්ථාවක

සහ 63 වන සහ 68 වන වගන්තිවල සඳහන් කරන ලද මුදල් සහ භාණ්ඩ ද බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක් වෙරළ ඒකකයන් විසින් දරනු ලබන එවැනි භාණ්ඩ හැරෙන්නට බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරනු ලබන මේ වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් භාණ්ඩ ද අත්හැර දමූ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පහත සඳහන් භාණ්ඩ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද භාණ්ඩ විය යුතු ය :—

(අ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත ශ්‍රී ලංකාවේ තැන්පත් කරන ලද (ඉල්ලූවිට ගෙවන, ඉතිරි කිරීමේ හෝ කල් පිරුණු විට ගෙවන) යම් සාමාන්‍ය තැන්පතුවලට හිමි යම් පොළියක් හෝ ලාභාංශයක් සමඟ, නීත්‍යානුකූල අයවීම් හැරෙන්නට ඒ සාමාන්‍ය තැන්පතු ;

(ආ) බලපත්‍රලාභී ඒ වාණිජ බැංකුවේ කොටස් හෝ වෙනත් සම්බන්ධතා මිලට ගැනීම අරභයා ශ්‍රී ලංකාවේ ද ගෙවන ලද යම් අරමුදල් සමග යම් නීත්‍යානුකූල ගෙවීම් හැරෙන්නට යම් පොළියක් හෝ ලාභාංශයක් ;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුව කෙළින්ම වගකීමට යටත් චෙක්පත් වලට හා වෙනත් ලිඛිත සාධන පත්‍රවලට ගෙවිය යුතු යම් මුදල් ;

(ඈ) වෙනත් තැනැත්තකුගේ යහපත සඳහා පිත කොමිස් භාරකාර තත්ත්වයෙන් දරනු ලබන යම් අස්පෘශ්‍ය පුද්ගලික සහ ඒ මත වූ යම් ආදායමක් හෝ පොළියක් ;

(ඉ) බද්දට ගත් කාල සීමාව අවසන් වී ඇති සහ එයට අදාළව බදුකරුගේ අන්තිමට දන්නා ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් පසුව ද අවුරුදු තුනක කාලයක් තුළ ඊට වගඋත්තර කීමට අයිතිකරු පැහැර හැර ඇත්තා වූ ආරක්ෂිත නඩත්තු පෙට්ටියක අඩංගු යම් ද්‍රව්‍ය.

**73.** (1) 72 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි යම් අත්හැර දැමූ දේපළක් දරන්නා වූ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, එය විසින් දරන්නා වූ භාණ්ඩවල ස්වභාවය සඳහන් කරමින් සහ මුදල් සම්බන්ධයෙන් වන විට, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතියක ඒ මුදල් ප්‍රමාණ ද සඳහන් කරමින්, මුදල් මණ්ඩලයට වාර්තාවක් කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද, මුදල් මණ්ඩලය විසින් විධාන කරනු ලබන්නේ නම්, වාර්තාවේ ඇතුළත් කරන ලද සියලු මුදල් මහ බැංකුවේ ඇති විශේෂ ගිණුමට බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් මාරු කරනු ලැබිය යුතු අතර අමාත්‍යවරයා සමග සාකච්ඡා කිරීමෙන්, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතට නොවැටෙන වාර්තාවේ ඇතුළත් කරන ලද භාණ්ඩ මුදල් මණ්ඩලය විසින්, අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලබන ක්‍රියාවක් සඳහා අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

**74.** 73 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් නියම කර ඇති වාර්තාව ඉදිරිපත් කිරීමෙන් දින තිහක් ඇතුළත බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල දේපළෙහි අයිතිකරුගේ නම සහ ඊට අදාළ විස්තර ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර ඒ දේපළට අදාළ විස්තර ඇතුළත් වූ දැන්වීමක් අයිතිකරුගේ අවසන් වරට දැනගෙන සිටි ලිපිනයට, ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලැබිය යුතු ය. එසේ වුවද, අධිකරණය විසින් ස්ථිර කරනු ලැබීමට යටත්ව, මුදල් මණ්ඩලය විසින්, බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් සාධාරණ හේතු දක්වීම මත ඒ දැන්වීම තැපැල් කිරීමෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව, මුදල් මණ්ඩලය විසින් නිදහස් කරනු ලැබිය හැකි ය.

**75.** තමාගේ නමින් හෝ තමාට හිමිකම ලැබෙන තැනැත්තකුගේ නමින් පැවැති බැරට තිබූ මුදල් 73 වන වගන්තිය යටතේ මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරුකර ඇති බවට මුදල් මණ්ඩලය සෑහීමකට පත්වන අන්දමට ඔප්පු කර සිටින යම් තැනැත්තකු ඒ මුදල් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ පනවන ලද නියම කොන්දේසි හෝ පරිසීමා කිරීම් වලට යටත්ව, ඒ මුදල් මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කිරීමට කලින් ඒවා පැවතියා වූ ගිණුමට අදාළව තිබූ ප්‍රමාණ හා කොන්දේසි ප්‍රකාරව, ඒ මුදල් ආපසු ගෙවනු ලබන ඒ දිනය තෙක් ඒ මුදල්වලට ගෙවිය යුතු වූ පොළිය ද සමඟ මහ බැංකුව විසින් ඒ මුදල් ආපසු ගෙවනු ලැබීමට හිමිකම් ලබන්නේ ය.

**76.** වාර්තාව ඉදිරිපත් කිරීමට හෝ 74 වන වගන්තියෙන් නියමකර ඇති අත්හැර දමූ ලෙස සලකන දේපළ ගෙවීම හෝ භාරදීම ඕනෑකමින්ම පැහැර හරින යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

## X වන කොටස

### පොදු

**77.** සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යාපාරික කටයුතුවල සේවා නියුක්ත කර සිටින වෙනත් සෑම තැනැත්තකුම සිය කාර්‍යයට ඇතුලත් වීමට මත්තෙන්, බැංකුවේ සහ එහි ගණුදෙනු කරුවන්ගේ සියලු ගණුදෙනු සම්බන්ධයෙන් ද යම් තැනැත්තකුගේ ගිණුම්වල තත්වය සම්බන්ධයෙන් හා ඒ හා සම්බන්ධිත සියලු කාරණා සම්බන්ධයෙන් ද ඒකාන්ත රහස්‍යභාවය රැකීමට තමා පොරොන්දුවන බවට ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර සිය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගන්නට ලැබෙන වෙනත් යම් කාරණා—

(අ) (i) අධිකරණයකින් ; හෝ

(ii) තත් කාරණය අදාළවන තැනැත්තා විසින් ඉල්ලා සිටි විටක ;

(ආ) සිය කාර්ය ඉටු කිරීම පිණිස ; සහ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක යම් විධිවිධාන ඉටු කිරීම පිණිස

හැර, අනාවරණය නො කිරීමට එවැනි ප්‍රකාශයකින් පොරොන්දු විය යුතුය.

**78.** මුදල් මණ්ඩලය විසින් හෝ මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හිතාධ්‍යාශයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව ද මේ පනත යටතේ හෝ මුදල් මණ්ඩලයේ විධානයක් මත හෝ හිතාධ්‍යාශයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකුට, නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට විරුද්ධව ද නඩුවක් හෝ නඩු පැවරීමක් නොතිබිය යුතු ය.

**79.** (1) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 3 වන වගන්තියේ (5) වන උපවගන්තියේ, 15 වන වගන්තියේ (2) වන උප වගන්තියේ, 16 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 33 වන වගන්තියේ (2) වන උප වගන්තියේ, 41 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 47 වන වගන්තියේ (9) වන හා (10) වන උප වගන්තිවල සහ මේ පනතේ 77 වන වගන්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නීති හෝ නියෝග කඩ කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. තවද, එවැනි පැහැර හැරීම් සඳහා දන දනම සහ ඕනෑකමින් ම බලය දෙන හෝ අවසර දෙන බලපත්‍රලාභී වාණිජ බැංකුව සහ ඒ බැංකුවේ සෑම නිලධරයකු හෝ සේවකයකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීම මත අවුරුදු තුනකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දඬුවමක් නියම කර නොමැති මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තෙක්ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු මාස දහ අටකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් පන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

**80.** (1) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් මේ පනතේ නියමයන් ඉටු කිරීම තහවුරු කිරීම පිණිස සියලු සාධාරණ පියවර ගැනීමට නොහැකි වන්නා වූ ; හෝ

(ආ) මුදල් මණ්ඩලය විසින් මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් විධානයක් ඉටු කිරීමට නොහැකි වන්නා වූ ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශනයක නිරවද්‍යතාවය සහතික කිරීම පිණිස සාධාරණ සියලු පියවර ගැනීමට නොහැකි වන්නා වූ ; හෝ

(ඈ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් පොතක හෝ ලේඛනයක හෝ යම් වාර්තාවක, තුණ්ඩුවක, ලියවිල්ලක හෝ ව්‍යාපාර කටයුතුවල, ගණුදෙනු කොන්දේසි, වත්කම් හෝ බැරකම් හෝ ගිණුම් පිළිබඳ ප්‍රකාශනයක අසත්‍ය සටහනක් ඕනෑකමින්ම කරන්නා වූ හෝ එවැනි සටහනක් කිරීමට සලස්වන්නා වූ ; හෝ

(ඉ) යම් පොතක, හෝ ලේඛනයක හෝ යම් වාර්තාවක, තුණ්ඩුවක, ලියවිල්ලක හෝ ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යාපාර කටයුතු, ගණුදෙනු, කොන්දේසි, වත්කම් හෝ බැරකම් හෝ ගිණුම් පිළිබඳ ප්‍රකාශනයක යම් සටහනක් කිරීම ඕනෑකමින්ම නොකර හරින්නා වූ හෝ එවැනි යම් සටහනක් කිරීම නොකර හැරීමට ඕනෑකමින්ම ඉඩ සලසන්නා වූ ; හෝ

(ඊ) යම් පොතක, හෝ ලේඛනයක හෝ යම් වාර්තාවක, තුණ්ඩුවක, ලියවිල්ලක හෝ ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යාපාර කටයුතු ගණුදෙනු, කොන්දේසි, වත්කම් හෝ බැරකම් හෝ ගිණුම් පිළිබඳ ප්‍රකාශන සටහනක් ඕනෑකමින් ම මකාහරින, සඟවන හෝ විනාශ කරන්නා වූ හෝ එවැනි යම් සටහනක් වෙනස් කිරීමට, මකා දැමීමට, සැඟවීමට හෝ විනාශ කිරීමට ඕනෑකමින් ම ඉඩ සලසන්නා වූ

බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු මාස දහ අටක කාලයක් සඳහා වූ බන්ධනාගාර ගත කිරීමට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව කෙරෙන යම් නඩු කටයුත්තක දී, මේ පනතේ නියමයන් ඉටු කිරීම තහවුරු කිරීමේ කාර්යයෙහි ලා සහ මෙම ප්‍රකාශන නිවැරදි බව සහතික කිරීමේ කාර්යයෙහි ලා වෙනත් තැනැත්තකු කාර්ය භාරය දැරූ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බව සහ ඒ තැනැත්තා ඒ කාර්යය ඉටු කිරීමෙහි ලා ප්‍රවීන බැවින් සහ ඉටු කිරීමට හැකි තත්වයක සිටි බව ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

**81.** මේ පනත යටතේ වූ වරදක් සංස්ථාවක් විසින් කරනු ලබන අවස්ථාවක, ඒ වරද කරන අවස්ථාවේ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම, ඒ තැනැත්තාගේ දැනුමක් නොමැතිව ඒ වරද කරන ලද බව හෝ ඒ වරද කිරීම මග හැරීම සඳහා තමා විසින් සියලු අවශ්‍ය උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

**82.** (1) මේ පනතින් නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් ආමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝග ඒ පළ කිරීම කරනු ලබන දිනයේ දී හෝ ඒ නියෝගයේ සඳහන් කරනු ලබන වෙනත් පසු දිනක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි තරම් ඉක්මනින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව හමුවට පමුණුවනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත නොකරනු ලැබූ සෑම නියෝගයක් ම ඒ අනුමැතිය නොදීමේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ සේ සලකන ලද දිනය පිළිබඳ දැන්වීම් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**83.** 5 වන වගන්තිය ප්‍රකාර බලපත්‍රයක් ප්‍රදානය කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක්—

(i) (85 වන අධිකාරය වන) භාර ලැබුම් ආඥාපනතේ සහ (89 වන අධිකාරය වන) උගස් පනතේ කාර්ය සඳහා අනුමත කළ ණය දෙන නියෝජ්‍යායතනයක් ලෙස ද

(ii) 1961 අංක 65 දරන මුදල් පනතේ කාර්ය සඳහා ''අනුමත කළ බැංකුවක්'' ලෙස ද

සලකනු ලැබිය යුතු ය.

## XI වන කොටස

## ඉවත් කිරීම

**84.** (422 වන අධිකාරය වන) මුදල් නීති පනත එම පනතේ 116අ, 121අ සහ 121ආ යන වගන්ති ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**85.** 1982 අංක 17 දරන සමාගම් පනත, එම පනතේ XIV වන කොටස ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## XII වන කොටස

## අර්ථනිරූපනය

**86.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

''අනුග්‍රහය'' යන්නට යම් ණයක් හෝ අයිරාවක් හෝ අත්තිකාරමක් හෝ සම්භාව්‍ය වගකීම් පිළිගැනීම පිණිස වූ භාර දීමක් ඇතුළු, යම් ණයක් හෝ අයිරාවක් හෝ අත්තිකාරමක් ප්‍රදානය කිරීමට වූ යම් භාර ගැනීමක් අදහස් වේ ;

"බැංකු ව්‍යාපාරය" යන්නෙන් ඉල්ලූ විට චෙක්පත්, අණකර, ඇණවුම් මගින් හෝ අන්‍යාකාරයෙන් ගෙවිය යුතු මුදල් තැන්පතු පිළිගැනීමේ මාර්ගයෙන් මහජනයාගෙන් අරමුදල් ලබා ගැනීමේ ව්‍යාපාරය සහ ඒ අරමුදල් සම්පූර්ණයෙන් හෝ කොටස් වලින් අත්තිකාරම්, ආයෝජන හෝ නීතියෙන් හෝ සම්ප්‍රදායික බැංකු පිළිවෙත්වලින් බලය ලැබුණු වෙනත් යම් මෙහෙයුම් සඳහා යෙදවීම අදහස් වේ ;

"ප්‍රාග්ධන අරමුදල්" යන්නෙන් ගෙවා නිමි හෝ පැවරූ ප්‍රාග්ධනය සහ 2 වන වගන්තියෙන් ඉඩ සලසා ඇති පරිදි සංචිත අරමුදල අදහස් වේ ;

"මහ බැංකුව" යන්නෙන් (422 වන අධිකාරය වන) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ ;

"කිට්ටු ඥාතියා" යන්නෙන් කලත්‍රයා හෝ යැපෙන දරුවා අදහස් වේ ;

"සමාගම" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ ;

"ආයතනය" යන්නෙන් සමාගමක් හෝ ව්‍යාපාර ආයතනයක් අදහස් වේ ;

"ව්‍යවහාර විදේශ මුදල්" යන්නෙන් මේ කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් ව්‍යවහාර විදේශ මුදල් ලෙස තීරණය කරනු ලැබූ විදේශ මුදල් අදහස් වේ ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවකට අදාළ වීමේ දී, සමාගම් ආඥාපනත යටතේ සංවිධානය කළ සමාගමක අධ්‍යක්ෂවරයකු විසින් කරගෙන යනු ලබන කර්තව්‍යවලට සමාන, කවරාකාරයක පදවි නාමයකින් හඳුන්වනු ලැබුව ද, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ මෙහෙයුම්වලට අදාළ වූ කර්තව්‍ය කරගෙන යනු ලබන හෝ එවැනිම කර්තව්‍ය කරගෙන යාමට බලය ලැබ ඇත්තා වූ, තැනැත්තකු අදහස් වේ ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටස්තරව සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවකට අදළ වීමේදී, කවරාකාර පදවිනාමයකින් හඳුන්වනු ලැබුව ද, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ මෙහෙයවීමට අදාළව සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක අධ්‍යක්ෂවරයකු විසින් කරනු ලබන්නා වූ කර්තව්‍ය පරිදි වූ කර්තව්‍ය කරගෙන යනු ලබන හෝ එවැනිම කර්තව්‍ය කරගෙන යාමට බලය ලැබ ඇත්තා වූ තැනැත්තා සහ ප්‍රධාන බලයලත් අනුයෝජිතයා හෝ ඔහුගේ විකල්ප නිලධරයා වන, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කර්තව්‍ය කරගෙන යාම සඳහා ශ්‍රී ලංකාවෙහි වගකිවයුතු තැනැත්තා අදහස් වේ ;

"බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා" යන්නෙන්, (422 වන අධිකාරය වන) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් වේ ;

"මෙරට බැංකු ව්‍යාපාර කටයුතු" යන්නෙන්, අක් වෙරළ බැංකු කටයුතු සම්බන්ධයෙන් වූ මේ පනතේ IV වන කොටසට යටත් නොවූ යම් බැංකු ව්‍යාපාර කටයුතු අදහස් වේ ;

''වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යාලය'' යන්නෙන්, වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යාලය පිහිටි ස්ථානය අදහස් වේ ;

''ද්‍රවශීල වත්කම්'' යන්නෙන්—

(අ) මුදල් ;

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවල තිබෙන ශේෂයන් ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ ඉල්ලා සිටිය හැකි මුදල් ;

(ඈ) එක් අවුරුද්දකට නොවැඩි කල්පිරීමක් ඇති ශ්‍රී ලංකාණ්ඩුව විසින් නිකුත් කරන ලද හෝ ඇප වූ භාණ්ඩාගාර බිල්පත් හෝ සුරැකුම්පත් ;

(ඉ) බඩු ලැබීම් ;

(ඊ) ආනයන සහ අපනයන බිල්පත් ;

(උ) මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වෙනත් එවැනි වත්කම්

අදහස් වේ ;

''පළාත් පාලන ආයතනය'' යන්නෙන් යම් මහනගර සභාවක්, නගර සභාවක්, හෝ සංවර්ධන සභාවක්, අදහස්වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කරන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ ඒ යටතේ ඇතිකොට පිහිටුවන ලද යම් අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

''මුදල් මණ්ඩලය'' යන්නෙන්, (422 වන අධිකාරය වන) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ ;

''අනේවාසිකයා'' යන්නෙන් පදිංචිකරුවකු නොවන පුද්ගලයෙක්, සමාගමක්, සංස්ථාවක් හෝ වෙනත් නෛතික තැනැත්තකු හෝ ''නේවාසිකයා'' යන විග්‍රහයට ඇතුළත් නොකරන ලද යම් සංස්ථාගත නොකළ මණ්ඩලයක් අදහස් වේ ;

''ව්‍යාපාරික ස්ථානය'' යන්නෙන් මහජනයාට විවෘතව ඇති ජංගම කාර්යාලයක් ද ඇතුළු ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවක යම් ශාඛාවක් හෝ කාර්යාලයක් අදහස් වේ ;

''රාජ්‍ය සංස්ථාවක්'' යන්නෙන් ආණ්ඩුව විසින්, ප්‍රදාන හෝ ණය මගින් හෝ අන්‍යාකාරයෙන් සම්පූර්ණයෙන් හෝ කොටසකින් සලස්වනු ලැබූ මුදල් හෝ ප්‍රාග්ධනය ඇතිව, සමාගම් ආඥාපනත හැර යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ ;

''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්--

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද ඒ ආයතනයේ සභාව විසින්, ගණකාධිකාරීවරයකු ලෙස ක්‍රියා කිරීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද පුද්ගලයෙක් ;

(ආ) එක් එක් නේවාසික හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් ක්‍රියාකිරීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද ගණකාධිකාරීවරුන්ගේ ව්‍යාපාර ආයතනයක්

අදහස් වේ ;

''නේවාසිකයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින ශ්‍රී ලංකා පුරවැසියකු ;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද එහෙත් යටත් පිරිසෙයින් මාස හයක් ශ්‍රී ලංකාවේ වාසය කර ඇත්තා වූ ද නොකඩවා ශ්‍රී ලංකාවේ වාසය කරන්නා වූ හෝ වාසය කිරීමට අදහස් කරන්නා වූ ද පුද්ගලයකු ;

(ඇ) ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද සමාගමක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද සංස්ථාවක්, හෝ යම් ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක් හෝ ශ්‍රී ලංකාවෙහි වෙනත් සංවිධානයක් ;

(ඈ) සමාගමක ශාඛාවක්, පාලිත සමාගමක්, ඒකාබද්ධ ව්‍යාපාරයක්, දීර්ඝ කිරීමක්, කාර්යාලයක් හෝ වෙනත් යම් ඒකකයක් හෝ යම් විදේශ රටක නීති යටතේ පිහිටුවනු ලැබ ශ්‍රී ලංකාවෙහි මෙහෙයුම් කර ගෙන යන වෙනත් විනිශ්චය තැනැත්තකු

අදහස් වේ ;

''සැලෙහන සම්බන්ධතාවයක්'' යන්නෙන්—

(අ) සමාගමක් සම්බන්ධයෙන් වන විට රුපියල් මිලියනයක් ඉක්ම වූ ඒ සමාගමේ ගෙවා නිමි කොටස්වල වටිනාකම හෝ සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයක් යන දෙකින් වඩා අඩු වන කොටස් කෙරෙහි තනිතනිවම හෝ එක්ව තවත් සමාගමක් හෝ පුද්ගලයෙක් නැතහොත් ඔහුගේ ළඟ ඥාතියකු විසින් දරන්නා වූ වැඩදායි සම්බන්ධතාව හෝ පුද්ගලයකු, හෝ ඔහුගේ ළඟ ඥාතියකු හෝ වෙනත් සමාගමක් විසින් දෙන ලද ඒ සමාගම වෙනුවෙන් වූ ඇපයක් හෝ හානිපූරණයක් අදහස් වේ ;

(ආ) ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් වන විට, එකී ව්‍යාපාර ආයතනයේ සියලු හවුල් කරුවන් විසින් දයක වූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි වූ ප්‍රමාණයක් නියෝජනය කෙරෙන තනි තනිව හෝ එක්ව පුද්ගලයකු හෝ ඔහුගේ ඥාතියකු විසින් ඒ ව්‍යාපාර ආයතනයෙහි දරන වැඩදයි සම්බන්ධතාව

හෝ පුද්ගලයකු හෝ ඔහුගේ හෝ ඇගේ කලත්‍රයා හෝ දෙමාපියකු හෝ දරුවකු විසින් ඒ ව්‍යාපාර ආයතනය වෙනුවෙන් දෙන ලද ඇපයක් හෝ හානි පූරණයක් අදහස් වේ.

## I වන උපලේඛනය

(2 (4) වන වගන්තිය)

1. අල්ගමේන් බෑන්ක් නෙදර්ලන්ඩ් එන්.වී.,
2. ඇමෙරිකන් එක්ස්ප්‍රස් බෑන්ක් ලිමිටඩ්,
3. ඈම්ස්ටර්ඩෑම්—රොටර්ඩෑම් බැංකුව එන්.වී.,
4. ලංකා බැංකුව,
5. සීමාසහිත ජාත්‍යන්තර ණය සහ වාණිජ (ඕවර්සීස්) බැංකුව,
6. සීමාසහිත ඕමාන් බැංකුව,
7. ඉන්දු-සුවස් බැංකු,
8. සිටි බෑන්ක් එන්. ඒ.,
9. සීමාසහිත ලංකා වාණිජ බැංකුව,
10. ඩොයිෂ් බැංකුව, ඒ. ජී.,
11. ග්‍රින්ලේස් බැංකුව, පී. එල්. සී.,
12. හබීබ් බෑන්ක් ඒ. ජී. සූරිච්,
13. සීමාසහිත හබීබ් බැංකුව,
14. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව,
15. හොංකොං සහ ෂැංහයි බෑන්කින් කෝපරේෂන්,
16. ඉන්ඩියන් බැංකුව,
17. ඉන්ඩියන් ඕවර්සීස් බැංකුව,
18. සීමාසහිත මිඩ්ල් ඊස්ට් බැංකුව,
19. සීමාසහිත ඕවර්සීස් ට්‍රස්ට් බැංකුව,
20. මහජන බැංකුව,
21. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව,
22. ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා,
23. යූනියන් බෑන්ක් ඔෆ් ද මිඩ්ල් ඊස්ට් ලිමිටඩ්,
24. සීමාසහිත සම්පත් බැංකුව,
25. සෙලාන් ට්‍රස්ට් බෑන්ක් ලිමිටඩ්,
26. 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද යම් බැංකුවක්.

## II වන උපලේඛනය

(3 (4) වන වගන්තිය)

(අ) තැන්පතු, ඉතිරි කිරීමේ සහ වෙනත් සමාන ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ කළමනාකරණය ;

(ආ) මුදල් ණයට ගැනීම, රැස් කිරීම හෝ භාර ගැනීම ; ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට දීම හෝ අත්තිකාරම් මුදල් ගෙවීම ; විනිමය බිල්පත්, හුන්ඩි, පොරොන්දු නෝට්ටු, කූපන්, අණකර, නොභාර පත්‍ර, දුම්රිය කුවිතාන්සි, බලපත්‍ර, සෘණපත්‍ර, සහතික කොටස් සහතික පත්‍ර හා වෙනත් සාධන පත්‍ර ද පැවරිය හැකි වූ හෝ ගණුදෙනු කළ හැකි වූ හෝ නොහැකි වූ සුරැකුම් පත් ලිවීම, පිළිගෙන කිරීම, භාරගැනීම,

වට්ටම් කිරීම, මිලට ගැනීම, විකිණීම, එකතු කිරීම හා අලෙවි කිරීම, ණයවර ලිපි ගමන් වැක්පත් හා අය නිවේදන චක්‍රලේඛ ප්‍රදානය කිරීම හා නිකුත් කිරීම ; රන් රිදී බඩු හෝ රන් රිදී කාසි මිලට ගැනීම, විකිණීම සහ අලෙවි කිරීම, විදේශීය බැංකු නෝට්ටු ඇතුළුව විදේශීය මුදල් මිලට ගැනීම හා විකිණීම, ස්කන්ධ අරමුදල්, කොටස් සෘණපත්‍ර, සෘණපත්‍ර ස්කන්ධ, බැඳුම්කර, ගැතිකම්, සුරැකුම්පත් හා සියලුම වර්ගවල ආයෝජන අත්කර ගැනීම, දැරීම, කොමිස් පිට නිකුත් කිරීම, ප්‍රාරක්ෂණය කිරීම හා අලෙවි කිරීම, ගණුදෙනුකරුවන් හෝ සෙස්සන් වෙනුවෙන් බැඳුම්කර, කොටස් සහතික පත්‍ර හෝ වෙනත් සුරැකුම් පත් වර්ග මිලට ගැනීම හා විකිණීම, තැන්පත් කිරීම සඳහා හෝ ආරක්ෂා භාරය සඳහා අන්‍යාකාරයකට සියලුම වර්ගවල බැඳුම්කර කොටස් සහතික පත්‍ර හෝ වටිනා දේවල් භාර ගැනීම හා ආරක්ෂා භාරය පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යාම ; මුදල් හා සුරැකුම්පත් එකතු කිරීම හා යැවීම ;

(ඇ) ආණ්ඩු හෝ පළාත් පාලන ආයතන හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙනුවෙන් අනුයෝජිතයන් ලෙස ක්‍රියා කිරීම ; බලකාරයන් ලෙස ක්‍රියා කිරීමෙහි හා නිදහස් කිරීමෙහි සහතික හා කුවිතාන්සි දීමේ බලය ඇතුළුව, බැංකු සමාගමක් නොවූ යම් සමාගමක කළමනාකාර අනුයෝජිතයාගේ ව්‍යාපාරය හැර, වෙනත් යම් වර්ගයක නියෝජ්‍යත්ව ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම ;

(ඈ) මහජන සහ පෞද්ගලික ණය ගිවිස ගැනීම හා ඒවා ගණුදෙනු කිරීම හා නිකුත් කිරීම ;

(ඉ) රජයේ, නාගරික සභාවල හෝ වෙනත් ණය හෝ, යම් සමාගමක, සංස්ථාවක හෝ සංගමයක කොටස්, ස්කන්ධ, සෘණපත්‍ර ස්කන්ධ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව නිකුත් කිරීම ප්‍රවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, රක්ෂණය සහතික කිරීම, ප්‍රාරක්ෂණය කිරීම, කළමනාකරණයට සහභාගිවීම සහ ක්‍රියාවේ යෙදවීම හා එවැනි යම් නිකුත් කිරීමක් සඳහා මුදල් ණයට දීම ;

(ඊ) සෑම වර්ගයකටම අයත් වූ සහතික කිරීම් හා හානි රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන යාම හා ගණුදෙනු කිරීම ;

(උ) දැනට පවත්වා හෝ අලුතින් ඇතිවන හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම හෝ එහි මුදල් සැපයීම නැතහොත් ප්‍රවර්ධනය කිරීමෙහි හෝ මුදල් සැපයීමෙහි ලා සහායවීම හා සංගම් මාර්ගයෙන් හෝ අන්‍යාකාරයෙන් එය සංවර්ධනය කිරීම හෝ පිහිටුවීම ;

(ඌ) අත්කර ගැනීම අවශ්‍ය යයි නැතහොත් පහසු යයි සමාගම විසින් අදහස් කරනු ලබන නැතහොත් සමාගමේ මතය අනුව අත්කර ගැනීම නිසා සමාගම සතුව ඇති යම් සුරැකුම්පත් අයකර ගැනීමෙහි ලා හෝ යම් අපේක්ෂිත අලාභයක් හෝ බැඳීමක් වැළැක්වීමෙහි ලා නැතහොත් ක්ෂය කිරීමෙහි ලා හෝ උපකාර වන යම් නිශ්චල හෝ චංචල දේපළක් හා යම් අයිතිවාසිකම් හෝ වරප්‍රසාද මිලට ගැනීමෙන්, බදු ගැනීමෙන්, හුවමාරු කිරීමෙන්, කුලියට ගැනීමෙන් හෝ අන් ලෙසකින් අත්කර ගැනීම ;

(එ) සමාගමේ හිමිකම් පෑම් කිසිවක් ගෙවීමෙහි ලා නැතහොත් ඉන් කොටසක් ගෙවීමෙහි ලා සමාගම සතු විය හැකි චංචල හා නිශ්චල සියලුම දේපළ පාලනය කිරීම, විකිණීම හා ඊට මුදල් අය කර ගැනීම ;

(ඒ) යම් ණය හෝ අත්තිකාරමක් සඳහා ඇපයක් විය හැකි නැතහොත් එවැනි යම් ඇපයකට සම්බන්ධ විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් ද, යම් චංචල හෝ නිශ්චල දේපළක යම් අයිතිවාසිකමක්, අයිතියක් හෝ සම්බන්ධතාවයක් ද අත්කොටගෙන දැරීම හා සාමාන්‍යයෙන් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

(ඔ) භාර ක්‍රියාත්මක කිරීමට භාර ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඕ) පොල්මඃකරුවකු ලෙස, භාරකරුවකු ලෙස හෝ අන් ලෙසකින් බූදල් අද්මිනිස්ත්‍රාසි කිරීම භාර ගැනීම ;

(ක) සමාගමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙන යම් සමාගමක කොටස් ගෙන හෝ අන්‍යාකාරයකින් අත්කොට ගෙන දැරීම ;

(ග) සමාගමේ සේවා නියුක්තයන්ට හෝ එහි කලින් සිටි සේවා නියුක්තයන්ට හෝ ඒ තැනැත්තන්ගෙන් යැපෙන්නන්ට හෝ ඒ තැනැත්තන්ගේ ඥාතීන්ට යහපතක් සිදු කිරීම අභිප්‍රේත කොටගත් සංගම්, ආයතන, අරමුදල්, භාර හා සැප පහසුකම් ඇති කිරීම හා නඩත්තු කිරීම නොහොත් ඇති කිරීමෙහි ලා හා නඩත්තු කිරීමෙහි ලා ආධාර කිරීම, විශ්‍රාම වැටුප් හා වේතන ප්‍රදානය කිරීම හා රක්ෂණය සඳහා ගෙවීම් කිරීම, පුණ්‍ය හෝ ශුභසාධක පරමාර්ථ සඳහා නැතහොත් යම් ප්‍රදර්ශනයක් සඳහා නැතහොත් යම් මහජන, පොදු හෝ ප්‍රයෝජනවත් පරමාර්ථ සඳහා මුදල් ගෙවීම හෝ ගෙවන බව සහතික කිරීම ;

(ච) සමාගමේ කාර්ය සඳහා අවශ්‍ය නැතහොත් පහසු වූ යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්ත කිසිවක් අත්කර ගැනීම, ගොඩ නැගීම, නඩත්තු කිරීම හා වෙනස් කිරීම ;

(ජ) සමාගමේ දේපළ හා අයිතිවාසිකම් සියල්ලම හෝ ඉන් යම් කොටසක් හෝ විකිණීම, වැඩිදියුණු කිරීම, කළමනාකරණය කිරීම, සංවර්ධනය කිරීම, හුවමාරු කිරීම, බදු දීම, උකස් කිරීම, සුදුස්සක් කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ පිළිබඳ අන්‍යාකාරයකින් කටයුතු කිරීම ;

(ට) යම් තැනැත්තකුගේ හෝ සමාගමක ව්‍යාපාරය මේ වගන්තියේ සඳහන් කරනු ලැබූ නැතහොත් විස්තර කරනු ලැබූ ස්වභාවයක ව්‍යාපාරයක් වූ විට, එය සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් හෝ අත්කර ගැනීම හා භාර ගැනීම ;

(ඩ) සමාගමේ ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට හෝ දියුණු කිරීමට ආනුෂංගික වූ නැතහොත් උපකාරී වූ වෙනත් සියලුම දේ කිරීම ;

(ඝ) කළමනාකරණ උපදේශක සේවාවල නියුක්ත වීම ;

(ත) බැංකු කටයුතු, ගණකාධිකරණය, තක්සේරු කිරීම, ව්‍යාපෘති හා ණය ඇගැයීම හා අනුබද්ධ විෂයයන් පිළිබඳ පුහුණුව ලබා දීම ;

(ද) කුලී සින්නක්කර සේවාවල, ආයෝජනය කිරීමේ, බදු දීමේ හා ගබඩා කිරීම් කටයුතුවල නියුක්ත වීම ;

(න) සංවර්ධනය සඳහා මධ්‍යම හා දීර්ඝකාලීන ණය මුදල් ලබාදීම.

## 1988 අංක 31 දරන දේශීය ආදයම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 සැප්තැම්බර් මස 08 වන දින]

**1979 අංක 28 දරන දේශීය ආදයම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1988 අංක 31 දරන දේශීය ආදයම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදයම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ (lii) වන අනුඡේදයේ " ශ්‍රී ලංකා මිනින්දෝරුවරයන්ගේ ආයතනය ; සහ " යන වචන වෙනුවට " ශ්‍රී ලංකා මිනින්දෝරුවරයන්ගේ ආයතනයේ ලාභ සහ ආදයම;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (liii) වන අනුඡේදයේ " රසායන විද්‍යා (ලංකා) ආයතනය " යන වචන වෙනුවට " රසායන විද්‍යා (ලංකා) ආයතනයේ ලාභ සහ ආදයම ; සහ " යන වචන ආදේශ කිරීමෙන් ; තවද

(3) ඒ ඡේදයේ (liii) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

" (liv) 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ලාභ සහ ආදයම.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ " ඊට පසුව අඩු කරනු නොලැබූ, සහ " යන වචන වෙනුවට " ඊට පසුව අඩු කරනු නොලැබූ " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ " ඊට පසුව පිහිටුවනු නොලැබූ " යන වචන වෙනුවට " ඊට පසුව පිහිටුවනු නො ලැබූ, සහ " යන වචන ආදේශ කිරීමෙන් ; තව ද

(3) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :—

'' (v) 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ස්වකීය ආදායම රුපියල් තුන් ලක්ෂ තිස් තුන් දහස් තුන්සිය තිස් තුනක් නො ඉක්මවන්නා වූ.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 33අ, 33ආ, 33ඇ සහ 33ඈ වන වගන්ති වශයෙන් බල පවත්වන්නේය.

''සුදුසුකම් ලබන බෙදාහැරීම් මත වාසික ගෙවීමට යටත්වන අත්තිකාරම් සමාගම් බද්ද.

33අ. (1) ශ්‍රී ලංකාවේ වාසික සෑම සමාගමක්ම, 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් ම තුළ වූ ඒ සමාගම විසින් කරන ලද සෑම සුදුසුකම් ලබන බෙද හැරීමක මුදල් ප්‍රමාණයට සමාන වන මුදලක් මත ඒ වර්ගයේ සමාගම්වලට අදාළ වන අනුප්‍රමාණය වශයෙන් මේ පනතේ හත්වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් උචිත අනුප්‍රමාණය අනුව ගණන් බලනු ලබන (මෙහි මින් මතු '' අත්තිකාරම් සමාගම් බද්ද '' යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් ගෙවීමට යටත් වන්නේය.

(2) සෑම වාසික සමාගමක්ම විසින්, 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, මේ පනතේ 33(1) (අ) වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දෙන්, ඒ තක්සේරු වර්ෂයේ දී ඒ සමාගම විසින් ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද, 125 (2) (IV) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, අඩු කිරීමට ඒ සමාගමට හිමිකම ඇත්තේ ය. ඒ අඩුකිරීම, ඒ තක්සේරු වර්ෂය තුළ දී ඒ සමාගම විසින් 33(1) (අ) වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දෙන් සියයට පනහක් නොඉක්මවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ මේ තක්සේරු වර්ෂයක් සඳහා අඩුකරනු ලැබූ මුදල ඉක්මවන ලෙස ඒ තක්සේරු වර්ෂය තුළ දී සමාගමක් විසින් ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද සමාගමට ආපසු ගෙවනු නොලැබිය යුතු අතර එය ඉදිරියට ගෙන ගොස් ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂය සඳහා ආදී වශයෙන් 33(1) (අ) වන වගන්තිය යටතේ එම සමාගම විසින් ගෙවිය යුතු වන බද්දෙන් 125 (2) (IV) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව අඩු කළ යුතු ය. එහෙත් යම් තක්සේරු වර්ෂයක් සඳහා 33(1) (අ) වන වගන්තිය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු බද්දෙන් අත්තිකාරම් සමාගම් බද්ද වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු මුළු මුදල ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් 33 (1) (අ) වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දෙන් සියයට 50 ක් නොඉක්මවිය යුතු ය.

33ආ. (1) යම් වාසික සමාගමක් විසින් 33අ වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අත්තිකාරම් සමාගම් බද්ද යම් ලාභාංශයක් සම්බන්ධයෙන් ගෙවන ලද විටෙක, ඒ ලාභාංශය, යම් තක්සේරු වර්ෂයකදී, සමාගමක් නොවන වාසික තැනැත්තෙකුට ලැබුණු අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභාංශයෙන් ලැබුණු ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම, දළ ලාභාංශයේත් සුදුසුකම් ලබන බෙද හැරීමකින් සමන්විත වන්නේ ඒ ලාභාංශයේ යම් කොටසක් ද, ඒ කොටසට ආරෝපණය කරනු ලැබිය හැකි අත්තිකාරම් සමාගම් බද්දේත් එකතුවට සමාන මුදල් ප්‍රමාණයක් වශයෙන් සැළකිය යුතු ය.

(2) යම් වාසික සමාගමක් විසින් 33අ වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අත්තිකාරම් සමාගම් බද්ද යම් ලාභාංශයක් සම්බන්ධයෙන් ගෙවන ලද විටක, ඒ ලාභාංශය යම් තක්සේරු වර්ෂයක් සඳහා, සමාගමක් නොවන, යම් වාසික තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් වන අවස්ථාවක, එම ලාභාංශයෙහි යම් කොටසක් සුදුසුකම් ලබන බෙද හැරීමකින් සමන්විත වන්නේ නම්, එම කොටස මත ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්දට සමාන මුදලක් එම තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බද්දෙන් අඩුකිරීමට ඒ තැනැත්තා හිමිකම ලබන්නේ ය. එසේ අඩු කරනු ලබන මුදල ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්ද ඉක්මවන අවස්ථාවක, එසේ ඉක්මවන මුදල් ප්‍රමාණය, xxiii වන පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

33ඇ. සෑම වාසික සමාගමක්ම විසින් 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක්ම සඳහා—

(1) මුදලින් හෝ මුදල් ගෙවීම සඳහා වන ඇනවුමක් මාර්ගයෙන් හෝ 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව වෙනත් වාසික සමාගම්වලින් ලැබුණු ලාභාංශ, පහත දැක්වෙන ගණ සහ උපගණ යටතේ වර්ග කර—

(අ) බදු වලින් නිදහස් ලාභාංශ ;

(ආ) අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු නොලැබ ඇත්තේ, යම් ලාභාංශ සම්බන්ධයෙන්ද එම ලාභාංශ :

(ඇ) වෙනත් ලාභාංශ : එනම්,

(i) 1988 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාල සීමාවක් තුළ ලාභවලින් ගෙවන ලද ලාභාංශ ;

(ii) අත්තිකාරම් සමාගම් බද්ද සියයට 50 බැගින් ගෙවනු ලැබ ඇත්තේ, යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(iii) අත්තිකාරම් සමාගම් බද්ද සියයට 33⅓ බැගින් ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(iv) අත්තිකාරම් සමාගම් බද්ද සියයට 25 බැගින් ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(2) 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ලැබෙන හෝ උපචිත වන, ලාභාංශ ආදායම නොවන, ලාභ හා ආදායම් පහත දැක්වෙන ගණ යටතේ වර්ග කර—

(අ) බදු වලින් නිදහස් ලාභ හා ආදයම් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් අනුප්‍රමාණනොවන අනුප්‍රමාණ මත බදු අයකළ හැකි ලාභ හා ආදයම් ; සහ

(ඇ) වෙනත් ලාභ හා ආදයම් ;

(3) ඉහත සඳහන් ඡේදවල දක්වා ඇති එක් එක් ආදයම් ගණයෙන් සහ උපගණයෙන්, ඒ තක්සේරු වර්ෂය තුළ ගෙවන ලද ලාභාංශ පිළිබඳ විස්තර ;

(4) බදු ගෙවීම සහ සංචිතයන් සඳහා ඉහත සඳහන් ඡේදවල දක්වා ඇති එක් එක් ආදයම් ගණයෙන් හා උපගණයෙන් එම තක්සේරු වර්ෂය තුළ කරන ලද විසර්ජනයන්

දක්වෙන වාර්තාවක් පවත්වා ගෙන යා යුතු ය.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(i) (ඇ) ඡේදය වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඇ) (i) ලැබුණු, බදු වලින් නිදහස් ලාභාංශ වලින් ;

(ii) අත්තිකාරම් සමාගම් බද්ද සියයට 50 බැගින් ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද ලැබුණු ඒ ලාභාංශ වලින් ;

(iii) අත්තිකාරම් සමාගම් බද්ද සියයට 33 1/3 බැගින් ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද ලැබුණු ඒ ලාභාංශ වලින් ;

(iv) අත්තිකාරම් සමාගම් බද්ද සියයට 25 බැගින් ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද ලැබුණු ඒ ලාභාංශ වලින් ;

(v) ලැබුණු වෙනත් ලාභාංශ වලින් ;

(vi) ආදයම් බද්දෙන් නිදහස් ආදයමෙන් ;

(vii) මේ පනතේ දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් අනුප්‍රමාණ නොවන වෙනත් අනුප්‍රමාණ අනුව බදු අය කළ හැකි ලාභ වලින් සහ ආදයමෙන් ; සහ

(viii) වෙනත් ලාභ වලින් සහ ආදායමෙන් ගෙවන ලද මුදල වෙන් වෙන්ව දක්වෙන දළ ලාභාංශ පිළිබඳ සංයුතිය ; '' තවද

(ii) (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

(ඉ) ඉහතින් වූ ඡේදයෙහි (viii) වන අනුඡේදයේ සඳහන් වෙනත් ලාභවලින් සහ ආදායමෙන් ගෙවන ලද ලාභාංශයේ කොටසක සුදුසුකම් ලබන බෙදා හැරීමකින් සමන්විත වන කොටස සම්බන්ධයෙන් ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද ;

(ඊ) (ඈ) ඡේදයේ (ii) වන හෝ (iii) වන හෝ (iv) වන අනුඡේදයේ සඳහන් ලාභාංශයකින් ගෙවන ලද ලාභාංශයේ කොටසක් සුදුසුකම් ලබන බෙදා හැරීමකින් සමන්විත වන විට ඒ කොටස සම්බන්ධයෙන් ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද ; තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'' (2අ) ශ්‍රී ලංකාවේ සෑම වාසික සමාගමක් ම විසින් 1988 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් ම වෙනුවෙන්—

(i) ඒ තක්සේරු වර්ෂය තුළ ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද ;

(ii) 1988 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 33(1) (අ) වන වගන්තිය යටතේ බද්ද වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂය තුළ කරන ලද යම් ගෙවීම් ;

සම්බන්ධයෙන් විස්තර දක්වෙන, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ආකෘතියක් අනුව වූ, ප්‍රකාශයක් ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් ඉක්බිතිව ම එළඹෙන නොවැම්බර් මාසයේ තිස් වන දින හෝ ඊට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය.''; තවද,

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ '' ඒ ප්‍රකාශයෙන් පෙන්වනු ලැබූ බදු ප්‍රමාණය අඩුකර ගැනීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.'' යන වචන වෙනුවට '' අත්තිකාරම් සමාගම් බද්ද ඇතුලුව ඒ ප්‍රකාශයෙන් පෙන්වනු ලබන බදු ප්‍රමාණය අඩු කර ගැනීමට ඔහුට හිමිකම තිබිය යුතුය.''. යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (4) ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක් විසින් 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් මත, එම සමාගම විසින් 33අ. (1) වන වගන්තිය යටතේ ගෙවිය යුතු වන මුළු අත්තිකාරම් සමාගම් බද්දෙහි සමස්තය ඉහතින් දක්වූ යම් උපවගන්තියක විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, එකී එක් එක් සුදුසුකම් ලබන බෙදාහැරීමකින් සමන්විත වන ලාභාංශය බෙදා හරිනු ලබන

අවස්ථාවේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. ඒ බද්ද ක්‍රමවත් ලෙස එකතු කිරීම සහතික කරනු පිණිස, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘතියක වූ සහ විස්තර ඇතුළත් ප්‍රකාශයක් සමග ප්‍රේෂණය ඉදිරිපත් කළ යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා " එකී එක් එක් සුදුසුකම් ලබන බෙද හැරීමකින් සමන්විත වන ලාභාංශය බෙද හරිනු ලබන අවස්ථාවේ දී " යන යෙදුමෙන් ලාභාංශය ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනය හෝ ලාභාංශය ඉදිරි දිනයක දී ගෙවනු ලැබීමට ප්‍රකාශ කරන අවස්ථාවක ඒ ඉදිරි දිනය අදහස් වේ.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියේ (12) වන උපවගන්තියේ " එකඟත්වයකට පත් කරනු ලැබිය යුතු ය ; නැතහොත් තීරණය කරනු ලැබිය යුතු ය " යන වචන වෙනුවට "එකඟත්වයකට පත් කරනු ලැබිය යුතු ය ; නැතහොත් එකී කාලය තුළ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියේ, " 97 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් " යන ඉලක්කම් සහ වචන වෙනුවට, " 97 වන වගන්තියේ (3) වන උප වගන්තියේ හෝ 97 වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් බද්ද ගෙවීම සඳහා නිශ්චිතව සඳහන් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (iii) වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" (iv) 1989 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් විසින් ගෙවනු ලැබ ඒ තක්සේරු වර්ෂයට ඉහතින් ම වූ වර්ෂයේ සිට 33අ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ඉදිරියට ගෙන එනු ලැබූ අත්තිකාරම් සමාගම් බද්දේ යම් අතිරික්තයක් පළමුව ඒ තක්සේරු වර්ෂයේ අගෝස්තු මස 15 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතු ත්‍රෛමාසික වාරිකයෙන් සහ ඒ අතිරික්තයේ යම් ශේෂයක් වෙතොත්, එම ශේෂය ඒ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස පහළොස් වන දින හෝ ඉන් පෙර ගෙවිය යුතු ඊළඟ ත්‍රෛමාසික වාරිකයෙන් යනාදී වශයෙන්, අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය හැකි ය. තවද, එසේ අඩු කරනු ලැබූ මුදල, මේ ඡේදයේ කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි, අගෝස්තු මස පහළොස්වන දින හෝ නොවැම්බර් මස පහළොස්වන දින හෝ යනාදී වශයෙන් ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය." ;

(3) ඒ වගන්තියේ (11) වන උපවගන්තියේ " තැගි බද්ද අදහස් වේ " යන වචන වෙනුවට " තැගි බද්ද සහ යම් සුදුසුකම් ලබන බෙදහැරීමක් සම්බන්ධයෙන් සමාගමක් විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු යම් අත්තිකාරම් සමාගම් බද්ද" යන වචන ආදේශ කිරීමෙන්.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ඈ) මේ පනත යටතේ ගෙවන ලෙස සමාගමකට නියම කරනු ලබන යම් අත්තිකාරම් සමාගම් බද්දක් ; සහ ".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ " 60 වන උපවගන්තියේ (3) වන උපවගන්තියේ " යන ඉලක්කම් සහ වචන වෙනුවට "33ඇ වන වගන්තියේ හෝ 60 වන වගන්තියේ (3) වන උපවගන්තියේ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියේ (ii) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (12) යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළව කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ, භාරයේ හෝ පාලනය යටතේ ඇති යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලබාගැනීමට හෝ පරීක්ෂා කිරීමට අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ බලයක් පැවරෙන විධිවිධාන කිසිවක් මේ වගන්තියේ අඩංගු ලෙස කියවා තේරුම් නොගත යුතු ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ " දේපල " යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" සුදුසුකම් ලබන බෙදා හැරීම " යන්නෙන් වාසික සමාගමක් විසින් ඒ සමාගම අයත්වන වර්ගයේ සමාගම්වලට අදාළ වන අනුප්‍රමාණ වශයෙන් මේ පනතේ දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් උචිත අනුප්‍රමාණය මත ඒ තක්සේරු වර්ෂයට බදු අයකළ හැකි එම සමාගමේ යම් ආදායමක් වේ ද, එම ආදායමෙන්, මුදලින් හෝ මුදල් ගෙවීම සඳහා වූ ඇනවුමක් මාර්ගයෙන් කොටස් හිමියකුට, 1988 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී බෙදා හරිනු ලැබූ මුළු දළ ලාභාංශය හෝ එහි යම් කොටසක් අදහස් වන අතර, ඊට—

(i) 1988 අප්‍රේල් මස 01 වන දිනට පෙරාතුව ඒ සමාගමට උපචිත වූ හෝ ලැබුණු ලාභවලින් හෝ ආදායමෙන් ;

(ii) එම සමාගමේ බදු නිදහස් ආදායමෙන් ; සහ

(iii) ඒ සමාගමට ලැබුණ ලාභාංශවලින් ලැබුණු යම් ආදායමකින්

බෙදා හරිනු ලබන යම් ලාභාංශයක් ඇතුළත් නොවේ.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයේ II වන කොටසේ " 1979 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1979 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන නමුත් 1988 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ III වන කොටසේ " 1979 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1979 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන නමුත් 1988 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපලේඛනයේ IV වන කොටසේ (ආ) ඡේදයේ " 1982 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1982 අප්‍රේල් මස 01 වන දින හෝ ඊට පසු ආරම්භ වන නමුත් 1988 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසාන වන " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ උපලේඛනයේ IV වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

" IV අ වන කොටස

කුඩා සමාගම්

1988 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් ම සඳහා ආදායම් බදු අනුප්‍රමාණය—

(1) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහසක් නොඉක්මවන්නේ නම් සියයට 33 1/3.

(2) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස ඉක්මවන නමුත් රුපියල් තුන් ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් තුනක් නොඉක්මවන විටක බද්ද—

(i) රුපියල් දෙලක්ෂ පනස් දහසින් සියයට 33 1/3 සමාන මුදලක් ; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය සඳහා සමාගමේ බදු අය කළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස ඉක්මවන්නේ යම් මුදලකින් ද ඒ මුදලේ

එකතුව විය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය මෙයින් එකතු කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය වශයෙන් බල සහිත විය යුතු ය :—

" හත්වන උපලේඛනය

(33 අ (1) වන වගන්තිය)

1988 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක්ම සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි වන්නේ ය :—

(i) කුඩා සමාගමක් විසින් කරන ලද සුදුසුකම් ලබන සෑම බෙදා හැරීමක මුදලට සමාන මුදලක් මත සියයට 25

(ii) නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරන ලද සුදුසුකම් ලබන සෑම බෙදා හැරීමක මුදලට සමාන මුදලක් මත සියයට 33 1/3

(iii) කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තු ගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරන ලද සුදුසුකම් ලබන සෑම බෙදාහැරීමක මුදලට සමාන මුදලක් මත සියයට 50.".

## 1988 අංක 42 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1988 අංක 42 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) (ඊ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊඊ) සේවායෝජකයන් විසින් මෙම පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් හෝ අනුව අදාළ වාර්තා සැපයීමට අපොහොසත් වූ නැතහොත් ඌනතා සහිත හෝ සාවද්‍ය වාර්තා සැපයීම, නිසා පෞද්ගලික ගිණුම්වලට බැර කළ නොහැකි මේ පනත යටතේ ලැබුණු දායක මුදල් බැර කළ යුතු අවිනිශ්චිත ගිණුමක් පවත්වා ගෙන යා යුතු අතර, මෙම ඡේදය බලාත්මක වන දින එවැනි දායක මුදල් සම්බන්ධයෙන් අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකට අයත් සියලු මුදල් මූල්‍ය මණ්ඩලය විසින්, මෙම ඡේදය මගින් නිර්මිත අවිනිශ්චිත ගිණුමට පැවරිය යුතු ය.

ඉහත සඳහන් පරිදි අදාළ වාර්තා සැපයීමට අපොහොසත් වූ සේවායෝජකයකු විසින් ස්වකීය සේවකයා සම්බන්ධයෙන් නිවැරදි වාර්තා සපයනු ලබන විට හා එවැනි අවස්ථාවක, මූල්‍ය මණ්ඩලය විසින් අවිනිශ්චිත ගිණුමෙහි පවත්නා මුදල් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමට පැවරිය යුතු ය.

මෙම ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි අවිනිශ්චිත ගිණුමෙන් පෞද්ගලික ගිණුමකට මුදල් කිසිවක් පවරනු ලබන අවස්ථාවක, එම පැවරීමේ දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලයක් නොඉක්මවන පරිදි, එම මුදල් ලැබුනු දින සිට එම මුදල් පෞද්ගලික ගිණුමට පවරනු ලබන දින දක්වා වූ කාලය සඳහා එම මුදලට පොලියක් ගෙවිය යුතු අතර, පොලී අනුපාතය මෙම පනතේ 14 (1) වන වගන්තිය අනුව තීරණය කළ යුතු ය ; තව ද පොලී අනුපාතය, එය ගෙවනු ලබන වර්ෂය සඳහා අදාළ විය යුතු ය ;" තව ද,

(ආ) (ඔඔ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඔඔඔ) 22 වන වගන්තිය යටතේ වූ නිවාස ණයක් මත ලැබිය යුතු හිඟ මුදල් කිසිවක්, ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගෙන් ලැබෙන නියමයක් අනුව සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමෙන් අඩුකර ගතයුතු අතර, එසේ අඩුකර ගත් මුදල අදාළ ණය දෙන ආයතනයට පැවරිය යුතුය ;".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ අගට පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" එසේ වුවද තවදුරටත්, 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් හෝ 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් හෝ (401 වන අධිකාරිය වූ) ජාතික නිවාස පනත යටතේ පිහිටුවනු ලැබූ සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් හෝ 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව විසින් හෝ (397) වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව විසින් හෝ 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් හෝ (124 වන අධිකාරය වූ) සමුපකාර සමිති ආඥාපනත යටතේ පිහිටුවන ලද විවිධ සේවා සමුපකාර සමිති විසින් හෝ නිවාස ඉදිකිරීම් කාර්ය සඳහා දෙන ලද ණයකට ප්‍රති පක්ෂව, අරමුදලේ සාමාජිකයකු විසින්, අරමුදලේ ස්වකීය පෞද්ගලික ගිණුමේ බැරට පවත්නා දායක මුදල්, එකී ණය දෙන ආයතන අතුරින් යම් ආයතනයකට පැවරීම හෝ වැය බරක් කිරීම හෝ කළ හැකි ය.

කෙසේ වුව ද, පවුලක එක සාමාජිකයකුට වඩා වැඩි සංඛ්‍යාවක් අරමුදලේ සාමාජිකයන් වන අවස්ථාවක, එසේ සාමාජිකයන් වන එම පවුලේ සියලුම සාමාජිකයන් විසින් අරමුදලේ සාමාජිකයන් වශයෙන් ඉහත කී පරිදි ගන්නා ලද නිවාස ණයකට ප්‍රතිපක්ෂව, ස්වකීය පෞද්ගලික ගිණුම්වල බැරට පවත්නා දායක මුදල්වල මුළු එකතු මුදල පැවරීම හෝ වැය බරක් කිරීම කළ හැකි ය.

ණය මුදලක වාරිකයක් ආපසු ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, මෙම පනතේ 23 වන හා 24 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුවද ඒ ගැන නොතකා, සේවකයා විසින් එසේ පැහැර හරිනු ලැබූ වාරිකය මත උපචිත වී ඇති පොලිය ද සමග ඒ වාරිකය, අදාළ ණය දෙන ආයතන විසින් ඒ බව දැනුම් දෙනු ලැබීමෙන් පසුව, එම සේවකයාගේ පෞද්ගලික ගිණුමෙහි හෝ සේවකයන් පෞද්ගලික ගිණුම්වල පවත්නා මුදල්වලින් එම ණය දෙන ආයතනවලට කොමසාරිස්වරයා විසින් පියවිය යුතු ය.

ණය මුදලක වාරික ගෙවීම සේවානියුක්තයකු විසින් පැහැර හැරීම පිළිබඳව අදාළ ණය දෙන ආයතනයන් විසින් කොමසාරිස්වරයා වෙත දැනුම්දීම, එක් එක් ලිත් වර්ෂය අග දී කරනු ලැබිය යුතු ය.

අවස්ථාවෝචිත පරිදි, 23 වන හෝ 24 වන වගන්තිය යටතේ වූ අර්ථ ලාභයක් ගෙවනු ලබන කල්හි, ඉහත කී පරිදි ගනු ලැබූ නිවාස ණයක් හේතු කොට ගෙන හිඟ මුදල් කිසිවක් ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එම සාමාජිකයාගේ හෝ සාමාජිකයන්ගේ බැරට ඔහුගේ හෝ ඔවුන්ගේ පෞද්ගලික ගිණුම්වල පවත්නා මුදල්වලින් එම හිඟ මුදල් අඩු කොට, එසේ මුදල් අඩු කිරීමකට ඉක්බිතිවම, එසේ අඩුකර ගනු ලැබූ මුදල් අදාළ ණය දෙන ආයතනවලට පවරන ලෙස කොමසාරිස්වරයා විසින් මූල්‍ය මණ්ඩලයට නියම කළ හැකි ය.

22 වන වගන්තියේ කාර්යය සඳහා " පවුල " යන්නෙන් අරමුදලේ සාමාජිකයෙකු, ඔහුගේ භාර්යාව හෝ ඇයගේ ස්වාමි පුරුෂයා, සහ ඔහුගේ හෝ ඇයගේ දරුවන් අදහස් වේ.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " මෙම වගන්තියේ මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර " යන වචන වෙනුවට " මෙම වගන්තියේ මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර හා 22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම්වලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ '' එවිට එම මුදල '' යන වචන වෙනුවට '' එවිට 22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම්වලට යටත්ව ; එම මුදල '' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) උපවගන්තියේ '' එම මුදල '' යන වචන වෙනුවට '' 22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම්වලට යටත්ව, එම මුදල '' යන වචන ආදේශ කිරීමෙන් ;''.

**6.** 31 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතුය :—

'' වාර්තා සැපයීමට අපොහොසත් වන සේවා යෝජකයන්ට අධිභාරයක් පැනවීම.

31අ. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව යම් දායක මුදලක් සමග වාර්තාවක් සැපයීමට නියමිත යම් සේවා යෝජකයකු නියමිත කාලය ඇතුළත එම වාර්තාව සැපයීමට අපොහොසත් වන නැතහොත් සාවද්‍ය හෝ ඌනතා සහිත වාර්තාවක් සපයා ඇති අතර, තත් කාලය සඳහා එම වාර්තාව සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි කරුණු දැක්වීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, නිසි පරිදි සම්පූර්ණ කරන ලද වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබිය යුතු අවසාන දින හෝ ඊට පෙර සිට එය මහ බැංකුවට ලැබුණ දින දක්වා සෑම පූර්ණ මාසයක් හෝ එහි කොටසක් සඳහා ම එම දායක මුදලින් සියයට එක බැගින් වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඔහු යටත් විය යුතු ය.''.

# 1988 අංක 57 දරන බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සි පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

**බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය පිහිටුවීමේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවට ස්වකීය වගකීම ඉටු කළ හැකිවීම සඳහා වූ පනතකි.**

පාර්ශ්වික අයෝජන ඇප සහතික ඒජන්සිය පිහිටුවීමේ සම්මුතියට 1986 ඔක්තෝබර් මස 03 වන දින ශ්‍රී ලංකාව අත්සන් තබන පාර්ශ්වකරුවකු වූ හෙයින් ද :

ඒ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවට ස්වකීය වගකීම් ඉටු කළ හැකි වීම සඳහා නෛතික විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වන හෙයින් ද :

**1.** මේ පනත, 1988 අංක 57 දරන බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සි පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින්මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය පිහිටුවීමේ සම්මුතිය සහ මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති එහි විධිවිධාන ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක විය යුතු දිනය ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමය මගින් සහතික කරනු ලබන දිනයෙහි සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

**2.** සම්මුතිය මගින් පිහිටුවන ලද (මෙහි මින්මතු "ඒජන්සිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය වෙත සම්මුතියේ 7 වන ව්‍යවස්ථාවේ (i) වන ඡේදය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් ඉටු කිරීම පිණිස අවශ්‍යවන ගණුදෙනු කළ නොහැකි සහ පොළී රහිත පොරොන්දු නෝට්ටු සහ හෝ සමාන බැඳීම්, අමාත්‍යවරයා විසින් ආණ්ඩුව වෙනුවෙන් ඇති කොට ඒජන්සිය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

**3.** ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන්—

(අ) සම්මුතියේ 7 වන ව්‍යවස්ථාවේ (i) වන සහ (ii) වන ඡේද යටතේ ශ්‍රී ලංකාව විසින් ඒජන්සිය වෙත ගෙවිය යුතු වන ආරම්භක දායක මුදල ගෙවීම පිණිස කලින් කල අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන් ;

(ආ) සම්මුතියේ වෙනත් විධිවිධානයක් යටතේ ශ්‍රී ලංකාව විසින් ඒජන්සිය වෙත කලින් කල ගෙවිය යුතු වන මුදල් ප්‍රමාණයන් ; සහ

(ඇ) මේ පනතේ 2 වන වගන්තිය යටතේ ඒජන්සිය සම්බන්ධයෙන් ඇති කරන ලද හෝ එයට නිකුත් කරන ලද හෝ යම් නෝට්ටු හෝ බැඳීම් හෝ නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන්

ගෙවනු ලැබිය යුතු ය.

**4.** (1) 3 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීමට අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයන් සැපයීමේ කාර්යය සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා සුදුසුයයි සිතන ආකාරයකට, පොළී නොදරන්නා වූ ද ගණුදෙනු කළ නොහැකි වූ ද නෝට්ටු හෝ බැඳීම් නිර්මාණය කර, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කිරීම මගින්, ශ්‍රී ලංකාණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට ඒ අමාත්‍යවරයාට මෙයින් බලය පවරනු ලැබේ.

(2) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධි විධාන ප්‍රකාර, නිර්මාණ කර නිකුත් කරන ලද යම් නෝට්ටු හෝ බැඳීම් කිසිවක් භාර ගැනීමට සහ දැරීමට, ශ්‍රී ලංකා මහ බැංකුවට මෙයින් බලය පවරනු ලැබේ.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිර්මාණය කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරනු ලබන යම් නෝට්ටු හෝ බැඳීම් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය සියළු මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

**5.** ඒජන්සිය වෙතින්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් හෝ—

(අ) සම්මුතියේ 10 වන ව්‍යවස්ථාව යටතේ ආපසු ගෙවීමක් ලෙස;

(ආ) සම්මුතියේ 27 වන ව්‍යවස්ථාව යටතේ ශුද්ධ ආදායම බෙදා දීමක දී;

(ඇ) සම්මුතියේ 55 වන ව්‍යවස්ථාව යටතේ ඒජන්සිය ගණුදෙනු පියවා වසා දැමීමක දී; සහ

(ඈ) සම්මුතියේ වෙනත් යම් විධිවිධානයක් යටතේ, ලබාගත් සියළු මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

**6.** සම්මුතියේ 1 වන, 44 වන, 45 වන, 46 වන, 47 වන, 48 වන සහ 50 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ශ්‍රී ලංකාවෙහි නීති බලය දැරිය යුතු අතර, ඒ අනුව—

(අ) ඉහත කී 1 වන ව්‍යවස්ථාවෙහි නිශ්චිතව සඳහන් තත්ත්වය සහ ශක්‍යතාව ඒජන්සියට ශ්‍රී ලංකාවෙහි තිබිය යුතුය; තවද,

(ආ) ඉහත කී 44 වන, 45 වන, 46 වන, 47 වන සහ 48 වන ව්‍යවස්ථාවල නිශ්චිතව සඳහන් භුක්තීන් සහ වරප්‍රසාද ඉහත කී 50 වන ව්‍යවස්ථාවට යටත්ව, ඒජන්සියට සහ එහි නිලධරයන්ට ශ්‍රී ලංකාවේ තිබිය යුතුය.

**7.** ශ්‍රී ලංකා මහ බැංකුව, සම්මුතියේ 37 වන ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සඳහා ඒජන්සියේ ශ්‍රී ලංකාවෙහි භාරකරු විය යුතු යයි ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඒ ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලැබූ විට, ශ්‍රී ලංකා මහ බැංකුව එසේ භාරකරු විය යුතු ය.

**8.** මේ පනතෙහි ''මහ බැංකුව'' යන්නෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 5 වන වගන්තියෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

## උපලේඛනය (I වන වගන්තිය)

### පූර්විකාව

**ගිවිසුමට එළඹෙන රාජ්‍යයෝ**

ආර්ථික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගිතාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව සහ එම සංවර්ධනය උදෙසා පොදුවේ විදේශ ආයෝජනවල සහ විශේෂයෙන් ම විදේශ පෞද්ගලික ආයෝජනවල දායකත්වය පිහිටාධාර කර ගැනීම සැළකිල්ලට ගෙන :

වාණිජ නොවන අවදානම්වලට අදාළ දුෂ්කරතා සැහැල්ලු කිරීම මගින් සංවර්ධනය වන රටවලට විදේශ ආයෝජන ගලා ඒම වඩාත් පහසු වී වැඩිදුරටත් උනන්දු කරවන බව පිළිගනිමින් :

සංවර්ධනය වන රටවල සංවර්ධනය අවශ්‍යතාවලට, ප්‍රතිපත්තිවලට සහ අරමුණු වලට ගැලපෙන්නා වූ කොන්දේසි යටතේ, විදේශ ආයෝජනවලට සැලකීමේ දී සාධාරණ සහ ස්ථාවර ප්‍රමිතියක පදනම මත නිෂ්පාදන කාර්යයන් සඳහා ප්‍රාග්ධනය සහ තාක්ෂණය සංවර්ධනය වන රටවලට ගලා ඒම නංවාලීමේ අභිලාෂයෙන් :

ජාතික සහ ප්‍රාදේශීය ආයෝජනවලට ඇප සහතික කිරීමේ වැඩ පිළිවෙලවල් සහ වාණිජ නොවන අවදානම් පිළිබඳ පෞද්ගලික රක්ෂකයන් ඌනපූරණය කිරීම පිණිස, විදේශ ආයෝජන උනන්දු කිරීමේදී බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය විසින් ඉටු කරනු ලැබිය හැකි වැදගත් කාර්ය භාරය ඒත්තු ගෙන :

එම ඒජන්සිය විසින්, එය ඉල්ලා සිටිය හැකි ප්‍රාග්ධනය පිටුවහල් කර නොගෙන එහි වගකීම හැකිතාක් දුරට ඉටු කරනු ලැබිය යුතු බව සහ ආයෝජන තත්ත්වයන් දිගටම වර්ධනය කිරීම මගින්, එවැනි අරමුණක් ඉටු වන බව වටහා ගෙන පහත දක්වෙන පරිදි එකහත්වයකට එළඹුනහ :—

### 1 වන පරිච්ඡේදය

### පිහිටුවීම, තත්ත්වය, කාර්යයන් සහ අර්ථකථන

**1 වන ව්‍යවස්ථාව : ඒජන්සිය පිහිටුවීම සහ එහි තත්ත්වය**

(අ) (මෙහි මින් මතු "ඒජන්සිය" යනුවෙන් හඳුන්වනු ලබන) බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය මෙයින් පිහිටුවනු ලැබේ.

(ආ) ඒජන්සියට පූර්ණ නෛතික පුද්ගලභාවය සතු විය යුතු අතර, විශේෂයෙන් ම,—

(i) ගිවිස ගැනීමේ ;

(ii) චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමේ සහ බැහැර කිරීමේ ; සහ

(iii) නඩු කටයුතු පැවරීමේ

ශක්නුතාව එයට තිබිය යුතුය.

**2 වන ව්‍යවස්ථාව : අරමුණ සහ අභිමතාර්ථ**

ඒජන්සියේ අරමුණ වන්නේ, (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන ) ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙහි, ජාත්‍යන්තර මුදල් සංස්ථාවෙහි සහ වෙනත් ජාත්‍යන්තර සංවර්ධන මුදල් ආයතනවල කාර්යයන්ට පරිපූරක වන පරිදි, සාමාජික රටවල් අතර, විශේෂයෙන් ම සංවර්ධනය වන සාමාජික රටවලට නිෂ්පාදන කාර්යයන් සඳහා ආයෝජන ගලා ඒම උනන්දු කරලීමයි.

ඒජන්සියේ අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා, ඒජන්සිය විසින්—

(අ) වෙනත් සාමාජික රටවල්වලින් යම් සාමාජික රටකට ගලා එන ආයෝජන පිළිබඳ වූ වාණිජ නොවන අවදානම් සම්බන්ධයෙන් සමූහ රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය ඇතුළුව ඇප සහතික නිකුත් කිරීම ;

(ආ) සංවර්ධනය වන සාමාජික රටවල් වෙත සහ ඒ රටවල් අතර, ආයෝජන ගලා ඒම නංවාලීම සඳහා සුදුසු අනුපූරක කටයුතු කර ගෙන යාම ; සහ

(ඇ) එහි අරමුණු තවදුරටත් ඉෂ්ඨ කර ගැනීමෙහි ලා අවශ්‍ය වන්නා වූ හෝ යෝග්‍ය වන්නා වූ වෙනත් ආනුෂංගික බලතල ක්‍රියාත්මක කිරීම

කරනු ලැබිය යුතුය.

ඒජන්සිය එහි සියළු තීරණවලදී මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන මගින් මෙහෙයවනු ලැබිය යුතුය.

**3 වන ව්‍යවස්ථාව : අර්ථ නිරූපන**

මේ සම්මුතියේ කාර්යයන් සඳහා—

(අ) "සමාජික" යන්නෙන්, 61 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මුතිය බලාන්විත වන්නේ යම් රාජ්‍යයක් වෙනුවෙන් ද, ඒ රාජ්‍යය අදහස් වේ.

(ආ) "ධාරක රට" හෝ "ධාරක ආණ්ඩුව" හෝ යන්නෙන්, ඒජන්සිය විසින් ඇප සහතික කරන ලද නැතහොත්, ප්‍රතිරක්ෂණය කරන ලද හෝ ඇප සහතික කිරීම නැතහොත් ප්‍රතිරක්ෂණය සඳහා සැලකිල්ලට ගන්නා ලද හෝ ආයෝජනයක් කරනු ලැබිය යුත්තේ යම් සාමාජික රටක, එහි ආණ්ඩුවක හෝ සාමාජික රටක යම් පොදු අධිකාරයක 66 වන ව්‍යවස්ථාවේ අර්ථ නිරූපිත යම් ප්‍රදේශයක ද ඒ ප්‍රදේශය අයත් සාමාජික රට, එහි ආණ්ඩුව හෝ එහි පොදු අධිකාරිය හෝ අදහස් වේ.

(ඇ) "සංවර්ධනය වන සාමාජික රටක්" යන්නෙන් මෙහි අ උපලේඛනයෙහි එවැනි සාමාජික රටක් ලෙස ලැයිස්තු ගත කරන ලද සාමාජික රටක් අදහස් වන අතර, මෙම උපලේඛනය 30 වන ව්‍යවස්ථාවෙහි සඳහන් (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාව විසින් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(ඈ) "විශේෂ බහුතර ඡන්දය" යන්නෙන් ඒජන්සියේ ප්‍රාග්ධන ස්කන්ධයෙහි සියයට පනස් පහකට නොඅඩු ප්‍රමාණයක දායක මුදල් ගෙවනු ලැබූ කොටස් නියෝජනය කෙරෙන, මුළු ඡන්ද බලයෙන් තුනෙන් දෙකකට නොඅඩු පක්ෂව දෙනු ලබන ඡන්දයක් අදහස් වේ ;

(ඉ) ''නිදහස් ලෙස භාවිතා කළ හැකි ව්‍යවහාර මුදලක්'' යන්නෙන්,—

(i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් කලින් කල එවැනි ව්‍යවහාර මුදලක් ලෙස නම් කරන ලද යම් ව්‍යවහාර මුදලක් සහ (ii) 30 වන ව්‍යවස්ථාවෙහි සඳහන් (මෙහි මින් මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විමසා, එම ව්‍යවහාර මුදල තිබෙන රටෙහි අනුමැතිය ඇතිව සම්මුතියේ කාර්යයන් සඳහා නම් කරනු ලබන්නා වූද, නිර්බාධිතව ලබා ගත හැකි සහ ඵලදායි ලෙස භාවිතා කළ හැකි වූද වෙනත් යම් ව්‍යාවහාර මුදලක් අදහස් වේ.

## 11 වන පරිච්ඡේදය

## සාමාජිකත්වය සහ ප්‍රාග්ධනය

**4 වන ව්‍යවස්ථාව : සාමාජිකත්වය**

(අ) නියෝජ්‍යායතනයේ සාමාජිකත්වය, බැංකුවෙහි සියළු සාමාජිකයින් සහ ස්විට්සර්ලන්තය වෙත විවෘතව තිබිය යුතුය.

(ආ) මෙහි 'අ' උපලේඛනයෙහි ලැයිස්තුගත කරනු ලැබ ඇත්තා වූ ද, 1987 ඔක්තෝබර් මස 30 වන දින හෝ ඒ දිනයට පෙර හෝ මේ සම්මුතියෙහි පාර්ශ්වකරුවන් වන්නා වූද රාජ්‍යයන් ආරම්භක සාමාජිකයන් විය යුතු ය.

**5 වන ව්‍යවස්ථාව : ප්‍රාග්ධනය**

(අ) ඒජන්සියේ අනුමත ප්‍රාග්ධන ස්කන්ධය විශේෂ ගැණුම් හිමිකම් බිලියන එකක් (වි.ගැ.හි. 1,000,000,000 ක්) විය යුතු ය. එක් කොටසකට වි. ගැ. හි. 10,000 කට සමාන වටිනාකම ඇති කොටස් 100,000 කට ප්‍රග්ධන ස්කන්ධය බෙදනු ලැබිය යුතු අතර, ඒවා සාමාජිකයන්ගේ සහභාගිවීම සඳහා තිබිය යුතු ය. ප්‍රාග්ධන ස්කන්ධය සම්බන්ධයෙන් සාමාජිකයන්ගේ සියළු ගෙවීම් වගකීම්, 1981 ජනවාරි මස 1 වන දින සිට 1985 ජූනි මස 30 වන දිනය දක්වා කාල සීමාව සඳහා එක්සත් රාජධානි ඩොලරයට අනුව වි. ගැ. හි. හි සාමාන්‍ය වටිනාකම පදනම් කරගෙන බේරුම් කරනු ලැබිය යුතු ය. එම වටිනාකම වි. ගැ. හි. එකකට එක්සත් රාජධානි ඩොලර් 1,082 ක් වන්නේ ය.

(ආ) නව සාමාජිකයකු ඇතුළත් කර ගනු ලැබූ විට 6 වන ව්‍යවස්ථාව ප්‍රකාර ඒ සාමාජිකයා විසින් සහභාගී විය යුතු කොටස් මුදල් සැලසීම සඳහා එවිට අනුමත කොටස් ප්‍රමාණවත් නොවන විට එසේ ප්‍රමාණවත් වන දුරට ප්‍රාග්ධන ස්කන්ධය වැඩි විය යුතු ය.

(ඇ) සභාව විසින්, විශේෂ බහුතර ඡන්දයක් මගින්, ඕනෑම අවස්ථාවකදී ඒජන්සියේ ප්‍රාග්ධන ස්කන්ධය වැඩි කරනු ලැබිය හැකිය.

**6 වන ව්‍යවස්ථාව : කොටස් සඳහා සහභාගි වීම**

ඒජන්සියේ එක් එක් ආරම්භක සාමාජිකයා විසින්, මෙහි 'අ' උපලේඛනයේ ස්වකීය නාමය ඉදිරියේ දක්වා ඇති, ප්‍රාග්ධන ස්කන්ධයෙන් කොටස් සංඛ්‍යාවට සමාන වන පරිදි සහභාගි විය යුතු ය. වෙනත් එක් එක් සාමාජිකයා සභාව විසින් තීරණය කරනු ලබන නියම හා කොන්දේසි මත ප්‍රාග්ධන ස්කන්ධයෙන් එවැනි කොටස් සංඛ්‍යාවකට සහභාගි විය යුතු අතර, එය කිසිම හේතුවක් නිසාවත් සමාන මුදලට අඩු නිකුත් කිරීමේ මිළකට නොවිය යුතු ය. කිසිම සාමාජිකයෙකු කොටස් පනහකට අඩු සංඛ්‍යාවකට සහභාගි නොවිය යුතුය. අනුමත කරන ලද ප්‍රාග්ධන ස්කන්ධයෙහි අතිරේක කොටස්වලට සාමාජිකයන් විසින් සහභාගි විය හැකි රීති, සභාව විසින් නියම කරනු ලැබිය හැකිය.

**7 වන ව්‍යවස්ථාව : සහභාගි ප්‍රාග්ධනය බෙදීම සහ ඇරයුම**

එක් එක් සාමාජිකයාගේ ආරම්භක සහභාගි මුදල පහත දක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතු ය:—

(i) එම සාමාජිකයා සම්බන්ධයෙන් මෙම සම්මුතිය බලාත්විත වූ දින සිට දින අනුවක් ඇතුළත 8 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තියේ නියම කර ඇති පරිදි එක් එක් කොටසෙහි වටිනාකමින් සියයට දහයක් ද, ඊට අමතරව, ඒජන්සියේ වගකීම් ඉටු කිරීම පිණිස, මණ්ඩලයේ තීරණයක් ප්‍රකාර මාරුකර ගැනීම පිණිස, ගණුදෙනු කළ නොහැකි, පොළී නොදරන පොරොන්දු නෝට්ටු හෝ ඒ සමාන බැඳීම්වල හෝ ස්වරූපයේ සියයට දහයක් ද ගෙවනු ලැබිය යුතු ය.

(ii) ඉතිරිය ස්වකීය වගකීම් ඉටු කිරීම පිණිස ඒජන්සියට අවශ්‍ය වන විට, ඒජන්සිය විසින් ඇරයුම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

**8 වන ව්‍යවස්ථාව : කොටස් සඳහා සහභාගිවීමේ ගෙවීම**

(අ) 7 (1) වන ව්‍යවස්ථාව යටතේ තමන් විසින් ගෙවනු ලැබිය යුතු සහභාගි මුදලෙහි මුදලින් ගෙවිය යුතු කොටසින් සියයට විසිපහක් දක්වා, සංවර්ධනය වන සාමාජික රටවල් විසින් තම ව්‍යාවහාර මුදලින් ගෙවනු ලැබිය හැකි වීම හැරුණු විට, සහභාගිවීමේ ගෙවීම නිර්බාධිතව භාවිතා කරනු ලැබිය හැකි ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබිය යුතුය.

(ආ) නොගෙවා ඇති සහභාගි මුදල්වලින් කිසියම් කොටසක් ගෙවන ලෙස කරනු ලබන ඇරයුම්, සියලු කොටස් සම්බන්ධයෙන් ඒකාකාර විය යුතු ය.

(ඇ) ඇරයුමක දී ඒජන්සිය වෙත ලැබෙන මුදල, එම ඇරයුම් කිරීමේ අවශ්‍යතාව ඇති කළ වගකීම ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම්, ඒජන්සිය වෙත ලැබෙන මුදලෙහි එකතුව එම වගකීම ඉටු කිරීමට ප්‍රමාණවත් වන තුරු නොගෙවා ඇති සහභාගි මුදල සම්බන්ධයෙන් ඒජන්සිය විසින් නැවත නැවතත් වැඩිදුර ඇරයුම් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(ඈ) කොටස් මුදල් සම්බන්ධයෙන් වගකීම, නිකුත් මිළෙහි නොගෙවන ලද කොටසට සීමා විය යුතු ය.

**9 වන ව්‍යවස්ථාව : ව්‍යවහාර මුදල් තක්සේරු කිරීම**

එක් ව්‍යවහාර මුදලක වටිනාකම, වෙනස් ව්‍යවහාර මුදලකින් ප්‍රමාණ කිරීමට මේ සම්මුතියේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ කවර අවස්ථාවක වුවද, එම වටිනාකම ඒජන්සිය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විමසීමෙන් පසුව, සාධාරණ ලෙස තීරණය කරනු ලැබිය යුතු ය.

**10 වන ව්‍යවස්ථාව : ආපසු ගෙවීම්**

(අ) දායක ප්‍රාග්ධනය මත ඇරයුම් අනුව ගෙවන ලද මුදල්,—

(i) එම ඇරයුම කරන ලද්දේ ඇප සහතිකවීමේ හෝ ප්‍රතිරක්ෂණ හෝ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් හිමිකම් පෑමක් ගෙවීම සඳහා නම් සහ, ඉන් ඉක්බිතිව එම ගෙවීම, නිර්බාධිතව භාවිතා කළ හැකි ව්‍යවහාර මුදලින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ඒජන්සිය විසින් අය කර ගනු ලැබ ඇත්නම් ; හෝ

(ii) එම ඇරයුම කරන ලද්දේ, සාමාජිකයෙකු විසින් ගෙවීම සම්බන්ධයෙන් කරන ලද පැහැර හැරීමක් නියා නම් සහ, ඉන් ඉක්බිතිව ඒ සාමාජිකයා විසින්, එම ගෙවීම පැහැර හැර ඇති මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ පියවනු ලැබ ඇත්නම් ; හෝ

(iii) ඒ මුදල සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ඒජන්සියේ ආදායමෙන් ආපසු ගෙවීමට ඒජන්-සියේ මුදල් තත්ත්වය අනුව අවස්ථාව සැලසේ යයි, සභාව විශේෂ බහුතර ඡන්දයක් මගින් තීරණය කරනු ලබයි නම් ; හෝ

ඒ ප්‍රමාණයට පහසු හැකි ඉක්මණින් ඒජන්සිය විසින් සාමාජිකයන් වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ සාමාජිකයකු වෙත කරනු ලබන යම් ආපසු ගෙවීමක්, එම ආපසු ගෙවීමට පෙරාතුව කරන ලද ඇරයුම් ප්‍රකාර, ඒ සාමාජිකයා විසින් ගෙවන ලද මුදල මුළු ගෙවීම්වලට දරන අනුපාතය අනුව නිර්බාධිතව භාවිතා කළ හැකි ව්‍යවහාර මුදලින් කරනු ලැබිය යුතු ය.

(ඇ) සාමාජිකයකු වෙත මේ ව්‍යවස්ථාව යටතේ ආපසු ගෙවන ලද මුදල්වලට සමාන ප්‍රමාණය, 7 (ii) වන ව්‍යවස්ථාව යටතේ සාමාජිකයාගෙන් ඇරයුම් කර සිටිය හැකි ප්‍රාග්ධන වගකීමෙහි කොටසක් විය යුතු ය.

## III වන පරිච්ඡේදය

## මෙහෙයවුම්

**11 වන ව්‍යවස්ථාව : ආවරණහිත අවදානම්**

(අ) පහත දක්වෙන අවදානම් වර්ග එකකින් හෝ ඊට වැඩි ගණනකින් උද්ගත වන අලාභවලට එරෙහිව, ඒජන්සිය විසින් පහත (ආ) සහ (ඇ) වගන්තිවල විධිවිධානවලට යටත් ව, යෝග්‍ය ආයෝජන සම්බන්ධයෙන් ඇප සහතික කරනු ලැබිය හැකි ය.

(i) **ව්‍යවහාර මුදල් මාරු කිරීම.**—ව්‍යවහාර මුදල් දරන්නා විසින්, එම මුදල් මාරු කිරීම සඳහා කරනු ලැබූ ඉල්ලීමක් සම්බන්ධයෙන් ධාරක ආණ්ඩුව සාධාරණ කාල සීමාවක් ඇතුළත කටයුතු කිරීම පැහැර හැරීමක් ඇතුළුව, ධාරක රටෙහි ව්‍යවහාර මුදල නිර්බාධිතව භාවිතා කළ හැකි ව්‍යවහාර මුදලකට හෝ ඇප සහතිකය දරන්නාට පිළිගත හැකි වෙනත් ව්‍යවහාර මුදලකට හෝ ධාරක රටින් පිටත මාරු කිරීම සම්බන්ධයෙන් ධාරක ආණ්ඩුව විසින් පනවන ලද යම් සීමා ;

(ii) **අහිමි කිරීම සහ සමාන පියවරවල්.**—ස්වකීය දේශවල ආර්ථික ක්‍රියාවලිය විධිමත් කිරීමේ කාර්යය සඳහා ආණ්ඩු විසින් සාමාන්‍යයෙන් ගනු ලබන්නා වූ ද පොදු අදාළ වීමක් ඇත්තා වූද වෙනස් ලෙස සැලකීමක් කරනු නොලබන පියවරවල් හැර ඇප සහතිකයක් දරන්නාට තම ආයෝජනයෙහි අයිතිය හෝ පාලනය හෝ විසින් සැලකිය යුතු ප්‍රතිලාභයක් හෝ අහිමි කිරීමේ ප්‍රතිඵලය තිබෙන, ධාරක ආණ්ඩුවට දෝෂය පැවරිය හැකි යම් ව්‍යවස්ථාදායක ක්‍රියාවක් හෝ පරිපාලනමය ක්‍රියාවක් හෝ අත්හැරීමක් ;

**(iii) ගිවිසුම් කඩ කිරීම**

(අ) ඇප සහතිකයක් දරන්නාට, ප්‍රතික්ෂේප කිරීම හෝ කඩ කිරීම හෝ සම්බන්ධයෙන් තම හිමිකම් පෑම තීරණය කර ගැනීම සඳහා අධිකරණ හෝ බේරුම්කාර මණ්ඩලයක පිහිට නොතිබෙන්නාවූ ; හෝ

(ආ) ඒජන්සියේ නියෝග ප්‍රකාර ඇප සහතික ගිවිසුම්වල නියම කර ඇති පරිදි වූ සාධාරණ කාල සීමාවක් ඇතුළත එවැනි මඩුල්ලක් විසින් තීරණයක් දෙනු නොලබන්නා වූ ; හෝ

(ඇ) එවැනි තීරණයක් ක්‍රියාත්මක කළ නොහැකි වූ හෝ විට ඇප සහතිකයක් දරන්නා සමග ඇති ගිවිසුමක් සම්බන්ධයෙන් ධාරක ආණ්ඩුව විසින් කරනු ලැබූ යම් ප්‍රතික්ෂේප කිරීමක් හෝ කඩකිරීමක් ; සහ

**(iv) යුද්ධය සහ අභ්‍යන්තර කලබල.**—66 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි, මේ සම්මුතියට අදාළ වන ධාරක රටෙහි යම් ප්‍රදේශයක යම් හමුදා ක්‍රියාවක් හෝ අභ්‍යන්තර කලබලයක්.

(ඇ) ආයෝජන සහ ධාරක රට විසින් එක්ව කරනු ලබන ඉල්ලීමක් මත ඉහත (අ) වගන්තියෙහි සඳහන් අවදානම් නොවන, නිශ්චිත අවදානම් සඳහා මේ ව්‍යවස්ථාව යටතේ ආවරණය ව්‍යාප්ත කිරීම, මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයෙන් කරනු ලැබිය හැකි නමුත්, කිසිදු අවස්ථාවක මෙය ව්‍යවහාර මුදල් අවප්‍රමාණ කිරීමේ හෝ, එම මුදල්වල අගය අඩුවීමේ හෝ අවදානම කෙරෙහි අදාළ නොවිය යුතු ය.

(ඈ) පහත දැක්වෙන කරුණු නිසා උද්ගත වන අලාභ ආවරණය නොවිය යුතු ය—

(i) ඇප සහතිකය දරන්නා එකඟ වී ඇත්තා වූ හෝ ඔහු වගකිව යුතුව සිටින්නා වූ හෝ ධාරක ආණ්ඩුවේ යම් ක්‍රියාවක් හෝ අත් හැරීමක් ; සහ

(ii) ඇප සහතික ගිවිසුම නිම වීමට පෙර, ධාරක ආණ්ඩුවේ ක්‍රියාවක් හෝ අත්හැරීමක් හෝ වෙනත් යම් සිද්ධියක්.

**12 වන ව්‍යවස්ථාව : සුදුසු ආයෝජන**

(අ) අදාළ ව්‍යවසායෙහි හිමිකාර ප්‍රාග්ධනය දරන්නන් විසින් දෙන ලද හෝ ඇප සහතික කරන ලද හෝ මධ්‍ය කාලීන හෝ දීර්ඝ කාලීන හෝ ණය ද මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත්, ආකාරයේ ඍජු ආයෝජන ද ඇතුළුව හිමිකාර ප්‍රාග්ධන සම්බන්ධතා සුදුසු ආයෝජනවලට ඇතුළත් වේ.

(ආ) මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයෙන් මෙම සුදුසුකම්, වෙනත් යම් ආකාරයක මධ්‍ය හෝ දීර්ඝ කාලීන ආයෝජනයකට ව්‍යාප්ත කරනු ලැබිය හැකි ය. එහෙත් ඉහත (අ) වගන්තියෙහි සඳහන් ණය නොවන වෙනත් ණය, සුදුසු විය හැක්කේ, ඒවා ඒජන්සිය මඟින් ආවරණිත නැතහොත් එසේ ආවරණය කිරීමට ඇති නිශ්චිත ආයෝජනයකට අදාළ වන්නේ නම් පමණය.

(ඇ) ඇප සහතික කරනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍රය, ඒජන්සිය විසින් ලියා පදිංචි කරනු ලැබීමෙන් ඉක්බිතිව, ක්‍රියාත්මකවීම ආරම්භ වන ආයෝජනවලට ඇප සහතික කිරීම සීමා විය යුතු ය. එම ආයෝජනවලට—

(i) පවත්නා ආයෝජනයක්, නවීකරණය කිරීම, ව්‍යාප්ත කිරීම හෝ සංවර්ධනය කිරීම පිණිස, විදේශ විනිමය වල යම් පැවරීමක් ; සහ

(ii) පවත්නා ආයෝජනවලින් උද්ගත වන්නා වූ ද ධාරක රටින් පිටතට මාරු කරනු ලැබිය හැකි වූද ඉපයුම් පාවිච්චියට ගැනීමක්

ඇතුළත් විය හැකිය.

(ඈ) ආයෝජනයක් සහතික කිරීමේ දී,—

(i) ආයෝජනයේ ආර්ථිකමය යෝග්‍යතාව සහ ධාරක රටේ සංවර්ධනයට එයින් සිදුවන සේවය ;

(ii) ධාරක රටෙහි නීතිවලට සහ නියෝගවලට එම ආයෝජනයෙහි අනුකූලතාව ;

(iii) ධාරක රටේ ප්‍රකාශිත සංවර්ධන අරමුණු සහ ප්‍රමුඛතා සමග ආයෝජනයෙහි ඇති අනුකූලතාව ; සහ

(iv) යුක්ති සහගත සහ සාධාරණ සැලකිල්ල තිබීම සහ ආයෝජනය සඳහා නීතිමය ආරක්ෂාව ඇතුළුව, ධාරක රටෙහි ආයෝජන පරිසරය

සම්බන්ධයෙන් ඒජන්සිය සෑහීමට පත් විය යුතු ය.

**13 වන ව්‍යවස්ථාව : සුදුසු ආයෝජකයෝ**

(අ) යම් ස්වභාවික පුද්ගලයකු සහ නෛතික පුද්ගලයකු—

(i) එම ස්වාභාවික පුද්ගලයා ධාරක රට නොවන, වෙනත් සාමාජික රටක, රටවැසියකු නම් ;

(ii) එම නෛතික පුද්ගලයා, සංස්ථාගත වී සිටී නම් සහ ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය, සාමාජික රට තුළ පිහිටා ඇත්නම් හෝ එහි ප්‍රාග්ධනයෙන් බහුතරය සාමාජික රටට හෝ සාමාජික රටවලට හෝ එහි රටවාසීන්ට හෝ අයත්ව තිබේ නම් සහ ඉහත අවස්ථාවලින් කිසිවක දී එම සාමාජික රට ධාරක රට නොවේ නම්,

(iii) එම නෛතික පුද්ගලයා, එය පෞද්ගලික අයිතියට යටත් වුව ද නොවුව ද වාණිජ පදනමක් මත මෙහෙයවයි නම්

ඒජන්සියේ ඇප සහතිකය ලැබීමට සුදුසු වන්නේ ය.

(ආ) ආයෝජකට එකකට වැඩි ජාතිකත්ව තිබෙන අවස්ථාවක, ඉහත (අ) වගන්තියේ කාර්යයන් සඳහා සාමාජිකයකුගේ ජාතිකත්වය, සාමාජිකයකු නොවන්නකුගේ ජාතිකත්වය අභිබවා බල පැවැත්විය යුතු ය. තවද ධාරක රටෙහි ජාතිකත්වය වෙනත් යම් සාමාජිකයකුගේ ජාතිකත්වය අභිබවා බලපැවැත්විය යුතු ය.

(ඇ) ආයෝජනය කරනු ලබන වත්කම් ධාරක රටින් පිටත සිට මාරු කරනු ලබන්නේ නම්, ආයෝජක සහ ධාරක රට විසින්, එක්ව කරනු ලබන ඉල්ලීමක් මත, මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයක් මගින් ධාරක රටෙහි ජාතිකයකු වන ස්වාභාවික තැනැත්තෙකු වෙත හෝ ධාරක රටෙහි සංස්ථාගත කරන ලද නැතහොත් ප්‍රාග්ධනයෙහි බහුතරය, එහි ස්වජාතිකයිනට අයත්ව තිබෙන්නා වූ නෛතික පුද්ගලයකු වෙත හෝ සුදුසුකම ව්‍යාප්ත කරනු ලැබිය හැකිය.

## 14 වන ව්‍යවස්ථාව : සුදුසු ධාරක රටවල්

මේ පරිච්ඡේදය යටතේ ආයෝජන සහතික කරනු ලැබිය යුත්තේ ඒවා සංවර්ධනය වන සාමාජික රටක ප්‍රදේශයෙහි ආයෝජනය කරනු ලබන්නේ නම් පමණය.

## 15 වන ව්‍යවස්ථාව : ධාරක රටෙහි අනුමැතිය

ආවරණය සඳහා නම් කරන ලද අවදානම්වලට එරෙහිව ඒජන්සිය විසින් ඇප සහතිකය දීම ධාරක ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබීමට පෙරාතුව, ඒජන්සිය විසින් යම් ඇප ගිවිසුමකට ඇතුළත්වීම කරනු නොලැබිය යුතු ය.

## 16 වන ව්‍යවස්ථාව : නියම සහ කොන්දේසි

එක් එක් ඇප ගිවිසුමෙහි නියම සහ කොන්දේසි මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය යුතු රීතිවලට සහ නියෝගවලට යටත්ව ඒජන්සිය මගින් තීරණය කරනු ලැබිය යුතුය. එසේ වුවද ඇප වූ ආයෝජනයෙහි මුළු අලාභය ඒජන්සිය විසින් ආවරණය කරනු නොලැබිය යුතුය. මණ්ඩලයේ විධානය යටතේ සභාපති වරයා විසින් ඇප සහතික ගිවිසුම්, අනුමත කරනු ලැබිය යුතුය.

## 17 වන ව්‍යවස්ථාව : හිමිකම් පෑම් සඳහා ගෙවීම්

ඇප සහතිකයක් දරන්නකුට හිමිකම් පෑම් සඳහා ගෙවීම පිළිබඳව, ඇප සහතික ගිවිසුමට සහ මණ්ඩලය විසින් පිළිගනු ලැබිය හැකි ප්‍රතිපත්තිවලට අනුකූලව මණ්ඩලයේ විධානය යටතේ සභාපතිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය. ඒජන්සිය විසින් ගෙවීමක් කරනු ලැබීමට ප්‍රථම අවස්ථාගත තත්ත්වය අනුව යෝග්‍ය පරිපාලනමය ප්‍රතිකර්ම, ධාරක රටෙහි නීති යටතේ පහසුවෙන් ලබා ගත හැකි නම්, ඒ ප්‍රතිකර්මවල පිහිට පැතිය යුතු යයි ඇප සහතික ගිවිසුම මගින් ඇප සහතික දරන්නන්ට නියම කළ යුතුය. ගෙවීම් සඳහා හිමිකම් පෑම් උද්ගත වීමට තුඩුදුන් සිද්ධි සිදුවීම හා හිමිකම් පෑම්වලට ගෙවීම අතරතුර කිසියම් සාධාරණ කාල සීමාවක් ඉකුත් විය යුතු යැයි එම ගිවිසුම මගින් නියම කරනු ලැබිය හැකිය.

## 18 වන ව්‍යවස්ථාව : පුනරාදේශ කිරීම

(අ) ඇප සහතිකයක් දරන්නකුට වන්දි ගෙවූ විට හෝ ගෙවීමට එකඟ වූ විට, ධාරක රටට සහ අනෙකුත් බන්ධනදායීන්ට එරෙහිව ඇප සහතික ධාරියාට සහතික කරන ලද ආයෝජන හා සම්බන්ධව තිබිය හැකි අයිතිවාසිකම් හා හිමිකම් පෑම්වලට ඒජන්සිය පුනරාදේශ විය යුතු ය. එම පුනරාදේශයේ නියමයන් හා කොන්දේසි සඳහා ඇප සහතික ගිවිසුමෙහි විධිවිධාන ඇතුළත් විය යුතු ය.

(ආ) ඉහත (අ) වගන්තිය ප්‍රකාර ඒජන්සිය සතු අයිතිවාසිකම් සියළු සාමාජිකයන් විසින් පිළිගත යුතු ය.

(ඇ) පුනරාදේශක වශයෙන් ඒජන්සිය විසින් (අ) වගන්තිය ප්‍රකාර අත්කර ගන්නා, ධාරක රටෙහි ව්‍යවහාර මුදලින් වූ මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන්, ඒ අරමුදල් ඇප සහතිකධාරියා අත වී නම් ප්‍රයෝජනයට ගැනීම සහ පරිවර්තනය කිරීම සම්බන්ධව ඔහුට ලැබීමට හිමිකම තිබිය හැකි වූ වාසිදායක සැලකිල්ල ම දෙනු ලැබිය යුතු ය. කවර ලෙසකින් වුව ද ඒ මුදල් ප්‍රමාණයන්, ඒජන්සිය විසින් සිය පරිපාලන වියදම් හා වෙනත් ගාස්තු සඳහා ප්‍රයෝජනයට ගත හැකි ය. ඒ ව්‍යවහාර මුදල් නිදහසේ ප්‍රයෝජනයට ගත නොහැකි වන ප්‍රමාණයට, ඒ ව්‍යවහාර මුදල් වෙනත් අයුරින් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් ඒජන්සිය විසින් ධාරක රටවල් සමග වැඩපිළිවෙලවලට ඇතුළත් වීමට ප්‍රයත්න දැරිය යුතු ය.

## 19 වන ව්‍යවස්ථාව : ජාතික හා ප්‍රාදේශීය අස්තිත්වවලට සම්බන්ධතාව

ඒජන්සියේ කටයුතුවලට සමාන කටයුතුවල නිරතව සිටින්නා වූ සාමාජික රටවලට ජාතික අස්තිත්ව සමඟ සහ ප්‍රාග්ධනයෙන් බහුතර කොටස සාමාජික රටවලට අයත්ව තිබෙන ප්‍රාදේශීය අස්තිත්ව සමඟ ඒවායේ සේවාවන්හි උපරිම කාර්යක්ෂමතාවක් ඇති කර ගැනීමේ සහ විදේශ ආයෝජන වැඩි වැඩියෙන් ගලා ඒම සම්බන්ධයෙන් ඒවායේ දායකත්වය උපරිම මට්ටමකට ගෙන ඒමේ අරමුණ ඇතිව, ඒජන්සිය විසින් ඒවා සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතු අතර ඒවායේ ක්‍රියාකාරිත්වය ඌණපූරණය කිරීමට උත්සාහ කළ යුතුය. එම ප්‍රතිඵලය ඇති කර ගැනීමට, ඒජන්සිය විසින් එම සහයෝගිතාවයේ විස්තර සම්බන්ධයෙන් විශේෂයෙන් ම, ප්‍රතිරක්ෂණයේ දී සහ හවුල් රක්ෂණයේ දී බැඳීම් ඉටු කරන ආකාරය සම්බන්ධයෙන් ක්‍රියා පිළිවෙලකට ඇතුළත් විය යුතු ය.

## 20 වන ව්‍යවස්ථාව : ජාතික සහ ප්‍රාදේශීය අස්තිත්වවල ප්‍රතිරක්ෂණය

(අ) ඒජන්සියේ සාමාජිකයකු හෝ සාමාජිකයකුගේ නියෝජිතයකු හෝ ප්‍රාග්ධනයෙන් බහුතර කොටසක් සාමාජිකයන්ට අයත්ව තිබෙන ප්‍රාදේශීය ආයෝජන ඇප සහතික ආයතනයක් හෝ ප්‍රතිරක්ෂණ කර තිබෙන වාණිජමය නොවන අවදානම් එකක් හෝ වැඩි ගණනක් හේතුවෙන් ඇති වන පාඩු සම්බන්ධයෙන් නිශ්චිත

ආයෝජන වෙනුවෙන් ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණ නිකුත් කළ හැකි ය. ප්‍රතිරක්ෂණ ගිවිසුම් වෙනුවෙන් ඒජන්සිය විසින් ආරෝපනය කර ගත හැකි අනිශ්චිත ණය තුරුස් උපරිමය මණ්ඩලය විසින් කලින් කල, විශේෂ බහුතර ඡන්දයෙන් නියම කළ යුතු ය. ප්‍රතිරක්ෂණය සඳහා ඒජන්සියට ඉල්ලුම් පත්‍රය ලැබීමට මාස දොළහකට වැඩි කාලයකට පෙර සම්පූර්ණ කර තිබෙන නිශ්චිත ආයෝජන සම්බන්ධයෙන්, ආරම්භ වශයෙන් උපරිම ප්‍රමාණය, මේ පරිච්ඡේදය යටතේ ඒජන්සියේ මුළු අනිශ්චිත ණය තුරුස් ප්‍රමාණයෙන් සියයට දහයක් ලෙස නියම කළ යුතු ය. ප්‍රතිරක්ෂණය සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසුව ප්‍රතිරක්ෂිත ආයෝජන ක්‍රියාත්මක නොකළ යුතු විම හැර, ප්‍රතිරක්ෂණ කටයුතු වලට 11 සිට 14 දක්වා වන ව්‍යවස්ථාවල නිශ්චය කොට දක්වෙන සුදුසුකම් ලැබීමේ කොන්දේසි අදාළ විය යුතු ය.

(ආ) ඒජන්සියේ සහ ප්‍රතිරක්ෂිත සාමාජිකයකු හෝ ආයතනයක හෝ අතර අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම්, මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි රීති හා නියෝග ඇතොත් ඒවාට යටත්ව, ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි සඳහන් කළ යුතු ය. ඒජන්සියට ප්‍රතිරක්ෂණය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබීමට පෙරාතුව කරන ලද ආයෝජන ආවරණය වන එක් එක් ප්‍රතිරක්ෂණ ගිවිසුම, අවදානමට සරිලන වාරික, ඒජන්සියට ලැබෙන බව සහතික කර ගනිමින් සහ ප්‍රතිරක්ෂිත අස්තිත්වය සංවර්ධනය වන සාමාජික රටවල ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරභයා නිසි කැපවීමක් ඇතිව සිටින බව සහතික කර ගනිමින්, අවදානම අවම මට්ටමකට ගෙන ඒමේ අරමුණින්, මණ්ඩලය විසින් අනුමත කළ යුතු ය.

(ඇ) ඒජන්සිය මුල් ඇප සහතිකකරු වී නම් ඒජන්සිය තිබිය හැකි වූ පුනරා දේශන සහ බේරුම් කිරීමේ අයිතිවාසිකම් ප්‍රතිරක්ෂිත අස්තිත්වයට හෝ ඒජන්සියට තිබෙන බවට, හැකිතාක් දුරට වග බලා ගත යුතු ය. ඒජන්සිය විසින් ගෙවීමක් කිරීමට පෙර 17 වන ව්‍යවස්ථාවට අනුකූලව පරිපාලනමය ප්‍රතිකර්ම ලබා ගැනීමට යත්න දැරිය යුතු බව, ප්‍රතිරක්ෂණ නියමයන්හි සහ කොන්දේසිවල නියමිතව තිබිය යුතු ය. අදාළ ධාරක රට සම්බන්ධයෙන් පුනරාදේශනය ක්‍රියාත්මක වන්නේ ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය අනුමත කරනු ලැබීමෙන් පසුව පමණකි. ප්‍රතිරක්ෂිත ආයෝජනය හා සම්බන්ධ අයිතිවාසිකම් හෝ හිමිකම් පෑම් පිළිබඳව ප්‍රතිරක්ෂිතයා විසින් නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ යුතු බව නියම කෙරෙන විධිවිධාන, ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි ඇතුළත් කළ යුතු ය.

**21 වන ව්‍යවස්ථාව : පෞද්ගලික රක්ෂකයන් සමග සහ ප්‍රතිරක්ෂකයන් සමග සහයෝගිතාව**

(අ) ඒජන්සිය විසින් ස්වකීය කටයුතුවල වර්ධනයක් ඇති කර ගැනීම පිණිස සහ සංවර්ධනය වන සාමාජික රටවල වාණිජමය නොවන අවදානම් සඳහා ඒජන්සිය විසින් අදාළ කර ගන්නා කොන්දේසිවලට සමාන කොන්දේසි මත ආවරණය සැපයීමට පෞද්ගලික රක්ෂකයන් දිරි ගැන්වීම පිණිස, ඒජන්සිය විසින් සාමාජික රටවල පෞද්ගලික රක්ෂකයන් සමග වැඩ පිළිවෙළවලට ඇතුළත් විය හැකිය. එවැනි වැඩපිළිවෙලවලට 20 වන ව්‍යවස්ථාවේ නිශ්චය කොට දක්වා ඇති කොන්දේසි හා ක්‍රියා පටිපාටි යටතේ ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය සැපයීම ද ඇතුළත් විය හැකිය.

(ආ) ඒජන්සිය විසින් නිකුත් කරන ලද යම් ඇප සහතිකයක් හෝ ඇප සහතික කවර හෝ නිසි ප්‍රතිරක්ෂණ අස්තිත්වයක සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ ප්‍රතිරක්ෂණය කළ හැකිය.

(ඇ) පෞද්ගලික රක්ෂකයන් සහ ප්‍රතිරක්ෂකයන්ගෙන් සාධාරණ නියමයන් මත තුලනීය ආවරණයක් ලබා ගත නොහැකි ආයෝජන සඳහා ඇප සහතික දීමට ඒජන්සිය විශේෂයෙන් ප්‍රයත්න දරනවා ඇත.

**22 වන ව්‍යවස්ථාව : ඇප සහතිකවල සීමාවන්**

(අ) සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් අන්‍යාකාරව තීරණය කළහොත් මිස, ඒජන්සිය විසින් මේ පරිච්ඡේදය යටතේ ආරෝපනය කර ගත හැකි අනිශ්චිත ණයතුරුස් ප්‍රමාණය, ඒජන්සියේ අවල සහභාග ප්‍රාග්ධනයේ සහ සංචිතවල ද මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි එහි ප්‍රතිරක්ෂණ ආවරණයේ කිසියම් කොටසක ද ප්‍රමාණයෙන් සියයට එකසිය පණහක් නොඉක්මවිය යුතුය. අනිශ්චිත ණයතුරුස් ප්‍රමාණයේ එකතුවෙහි උපරිමයේ වෙනසක් නිර්දේශ කළ අවදානම් මට්ටම මණ්ඩලය විසින් හිමිකම් පෑම අවදානමෙහි තරාතිරම, විවිධාංගීකරණය, ප්‍රතිරක්ෂණ ආවරණය සහ වෙනත් අදාළ සාධක සම්බන්ධයෙන් ඇති දූයි නිශ්චය කර ගැනීමේ අරමුණ ඇතිව, ඒජන්සියේ කාර්ය භාරයෙහි ඇති අත්දැකීම් ආශ්‍රයෙන්, කලින් කල සමාලෝචනය කළ යුතු ය. සභාව විසින් නිශ්චය කරන උපරිම ප්‍රමාණය කවර අවස්ථාගත තත්ත්වයක් යටතේ වුවද, ඒජන්සියේ අවල සහාගත ප්‍රාග්ධනයේ, එහි සංචිතයේ සහ සුදුසුයැයි සැලකෙන එහි ප්‍රතිරක්ෂණ ආවරණයේ කිසියම් කොටසක ප්‍රමාණය මෙන් පස් ගුණයක් නොඉක්මවිය යුතු ය.

(ආ) ඉහත (අ) වගන්තියේ සඳහන් ඇපවීමේ සාමාන්‍ය සීමාවට හානියක් නොමැතිව, මණ්ඩලය විසින්,—

(i) එක් එක් සාමාජික රටෙහි ආයෝජකයන්ට නිකුත් කර ඇති සියළු ඇප සහතික සඳහා මේ පරිච්ඡේදය යටතේ ඒජන්සිය විසින් ආරෝපනය කර ගත හැකි අනිශ්චිත ණයතුරුස් ප්‍රමාණවල උපරිම එකතුව නියම කළ හැකිය. එම උපරිම ප්‍රමාණයන් නිශ්චය කිරීමේදී ඒජන්සියේ ප්‍රාග්ධනයෙහි ඒ ඒ සාමාජිකයා දරන කොටස ගැන සහ සංවර්ධනය වන සාමාජික රටවලින් ආරම්භ වන ආයෝජන සම්බන්ධව වඩාත් නොමසුරු සීමා අදාළ කර ගැනීමේ අවශ්‍යතාව ගැන නිසි සැලකිල්ල යොමු කළ යුතු ය ; තවද

(ii) තනි ව්‍යාපෘති, තනි ධාරක රටවල් සහ ආයෝජනයේ හෝ අවදානමේ ස්වභාවය වැනි අවදානම් විවිධාංගීකරණ සාධක සම්බන්ධයෙන් ඒජන්සිය විසින් ආරෝපනය කර ගත හැකි අනිශ්චිත ණයතුරුස් ප්‍රමාණයෙහි උපරිම එකතුව නියම කළ හැකිය.

**23 වන ව්‍යවස්ථාව : ආයෝජන ප්‍රවර්ධනය**

(අ) සංවර්ධනය වන සාමාජික රටවලට විදේශ ආයෝජන ගලා ඒම සඳහා වාතාවරණය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව, ඒජන්සිය විසින් පර්යේෂණ කටයුතු කිරීම, ආයෝජන ගලා ඒම, ප්‍රවර්ධනය කිරීම පිණිස ක්‍රියා කිරීම සහ සංවර්ධනය වන සාමාජික රටවල ඇති ආයෝජන ඉඩ ප්‍රස්ථා පිළිබඳව තොරතුරු ප්‍රචාරය කිරීම කළ යුතු ය. සාමාජික රටක ඉල්ලීම මත එම රටෙහි දේශ සීමා ඇතුළත ආයෝජන තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස, ඒජන්සිය විසින් ශිල්පීය උපදෙස් හා සහාය දිය හැකි ය. මේ කටයුතු ඉටු කිරීමේ දී, ඒජන්සිය—

(i) සාමාජික රටවල් අතර ඇති අදාළ ආයෝජන ගිවිසුම්වල මාර්ගෝපදේශකත්වය ලබා ගත යුතු ය.

(ii) සංවර්ධනය වන සාමාජික රටවලට ආයෝජන ගලා ඒම සම්බන්ධව සංවර්ධිත සහ සංවර්ධනය වන සාමාජික රටවල ඇති බාධක ඉවත් කිරීමට උත්සාහ කළ යුතු ය.

(iii) විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ වෙනත් ආයතන සමඟ, විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු ය.

(ආ) තවද ඒජන්සිය විසින්—

(i) ආයෝජකයන් සහ ධාරක රටවල් අතර මතභේද සාමාකාමී වී නිරාකරණය කර ගැනීමට උනන්දු කරවිය යුතු ය ;

(ii) සංවර්ධනය වන සාමාජික රටවල් සමඟ, විශේෂයෙන් ම ධාරක රටවල් විමටත් ඉඩ ඇති රටවල් සමඟ යටත් පිරිසෙයින්, අදාළ සාමාජිකයා වඩාත් ම කැමැත්තක් දක්වන ආයෝජන ඇප සහතික ආයතනය හෝ රාජ්‍යය සඳහා ආයෝජන සම්බන්ධව වූ ගිවිසුමක එකඟ වී තිබෙන සැලකිල්ල හා සමාන වාසිදායක සැලකිල්ලක්, ඒජන්සිය ඇප වී ඇති ආයෝජන සම්බන්ධයෙන් සහතික කෙරෙන ගිවිසුම් ඇති කර ගැනීමට ප්‍රයත්න දැරිය යුතු ය ; මණ්ඩලයේ විශේෂ බහුතර ඡන්දයෙන්, ඒ ගිවිසුම් අනුමත කරනු ලැබිය යුතු ය ;

(iii) ආයෝජන ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සාමාජිකයන් අතර ගිවිසුම් ඇති කර ගැනීම උනන්දු කරවිය යුතු ය ; ඒ සඳහා පහසුකම් සැලසිය යුතු ය.

(ඇ) සංවර්ධනය වන සාමාජික රටවල් අතර ආයෝජන ගලා ඒම වැඩි කිරීමේ වැදගත්කම කෙරෙහි ඒජන්සිය ස්වකීය ප්‍රවර්ධන ප්‍රයත්නයේ දී විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

**24 වන ව්‍යවස්ථාව : සමානුග්‍රහණ ආයෝජන සඳහා ඇපවීම**

ඒජන්සිය විසින් මේ පරිච්ඡේදය යටතේ භාරගනු ලබන ඇප සහතික කිරීමේ කටයුතුවලට අතිරේකව, මේ සම්මුතියේ 1 වන පරිශිෂ්ටයෙහි විධිවිධාන සලසා ඇති සමානුග්‍රහණ ක්‍රියා පිළිවෙල යටතේ ආයෝජන වෙනුවෙන් ද ඒජන්සිය විසින් ඇප විය හැකි ය.

## IV වන පරිච්ඡේදය

## මූල්‍ය විධිවිධාන

**25 වන ව්‍යවස්ථාව : මූල්‍ය කළමනාකරණය**

ඒජන්සිය, සියලු අවස්ථාගත තත්ත්වයන් යටතේ ස්වකීය මූල්‍ය වගකීම් ඉටු කිරීමේ හැකියාව රැක ගැනීමේ අරමුණ ඇතිව උචිත ව්‍යාපාර කළමනාකරණ පරිචයට සහ දූරදර්ශී මූල්‍ය කළමනාකරණ පරිචයට අනුකූලව ස්වකීය කටයුතු කරගෙන යා යුතු ය.

**26 වන ව්‍යවස්ථාව : වාරික සහ ගාස්තු**

එක් එක් ආකාරයේ අවදානම්, සම්බන්ධයෙන් අදාළ වන වාරික අනුප්‍රමාණ, ගාස්තු සහ වෙනත් අයකිරීම් ඇතොත් ඒවා ද ඒජන්සිය විසින් නියම කොට වරින් වර සමාලෝචනය කළ යුතු ය.

**27 වන ව්‍යවස්ථාව : ශුද්ධ ආදයම් විභාජනය**

(අ) 10 වන ව්‍යවස්ථාවේ (අ) (iii) වගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව, සංචිතවල ප්‍රමාණය ඒජන්සියේ සහභාග ප්‍රාග්ධනය මෙන් පස්ගුණයක් වනතෙක් ශුද්ධ ආදායම, ඒජන්සිය විසින් සංචිතවලට විභාජනය කළ යුතු ය.

(ආ) ඒජන්සිය, සංචිත (අ) උප වගන්තියේ නියමිත මට්ටමට පැමිණි පසුව, ඒජන්සියේ ශුද්ධ ආදායම සංචිතවලට විභාජනය කළ යුතු ද ඒජන්සියේ සාමාජිකයන් අතර බෙදා හැරිය යුතුද නැතහොත් අන්‍යාකාරයකින් යොදා ගත යුතුද යන වග සහ එසේ කළ යුත්තේ කිනම් ප්‍රමාණයකට ද යන වග පාලක සභාව විසින් තීරණය කළ යුතුය. ඒජන්සියේ ශුද්ධ ආදායම ඒජන්සියේ සාමාජිකයන් අතර බෙදා හැරීමත්, ඒජන්සියේ ප්‍රාග්ධනයෙහි එක් එක් සාමාජිකයාගේ කොටසට ප්‍රමාණානුකූලව, විශේෂ බහුතර ඡන්දයෙන් ක්‍රියා කරන පාලක සභාවේ තීරණයකට අනුකූලව, සිදු කළ යුතු ය.

**28 වන ව්‍යවස්ථාව : අයවැය ලේඛණය**

සභාපතිවරයා විසින් ඒජන්සියේ ආදායම් සහ වියදම් පිළිබඳව වාර්ෂික අයවැය ලේඛනයක්, මණ්ඩලයේ අනුමතිය සඳහා පිළියෙල කළ යුතු ය.

**29 වන ව්‍යවස්ථාව : ගිණුම්**

ස්වාධීන විගණකවරුන් විසින් විගණනය කරනු ලැබූ ඒජන්සියේ සහ මේ සම්මුතියේ 1වන පරිශිෂ්ටයේ සඳහන් සමානුග්‍රහණ භාර අරමුදලේ ගිණුම් පිළිබඳ වාර්තා ඇතුළත්ව වාර්ෂික වාර්තාවක්, ඒජන්සිය විසින් පළ කළයුතු ය. ඒජන්සිය විසින් යම් නිසි කාලයකට වරක්, එහි ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල පෙන්නුම් කරන එහි මුදල් තත්ත්වය පිළිබඳව සංක්ෂිප්ත ප්‍රකාශයක් සහ ලාභ අලාභ ප්‍රකාශයක් සාමාජිකයන්ට යැවිය යුතු ය.

## V වන පරිච්ඡේදය

## සංවිධානය හා කළමනාකරණය

**30 වන ව්‍යවස්ථාව : ඒජන්සියේ ව්‍යුහය**

ඒජන්සියට පාලක සභාවක්, අධ්‍යක්ෂ මණ්ඩලයක්, සභාපතිවරයෙක් සහ ඒජන්සිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාර්ය ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලයක් ද සිටිය යුතු ය.

**31 වන ව්‍යවස්ථාව : පාලක සභාව**

(අ) සම්මුතියේ නියමයන් අනුව ඒජන්සියේ වෙනත් යම් අනු ආයතනයක් වෙත නිශ්චිතව පවරා ඇති බලතල හැර ඒජන්සියේ සියලු බලතල සභාව වෙත පැවරෙන්නේය. පහත සඳහන් බලතල හැර, පාලක සභාවේ කවර හෝ බලයක්, පාලක සභාව විසින් මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි ය.

(i) අලුත් සාමාජිකයන් ඇතුළත් කර ගැනීමේ සහ ඔවුන් ඇතුළත් කිරීමේ කොන්දේසි නිශ්චය කිරීමේ බලය ;

(ii) සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවීමේ බලය ;

(iii) ප්‍රාග්ධනයේ යම් වැඩි කිරීමක් හෝ අඩු කිරීමක් පිළිබඳව තීරණය කිරීමේ බලය ;

(iv) 22 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය ප්‍රකාර, අනිශ්චිත ණයතුරුස්වල මුළු ප්‍රමාණයේ සීමාව වැඩි කිරීමේ බලය ;

(v) 3 වන ව්‍යවස්ථාවේ (ඇ) වගන්තිය ප්‍රකාර යම් සාමාජිකයෙකු සංවර්ධනය වන සාමාජික රටක් ලෙස නම් කිරීමේ බලය ;

(vi) 39 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය ප්‍රකාර, ඡන්දය දීමේ කාර්ය සඳහා අලුත් සාමාජිකයකු පළමු ගණයට හෝ දෙවන ගණයට ඇතුළත් වන සේ වර්ග කිරීමේ හෝ ඒ කාර්යය සඳහා ම දනට සිටින සාමාජිකයකු නැවත වර්ග කිරීම ;

(vii) අධ්‍යක්ෂවරුන්ගේ හා ඔවුන්ගේ වෛකල්පිකයන්ගේ දීමනා නිශ්චය කිරීමේ බලය ;

(viii) ඒජන්සියේ, කටයුතු නතර කොට එය ඈවර කිරීමේ බලය ;

(ix) ඈවර කිරීමේ දී සාමාජිකයන් අතර වත්කම් බෙදා හැරීමේ බලය ; සහ

(x) මේ සම්මුතිය, එහි පරිශිෂ්ඨාවලිය සහ උපලේඛන සංශෝධනය කිරීමේ බලය.

(ආ) පාලක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එක් එක් සාමාජික රට විසින් පත් කරන එක් පාලකවරයකුගෙන් සහ එක් වෛකල්පික පාලකවරයකුගෙන් පාලක සභාව සංයුක්ත වන්නේ ය. තමාගේ නියෝජක පැමිණ නොමැති විට හැර වෛකල්පික පාලකවරයා ඡන්දය නොදිය යුතු ය. සභාව විසින් එක් පාලකවරයකු එහි සභාපති ලෙස තෝරා ගත යුතුය.

(ඇ) වාර්ෂික රැස්වීමක් සහ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි හෝ මණ්ඩලය විසින් කැඳවනු ලැබිය හැකි පරිදි වූ වෙනත් රැස්වීම් ද සභාව විසින් පැවැත්විය යුතු ය. සාමාජිකයන් පස් දෙනෙකු විසින් හෝ මුළු ඡන්ද බලයෙන් සියයට විසිපහක් හිමි සාමාජිකයන් විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ කවර අවස්ථාවක වුවද මණ්ඩලය විසින් සභාවේ රැස්වීමක් කැඳවිය යුතු ය.

**32 වන ව්‍යවස්ථාව : මණ්ඩලය**

(අ) මණ්ඩලය, ඒජන්සියේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳව වගකිව යුතු අතර, එම වගකීම ඉටු කිරීමෙහි ලා මේ සම්මුතිය යටතේ කළ යුතු හෝ කිරීමට අවසර ඇති කවර හෝ ක්‍රියාවක් කළ යුතු ය.

(ආ) මණ්ඩලය, දොළොස්දෙනෙකුට නොඅඩු අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. සාමාජිකත්වයේ ඇති වන වෙනස් වීම් සැලකිල්ලට ගනිමින් සභාව විසින් අධ්‍යක්ෂ සංඛ්‍යාව වෙනස් කරනු ලැබිය හැකි ය. එක් එක් අධ්‍යක්ෂවරයා විසින්, ඔහු නොපැමිණි අවස්ථාවක හෝ ඔහුට කටයුතු කිරීමට නොහැකි අවස්ථාවක ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට පූර්ණ බලය සහිත වෛකල්පික අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකි ය. බැංකුවේ අධිපතිවරයා නිල බලයෙන් මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ ය. එහෙත් ඡන්ද සංඛ්‍යාව සමානව ඇති අවස්ථාවක දිය හැකි තීරක ඡන්දයක් හැර එම සභාපතිවරයාට ඡන්දයක් නොමැති විය යුතුය.

(ඇ) අධ්‍යක්ෂවරයන්ගේ ධුර කාලය, සභාව විසින් නිශ්චය කළ යුතු ය. සභාව විසින් එහි ආරම්භක රැස්වීමේ දී ප්‍රථම මණ්ඩලය සංස්ථාපනය කළ යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ අධ්‍යක්ෂවරයන් තිදෙනෙකුගේ ඉල්ලීම මත ක්‍රියා කරමින් කැඳවනු ලැබූ විට මණ්ඩලය රැස්විය යුතු ය.

(ඉ) ඒජන්සියට අඛණ්ඩව රැස්ව ක්‍රියා කරන නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටීය යුතු යැයි සභාව විසින් තීරණය කරනු ලබන තෙක්, මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීමේ සහ ඒජන්සිය වෙනුවෙන් වෙනත් නිල කර්තව්‍යයන් ඉටු කිරීමේ වියදම් සඳහා පමණක්, අධ්‍යක්ෂවරයන්ට හා වෛකල්පික අධ්‍යක්ෂවරයන්ට දීමනා ලැබිය යුතු ය. අඛණ්ඩව ක්‍රියා කරන මණ්ඩලයක් පිහිටුවනු ලැබූ විට, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් අධ්‍යක්ෂවරුන්ට සහ වෛකල්පික අධ්‍යක්ෂවරයන්ට ගෙවනු ලැබිය යුතුය.

**33 වන ව්‍යවස්ථාව : ඒජන්සියේ සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය**

(අ) ඒජන්සියේ සභාපතිවරයා විසින්, මණ්ඩලයේ සාමාන්‍ය පාලනය යටතේ ඒජන්සියේ, සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යා යුතු ය. කාර්ය මණ්ඩලය සංවිධාන කිරීම, පත් කිරීම සහ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

(ආ) මණ්ඩලයේ සභාපතිවරයා විසින් කරනු ලබන නාමයෝජනාව මත මණ්ඩලය විසින් ඒජන්සියේ සභාපති-වරයා පත් කරනු ලැබිය යුතු ය. ඒජන්සියේ සභාපතිවරයාගේ වැටුප සහ සේවා ගිවිසුමේ නියමයන්, සභාව විසින් නිශ්චය කළ යුතු ය.

(ඇ) තම තමන්ගේ ධුරවල කටයුතු ඉටු කිරීමේ දී සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය වෙනත් කිසිම අධිකාර-යකට නොව මුළුමනින් ම ඒජන්සියට සේවය කිරීමට බැඳී සිටින්නේ ය. මෙම බැඳීමෙහි අන්තර්ජාතික ස්වරූප-යට ඒජන්සියේ සැම සාමාජිකයකුම ගරු කළ යුතු අතර, සභාපතිවරයා විසින් හෝ කාර්ය මණ්ඩලය විසින් හෝ ඔවුන්ගේ කාර්ය ඉටු කරනු ලැබීමේ දී බලපෑමක් කිරීමේ සියලු ප්‍රයත්නයන්ගෙන් වැළකිය යුතු ය.

(ඈ) කාර්ය මණ්ඩලය පත් කිරීමේ දී සභාපතිවරයා විසින්, ඉහළම කාර්යක්ෂමතා මට්ටමක් සහ ශිල්පීය ප්‍රවීණතාවක් අත් කර ගැනීමේ ප්‍රධානතම වැදගත්කමට යටත්ව භූගෝලීය වශයෙන් හැකිතාක් පුළුල් පදනමක් මත පුද්ගලයන්, බඳවා ගැනීමේ වැදගත්කම ගැන ද නිසි පරිදි සැලකිලිමත් විය යුතු ය.

(ඉ) ඒජන්සියේ කටයුතු කර ගෙන යාමේ දී ලබා ගන්නා තොරතුරු සම්බන්ධයෙන් සභාපතිවරයාගේ කාර්ය මණ්ඩලය සැමවිටම රහස්‍යභාවය පවත්වා ගත යුතු ය.

**34 වන ව්‍යවස්ථාව : දේශපාලන කටයුතු තහනම් බව**

ඒජන්සිය එහි සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය, කවර හෝ සාමාජික රටක දේශපාලන කටයුතුවලට මැදිහත් නොවිය යුතු ය. ආයෝජනයක් සම්බන්ධ වූ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගැනීමට ඒජන්සියට ඇති අයිතිවාසිකමට හානියක් නොමැතිව, සාමාජික රටෙහි හෝ සාමාජික රටවල දේශපාලන ස්වරූපය, ඒජන්සියේ තීරණ කෙරෙහි බල නොපෑ යුතු ය. 2 වන ව්‍යවස්ථාවේ ප්‍රකාශිත කාර්යයන් සාක්ෂාත් කර ගැනීම පිණිස, ඔවුන්ගේ තීරණවලට අදාළ ව සැලකිල්ලට ගත යුතු කරුණු අපක්ෂපාතව තුලනය කළ යුතු ය.

**35 වන ව්‍යවස්ථාව : අන්තර්ජාතික සංවිධාන සමග සම්බන්ධතා**

ඒජන්සිය මේ සම්මුතියේ නියමයන් ඇතුළත, එක්සත් ජාතීන්ගේ ආයතනය සමඟ සහ අදාළ ක්ෂේත්‍රයන් හි විශේෂ වගකීම් දරන විශේෂයෙන්ම බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව ඇතුළුව වෙනත් ආණ්ඩු අතර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.

**36 වන ව්‍යවස්ථාව : ප්‍රධාන කාර්යාලයේ පිහිටීම**

(අ) ඒජන්සියේ ප්‍රධාන කාර්යාලය, වෙනත් ස්ථානයක පිහිටුවීමට සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් තීරණය කළහොත් මිස, වොෂින්ටන් ඩී. සී. හි පිහිටුවනු ලැබිය යුතු ය.

(ආ) සභාව විසින් ස්වකීය වැඩ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි වෙනත් කාර්යාල, පිහිටුවනු ලැබිය හැකි ය.

**37 වන ව්‍යවස්ථාව : වත්කම් තැන්පත් කරන ස්ථාන**

එක් එක් සාමාජික රටෙහි ව්‍යවහාර මුදලින් ඒජන්සිය සතු වත්කම් හෝ ඒජන්සියේ වෙනත් වත්කම් තැන්පත් කර තැබීම සඳහා ඒ ඒ සාමාජික රට විසින් ස්වකීය මහ බැංකුව නම් කළ යුතු ය.එම රටෙහි මහ බැංකුවක් නොමැති නම්, ඒ කාර්යය සඳහා ඒජන්සියට පිළිගත හැකි වෙනත් යම් ආයතනයක් එම රට විසින් නම් කළ යුතු ය.

**38 වන ව්‍යවස්ථාව : සංනිවේදන මාර්ග**

(අ) මේ සම්මුතිය යටතේ උද්ගතවන කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් ඒජන්සිය විසින් අදහස් හුවමාරු කර ගත හැකි උචිත බලධරයකු එක් එක් සාමාජික රට විසින් නම් කළ යුතු ය. ඒ බලධරයාගේ ප්‍රකාශ, සාමාජි-කයාගේ ප්‍රකාශ ලෙස සලකා ඒජන්සිය විසින් ඒවා කෙරෙහි විශ්වාසය තැබිය හැකි ය. 19 සිට 21 දක්වා වූ ව්‍යවස්-ථාවල සඳහන් කර ඇති සහ ඒ සාමාජික රටෙහි අස්තිත්ව හෝ රක්ෂකයන් පිළිබඳව වන කාරණා සම්බන්ධයෙන්, සාමාජිකයකු විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒජන්සිය විසින් ඒ සාමාජිකයා සමග සාකච්ඡා කළ යුතු ය.

(ආ) ඒජන්සිය විසින් කිසියම් ක්‍රියාවක් කිරීමට පෙර සාමාජිකයාගේ අනුමතිය අවශ්‍ය වන කවර අවස්ථාවක වුවද යෝජිත ක්‍රියාව පිළිබඳව දනුම් දීමේ දී ඒජන්සිය විසින් නියම කරනු ලැබිය හැකි යම් සාධාරණ කාල සීමාවක් ඇතුළත, ඒ සාමාජිකයා විසින් විරෝධතාවක් ඉදිරිපත් කළහොත් මිස, ඊට අනුමතිය දී ඇත්තාක් සේ සලකනු ලැබිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

## ඡන්දය දීම, සහභාගි වීම සහ නියෝජනය සැකසීම

**39 වන ව්‍යවස්ථාව : ඡන්දය සහ සහභාගිත්වය සැකසීම**

(අ) මේ සම්මුතියේ "අ" උපලේඛනයේ ලැයිස්තු ගත කර තිබෙන රාජ්‍ය ගණ දෙකට, ඒජන්සියේ සමාන සම්බන්ධතා මෙන් ම එක් සාමාජිකයාගේ මූල්‍ය සහභාගීත්වයේ වැදගත් කම පිළිඹිඹු වන පරිදි ඡන්දය දීමේ ක්‍රියා පිළිවෙලක් සඳහා විධිවිධාන සැලසීම පිණිස එක් එක් සාමාජිකයාට, සාමාජික ඡන්ද 177 ක් සහ ඊට එකතුව ඒ සාමාජිකයා උසුලන එක් එක් ස්කන්ධ කොටස වෙනුවෙන් එක් සහභාගීත්ව ඡන්දයක් ද තිබිය යුතු ය.

(ආ) මේ සම්මුතිය බලාත්මක වී අවුරුදු තුනක් ඇතුළත කවර හෝ අවස්ථාවක, මේ සම්මුතියේ "අ" උපලේඛනයේ ලැයිස්තුගත රාජ්‍ය ගණ දෙකෙන් කවර හෝ එක් ගණයකට අයත් සාමාජිකයන්ගේ සාමාජික ඡන්ද සහ සහභාගිත්ව ඡන්දවල එකතුව, සමස්ත ඡන්ද බලයෙන් සියයට හතලිහකට අඩු වන්නේ නම්, ඒ ගණයේ මුළු ඡන්ද බලය ; සමස්ත ඡන්ද බලයෙහි එවැනි ප්‍රතිශතයකට සම කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිපූරක ඡන්ද සංඛ්‍යාවක් හිමි වන්නේ ය. ඒ පරිපූරක ඡන්ද ගණයේ එක් එක් සාමාජිකයාගේ සහභාගිත්ව ඡන්ද සහ ඒ ගණයේ මුළු සහභාගිත්ව ඡන්ද සංඛ්‍යාව අතර ඇති අනුපාතය අනුව ඒ ගණයේ සාමාජිකයන් අතර බෙද හැරිය යුතු ය. ඒ පරිපූරක ඡන්ද, ඒ ප්‍රතිශතය පවත්වා ගෙන යන බවට වග බලා ගැනීම පිණිස අවශ්‍ය නිරායාස සැකසීම්වලට යටත් වන අතර, ඉහත සඳහන් තුන් අවුරුදු කාල සීමාව අවසානයේදී අවලංගු කරනු ලබන්නේ ය.

(ඇ) මේ සම්මුතිය බලාත්මක වීමෙන් පසුව එන තුන්වන අවුරුද්ද තුළ, කොටස් වෙන් කර දී ඇති ආකාරය සභාව විසින් සමාලෝචනය කළ යුතු අතර එම තීරණවලට එළඹීමේ දී මෙහි පහත දැක්වෙන මූලධර්ම මාර්ගෝපදේශක කර ගත යුතු ය :—

(i) සාමාජික රටවල ඡන්දවලින් ඒජන්සියේ ප්‍රාග්ධනයට නියම වශයෙන් සහභාගි වී ඇති ප්‍රමාණය සහ මේ ව්‍යවස්ථාවේ (අ) වගන්තියේ ගෙන හැර දක්වා ඇති පරිදි සාමාජික ඡන්ද පිළිබිඹු විය යුතු ය.

(ii) සම්මුතියට අත්සන් කර නොමැති රටවලට වෙන් කර දී ඇති කොටස්, ඉහත සඳහන් ගණ අතර ඡන්දවල සමතාවක් ඇති කළ හැකි වන පරිදි එවැනි යම් සාමාජිකයන්ට හා එවැනි යම් ආකාරයකට නැවත වෙන් කර දීම පිණිස ඉදිරිපත් කළ යුතු ය.

(iii) සාමාජිකයන්ට වෙන් කර දෙන කොටස් සඳහා සහභාගි වීමට සාමාජිකයන්ට ඇති ශක්තිය සඳහා පහසුකම් සලසන ක්‍රියා මාර්ග, සභාව විසින් ගත යුතු ය.

(ඈ) මේ ව්‍යවස්ථාවේ (ආ) වගන්තියේ විධිවිධාන සලසා ඇති තුන් අවුරුදු කාල සීමාව ඇතුළත, මේ සම්මුතිය යටතේ වඩාත් ඉහළ බහුතරයක් අවශ්‍යව ඇති තීරණ ඒ ඉහළ බහුතර ඡන්දයෙන් ගත යුතු වීම හැර, පාලක සභාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු තීරණ, විශේෂ බහුතර ඡන්දයෙන් ගත යුතු ය.

(ඉ) 5 වන ව්‍යවස්ථාවේ (ඇ) වගන්තිය ප්‍රකාර ඒජන්සියේ ප්‍රාග්ධන ස්කන්ධ වැඩි කරනු ලැබූ විටක, සහභාගි වීම සඳහා ඉල්ලීමක් කරන එක් එක් සාමාජික රටට, ඊට ඉහතින් එය දායක වී ඇති ස්කන්ධ ප්‍රමාණය, ඒජන්සියේ මුළු ප්‍රාග්ධන ස්කන්ධවලට දරන අනුපාතයට සමානුපාතික වන එම වැඩි කළ ප්‍රාග්ධනයෙන් කොටසකට සහභාගි වීමට, බලය දිය යුතු ය ; එහෙත් වැඩි කළ ප්‍රාග්ධනයේ කිසියම් කොටසකට දායක වීමට කිසි සාමාජික රටක බැඳීමක් නොවිය යුතු ය.

(ඊ) මේ ව්‍යවස්ථාවේ (ඉ) වගන්තිය යටතේ අතිරේක සහභාගිවීම් සම්බන්ධයෙන් පාලක සභාව විසින් නියෝග නිකුත් කරනු ලැබිය යුතු ය. සාමාජිකයන් විසින් එවැනි සහභාගිවීම් සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි සාධාරණ කාල සීමාවන් ඒ නියෝගවලින් නියම කරනු ලැබිය යුතු ය.

**40 වන ව්‍යවස්ථාව : සභාවේ ඡන්දය දීම**

(අ) එක් එක් පාලකවරයාට ඔහු නියෝජනය කරන සාමාජිකයාගේ ඡන්ද පාවිච්චි කිරීමට හිමිකම් තිබිය යුතු ය. මේ සම්මුතියේ අන්‍යාකාරව නිශ්චිතව දක්වා ඇති අවස්ථාවන් හි හැර, පාලක සභාවේ තීරණ, දෙන ලද ඡන්ද සංඛ්‍යාවේ බහුතරය අනුව ගත යුතු ය.

(ආ) සභාවේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය, සමස්ත ඡන්ද බලයෙන් තුනෙන් දෙකකට නොඅඩු ප්‍රමාණයක් පාවිච්චි කරන පාලකවරයන්ගේ බහුතරයකින් සංයුක්ත විය යුතු ය.

(ඇ) කිසියම් නිශ්චිත ප්‍රශ්නයක් පිළිබඳව සභාවේ රැස්වීමක් නොකැඳවා තීරණයකට එළඹීම, ඒජන්සියේ උපරිම යහපත පිණිස වන බව මණ්ඩලය සලකන අවස්ථාවක, මණ්ඩලය විසින් එසේ ඉල්ලා සිටිය හැකි වන පරිදි, සභාව විසින් නියෝග මගින් කාර්ය පටිපාටියක් ස්ථාපනය කළ හැකි ය.

**41 වන ව්‍යවස්ථාව : අධ්‍යක්ෂවරයන් තෝරා පත් කර ගැනීම**

(අ) අධ්‍යක්ෂවරයන් "ආ" උපලේඛනයට අනුකූලව තෝරා පත් කර ගත යුතු ය.

(ආ) ස්වකීය අනුප්‍රාප්තිකයන් තෝරා පත් කර ගන්නා තෙක් අධ්‍යක්ෂවරයන් තම ධුරයෙහි නොකඩවා කටයුතු කළ යුතු ය. අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය අවසන් වීමට පෙර, දින අනූවකට වැඩි කාලයක් ඔහුගේ ධුරය හිස්ව තිබුණහොත් කලින් සිටි අධ්‍යක්ෂවරයා තෝරා පත් කර ගනු ලැබූ පාලකවරයන් විසින්, ඒ ධුර කාලයෙන් ඉතිරි කොටස සඳහා වෙනත් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගත යුතු ය. තෝරා පත් කර ගැනීම සඳහා, දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාවෙන් බහුතර ඡන්දයක් අවශ්‍ය වන්නේ ය. ධුරය හිස්ව පවත්නා අතරතුර, කලින් සිටි අධ්‍යක්ෂවරයාගේ විකල්ප අධ්‍යක්ෂවරයා විසින් විකල්පයක් පත් කිරීමේ බලය හැර, ඔහුගේ බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

**42 වන ව්‍යවස්ථාව : මණ්ඩලයේදී ඡන්දය දීම**

(අ) අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගැනීම උදෙසා ගණන් කරනු ලැබුවේ යම් සාමාජිකයන්ගේ ඡන්ද සංඛ්‍යාවක් ද, ඒ ඡන්ද සංඛ්‍යාව දීමට එක් එක් අධ්‍යක්ෂවරයාට හිමිකම ඇත්තේ ය. අධ්‍යක්ෂවරයකු විසින් දෙනු ලැබීමට හිමිකම ඇති සියලු ඡන්ද එක් ඒකකයක් වශයෙන් දෙනු ලැබිය යුතු ය. මේ, සම්මුතියෙහි අන්‍යාකාරයකින් නියම කොට ඇති විට හැර, දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාවේ බහුතරයකින් මණ්ඩලයේ තීරණ ගත යුතු ය.

(ආ) ඡන්දය දීමේ සම්පූර්ණ බලයෙන් අඩකට අඩු නොවන, ඡන්ද බලය ක්‍රියාත්මක කරන අධ්‍යක්ෂවරයන්ගේ බහුතරයකින් මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සංයුක්ත විය යුතු ය.

(ඇ) යම් ක්‍රියාවක් ඒජන්සියේ උපරිම යහපත සඳහා වන්නේ යයි මණ්ඩලයේ සභාපතිවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින් මණ්ඩලයේ රැස්වීමක් නොකැඳවා, නිශ්චිත ප්‍රශ්ණයක් පිළිබඳව මණ්ඩලයේ තීරණයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි කාර්ය පටිපාටියක්, මණ්ඩලය විසින්, නියෝග මගින් ඇති කරනු ලැබිය හැකි ය.

## VII වන පරිච්ඡේදය

## වරප්‍රසාද සහ නිදහස් කිරීම්

### 43 වන ව්‍යවස්ථාව : පරිච්ඡේදයේ පරමාර්ථ

ස්වකීය කර්තව්‍ය මුදුන්පත් කර ගැනීමට ඒජන්සියට හැකි කරනු පිණිස, එක් එක් සාමාජිකයාගේ දේශයෙහි ඇති ඒජන්සියට මේ පරිච්ඡේදයෙහි දක්වා ඇති නිදහස් කිරීම් සහ වරප්‍රසාද ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

### 44 වන ව්‍යවස්ථාව : නෛතික කාර්යාවලිය

ඒජන්සියට කාර්යාලයක් ඇත්තා වූ හෝ කාර්යාවලිය පිළිබඳ දැන්වීම් භාර ගැනීමේ හෝ භාර දීමේ කාර්ය සඳහා අනුයෝජිතයකු වශයෙන් පත් කරනු ලැබ ඇත්තා වූ සාමාජිකයන්ගේ දේශයන් හි නිසි අධිකරණ බලය ඇති අධිකරණයක දී පමණක් 57 වන සහ 58 වන ව්‍යවස්ථාවල විෂය ප්‍රමාණය ඇතුළත නොවන නඩු ඒජන්සියට විරුද්ධව පවරනු ලැබිය හැකි ය. (i) සාමාජිකයන් විසින් හෝ සාමාජිකයන් වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ හෝ හිමිකම් පෑම් ව්‍යුත්පන්න වූ තැනැත්තන් විසින් ; හෝ (ii) පෞද්ගලික කාරණා සම්බන්ධයෙන් හෝ එවැනි කිසිම නඩුවක් ඒජන්සියට විරුද්ධව පවරනු නොලැබිය යුතු ය. ඒජන්සියේ දේපළ සහ වත්කම් කවර හෝ ස්ථානයක පිහිටිය ද, කවරකු විසින් හෝ දරනු ලැබුව ද, ඒජන්සියට විරුද්ධව අවසාන නඩු තීන්දුව හෝ ප්‍රදානය භාරදීමට පෙර සියලු ආකාරයෙන් වූ තහනමට ගැනීමෙන්, තහනම් කිරීමෙන් හෝ ක්‍රියාවේ යෙදවීමෙන් නිදහස් වන්නේ ය.

### 45 වන ව්‍යවස්ථාව : වත්කම්

(අ) ඒජන්සියේ දේපළ සහ වත්කම් කවර හෝ ස්ථානයක පිහිටිය ද කවරකු විසින් හෝ දරනු ලැබුව ද, විධායක හෝ ව්‍යවස්ථාදායක ක්‍රියාවක් මගින් සෝදිසි කිරීමෙන්, බල කර ලබා ගැනීමෙන්, රජය සතු කිරීමෙන්, සන්තකය පැහැර ගැනීමෙන් හෝ වෙනත් යම් ආකාරයක තහනමට ගැනීමෙන් නිදහස් වන්නේ ය.

(ආ) මේ සම්මුතිය යටතේ ස්වකීය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ඒජන්සියේ සියලු දේපළ සහ වත්කම් කවර හෝ ස්වභාවයකින් වූ පරිසීමාකිරීම්වලින්, විධිමත් කිරීම්වලින්, පාලන කිරීම්වලින් සහ දේපළ පැවරීම තාවකාලිකව අත්හිටවීමෙන් නිදහස් වන්නේය එය එසේ වුවද ඇප සහතිකයක් ප්‍රතිරක්ෂිත අස්තිත්වයක් දරන්නකුගේ අනුප්‍රාප්තිකයකු වශයෙන් හෝ පුනරාදේශකයකු වශයෙන් හෝ ප්‍රතිරක්ෂිත අස්තිත්වයකින් රක්ෂිත ආයෝජකයකු වශයෙන් හෝ ඒජන්සිය විසින් අත්කර ගනු ලැබූ දේපළ සහ වත්කම්, ඒ ඒජන්සිය පුනරාදේශකයකු කරනු ලැබුවේ යම් දරන්නකුට ද, අස්තිත්වයකුට ද නැතහොත් ආයෝජකයකුට ද, ඒ දරන්නා අස්තිත්වය නැතහොත් ආයෝජක ඒ ප්‍රතිකර්මය ලැබීමට හිමිකම් ඇති ප්‍රමාණයට අදාළ සාමාජිකයාගේ දේශයන්හි භාවිත ධන විදේශ විනිමය පරිසීමාකිරීම් වලින්, නියෝගවලින් සහ බලපවත්නා පාලන ක්‍රමවලින් නිදහස් විය යුතු ය.

(ඇ) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "වත්කම්" යන යෙදුමෙහි මේ සම්මුතියෙහි I වන උපලේඛනයෙහි සඳහන් සමානුග්‍රහ භාර අරමුදලේ වත්කම් සහ ස්වකීය අරමුණු නංවාලීමෙහි ලා ඒජන්සිය විසින් පරිපාලනය කරනු ලබන වෙනත් වත්කම් ඇතුළත් වන්නේ ය.

### 46 වන ව්‍යවස්ථාව : ලේඛනාගාරය සහ පණිවුඩ සේවය

(අ) කවර හෝ ස්ථානයක තිබුණ ද ඒජන්සියේ ලේඛනාගාර අලංඝනීය වේ.

(ආ) එක් එක් සාමාජිකයා විසින් බැංකුවේ නිල පණිවුඩවලට දෙනු ලබන සැලකිල්ලම ඒජන්සියේ නිල පණිවුඩ වලට ද දෙනු ලැබිය යුතු ය.

### 47 වන ව්‍යවස්ථාව : බදු

(අ) ඒජන්සිය, එහි වත්කම් දේපළ හා ආදායම් සහ මේ සම්මුතියෙන් බලය දෙනු ලැබූ එහි ක්‍රියා කාරකම් හා ගණුදෙනු සියලු බදුවලින් සහ තීරු බදුවලින් නිදහස් වන්නේ ය. යම් බද්දක් හෝ තීරු බද්දක් එකතු කිරීම හෝ ගෙවීම සඳහා වූ වගකීමෙන් ද ඒජන්සිය නිදහස් විය යුතුය.

(ආ) ස්වදේශිකයන් සම්බන්ධයෙන් වන විට හැර, ඒජන්සිය විසින් පාලක වරයන්ට සහ ඔවුන්ගේ වෛකල්පිකයන්ට, ගෙවනු ලබන වියදම් දීමනා මත හෝ ඒ සම්බන්ධයෙන් හෝ ඒජන්සිය විසින් මණ්ඩලයේ සභාපතිවරයාට, අධ්‍යක්ෂ වරයන්ට, ඔවුන්ගේ වෛකල්පිකයන්ට, සභාපතිවරයාට හෝ ඒජන්සියේ කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන වැටුප්, වියදම් දීමනා හෝ වෙනත් පඩිනඩි මත හෝ ඒ සම්බන්ධයෙන් කිසිම බද්දක් අය නොකළ යුතුය.

(ඇ) කවරකු විසින් දරනු ලැබුව ද, (සහතික කරනු ලැබූ හෝ ප්‍රතිරක්ෂණය කරනු ලැබූ යම් ආයෝජනයකින් ලබන ඉපැයීම් කිසිවක් ඇතුළුව) සහතික කරනු ලැබූ හෝ ප්‍රතිරක්ෂණය කරනු ලැබූ යම් ආයෝජනයක් මත හෝ (ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය කරනු ලැබූ රක්ෂණ ඔප්පු කිසිවකින් ලබන යම් වාරික සහ වෙනත් ආදායම් ඇතුළුව) ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය කරනු ලැබූ රක්ෂණ ඔප්පු කිසිවක් මත,—

(i) ඒජන්සිය විසින් ඒ ආයෝජනය හෝ රක්ෂණ ඔප්පුව සහතික කරනු ලැබූ නිසා ම නැතහොත් ප්‍රතිරක්ෂණය කරනු ලැබූ නිසා ම, ඒ ආයෝජනයට හෝ රක්ෂණ ඔප්පුවට ප්‍රතිපක්ෂව විශේෂත්වයක් දක්වන්නා වූ ; හෝ

(ii) ඒ බදු පැනවීම සඳහා එකම අධිකරණ බලසීමා පදනම ඒජන්සිය විසින් පවත්වා ගෙන යනු ලබන යම් කාර්යාලයක හෝ ව්‍යාපාර ස්ථානයක පිහිටීම වන්නේ නම්, ඒ මත කවර හෝ වර්ගයකට අයත් බද්දක් අය නොකළ යුතුය.

**48 වන ව්‍යවස්ථාව : ඒජන්සියේ නිලධරයන්**

ඒජන්සියේ සියලු පාලකවරයන්, අධ්‍යක්ෂවරයන්, වෛකල්පිකයන්, සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය,—

(i) ඔවුන් විසින් තම නිල තත්ත්වයෙන් ඉටු කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් නෛතික කාර්යාවලියට භාජනය කරනු ලැබීමෙන් නිදහස් වන්නේ ය;

(ii) ස්වදේශිකයන් නොවන්නේ නම්, වෙනත් සාමාජික රටවල සමාන නිලයක් දරන නියෝජිතයින්ට, නිලධරයන්ට සහ සේවා නියුක්තියන්ට අදාළව පිරිනමනු ලබන ආගමන පරිසීමා කිරීම් වලින් විදේශිකයින් ලියාපදිංචි කිරීමේ නියමයන්ගෙන් සහ ජාතික සේවා බැඳීම්වලින් නිදහස් කිරීමේ පරිහාරය සහ විදේශ විනිමය පරිසීමා කිරීම් සම්බන්ධයෙන් ඒ පහසුකම් වලින් ප්‍රදානය කළ යුතුය; තවද,

(iii) වෙනත් සාමාජික රටවල සමාන නිලයක් දරන නියෝජිතයන්ට, නිලධරයන්ට සහ සේවකයන්ට අදළ සාමාජික රටවල් විසින් පිරිනමනු ලබන ගමන් පහසුකම් සම්බන්ධයෙන් එම සැළකිල්ලම ප්‍රදානය කළ යුතු ය.

**49 වන ව්‍යවස්ථාව : මෙම පරිච්ඡේදය අදළ කිරීම**

මේ පරිච්ඡේදයේ දක්වා ඇති සිද්ධාන්ත ස්වකීය නීතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එක් එක් සාමාජික රට විසින් ස්වකීය දේශය ඇතුළත අවශ්‍ය යම් ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර, ඒ සාමාජික රට විසින් ගනු ලැබූ සවිස්තර ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් ඒජන්සියට දන්විය යුතු ය.

**50 වන ව්‍යවස්ථාව : අත් හැරීම**

මේ පරිච්ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිහාර, නිදහස් කිරීම සහ වරප්‍රසාද ඒජන්සියේ යහපත උදෙසා ප්‍රදානය කරනු ලබන අතර, යම් අත්හැරීමකින් ස්වකීය යහපතට හානිකර නොවන අවස්ථාවල දී ඒජන්සිය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රමාණයකට සහ යම් කොන්දේසි මත, ඒ පරිහාර, නිදහස් කිරීම සහ වරප්‍රසාද අත් හරිනු ලැබිය හැකි ය. ඒජන්සියේ මතය අනුව, යම් පරිහාරයක් යුක්තියේ ක්‍රියා මාර්ගයට බාධාවක් විය හැකි අවස්ථාවක, සහ ඒජන්සියේ යහපතට අගතියක් නොමැතිව එලෙස අත් හරිනු ලැබිය හැකි විටක, ස්වකීය කාර්ය මණ්ඩලයේ කිසිවකුගේ පරිහාර ඒජන්සිය විසින් අත් හරිනු ලැබිය හැකි ය.

## VIII වන පරිච්ඡේදය

### සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම, සාමාජිකත්වය අත්හිටුවීම සහ ක්‍රියාකාරකම්, නතර කිරීම

**51 වන ව්‍යවස්ථාව : ඉල්ලා අස්වීම**

යම් සාමාජිකයකු විසින් මේ සම්මුතියට එළඹ, ඒ සාමාජිකයා සම්බන්ධයෙන් එය බලාත්මක වීමේ දිනට ඉක්බිතිව එළඹෙන අවුරුදු තුන ඉකුත් වීමෙන් පසුව, ඒජන්සියේ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත දන්වීමක් දීමෙන් පසුව, කවර හෝ අවස්ථාවක, ඒ සාමාජිකයාට ඒජන්සියෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒජන්සිය විසින් ඒ දන්වීම ලැබුණු බව මේ සම්මුතියේ තැන්පතුධාරී වශයෙන් බැංකුවට දන්විය යුතු ය. ඒජන්සිය වෙත ඒ දන්වීම ලැබුණේ යම් දිනයක ද, එදින සිට දින අනුවකට පසු යම් ඉල්ලා අස්වීමක් බලසහිත විය යුතු ය. යම් දන්වීමක් බල සහිත නොවනතාක් කල් සාමාජිකයකු විසින් ඒ දන්වීම ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

**52 වන ව්‍යවස්ථාව : සාමාජිකත්වය අත්හිටුවීම**

(අ) මේ සම්මුතිය යටතේ වූ ස්වකීය බැඳීම් කිසිවක් ඉටු කිරීමට සාමාජිකයකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, සභාව විසින් සම්පූර්ණ ඡන්දය දීමේ බලයේ බහුතරයන් ක්‍රියාත්මක කරමින් ස්වකීය සාමාජිකයන්ගේ බහුතර ඡන්දයකින් ඒ සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබිය හැකි ය.

(ආ) සාමාජිකත්වය අත්හිටුවනු ලැබ සිටින අතරතුර, මේ පරිච්ඡේදයෙහි සහ IX වන පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති ඉල්ලා අස්වීමේ අයිතිය සහ වෙනත් අයිතිවාසිකම් හැර, මේ සම්මුතිය යටතේ අයිතිවාසිකම් කිසිවක් සාමාජිකයකුට නොතිබිය යුතු ය. එහෙත් ස්වකීය සියලු බැඳීම්වලට යටත් ව සිටිය යුතු ය.

(ඇ) මේ සම්මුතියේ III වන පරිච්ඡේදයේ හෝ I වන ඇමුණුම යටතේ නිකුත් කරනු ලැබිය යුතු ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණයක් සඳහා සුදුසුකම තීරණය කිරීමේ කාර්ය සම්බන්ධයෙන් අත්හිටුවනු ලැබූ සාමාජිකයකු ඒජන්සියේ සාමාජිකයකු වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(ඇ) සාමාජිකත්වය අත්හිටුවනු ලැබූ සාමාජිකයාගේ අත්හිටුවීමේ කාලය දීර්ඝ කිරීමට හෝ සාමාජිකයා යථා තත්ත්වයට පත් කිරීමට හෝ සභාව විසින් තීරණය කරනු ලැබුවහොත් මිස, ස්වකීය අත්හිටුවීමේ දින සිට එක් වර්ෂයකින්, අත්හිටුවනු ලැබූ සාමාජිකයා සාමාජිකයකු වීම නිතැතින්ම අවසන් විය යුතු ය.

**53 වන ව්‍යවස්ථාව : සාමාජිකයන්වීම අවසන් කෙරෙන රාජ්‍යයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්**

(අ) රාජ්‍යයක් විසින් සාමාජිකයකු වීම අවසන් කරන විට, ස්වකීය සාමාජිකත්වය අවසන් වීමට පෙර බල සහිත විය යුතු මේ සම්මුතිය යටතේ වූ ස්වකීය අවිනිශ්චිත බැඳීම් ඇතුළුව, ස්වකීය සියලු බැඳීම් සඳහා යටත් ව සිටිය යුතු ය.

(ආ) ඉහත (අ) වගන්තියට අගතියක් නොමැතිව, පිළිවෙළින් වූ තම හිමිකම් පෑම් සහ බැඳීම් බේරුම්කිරීම සඳහා ඒජන්සිය විසින් එවැනි රාජ්‍යයක් සමග යම් ක්‍රියා මාර්ගයකට ඇතුළත් විය යුතු ය. එවැනි යම් ක්‍රියා මාර්ගයක් මණ්ඩල විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

**54 වන ව්‍යවස්ථාව : ක්‍රියාකාරකම් අත් හිටුවීම**

(අ) යුක්තිසහගත යයි මණ්ඩලය විසින් සලකනු ලබන කවර හෝ විටෙක, යම් නිශ්චිත කාල සීමාවක් සඳහා අලුත් ඇප සහතික නිකුත් කිරීම අත්හිටුවනු ලැබිය හැකි ය.

(ආ) හදිසි අවස්ථාවක දී, ඒ හදිසි අවස්ථාව පවත්නා කාලය නොඉක්ම වන කාල සීමාවක් සඳහා, ඒජන්සියේ සියලු කටයුතු මණ්ඩලය විසින් අත් හිටුවනු ලැබිය හැකි ය. එසේ වුවද, එවැනි අවස්ථාවක ඒජන්සියේ සහ තෘතීය පාර්ශ්වයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය යම් ක්‍රියා මාර්ගයක් ඇති කරනු ලැබිය යුතු ය.

(ඇ) ක්‍රියාකාරකම් අත්හිටුවීම සඳහා වූ තීරණය මේ සම්මුතිය යටතේ සාමාජිකයන්ගේ බැඳීම් සම්බන්ධයෙන් හෝ ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණ ඔප්පුවක් දරන්නන් උදෙසා හෝ ඒජන්සියේ බැඳීම් සම්බන්ධයෙන් හෝ තෘතීය පාර්ශ්වයන් උදෙසා හෝ කිසිම බලපෑමක් නොවිය යුතු ය.

**55 වන ව්‍යවස්ථාව : ඈවර කිරීම**

(අ) ක්‍රියාකාරකම් නතර කොට ඒජන්සිය ඈවර කිරීමට සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය හැකි ය. එවිට, වත්කම් ක්‍රමවත්ව උප ලබ්ධ කර ගැනීමට, සංරක්ෂණය කිරීමට හා ආරක්ෂා කිරීමට සහ බැඳීම් බේරුම් කිරීමට ආනුෂංගික කටයුතු හැර, සියලු කටයුතු ඒජන්සිය විසින් වහාම නැවැත්විය යුතු ය. අවසාන වශයෙන් බේරුම් කොට වත්කම් බෙදා හරිනු ලබන තෙක්, ඒජන්සිය පවත්වා ගෙන ගිය යුතු අතර, මේ සම්මුතිය යටතේ සාමාජිකයන්ගේ සියලු අයිතිවාසිකම් සහ බැඳීම් දුබල නොකොට නොකඩවා පවත්වා ගෙන යා යුතු ය.

(ආ) ඇප සහතික දරන්නන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ සියලු බැරකම් නිදහස් කරනු ලබන තෙක්, හෝ ඒ සඳහා ප්‍රතිපාදන සලසනු ලබන තෙක්, සහ ඒ බෙදා හැරීම කිරීමට සභාව විසින් තීරණය කරනු ලබන තෙක්, වත්කම් කිසිවක් සාමාජිකයන්ට බෙදා දෙනු නොලැබිය යුතු ය.

(ඇ) ඉහත සඳහන් කරුණුවලට යටත්ව, ඒජන්සිය විසින් එහි ඉතිරි ව ඇති වත්කම් සභාගත ප්‍රාග්ධනයෙහි එක් එක් සාමාජිකයාගේ කොටස් ප්‍රමාණයට අනුප්‍රාප්තිකව සාමාජිකයන් වෙත බෙද හරිනු ලැබිය යුතු ය. මේ සම්මුතියේ 1 වන ඇමුණුමෙහි සඳහන් සමානුග්‍රහ භාර අරමුදලේ ඉතිරිව ඇති වත්කම් ද, එක් එක් සමානුග්‍රාහ සාමාජිකයා විසින් සමානුග්‍රහ කළ ආයෝජන, මුළු සමානුග්‍රහ ආයෝජනවලට දරන අනුපාතය අනුව සමානුග්‍රහක සාමාජිකයන් වෙත ඒජන්සිය විසින් බෙද හරිනු ලැබිය යුතු ය. ඒජන්සිය විසින්, ඒ වෙනුවෙන් කරන ලද බේරුම් කොට ඇත්නම් මිස, ඒජන්සියේ හෝ සමානුග්‍රහ භාර අරමුදලේ හෝ වත්කම්වලින් තම කොටසට ඒ සාමාජිකයා හිමිකම් නොලැබිය යුතු ය. සෑම වත්කම් බෙදා හැරීමක්ම, සභාව විසින් තීරණය කරනු ලබන යම් අවස්ථාවල දී සහ අපක්ෂපාතී සහ සාධාරණ යයි සභාව විසින් සලකනු ලබන යම් ආකාරයකින් කරනු ලැබිය යුතු ය.

## IX වන පරිච්ඡේදය

## ආරවුල් බේරුම් කිරීම

**56 වන ව්‍යවස්ථාව : සම්මුතිය අර්ථ නිරූපනය කිරීම හා අදළ කිරීම**

(අ) ඒජන්සියේ යම් සාමාජිකයකු සහ ඒජන්සිය අතර හෝ ඒජන්සියේ සාමාජිකයන් අතර උද්ගත වන, මේ සම්මුතියේ විධිවිධාන අර්ථ නිරූපනය කිරීම හෝ අදාළ කිරීම සම්බන්ධයෙන් වූ යම් ප්‍රශ්නයක් මණ්ඩලයේ තීරණය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ප්‍රශ්නය විශේෂයෙන් ම බලපා ඇත්තා වූ ද ස්වදේශිකයකු මගින් මණ්ඩලයෙහි අන්‍යාකාරයකින් නියෝජනය වී නොමැත්තා වූ ද යම් සාමාජිකයකු විසින් ඒ ප්‍රශ්නය සැලකිල්ලට භාජනය කරනු ලබන මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගිවීමට නියෝජිතයකු යවනු ලැබිය හැකි ය.

(ආ) මණ්ඩලය විසින් ඉහත (අ) වගන්තිය යටතේ තීරණයක් දෙනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, ප්‍රශ්නය සභාව වෙත යොමු කරන ලෙස කවර හෝ යම් සාමාජිකයකු විසින් ඉල්ලා සිටිය හැකි අතර, එහි තීරණය අවසානාත්මක වන්නේය. සභාව වෙත කරන ලද යොමුවේ ප්‍රතිඵලය තෙක්, අවශ්‍ය යයි ඒජන්සිය විසින් සලකනු ලබනතාක් දුරට මණ්ඩලයේ තීරණයේ පදනම මත, ඒජන්සිය විසින් ක්‍රියා කළ හැකිය.

**57 වන ව්‍යවස්ථාව : ඒජන්සිය සහ සාමාජිකයන් අතර ආරාවුල්**

(අ) 56 වන ව්‍යවස්ථාව සහ (ආ) වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, ඒජන්සිය සහ මේ ව්‍යවස්ථාවේ සාමාජිකයකු අතර හෝ ඒ සාමාජිකයාගේ අනුයෝජිතයකු අතර වූ යම් ආරවුලක් සහ ඒජන්සිය සහ සාමාජිකයකු වීම අවසන් කරනු ලැබූ රටක් (හෝ ඒ රටේ අනුයෝජිතයකු) අතර වූ යම් ආරවුලක් මේ සම්මුතියේ II වන ඇමුණුමෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව බේරුම් කළ යුතු ය.

(ආ) ආයෝජකයකුගේ පුනරාදේශක වශයෙන් ක්‍රියා කරමින් ඒජන්සියේ හිමිකම්පෑම් සම්බන්ධයෙන් වූ ආරාවුල් (i) මේ සම්මුතියේ II වන ඇමුණුමෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව හෝ (ii) ඒ ආරාවුල් බේරුම් කිරීම සඳහා වූ විකල්ප ක්‍රමයක් හෝ ක්‍රම මත ඒජන්සිය සහ අදළ සාමාජිකයා අතර ඇතුළත් විය යුතු එකඟවීමක් අනුව හෝ බේරුම් කර ගත යුතු ය. පසුව සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, මේ සම්මුතියේ II වන ඇමුණුම එවැනි එකඟවීමක් සඳහා වූ පදනමක් වශයෙන් යෙදිය යුතු අතර, ඒ එක් එක් අවස්ථාවේ දී අදාළ සාමාජිකයාගේ දේශයෙහි ඒජන්සිය විසින් ක්‍රියා කාරකම් භාර ගැනීමට පෙරාතුව මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයෙන් අනුමත කරනු ලැබිය යුතු ය.

**58 වන ව්‍යවස්ථාව : ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණයක් දරන්නට අදළවන ආරවුල්**

ගිවිසුමක පාර්ශ්වකරුවන් අතර ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණයක් සම්බන්ධයෙන් වූ ගිවිසුමක් යටතේ උද්ගතවන යම් ආරවුලක්, ඒ ඇප සහතික හෝ ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි විධිවිධාන සලසා ඇති පරිදි හෝ එහි සඳහන් පරිදි වූ රීතිවලට අනුකූලව, අවසාන තීරණය සඳහා බේරුම් කරනු ලැබීමට ඉදිරිපත් කළ යුතු ය.

## X වන පරිච්ඡේදය

## සංශෝධන

**59 වන ව්‍යවස්ථාව : සභාව විසින් සංශෝධනය කිරීම**

(අ) මුළු ඡන්ද බලයෙන් පහෙන් හතරක් ක්‍රියාත්මක කරන, පාලකවරයන්ගෙන් පහෙන් තුනක ඡන්දයෙන් මේ සම්මුතිය සහ එහි ඇමුණුම් සංශෝධනය කරනු ලැබිය හැකි ය ; එසේ වුව ද—

(i) 51 වන ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලසා ඇති පරිදි ඒජන්සියෙන් ඉල්ලා අස්වීමේ අයිතිය හෝ 8 වන ව්‍යවස්ථාවේ (ඇ) වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි වගකීම පිළිබඳ සීමාව වෙනස් කෙරෙන යම් සංශෝධනයකට සියලු පාලකවරයන්ගේ අස්ත්‍යාර්ථක ඡන්දය අවශ්‍ය වන්නේ ය ;
සහ

(ii) මේ සම්මුතියේ I වන ඇමුණුමෙහි 1 වන ව්‍යවස්ථාව සහ 3 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මගින් සලසා ඇති පාඩු කොටස් කර ගැනීමේ ක්‍රියා මාර්ගය වෙනස් කෙරෙන්නා වූ ද ඒ යටතේ යම් සාමාජිකයකුගේ වගකීම වැඩි කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙන්නා වූ ද යම් සංශෝධනයක් සමග ඒ එක් එක් සාමාජිකයාගේ, පාලකවරයාගේ අස්ත්‍යාර්ථක ඡන්ද අවශ්‍ය වන්නේ ය.

(ආ) මේ සම්මුතියේ 'අ' සහ 'ආ' උපලේඛන සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(ඇ) යම් සංශෝධනයකින් මේ සම්මුතියේ 1 වන ඇමුණුමෙහි වූ යම් විධිවිධානයක් කෙරෙහි බලපෑමක් වන්නේ නම්, මුළු ඡන්ද සංඛ්‍යාවෙහි සමානුග්‍රාහක සාමාජිකයන්ට සහ සමානුග්‍රාහක ආයෝජන ධාරක රටවල්වලට ඒ ඇමුණුමෙහි 7 වන ව්‍යවස්ථාව යටතේ වෙන් කර දෙනු ලැබූ අතිරේක ඡන්ද සංඛ්‍යාව ඇතුළත් විය යුතු ය.

**60 වන ව්‍යවස්ථාව : කාර්ය පටිපාටිය**

මේ සම්මුතිය සංශෝධනය කිරීම සඳහා වූ යම් යෝජනාවක් සාමාජිකයකුගෙන් හෝ පාලකවරයකුගෙන් හෝ අධ්‍යක්ෂවරයකුගෙන් ආරම්භ වුව ද, එය මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු එම යෝජනාව මණ්ඩලය ඉදිරියෙහි තැබිය යුතු ය. යෝජිත සංශෝධනය මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබුවහොත්, එය 59 වන ව්‍යවස්ථාව අනුව අනුමත කිරීම සඳහා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. යම් සංශෝධනයක් සභාව විසින් යථා පරිදි අනුමත කරනු ලැබ ඇති විට, සියලු සාමාජිකයන් අමතනු ලැබූ විධිමත් සන්දේශයක් මගින් ඒජන්සිය විසින් ඒ බව සහතික කළ යුතු ය. සභාව විසින් වෙනස් දිනයක් නිශ්චය කර ඇත්නම් මිස, සංශෝධන විධිමත් ලෙස දන්වීමේ දිනයට පසු, දින අනූවකින් එය සියලු සාමාජිකයන් සඳහා බලාත්මක විය යුතු ය.

## XI වන පරිච්ඡේදය

## අවසාන විධිවිධාන

**61 වන ව්‍යවස්ථාව : බලාත්මක වීම**

(අ) මේ සම්මුතිය බැංකුවේ සියලු සාමාජිකයන් සහ ස්විට්සර්ලන්තය වෙනුවෙන් අත්සන් කිරීම සඳහා විවෘත විය යුතු අතර, අත්සන් කරන රාජ්‍යයන් විසින්, තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කාර්ය පටිපාටිවලට අනුකූලව එය ස්ථිර කරනු ලැබීමට, පිළිගනු ලැබීමට හෝ අනුමත කරනු ලැබීමට යටත් වන්නේ ය.

(ආ) පළමුවන ගණයට අයත් අත්සන් කරන රාජ්‍යයන් වෙනුවෙන් ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ සාධන පත්‍ර පහකට නොඅඩු සංඛ්‍යාවක් තැන්පත් කරනු ලැබුවා වූ ද, දෙවන ගණයට අයත් අත්සන් කරන රාජ්‍යයන් වෙනුවෙන් එවැනි සාධන පත්‍ර පහළොවකට නොඅඩු සංඛ්‍යාවක් තැන්පත් කරනු ලැබුවා වූ ද දිනයෙහි මේ සම්මුතිය බලාත්මක වන්නේ ය. එසේ වුව ද මේ රාජ්‍යයන්ගේ මුළු දායක මුදල 5 වන ව්‍යවස්ථාවෙහි නියමිත පරිදි ඒජන්සියේ බලයලත් ප්‍රාග්ධනයෙන් තුනෙන් එකකට නොඅඩු මුදලක් විය යුතු ය.

(ඇ) මේ සම්මුතිය බලාත්මක වීමෙන් පසුව, ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ ස්වකීය සාධන පත්‍රය තැන්පත් කරන එක් එක් රාජ්‍ය සඳහා ඒ සාධන පත්‍රය තැන්පත් කිරීමේ දින සිට මේ සම්මුතිය බලාත්මක වන්නේ ය.

(ඈ) අත්සන් කිරීම සඳහා සම්මුතිය විවෘත කිරීමෙන් පසු, වර්ෂ දෙකක් ඇතුළත මේ සම්මුතිය බලාත්මක නොවුවහොත්, එහි ඉදිරි ක්‍රියා මාර්ගය තීරණය කිරීම පිණිස ඊට සම්බන්ධතාවක් ඇති රටවල සම්මේලනයක් බැංකුවේ අධිපතිවරයා විසින් කැඳවිය යුතු ය.

**62 වන ව්‍යවස්ථාව : ප්‍රාරම්භක රැස්වීම**

මේ සම්මුතිය බලාත්මක වූ විට, බැංකුවේ අධිපතිවරයා විසින් සභාවේ ප්‍රාරම්භක රැස්වීම කැඳවිය යුතු ය. මේ රැස්වීම, මේ සම්මුතිය බලාත්මක වූ දින සිට දින හැටක් ඇතුළත නැතහොත් ඉන් පසු හැකි ඉක්මණින්, ඒජන්සියේ ප්‍රධාන කාර්යාලයෙහි පවත්වනු ලැබිය යුතු ය.

**63 වන ව්‍යවස්ථාව : ලේඛනාගාරය**

මේ සම්මුතිය සහ එහි සංශෝධන ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ සාධන පත්‍ර බැංකුව වෙත තැන්පත් කළ යුතු අතර, එය මේ සම්මුතියේ ලේඛනාගාරය වශයෙන් ක්‍රියා කළ යුතු ය. ලේඛනාගාරය විසින් මේ සම්මුතියේ සහතික පිටපත් රාජ්‍යයන්ට, බැංකුවේ සාමාජිකයන්ට සහ ස්විට්සර්ලන්තයට යැවිය යුතු ය.

**64 වන ව්‍යවස්ථාව : ලියාපදිංචි කිරීම**

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 102 වන ව්‍යවස්ථාවට සහ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද ඒ යටතේ වූ නියෝගවලට අනුකූලව, ලේඛනාගාරය විසින් මේ සම්මුතිය එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලයෙහි ලියාපදිංචි කළ යුතු ය.

**65 වන ව්‍යවස්ථාව : නිවේදන**

ලේඛනාගාරය විසින් අත්සන් කරන සියලු රාජ්‍යයන්ට සහ මේ සම්මුතිය බලාත්මක වූ විට ඒජන්සියට පහත දක්වෙන කරුණු දැක්විය යුතුය :—

(අ) මේ සම්මුතියේ අත්සන් ;

(ආ) 63 වන ව්‍යවස්ථාවට අනුකූලව ස්ථිර කිරීමේ, පිළිගැනීමේ සහ අනුමත කිරීමේ සාධන පත්‍ර තැන්පත් කිරීම්

(ඇ) 61 වන ව්‍යවස්ථාව අනුව මේ සම්මුතිය බලාත්මක වන දිනය ;

(ඈ) 66 වන ව්‍යවස්ථාව අනුව දේශීය අදාළ කිරීමෙන් බැහැර කිරීම් ; සහ

(ඉ) 51 වන ව්‍යවස්ථාව අනුව සාමාජිකයකු ඒජන්සියෙන් ඉල්ලා අස්වීම,

**66 වන ව්‍යවස්ථාව : දේශීය අදාළ කිරීම**

ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ අවස්ථාවේ දී හෝ ඉන් අනතුරුව මේ සම්මුතියේ ලේඛනාගාරය වෙත කරන ලද ලිඛිත දැන්වීමක් මගින් බැහැර කරනු ලැබූ දේශ හැර, යම් දේශයක ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා සාමාජිකයෙකු වගකිව යුතු වන්නේ ද, එම දේශ ඇතුළුව, සාමාජිකයකුගේ බලසීමාව යටතේ වූ සියලු දේශවලට මේ සම්මුතිය අදාළ වන්නේ ය.

**67 වන ව්‍යවස්ථාව : කලින් කල කරනු ලබන සමාලෝචන**

(අ) ස්වකීය පරමාර්ථ ඉටු කිරීම පිණිස ඒජන්සියේ හැකියාවන්, වර්ධනය කිරීමට අවශ්‍ය වන්නා වූ යම් වෙනස්කම් ඇති කිරීමේ අරමුණු ඇතිව ඒජන්සියේ කටයුතු පිළිබඳව මෙන්ම අත් කර ගනු ලැබූ ප්‍රතිඵල පිළිබඳව සභාව විසින් කලින් කල පුළුල් විමර්ශන පැවැත්විය යුතු ය.

(ආ) ඒ ප්‍රථම විමර්ශනය මේ සම්මුතිය බලාත්මක වීමෙන් පසු වර්ෂ පහකින් පවත්වනු ලැබිය යුතු ය. ඉන් අනතුරුව පවත්වනු ලබන විමර්ශනවල දින සභාව විසින් තීරණය කළ යුතු ය.

ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ ලේඛනාගාරයේ තැන්පත්කර තිබෙන්නට හැරිය යුතු එක් පිටපතක් වශයෙන් සෝල් හි දී සාදනු ලැබ, මේ සම්මුතිය යටතේ ඊට පවරා ඇති කර්තව්‍ය මුදුන්පත් කිරීම පිණිස ස්වකීය එකඟත්වය මෙහි පහත ඇති ස්වකීය අත්සනින් දක්වා ඇත.

**1 වන ඇමුණුම**

**24 වන ව්‍යවස්ථාව යටතේ සමානුග්‍රහ ආයෝජනවලට ඇපවීම**

**1 වන ව්‍යවස්ථාව සමානුග්‍රහය**

(අ) යම් ජාතියක ආයෝජකයකු විසින් හෝ යම් ජාතික හෝ ජාති කිහිපයක ආයෝජකයින් විසින් කරනු ලබන ආයෝජන සම්බන්ධයෙන් ඇපවීම සඳහා යම් සාමාජිකයකු විසින් සමානුග්‍රහය දැක්විය හැකි ය.

(ආ) මේ ඇමුණුමේ 3 වන ව්‍යවස්ථාවේ (ආ) සහ (ඇ) වගන්තිවල විධිවිධාන වලට යටත්ව, එක් එක් සමානුග්‍රහ සාමාජිකයකු විසින්, සමානුග්‍රහ ආයෝජන පිළිබඳව වූ අලාභ, එම අලාභ මේ ඇමුණුමේ 2 වන ව්‍යවස්ථාවේ සඳහන් සමානුග්‍රහ භාර අරමුදලින් ආවරණය කළ නොහැකි වූ විට ද එසේ ආවරණය කළ නොහැකි ප්‍රමාණයටද, අනෙකුත් සමානුග්‍රහ සාමාජිකයන් සමඟ සියළුම සාමාජිකයන් විසින් සමානුග්‍රහය දක්වන ලද ආයෝජන ඇප යටතේ වූ උපරිම අවිනිශ්චිත බැරකම්වල මුළු ප්‍රමාණයට එම සාමාජිකයා විසින් සමානුග්‍රහ දක්වන ලද අවිනිශ්චිත බැරකම් දරන අනුපාතයට අනුව ද අනෙකුත් සමානුග්‍රහ සාමාජිකයන් සමඟ කොටස් කර ගත යුතු ය.

(ඇ) මේ ඇමුණුම යටතේ ඇප සහිතව නිකුත් කිරීම සම්බන්ධයෙන් ඒජන්සිය විසින් තීරණ ගැනීමේ දී, මේ ඇමුණුම යටතේ සමානුග්‍රහ සාමාජිකයන්ට ස්වකීය බැඳීම් ඉටු කිරීමට හැකිවීමේ ඉඩකඩ ගැන නිසි සැලකිල්ල යොමු කළ යුතු අතර අදාළ ධාරක රටවල් විසින් ඒ සමඟ සමානුග්‍රහය දක්වනු ලැබූ ආයෝජනවලට ප්‍රමුඛතාව දිය යුතු ය.

(ඇ) මේ ඇමුණුම යටතේ ඒජන්සියේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඒජන්සිය විසින් කලින් කල සමානුග්‍රහ සාමාජිකයන්ගේ අදහස් විමසිය යුතු ය.

2 වන ව්‍යවස්ථාව : සමානුග්‍රහ භාර අරමුදල

(අ) වාර මුදල් සහ ආදායම් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම ඇතුලුව සම්ප්‍රදාන ආයෝජන ඇප සහතික වලට ආරෝපනය කළ හැකි වාර මුදල් සහ වෙනත් ආදායම් සමානුග්‍රහ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වෙනම ගිණුමක තබා ගත යුතු ය.

(ආ) සියලු පරිපාලන වියදම් සහ මේ ඇමුණුම යටතේ නිකුත් කරන ලද ඇපවලට ආරෝපනය කළ හැකි හිමිකම් පෑම් සම්බන්ධයෙන් වූ සියලු ගෙවීම් සමානුග්‍රහ භාර අරමුදලින් ගෙවිය යුතු ය.

(ඇ) සමානුග්‍රහ භාර අරමුදලේ වත්කම්, සමානුග්‍රහ සාමාජිකයන්ගේ හවුල් ගිණුමේ තබා ගෙන පරිපාලනය කරනු ලැබිය යුතු අතර, එය ඒජන්සියේ වත්කම් වලින් වෙන් කර වෙනත් ගිණුමක් වශයෙන් තබා ගත යුතු ය.

3 වන ව්‍යවස්ථාව : සමානුග්‍රහ සාමාජිකයන් වෙත කරනු ලබන කැඳවීම්

(අ) සමානුග්‍රහ ඇපයක් යටතේ අලාභයක් සම්බන්ධයෙන් ඒජන්සිය විසින් යම් මුදලක් ගෙවිය යුතු වනතාක් ප්‍රමාණයට ද එම මුදල සමානුග්‍රහ භාර අරමුදලේ වත්කම්වලින් ගෙවිය නොහැකි වනතාක් ප්‍රමාණයට ද මේ ඇමුණුමේ 1 වන ව්‍යවස්ථාවේ (ආ) වගන්තිය අනුව තීරණය කරනු ලබන පරිදි වූ ඒ මුදලින් ස්වකීය කොටස එම අරමුදලට ගෙවන ලෙස එක් එක් සමානුග්‍රහ සාමාජිකයාට ඒජන්සිය විසින් නියම කළ යුතු ය.

(ආ) කැඳවීමක් ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමා විසින් ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය තමා විසින් සමානුග්‍රහය දක්වන ලද ආයෝජන ආවරණය වන ඇපවල මුළු ප්‍රමාණයට වඩා වැඩි වන්නේ නම්, මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වූ යම් කැඳවීමක් අනුව කිසිම මුදලක් ගෙවීමට කිසිම සාමාජිකයකු යටත් නොවිය යුතු ය.

(ඇ) යම් සමාජිකයකු විසින් සමානුග්‍රහය දක්වන ලද ආයෝජනයක් ආවරණය වන ඇපය අවසාන වූ විට එම සාමාජිකයාගේ වගකීම එම ඇපවීමේ ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් අඩු කරනු ලැබිය යුතු ය ; තව ද සමානුග්‍රහ ආයෝජනයක් සම්බන්ධයෙන් වූ යම් හිමිකම්පෑමක් ඒජන්සිය විසින් ගෙවනු ලැබූ විට එම වගකීම ප්‍රමාණානුකූලව අඩු කළ යුතු වන අතර, එසේ නොවුවහොත් එම මුදල ගෙවන වේලාවේ දී ඉතිරිව තිබූ සියලු සමානුග්‍රහ ඇප අවසාන වනතුරු බල සහිතව පැවතිය යුතු ය.

(ඈ) ඉහත (ආ) සහ (ඇ) වගන්තිවල අඩංගු සීමාකිරීම් නිසා මේ ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව වූ කැඳවීමක මුදල ගෙවීමට යම් සමානුග්‍රහ සාමාජිකයකු යටත් නොවේ නම් හෝ එවැනි යම් කැඳවීමක් අනුව අයවිය යුතු මුදල ගෙවීම යම් සමානුග්‍රහ සාමාජිකයකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, එම මුදල ගෙවීම පිළිබඳ වගකීම අනෙකුත් සමානුග්‍රහ සාමාජිකයන් විසින් ප්‍රමාණානුකූලව කොටස් කර ගත යුතු ය. මේ වගන්තිය අනුව සාමාජිකයන්ගේ වගකීම ඉහත (ආ) සහ (ඇ) වගන්තිවල දක්වා ඇති සීමාකිරීම්වලට යටත් විය යුතු ය.

(ඉ) මේ ව්‍යවස්ථාව අනුව වූ කැඳවීමක් අනුව සමානුග්‍රහ සාමාජිකයකු විසින් කරනු ලබන යම් ගෙවීමක් අනලස්ව ද නිදහසේ භාවිතා කළ හැකි ව්‍යවහාර මුදල්වලින් ද ගෙවිය යුතු ය.

4 වන ව්‍යවස්ථාව : ව්‍යවහාර මුදල් අගය කිරීම සහ ආපසු ගෙවීම්

ප්‍රාග්ධන දායක මුදල්වලට අදාළව ව්‍යවහාර මුදල් අගය කිරීම සහ මුදල් ආපසු ගෙවීම් සම්බන්ධයෙන් මේ සම්මුතියේ විධිවිධාන සමානුග්‍රහ ආයෝජන වෙනුවෙන් සාමාජිකයන් විසින් ගෙවනු ලබන අරමුදල්වලට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගත යුතු ය.

5 වන ව්‍යවස්ථාව : ප්‍රතිරක්ෂණය

(අ) ඒජන්සිය විසින් මේ ඇමුණුමේ 1 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති කොන්දේසි යටතේ, සාමාජිකයකුට, එහි ඒජන්සියක, මේ සම්මුතියේ 20 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තියේ අර්ථ කථනය කර ඇති පරිදි වූ ප්‍රාදේශීය ඒජන්සියකට හෝ සමාජික රටවල පුද්ගලික රක්ෂකයකුට ප්‍රතිරක්ෂණය සැලකිය හැකි ය. ඇප සහතිකවලට අදාළව මේ ඇමුණුමේ විධිවිධාන සහ මේ සම්මුතියේ 20 සහ 21 වන ව්‍යවස්ථාවල විධිවිධාන, මේ වගන්තිය යටතේ සලසනු ලබන ප්‍රතිරක්ෂණවලට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කර ගත යුතු ය.

(ආ) මේ ඇමුණුම යටතේ ඒජන්සිය විසින් ඇප වූ ආයෝජන සඳහා ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය බලා ගත යුතු අතර, ඒ ප්‍රතිරක්ෂණවල පිරිවැය සමානුග්‍රහ භාර අරමුදලෙන් දරනු ලැබිය යුතු ය. සලසන ලද ප්‍රතිරක්ෂණයේ හේතුවෙන් මේ ඇමුණමේ 1 වන ව්‍යවස්ථාවේ (ආ) වගන්තියේ සඳහන් සමානුග්‍රහ සාමාජිකයන්ගේ පාඩු බෙදා ගැනීමේ වගකීම, අඩු කළ හැකි ද ; එසේ අඩු කළ හැකි නම් ඒ කවර ප්‍රමාණයකට ද යන වග මණ්ඩලය විසින් තීරණය කළ හැකි ය.

**6 වන ව්‍යවස්ථාව : මෙහෙයුම් ප්‍රතිපත්ති**

මේ ඇමුණුමේ විධිවිධානවලට හානියක් නොමැතිව, මේ සම්මුතියේ 111 වන පරිච්ඡේදයේ ඇප සහතික පිළිබඳ ක්‍රියාකාරකම් පිළිබඳව වූ විධිවිධාන සහ මේ සම්මුතියේ IV වන පරිච්ඡේදය යටතේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ විධිවිධාන, සමානුග්‍රහ ආයෝජන ඇප සහතික සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගත යුතු ය. එහෙත්, (i) එම ආයෝජන කරනු ලබන්නේ මේ ඇමුණුමේ 7 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය යටතේ සුදුසුකම් ලත් ආයෝජකයකු හෝ ආයෝජකයන් විසින් යම් සාමාජිකයකුගේ දේශයක විශේෂයෙන් සංවර්ධනය වන සාමාජිකයකුගේ දේශයක නම් එම ආයෝජන සමානුග්‍රහය සඳහා සුදුසුකම් ලබයි. (ii) මේ ඇමුණුම යටතේ නිකුත් කරන ලද යම් ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණයක් සඳහා ඒජන්සිය එහි වත්කම් සම්බන්ධයෙන් වගකිව යුතු නොවන අතර, මේ ඇමුණම අනුව ඇති කර ගන්නා සෑම ඇප සහතික හෝ ප්‍රතිරක්ෂණ ගිවිසුමකින් ද ප්‍රකාශිතව ම එසේ විධිවිධාන සැලැස්විය යුතු ය.

**7 වන ව්‍යවස්ථාව : ඡන්දය දීම**

සමානුග්‍රහ ආයෝජන පිළිබඳ තීරණවල දී එක් එක් සමානුග්‍රහ සාමාජිකයාට එහි සමානුග්‍රාහකත්වයේ පදනම මත ඇප වූ හෝ ප්‍රතිරක්ෂණය කරන ලද ප්‍රමාණයට සමාන එක් එක් විශේෂ අවකරණ අයිතිවාසිකම් 10,000 සඳහා එක් අතිරේක ඡන්දයක් තිබිය යුතු අතර සමානුග්‍රහ ආයෝජනයක් පිළිගන්නා එක් එක් සාමාජිකයාට, එම සාමාජිකයා විසින් පිළිගත් යම් සමානුග්‍රහ ආයෝජන වෙනුවෙන්, ඇප වූ හෝ ප්‍රතිරක්ෂණය කරන ලද ප්‍රමාණයට සමාන එක් එක් විශේෂ අවකරණ අයිතිවාසිකම් 10,000 සඳහා එක් අතිරේක ඡන්දයක් තිබිය යුතු ය. එම අතිරේක ඡන්දය පාවිච්චි කළ යුතු වන්නේ සමානුග්‍රහ ආයෝජනවලට අදාළ තීරණය සඳහා පමණක් වන අතර එසේ නොවේ නම් සාමාජිකයන්ගේ ඡන්දය දීමේ බලය තීරණය කිරීමේ දී එය නොසලකා හැරිය යුතු ය.

## II වන ඇමුණුම

### 57 වන ව්‍යවස්ථාව යටතේ සාමාජිකයෙකු හා ඒජන්සිය අතර ආරවුල් සමථයකට පත් කිරීම

**1 වන ව්‍යවස්ථාව : ඇමුණුම අදාළ වීම**

57 වන ව්‍යවස්ථාවේ (ආ) (II) වගන්තිය අනුව නියෝජ්‍යායතනය සාමාජිකයකු සමඟ එකඟවීමකට ඇතුළත් වී ඇති අවස්ථාවල දී හැර, මේ සම්මුතියේ 57 වන ව්‍යවස්ථාවේ විෂය පථය ඇතුළතට ගැනෙන සියලුම ආරවුල් මේ ඇමුණුමේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව සමථයකට පත් කර ගත යුතු ය.

**2 වන ව්‍යවස්ථාව : සාකච්ඡා මාර්ගය**

මේ ඇමුණුමේ විෂය පථය යටතේ වූ ආරවුලක පාර්ශ්වකරුවන් සමගි කිරීම හෝ බේරුම් කිරීම අපේක්ෂා කිරීමට පළමුව එම ආරවුල් සාකච්ඡා මාර්ගයෙන් සමථයකට පත් කර ගැනීමට උත්සාහ කළ යුතු ය. සාකච්ඡා මාර්ගය කට එළඹීමට කරන ලද ඉල්ලීමේ දිනයට පසු දින එකසිය විස්සක කාල පරිච්ඡේදයක් ඇතුළත සමථයක් ඇති කර ගැනීමට පාර්ශ්වකරුවන් අපොහොසත් වුවහොත් සාකච්ඡා මාර්ගයෙන් සමථයන් ඇති කර ගැනීමේ හැකියාව අවසාන වූ ලෙස සැලකිය යුතු ය.

**3 වන ව්‍යවස්ථාව : සමගි කිරීම**

(අ) ආරවුල සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගනු නොලැබුවේ නම්, පළමුවෙන් මේ ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති සමගි කිරීමේ කාර්ය පටිපාටිය අනුගමනය කිරීමට පාර්ශ්වයන් විසින් අන්‍යොන්‍ය කැමැත්තෙන් තීරණය කර ඇත්නම් මිස, දෙපාර්ශවයෙන් ඒක් පාර්ශවයක් විසින් එම ආරාවුල මේ ඇමුණුමේ 4 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව බේරුම් කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි ය.

(ආ) සමගි කිරීම අපේක්ෂා කරන එකඟවීමේ, ආරාවුලට පාත්‍ර වූ කාරණය ද ඒ සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගේ හිමිකම්පෑම් ද හැකිනම්, පාර්ශ්වයන් විසින් එකඟ වූ සමගිකරුගේ නම ද නිශ්චිතව සඳහන් කළ යුතු ය. සමගිකරු සම්බන්ධයෙන් එකඟත්වයකට එළඹ නොමැති අවස්ථාවක දී සමඟිකරුවකු පත් කරන ලෙස පාර්ශ්වකරුවන් විසින් හවුලේ, (මෙහි මින්මතු අයි. සි. එස්. අයි. ඩි. යයි සඳහන් කරනු ලබන) ආයෝජන ආරාවුල් සමථයකට පත් කිරීම සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ මහලේකම්වරයාගෙන් හෝ අන්තර්ජාතික සභාපති වරයාගෙන් හෝ ඉල්ලා සිටිය හැකි ය. සමගි කිරීමක් අපේක්ෂා කිරීම සඳහා වූ එකඟවීමෙන් දින අනූවක් ඇතුළත සමගිකරු පත්කර නැත්නම් සමගි කිරීමේ කාර්ය පටිපාටිය අවසන් විය යුතු ය.

(ඇ) වෙනත් ආකාරයකට, මේ ඇමුණුමේ විධිවිධාන සලස්වා ඇත්නම් හෝ පාර්ශ්වකරුවන් විසින් එකඟ වී ඇත්නම් හෝ මිස, සමගි කිරීමේ කාර්ය පටිපාටිය පාලනය කෙරෙන රීති සමගිකරු විසින් නිශ්චය කළ යුතු ය. මේ කාරණයේ දී සමගිකරු රාජ්‍යයන් සහ වෙනත් රාජ්‍යවල වැසියන් අතර ආයෝජන ආරවුල් සමථයකට පත් කිරීම පිළිබඳ සම්මුතියක් අනුව පිළිගත් සමගි කිරීමේ රීති ගුරු කොට ගත යුතු ය.

(ඈ) පාර්ශ්වකරුවන් සමගිකරුට සද්භාවයෙන් සහයෝගී විය යුතු අතර විශේෂයෙන් ම, ඔහුගේ කටයුතු ඉටු කිරීමෙහි ලා ඔහුට සහාය විය හැකි සියලු තොරතුරු හා ලිපි ලේඛන ආදිය ඔහුට සැපයිය යුතු ය. ඔවුන් ඔහුගේ නිර්දේශ වලට ඔවුන්ගේ බලවත් සැලකිල්ල යොමු කළ යුතු ය.

(ඉ) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයට එකඟ වී ඇත්නම් මිස, සමගිකරු, ඔහුගේ පත්වීමේ දිනයෙන් දින එකසිය අසූවක් ඇතුළත ඔහුගේ ප්‍රයත්නවල ප්‍රතිඵල වාර්තා කෙරෙන්නා වූ ද පාර්ශ්වකරුවන් අතර මතභේදයට ලක් වූ කාරණා හා ඒවා සමථයකට පත් කිරීම සඳහා ඔහුගේ යෝජනා දක්වෙන්නා වූ ද වාර්තාවක් පාර්ශ්වකරුවන්ට සැපයිය යුතු ය.

(ඊ) වාර්තාව ලැබීමෙන් පසු දින 60 ක් ඇතුළත එක් එක් පාර්ශ්වකරු විසින් එම වාර්තාව පිළිබඳ තමන්ගේ අදහස් අනෙක් පාර්ශ්වකරුට ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.

(උ) (I) ඉහත (ඉ) වගන්තියෙන් නියම කරන ලද කාල පරිච්ඡේදය ඇතුළත තමන්ගේ වාර්තාව ඉදිරිපත් කිරීම සමගිකරු විසින් පැහැර හරිනු ලැබ ඇතහොත් ; හෝ

(II) වාර්තාව ලැබීමෙන් දින 60 ක් ඇතුළත එම වාර්තාවේ ඇතුළත් සියලුම යෝජනා භාර ගැනීමට පාර්ශ්වකරුවන් පැහැර හැර ඇතහොත් ; හෝ

(III) සමගිකරුගේ වාර්තාව ලැබීමෙන් දින 60 ක් ඇතුළත, වාර්තාව පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමෙන් පසුව මතභේදයට තුඩු දුන් සියලු කාරණා සමථයකට පත් කර ගැනීමක් පිළිබඳව පාර්ශ්වකරුවන් එකඟත්වයට පත්වීමට අපොහොසත් වුවහොත් ; හෝ

(IV) ඉහත (ඊ) වගන්තියේ නියමිත පරිදි ස්වකීය අදහස් කිරීමට පාර්ශ්වකරුවකු විසින් පැහැර හැර ඇතහොත්; හෝ

මිස, සමගි කිරීමට දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයකටවත් බේරුම් කිරීමක් අපේක්ෂා කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(ඌ) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයට එකඟ වුවහොත් මිස, සමගිකරුගේ ගාස්තු අයි. සී. එස්. අයි. ඩී. සමගි කිරීම් වලට අදාළ අනුප්‍රමාණ පදනම් කරගෙන නිශ්චය කළ යුතු ය. සමගි කිරීමේ කටයුතුවල ගාස්තු සහ වෙනත් පිරිවැය පාර්ශ්වකරුවන් විසින් සමසේ කොටස් කර ගත යුතු ය. එක් එක් පාර්ශ්වය විසින් තම තමන්ගේ වියදම් දැරිය යුතු ය.

**4 වන ව්‍යවස්ථාව : බේරුම් කිරීම**

(අ) බේරුම් කිරීම අපේක්ෂා කරන පාර්ශ්වකරු (ඉල්ලුම්කරු) විසින් ආරාවුලේ අනෙකුත් පාර්ශ්වකරුට (වගඋත්තරකරු) හෝ පාර්ශ්වකරුවන්ට යොමු කර යවන දැන්වීමක් මගින් බේරුම් කිරීමේ නඩු කටයුතු ආරම්භ කළ යුතු ය. ආරාවුලේ ස්වභාවය අපේක්ෂිත සහනය සහ ඉල්ලුම්කරු විසින් පත් කරන ලද බේරුම්කරුගේ නම එම දැන්වීමේ නිශ්චිතව දක්වා තිබිය යුතු ය. දැන්වීම ලැබුණු දිනයෙන් දින තිහක් ඇතුළත වගඋත්තරකරු විසින් පත් කරන ලද බේරුම්කරු ගේ නම වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. දෙවන බේරුම්කරු පත් කළ දිනයෙන් දින තිහක කාල පරිච්ඡේදයක් ඇතුළත පාර්ශ්වකරුවන් දෙදෙනා විසින් බේරුම් කිරීමේ විනිශ්චයාධිකාරයේ (විනිශ්චයාධිකාරයේ) සභාපති වශයෙන් ක්‍රියා කළ යුතු 3 වන බේරුම්කරුවකු පත් කළ යුතු ය.

(ආ) දැන්වීමේ දිනයෙන් දින හැටක් ඇතුළත විනිශ්චයාධිකාරය සංස්ථාපනය වී නැත්නම් ද බේරුම්කරු පත් කරනු ලැබූ හෝ සභාපති තෝරා පත් කර ගනු ලැබ නැත්නම් ද පාර්ශ්වකරුවන් විසින් හවුලේ කරනු ලබන ඉල්ලීමක් මත අයි. සී. එස්. අයි. ඩී. ප්‍රධාන ලේකම් විසින් ඔවුන් පත් කරනු ලැබිය යුතු ය. එවැනි හවුල් ඉල්ලීමක් නැත්නම් හෝ ඉල්ලීමෙන් දින තිහක් ඇතුළත එම පත්වීම කිරීම මහා ලේකම්වරයා විසින් පැහැර හැර ඇත්නම් හෝ, එම පත්වීම් කරන ලෙස දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් විසින් ජාත්‍යන්තර අධිකරණයේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(ඇ) ආරාවුල පිළිබඳ විභාගය ආරම්භ වූ පසුව කිසිම පාර්ශ්වකරුවකුට තමන් විසින් පත් කරන ලද බේරුම්කරු වෙනස් කිරීමේ අයිතිවාසිකම නැත. (විනිශ්චයාධිකාරයේ සභාපති ඇතුළුව) යම් බේරුම්කරුවකු ඉල්ලා අස් වුවහොත්, මියගියහොත් හෝ අබලතාවකට පත් වුවහොත්, ඔහුගේ පූර්වගාමියා පත් කිරීමේ දී අනුගමනය කළ ක්‍රමයටම අනුප්‍රාප්තිකයකු පත් කරනු ලැබිය යුතු අතර, ඒ අනුප්‍රාප්තිකයා අනුප්‍රාප්ත වන බේරුම්කරුට තිබූ බලතල හා කාර්යයම එම අනුප්‍රාප්තිකයාට ද සතු වන්නේ ය.

(ඈ) විනිශ්චයාධිකාරයේ ප්‍රථම රැස්වීම සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්විය යුතු ය. ඊට පසුව විනිශ්චයාධිකාරයේ රැස්වීම් පවත්වන ස්ථාන සහ දින විනිශ්චයාධිකරණය විසින් ම තීරණය කර ගත යුතු ය.

(ඉ) වෙනස් ආකාරයකට, මේ ඇමුණුමේ විධිවිධාන සලසා ඇත්නම් හෝ පාර්ශ්වකරුවන් විසින් එකඟත්වයකට පත් වී ඇත්නම් හෝ මිස, විනිශ්චයාධිකාරය විසින් එකී කාර්ය පටිපාටිය තීරණය කර ගත යුතු අතර, මේ කාරණයේදී රාජ්‍යය සහ වෙනත් රාජ්‍යවල වැසියන් අතර ඇති වන ආයෝජන ආරවුල් සමථයකට පත් කිරීමේ සම්මුතිය අනුව පිළි ගන්නා ලද බේරුම් කිරීමේ රීති ගුරු කොට ගත යුතු ය.

(ඊ) විනිශ්චයාධිකාරය සහ කාර්යක්ෂමතාව පිළිබඳ විනිශ්චයකරු විය යුතු ය. එහෙත් එම ආරාවුල 56 වන වගන්තිය යටතේ මණ්ඩලයේ හෝ සභාවේ අධිකරණ බලය ඇතුළතට ගැනෙන බවට හෝ මේ ඇමුණුමේ 1වන ව්‍යවස්ථාව යටතේ වූ ගිවිසුමක නම් කරන ලද අධිකරණ හෝ බේරුම් කිරීමේ මණ්ඩලයක අධිකරණ බලය යටතට වැටෙන බවට විරෝධතාවක් මතු කරනු ලැබ එම විරෝධතාව අව්‍යාජ බවට විනිශ්චයාධිකාරය සෑහීමට පත්වුවහොත් එම විරෝධතාව විනිශ්චයාධිකාරය විසින් අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයට හෝ සභාවට හෝ නම් කළ ආයතනයට හෝ යොමු කරනු ලැබිය යුතු අතර, එම කාරණය සම්බන්ධයෙන් තීරණයක් කරන තුරු බේරුම් කිරීමේ නඩු කටයුතු නතර කළ යුතු ය. එසේ ලැබෙන තීරණය විනිශ්චයාධිකාරය කෙරෙහි බන්ධනදායී විය යුතු ය.

(උ) මේ ඇමුණුමේ විෂය පථය ඇතුළත වූ යම් ආරවුලක දී විනිශ්චයාධිකාරය විසින් මේ සම්මුතියේ විධිවිධාන, ආරාවුලේ පාර්ශ්වකරුවන් අතර වූ යම් අදාළ ගිවිසුමක්, ඒජන්සියේ අතුරු ව්‍යවස්ථා හා නියෝග, ජාත්‍යන්තර නීතියේ අදාළ කළ හැකි රීති, අදාළ සාමාජිකයාගේ අභ්‍යන්තර නීතිය සහ ආයෝජන ගිවිසුමක් ඇත්නම් එම ගිවිසුමේ විධිවිධාන ද අදාළ කර ගත යුතු ය. මේ සම්මුතියේ විධිවිධාන වලට හානියක් නොමැතිව, ඒජන්සිය සහ අදාළ සාමාජිකයන් එකඟ වන්නේ නම් මෙම ආරාවුල තීරණය කළ හැකි ය. නීතිය නිශ්ශබ්ද වීම හෝ නොපැහැදිලිවීමේ හේතුව මත විනිශ්චයාධිකාරය විසින් තීන්දුවක් නොදිය යුතු ය.

(ඌ) විනිශ්චයාධිකාරය විසින් සියලුම පාර්ශ්වකරුවන්ට සාධාරණව සවන් දිය යුතු ය. විනිශ්චයාධිකාරයේ සියලුම තීරණ බහුතර ඡන්දයෙන් ගත යුතු අතර එම තීරණවලට පදනම් වූ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය. විනිශ්චයාධිකාරයේ ප්‍රදානය ලියවිල්ලකින් දිය යුතු අතර, එය යටත් පිරිසෙයින් බේරුම්කරුවන් දෙදෙනකු විසින් වත් අත්සන් කරනු ලැබිය යුතු ය. එහි පිටපතක් එක් එක් පාර්ශ්වකරුට යවනු ලැබිය යුතු ය. ප්‍රදානය අවසානාත්මක හා පාර්ශ්වකරුවන් කෙරෙහි බන්ධනදායී විය යුතු අතර එය අභියාචනයට, අවලංගු කිරීමට හෝ ප්‍රතිශෝධනයට යටත් නොවිය යුතු ය.

(එ) ප්‍රදානයක අර්ථය හෝ විෂය පථය සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් අතර යම් ආරවුලක් පැන නැඟුනහොත් එම ප්‍රදනය දීමෙන් දින 60 ක් ඇතුළත දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් විසින් එම ප්‍රදනය දුන් විනිශ්චයාධිකාරයේ සභාපති වරයාට ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මගින් එම ප්‍රදානයේ අර්ථ නිරූපනයක් ඉල්ලා සිටිය හැකි ය. සභාපතිවරයා විසින්, හැකි නම් එම ඉල්ලීම එම ප්‍රදානය දුන් විනිශ්චයාධිකාරය වෙතට යොමු කළ යුතු අතර ඉල්ලුම් පත්‍රය ලැබී දින 60 ක් ඇතුළත එම විනිශ්චයාධිකාරය රැස් කළ යුතු ය. මෙය කළ නොහැකි නම් ඉහත (අ) සිට (ඇ) දක්වා වූ වගන්තිවල විධිවිධානවලට අනුව අලුත් විනිශ්චයාධිකාරයක් සංස්ථාපනය කළ යුතු ය. ඉල්ලා සිටින ලද අර්ථ නිරූපනය පිළිබඳ විනිශ්චයාධිකාරයේ තීරණය තෙක් විනිශ්චයාධිකාරය විසින් ප්‍රදානය බලාත්මක කිරීම නතර කළ හැකි ය.

(ඒ) මේ ව්‍යවස්ථාව අනුව දෙන ලද සෑම ප්‍රදානයක්ම ස්වකීය රටේ අධිකරණයක නඩු තීන්දුවක් වූවාක් මෙන් එහි දේශය තුළ බන්ධනදායී සහ බලාත්මක කළ හැකි ප්‍රදානයක් වශයෙන් එක් එක් සාමාජිකයා විසින් ගත යුතු ය. ප්‍රදානය ක්‍රියාවේ යෙදවීම, එම ක්‍රියාවේ යෙදවීම අපේක්ෂා කරන දේශය අයත් වන රාජ්‍යයේ නඩු තීන්දු ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ඇති නීති වලින් පාලනය විය යුතු අතර, එය ක්‍රියාවේ යෙදවීම මුක්තිය සම්බන්ධයෙන් වලංගුව පවත්නා නීතියේ බලය හීන කරන්නක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ඔ) පාර්ශ්වකරුවන් වෙනත් ආකාරයකට එකඟ වුවහොත් මිස, බේරුම්කරුවන්ට ගෙවිය යුතු ගාස්තු සහ පාරිශ්‍රමිකය අයි. සී. එස්. අයි. ඩී. බේරුම් කිරීම් වලට අදාළ අනුප්‍රමාණ අනුව ගෙවිය යුතු ය. බේරුම් කිරීම නඩු කටයුතු සම්බන්ධයෙන් එක් එක් පාර්ශ්වයේ වියදම් එක් එක් පාර්ශ්වය විසින් දැරිය යුතු ය. විනිශ්චයාධිකාරය විසින් වෙනත් ආකාරයකට තීරණය කළහොත් මිස විනිශ්චයාධිකාරයේ ගාස්තු පාර්ශ්වකරුවන් විසින් සමාන කොටස්වලින් ගෙවිය යුතු ය. විනිශ්චයාධිකාරයේ ගාස්තු බෙදාහැරීම් සම්බන්ධයෙන් හෝ එම ගාස්තු ගෙවීමේ පිළිවෙල සම්බන්ධයෙන් වූ යම් ප්‍රශ්නයක් විනිශ්චයාධිකාරය විසින් තීරණය කළ යුතු ය.

**5 වන ව්‍යවස්ථාව : කැඳවීම් නියෝග භාරදීම**

මේ ඇමුණුම යටතේ වූ යම් නඩු කටයුත්තකට සම්බන්ධ යම් දැන්වීමක් හෝ කැඳවීම් නියෝගයක් ලියවිල්ලක් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය. එය මේ සම්මුතියේ 38 වන ව්‍යවස්ථාව අනුව අදාළ සාමාජිකයා විසින් නම් කරන ලද බලධරයා වෙත ඒජන්සිය විසින් එය භාර දිය යුතු අතර, එම සාමාජිකයා විසින් එය ඒජන්සියේ ප්‍රධාන කාර්යාලයේ දී භාර දිය යුතු ය.

"අ" උපලේඛනය

සාමාජිකත්වය හා දයකවීම

පළමුවන ගණය

| රට | කොටස් ගණන | | දායකත්වය (එස්.ඩී.ආර්. මිලියන) | |
|---|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව ... ... | 1,713 | | 17.13 | |
| ඕස්ට්‍රියා ... ... | 775 | | 7.75 | |
| බෙල්ජියම ... ... | 2,030 | | 20.30 | |
| කැනඩාව ... ... | 2,965 | | 29.65 | |
| ඩෙන්මාර්කය ... ... | 718 | | 7.18 | |
| ෆින්ලන්තය ... ... | 600 | | 6.00 | |
| ප්‍රංශය ... ... | 4,860 | | 48.60 | |
| ප්‍රජාතාන්ත්‍රවාදී ජර්මන් ජනරජය ... | 5,071 | | 50.71 | |
| අයිස්ලන්තය ... ... | 90 | | 0.90 | |
| අයර්ලන්තය ... ... | 369 | | 3.69 | |
| ඉතාලිය ... ... | 2,820 | | 28.20 | |
| ජපානය ... ... | 5,095 | | 50.95 | |
| ලක්සම්බර්ග් ... ... | 116 | | 1.16 | |
| නෙදර්ලන්තය ... ... | 2,169 | | 21,69 | |
| නවසීලන්තය ... ... | 518 | | 5.13 | |
| නෝර්වේ ... ... | 699 | | 6.99 | |
| දකුණු අප්‍රිකාව ... ... | 943 | | 9.43 | |
| ස්වීඩනය ... ... | 1,049 | | 10.49 | |
| ස්විට්සර්ලන්තය ... ... | 1,500 | | 15.00 | |
| එක්සත් රාජධානිය ... ... | 4,860 | | 48.60 | |
| එක්සත් ජනපදය ... ... | 20,519 | | 205.19 | |
| | | 59,473 | | 594.73 |

දෙවන ගණය

| රට | කොටස් ගණන | දායකත්වය (ඒස්.ඩී.ආර් මිලියන) |
|---|---|---|
| ඇෆ්ගනිස්ථානය | 118 | 1.18 |
| ඇල්ජීරියාව | 649 | 6.49 |
| ඇන්ටිගුවා සහ බාර්බුඩා | 50 | 0.50 |
| ආජන්ටිනා | 1,254 | 12.54 |
| බහමාස් | 100 | 1.00 |
| බහරේන් | 77 | 0.77 |
| බංගලාදේශ් | 340 | 3.40 |
| බාබඩෝස් | 68 | 0.68 |
| බෙලීස් | 50 | 0.50 |
| බෙනින් | 61 | 0.61 |
| භූටාන් | 50 | 0.50 |
| බොලිවියා | 125 | 1.25 |
| බොට්ස්වානා | 50 | 0.50 |
| බ්‍රසීලය | 1,479 | 14.79 |
| බර්කිනා ෆාසෝ | 61 | 0.61 |
| බුරුමය | 178 | 1.78 |
| බුරුන්ඩි | 74 | 0.74 |
| කැමරූන් | 107 | 1.07 |
| කේප්වර්ඩ් | 50 | 0.50 |
| මධ්‍යම අප්‍රිකානු ජනරජය | 60 | 0.60 |
| චැඩ් | 60 | 0.60 |
| චිලී | 485 | 4.85 |
| චීනය | 3,138 | 31.38 |
| කොලොම්බියා | 437 | 4.37 |
| කොමොරෝස් | 50 | 0.50 |
| කොංගෝ මහජන ජනරජය | 65 | 0.65 |
| කොස්ටරිකා | 117 | 1.17 |
| සයිප්‍රස් | 104 | 1.04 |
| ජිබූටි | 50 | 0,.50 |
| ඩොමිනිකා | 50 | 0.50 |
| ඩොමිනිකන් ජනරජය | 147 | 1.47 |
| ඉක්වදෙරය | 182 | 1.82 |
| ඊජිප්තු අරාබි ජනරජය | 459 | 4.59 |
| එල් සැල්වදෙරේ | 122 | 1.22 |
| නිරක්ෂයිය ගිනියාව | 50 | 0.50 |

*දෙවන ගණය යටතේ ලැයිස්තුගත කර ඇති රටවල් මේ සම්මුතියේ කාර්යය සඳහා දියුණුවන සාමාජික රටවල් වෙයි.

| | | |
|---|---|---|
| ඉතියෝපියා | 70 | 0.70 |
| ෆිජී | 71 | 0.71 |
| ගැබොන් | 96 | 0.96 |
| ගැම්බියා | 50 | 0.50 |
| ඝානා | 245 | 2.45 |
| ග්‍රීසිය | 280 | 2.80 |
| ග්‍රෙනාඩා | 50 | 0.50 |
| ගෝතමාලා | 140 | 1.40 |
| ගිනියා | 91 | 0.91 |
| ගිනි බිසෝ | 50 | 0.50 |
| ගයානා | 84 | 0.84 |
| හයිටි | 75 | 0.75 |
| හොන්ඩුරාස් | 101 | 1.01 |
| හන්ගේරියාව | 564 | 5.64 |
| ඉන්දියාව | 3,048 | 30.48 |
| ඉන්දුනීසියාව | 1,049 | 10.49 |
| අයිරාන් ඉස්ලාම් ජනරජය | 1,659 | 16.59 |
| ඉරාකය | 350 | 3.50 |
| ඊශ්‍රායෙල් | 474 | 4.74 |

| රට | කොටස් ගණන | දයකත්වය (එස්.ඩී.ආර්. මිලියන) |
|---|---|---|
| අයිවරි කෝස්ට් ... ... | 176 | 1.76 |
| ජැමෙයිකා ... ... | 181 | 1.81 |
| ජෝර්ඩාන් ... ... | 97 | 0.97 |
| ප්‍රජාතන්ත්‍රවාදී කම්පුචියාව ... | 93 | 0.93 |
| කිනියාව ... ... | 172 | 1.72 |
| කොරියන් ජනරජය ... ... | 449 | 4.49 |
| ක්වේට් ... ... | 930 | 9.30 |
| ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය ... | 60 | 0.60 |
| ලෙබනන් ... ... | 142 | 1.42 |
| ලෙසෝතෝ ... ... | 50 | 0.50 |
| ලයිබීරියාව ... ... | 84 | 0.84 |
| ලිබියානු අරාබි ජමරියා ... | 549 | 5.49 |
| මැඩගස්කරය ... ... | 100 | 1.00 |
| මලාවි ... ... | 77 | 0.77 |
| මලයාසියාව ... ... | 579 | 5.79 |
| මාලදිවයින් ... ... | 50 | 0.50 |
| මාලි ... ... | 81 | 0.81 |
| මෝල්ටා ... ... | 75 | 0.75 |
| මොරිටානියා ... ... | 63 | 0.63 |
| මුරිසිය ... ... | 87 | 0.87 |
| මැක්සිකෝව ... ... | 1,192 | 11.92 |
| මොරොක්කෝව ... ... | 348 | 3.48 |
| මොසැම්බික් ... ... | 97 | 0.97 |
| නේපාලය ... ... | 69 | 0.69 |
| නිකරගුවා ... ... | 102 | 1.02 |
| නයිජර් ... ... | 62 | 0.62 |
| නයජීරියාව ... ... | 844 | 8.44 |
| ඕමාන් ... ... | 94 | 0.94 |
| පකිස්ථානය ... ... | 660 | 6.60 |
| පැනමා ... ... | 131 | 1.31 |
| පැපුවා නව ගිනියාව ... | 96 | 0.96 |
| පැරගුවේ ... ... | 80 | 0.80 |
| පේරු ... ... | 373 | 3.73 |
| පිලිප්පීනය ... ... | 484 | 4.84 |
| පෘතුගාලය ... ... | 382 | 3.82 |
| ක්වාටාර් ... ... | 137 | 1.37 |
| රොමේනියා ... ... | 555 | 5.55 |
| රුවන්ඩා ... ... | 75 | 0.75 |
| සෙන්ට් ක්‍රිස්ටෝපර් සහ නෙවිස් ... | 50 | 0.50 |
| සෙන්ට් ලුසියා ... ... | 50 | 0.50 |
| සෙන්ට් වින්සන්ට් ... ... | 50 | 0.50 |
| සාඕ ටොමේ සහ ප්‍රින්සිපේ ... | 50 | 0.50 |
| සවුදි අරාබිය ... ... | 3,137 | 31.37 |
| සෙනිගාල් ... ... | 145 | 1.45 |
| සෙචලීස් ... ... | 50 | 0.50 |
| සියෙරා ලියොන් ... ... | 75 | 0.75 |
| සිංගප්පූරුව ... ... | 154 | 1.54 |
| සොලමන් දූපත් ... ... | 50 | 0.50 |
| සෝමාලියා ... ... | 78 | 0.78 |
| ස්පාඤ්ඤය ... ... | 1,285 | 12.85 |
| ශ්‍රී ලංකාව ... ... | 271 | 2.71 |
| සුඩානය ... ... | 206 | 2.06 |
| සුරිනාම් ... ... | 82 | 0.82 |
| සිරියානු අරාබි ජනරජය ... | 168 | 1.68 |
| ස්වාසිලන්තය ... ... | 58 | 0.58 |
| ටැන්සානියාව ... ... | 141 | 1.41 |
| තායිලන්තය ... ... | 421 | 4.21 |
| ටෝගෝ ... ... | 77 | 0.77 |
| ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ ... | 203 | 2.03 |

| රට | | කොටස් ගණන | | දායකත්වය (එස්.ඩී.ආර්. මිලියන) | |
|---|---|---|---|---|---|
| ටියුනීසියාව ... ... | | 156 | | 1.56 | |
| තුර්කිය ... ... | | 462 | | 4.62 | |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය ... | | 372 | | 3.72 | |
| උගන්ඩාව ... ... | | 132 | | 1.32 | |
| උරුගුවේ ... ... | | 202 | | 2.02 | |
| වනුආටු ... ... | | 50 | | 0.50 | |
| වෙනිසියුලාව ... ... | | 1,427 | | 14.27 | |
| වියට්නාමය ... ... | | 220 | | 2.20 | |
| බටහිර සැමෝආ ... ... | | 50 | | 0.50 | |
| යේමන් අරාබි ජනරජය ... | | 67 | | 0.67 | |
| යේමන් මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය | | 115 | | 1.15 | |
| යුගෝස්ලාවියාව ... ... | | 635 | | 6.35 | |
| සයිරේ ... ... | | 338 | | 3.38 | |
| සැම්බියා ... ... | | 318 | | 3.18 | |
| සිම්බාබ්වේ ... ... | | 236 | | 2.36 | |
| | | | 40,527 | | 405.27 |
| එකතුව ... | | | 1,000.00 | | 1,000.00 |

"ආ" උපලේඛනය

අධ්‍යක්ෂවරුන් තෝරා පත් කර ගැනීම

(1) අධ්‍යක්ෂ ධුරය සඳහා අපේක්ෂකයන් අධිපතිවරුන් විසින් නම් කරනු ලැබිය යුතු ය. එහෙත් එක් එක් අධිපතිවරුන් විසින් නම් කරනු ලැබිය හැකි වන්නේ එක් තැනැත්තකු පමණ ය.

(2) අධිපතිවරුන්ගේ ඡන්දයෙන් අධ්‍යක්ෂවරුන් තෝරා පත් කර ගත යුතු ය.

(3) අධ්‍යක්ෂවරුන් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්දය දීමේ දී සෑම අධිපතිවරයකුම, එම අධිපතිවරයා විසින් නියෝජනය කරනු ලබන සාමාජිකයා විසින් 40 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය යටතේ දීමට හිමිකම් ඇති සියලු ඡන්ද, එක් අපේක්ෂකයකුට දිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් හතරෙන් එකක්, වැඩිම කොටස් සංඛ්‍යාවක් හිමි සාමාජිකයන්ගේ එක් එක් අධිපතිවරයා විසින් එක් අධ්‍යක්ෂවරයා බැගින්, වෙන වෙනම තෝරා පත් කර ගත යුතු ය. මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතරෙන් බෙදෙන සංඛ්‍යාවක් නොවේ නම්, එසේ තෝරා පත් කර ගනු ලැබිය යුතු අධ්‍යක්ෂවරුන් ගණන ඊට අඩු ඊළඟ හතරෙන් බෙදිය හැකි සංඛ්‍යාවේ හතරෙන් එක විය යුතු ය.

5. ඉතිරි අධ්‍යක්ෂවරුන්, මේ උපලේඛනයේ 6 සිට 11 දක්වා වූ ඡේදවල විධිවිධානවලට අනුකූලව අනිකුත් අධිපතිවරුන් විසින් තෝරා පත් කර ගත යුතු ය.

6. නාම යෝජනා කරන ලද අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව එසේ තෝරා පත් කර ගැනීම සඳහා ඉතිරිවන අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවට සමානවේ නම්, සියලුම අපේක්ෂකයන් ප්‍රථම ඡන්දය දීමේ දී ම තෝරා පත් කර ගත යුතුය. එහෙත් යම් අපේක්ෂකයකුට සභාව විසින් තීරණය කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් උපරිම ප්‍රතිශතයට වැඩි සංඛ්‍යාවක් ලැබී ඇත්නම්, එම තෝරා පත් කර ගැනීම සඳහා සභාව විසින් තීරණය කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අවම ප්‍රතිශතය ලැබූ අපේක්ෂකයා හෝ අපේක්ෂකයන් තෝරා පත් කර ගනු නොලැබිය යුතු ය.

(7) නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් සංඛ්‍යාව, තෝරා පත් කර ගැනීම සඳහා එසේ ඉතිරිව ඇති අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවට වඩා වැඩි නම්, සභාව විසින් තීරණය කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයට වඩා අඩු ප්‍රමාණයක් ඡන්ද ලැබූ යම් අපේක්ෂකයකු හැර, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබන අපේක්ෂකයන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(8) එසේ ඉතිරි සියලුම අධ්‍යක්ෂවරුන් පළමු ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු නොලැබුවහොත් දෙවැනි ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය. පළමුවන ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු නොලැබූ අපේක්ෂකයා හෝ අපේක්ෂකයන් නැවත වරක් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසු විය යුතු ය.

(9) දෙවන ඡන්ද විමසීමේ දී ඡන්දය දීම (i) පළමුවන ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු නොලැබූ අපේක්ෂකයකුට ඡන්දය දී ඇති අධිපතිවරුන්ට සහ (ii) තමන්ගේ ඡන්ද ගණන් ගැනීමට පළමුව සභාව විසින් තීරණය කරන ලද උපරිම ඡන්ද ප්‍රමාණය එවකටත් ලබා සිටි තෝරා පත් කර ගත් අපේක්ෂකයකුට ඡන්දය දී ඇති අධිපතිවරුන්ට පමණක් සීමා විය යුතු ය.

(10) යම් තෝරා පත් කර ගත් අපේක්ෂකයකු උපරිම ඡන්ද ප්‍රතිශතයට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇති බව තීරණය කිරීමේ දී එම අපේක්ෂකයාට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් දුන් අධිපතිවරයාගේ ඡන්ද පළමුවෙන් ද ඊළඟ වැඩිම ඡන්ද සංඛ්‍යාව දුන් අධිපතිවරයාගේ ඡන්ද සංඛ්‍යාව ඊළඟට ද යනාදී වශයෙන් එම ප්‍රතිශතයට ළඟා වන තෙක් ගණන් ගත යුතු ය.

(11) දෙවන ඡන්ද විමසීමෙන් පසුව ඉතිරි සියලුම අධ්‍යක්ෂවරුන් තේරී පත්වී නොමැති නම් ඉතිරි අධ්‍යක්ෂවරුන් තේරී පත් වන තෙක් එම මූලධර්ම යටතේ ම වැඩිදුර ඡන්ද විමසීම් පැවැත්විය යුතු ය. එහෙත් අධ්‍යක්ෂවරයකු පමණක් තෝරා පත් කර ගැනීමට ඉතිරිවී ඇති විටෙක මේ අධ්‍යක්ෂවරයා ඉතිරි ඡන්දවලින් සාමාන්‍ය බහුතරයකින් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර ඔහු ඒ සියලුම ඡන්දවලින් තෝරා පත් කර ගනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

# 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් 18 දින]

මුදල් සමාගම් පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

**1.** මේ පනත 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) 3 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව-

(අ) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ; සහ

(ආ) රුපියල් මිලියන පහකට නොඅඩු නිකුත් කරනු ලැබ ඇත්තා වූ සහ ගෙවනු ලැබ ඇත්තා වූ අවම ප්‍රාග්ධනයක් ඇත්තා වූ ; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ පොදු සමාගමක් විසින් හැර, මුදල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම නොකළ යුතුය.

(2) සමාගමක් විසින් මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක් ම, නියමිත ආකෘතිය අනුව මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තර ඉල්ලුම්කරුගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවට ඉල්ලුම්කරු විසින් ප්‍රකාශයක් එහි ඇතුළත් විය යුතු ය.

(3) යම් ප්‍රකාශයක් හෝ තොරතුරක් අසත්‍ය බව දැනගෙනම (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රකාශයක් කරන හෝ යම් තොරතුරක් සපයන සෑම තැනැත්තෙකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, මණ්ඩලය විසින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන සමාගමේ පොත්, වාර්තා සහ ලේඛන කැඳවා පරීක්ෂා කරනු ලැබිය හැකි ය. නැතහොත් පරීක්ෂා කිරීමට සලස්වනු ලැබිය හැකි ය.

(5) පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා සමාගමක් විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් සැලකිල්ලට ගනු ලැබූ විට-

(i) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නියමයන් අනුව කටයුතු කර ඇති බවට ; සහ

(ii) සමාගම ලියා පදිංචි කරනු ලැබීම තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ සම්බන්ධතාවලට හානිකර නොවන බවට මණ්ඩලය වෙත සපයනු ලැබූ තොරතුරු මත

මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම්, මණ්ඩලය විසින් ඒ සමාගම මුදල් සමාගමක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(6) සමාගමක්, (5) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ නොමැති අවස්ථාවක හෝ 3 වන වගන්තිය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද නැතහොත් පුද්ගල මණ්ඩලයකට ද ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින් ඒ වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කිරීමට පැහැර හැර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ සමාගම, තැනැත්තා හෝ පුද්ගල

මණ්ඩලය විසින් කරගෙන යනු ලබන මුදල් ව්‍යාපාරය ගණන් බේරා වසා දැමීම සඳහා හෝ එය අවසතු කිරීම සඳහා සහ ඒ සමාගමේ, තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ තැන්පතු බැරකම් බේරුම් කිරීම සඳහා වූ විධාන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. තවද ඒ විධාන අනුව කටයුතු කිරීම ඒ සමාගමේ, තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ කාර්යය වන්නේය.

(7) (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධාන අනුව කටයුතු කිරීම ඒ විධාන නිකුත් කරනු ලැබීමේ සිට එක් මාසයක් ඇතුළත සමාගමක්, තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පැවරීම ඇතුළු ව ඒ අනුව කටයුතු කිරීම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**3.** (1) 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන ගිය සමාගමක් හෝ පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින්-

(අ) එය 2 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු නොලැබුව ද, මේ පනත ආරම්භ වන දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් සඳහා ඒ ව්‍යාපාර කටයුතු නොකඩවා කර ගෙන යනු ලැබිය හැකි ය;

(ආ) 2 (1) වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කිරීමට අවශ්‍ය යම් පියවර ගත යුතු අතර මේ පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ට) ඡේදය යටතේ නිකුත් කරන ලද යම් විධානයක් කඩ කරමින් කරගෙන යනු ලබන කටයුතු කිසිවක් මේ පනත ආරම්භ වීමේ දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් හෝ ඒ විධානය නිකුත් කිරීමේ දින සිට මාස හතර යන දෙකින් කවර හෝ පසුව එළඹෙන කාලසීමාව ඇතුළත ඒ සමාගම හෝ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින් වැළකී සිටිනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සෑම සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව කටයුතු කරනු ලැබූ විට, ඒ කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔප්පු කිරීමෙහිලා සාක්ෂි මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. මණ්ඩලය සෑහීමට පත් වන ආකාරයෙන් ඒ විධිවිධාන අනුව කටයුතු කරන සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් 2 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය.

(3) සමාගමක් හෝ තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් (1) වන උපවගන්තිය යටතේ මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යනු ලබන අවස්ථාවක, ඒ සමාගමට, තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු තාක් දුරට සහ මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව අදාළ විය යුතුය.

**4.** (1) මුදල් සමාගමක් විසින් රුපියල් මිලියන පහක අඩු නොකළ ප්‍රාග්ධනයන් සියලු අවස්ථාවලදී පවත්වා ගෙන යා යුතු ය.

(2) මණ්ඩලයේ කලින් ලබාගත් ලිඛිත අනුමතය නොමැතිව මුදල් සමාගමක් විසින් එහි ප්‍රාග්ධන හෝ ව්‍යවස්ථාපිත සංචිත හීන කිරීමක් හෝ අඩු කිරීමක් හෝ නොකළ යුතු ය. මේ උපවගන්තියෙහි " ව්‍යවස්ථාපිත සංචිත " යන්නෙන් මේ පනත යටතේ සමාගම වෙත නිකුත් කරන ලද විධානයක් අනුව සමාගම විසින් පවත්වා ගෙන යනු ලබන යම් සංචිත අරමුදලක් අදහස් වේ.

**5.** මුදල් සමාගමක් විසින්, එහි තැන්පතු ආරක්ෂා වන ආකාරයෙන් ස්වකීය ව්‍යාපාර කටයුතු සියලු අවස්ථාවලදී පවත්වා ගෙන යා යුතු අතර, තැන්පතුකරුවන්ට ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු මත පොලිය නියමිත දින ගෙවන බව සුරක්ෂිත කිරීමට යුක්ති සහගත ලෙස අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

**6.** මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම මුදල් සමාගමක් සම්බන්ධයෙන්ම නියමිත ආකෘතිය අනුව ලේඛනයක් මණ්ඩලය විසින් තබා ගත යුතු අතර, එය පවත්වා ගෙන යා යුතු ය.

**7.** (1) මේ පනත යටතේ මුදල් සමාගමක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට ඒ මුදල් සමාගමට අවසර දෙමින් නියමිත ආකෘතියෙහි වූ බලපත්‍රයක් මණ්ඩලය විසින් ඒ මුදල් සමාගමට නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ඒ බලපත්‍රය මුදල් සමාගමේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ ව්‍යාපාර ස්ථානයෙහි සියලු අවස්ථාවල දී ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම මුදල් සමාගමක් ම නියමිත මුදල් ප්‍රමාණයකින් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් මණ්ඩලයට ගෙවිය යුතු ය.

**8.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ මුදල් සමාගමක් විසින් මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක ඒ සමාගම විසින් එසේ අවසන් කරනු ලැබූ විට, මණ්ඩලය වෙත ඒ අවසන් කිරීම සම්බන්ධයෙන් දැන්වීමක් නොපමාව දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවසන් කිරීම් සම්බන්ධයෙන් දැන්වීම ලැබුණ විට 6 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙන් මුදල් සමාගමේ නම මණ්ඩලය විසින් ඉවත් කළ යුතු අතර, එහි බලපත්‍රය අවලංගු කළ යුතුය. තවද, මුදල් සමාගමේ මුදල් ව්‍යාපාර කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා හෝ අවසන් කිරීම සඳහා සහ මුදල් සමාගමේ තැන්පතු බැරකම් සම්බන්ධයෙන් නියම කරනු ලබන යම් ආකාරයකින් බේරුම් කිරීම සඳහා විධාන ඒ මුදල් සමාගමට නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් මුදල් සමාගමක් මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන නොයන බව විශ්වාස කිරීමට මණ්ඩලයට යුක්ති සහගත හේතු ඇති අවස්ථාවක, ඒ සමාගම විසින් මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම අවසන් කර නොමැති බව මණ්ඩලයේ දැන්වීමේ දින සිට සති දෙකක් ඇතුළත ඔප්පු කරන ලෙස ඒ සමාගමට නියම කරමින් මණ්ඩලය විසින් ඒ සමාගමට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යැවිය හැකි ය. ඒ කාලසීමාව ඇතුළත එය ඔප්පු කිරීම ඒ මුදල් සමාගම විසින් පැහැර හරින අවස්ථාවක, මණ්ඩලය විසින් 6 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙන් ඒ මුදල් සමාගමේ නම ඉවත් කොට එහි බලපත්‍රය අවලංගු කළ යුතුය. මුදල් සමාගමක ලියාපදිංචිය එසේ අවලංගු කර ඇති අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම සඳහා වූ විධාන ඇතුළු අවශ්‍ය යයි සලකනු ලබන යම් විධාන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. නැතහොත් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කිරීමට අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) මණ්ඩලය විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන අනුව කටයුතු කිරීමට මුදල් සමාගමක් පැහැර හරින අවස්ථාවක, එම විධිවිධාන නිකුත් කළ දින සිට මාසයක් ඇතුළත මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පැවරීමට මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කළ හැකි අතර ඒ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**9.** (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද මණ්ඩලය විසින් මුදල් සමාගම්වල ව්‍යාපාර කටයුතුවල යම් අංගයක් පවත්වා ගෙන යාම සහ විශේෂයෙන් ම, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් යම් කණ්ඩායමකට හෝ වර්ගයකට අයත් මුදල් සමාගම්වලට විධාන දෙනු ලැබිය හැකි ය :-

(අ) ඒ සමාගම් විසින් තැන්පතු භාර ගනු ලැබිය හැකි නියමයක් සහ කොන්දේසි. ඒ තැන්පතු මත ගෙවිය යුතු උපරිම පොළී අනුප්‍රමාණ සහ තැන්පතු භාර ගනු ලැබිය හැකි උපරිම කාලසීමාවන්, එක් ගිණුමක හෝ ඊට වැඩි ගිණුම් ගණනක එක් තැනැත්තකුගේ නමින් සමාගමක් වෙත තැන්පතු කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය;

(ආ) ඒ සමාගම විසින් යම් ණයක්, ණය පහසුවක් හෝ යම් වර්ගයකට අයත් මූල්‍ය පිළිසරණක් ප්‍රදානය කරනු ලබන්නේ යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන් සහ කොන්දේසි, ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගවලට අයත් මූල්‍ය පිළිසරණ මත අය කරනු ලැබිය හැකි උපරිම පොළී අනුප්‍රමාණයක් සහ ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගයකට අයත් මූල්‍ය පිළිසරණ ප්‍රදානය කරනු ලැබිය හැකි උපරිම කාලසීමාව;

(ඇ) කොමිස් මුදල්, වට්ටම්, ගාස්තු හෝ වෙනත් ලැබීම් නැතහොත් කවර වූ ගෙවීම් ආකාරයෙන් ඒ සමාගම්වලට ගෙවනු ලබන නැතහොත් ඒ සමාගම විසින් අය කරනු ලබන උපරිම අනුප්‍රමාණයක්;

(ඈ) යම් කුලී සින්නක්කර ගිවිසුමක් මත ශක්‍ය කුලියට ගන්නකු විසින් කරනු ලැබිය යුතු අවම මූලික ගෙවීම සහ විවිධ ගණුදෙනු පංති සඳහා වූ නිශ්චිත විවිධ මූලික ගෙවීම්, ඒ උපරිම මූලික ගෙවීම ඒ ගිවිසුම යටතේ කුලියට ගනු ලැබූ බඩුවල වටිනාකම ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(ඉ) ඒ සමාගම විසින් ආයෝජනය කරනු ලැබිය හැක්කේ යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි;

(ඊ) ඒ සමාගම් විසින් දෙනු ලබන ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගවලට අයත් මූල්‍ය පිළිසරණක් සහ කරනු ලබන ආයෝජන සඳහා අවසර දෙනු ලැබිය හැකි කල්පිරීමේ උපරිම කාලසීමාව සහ විවිධාකාර වර්ගවලට අයත් ණය දීම්, ණය සහ ආයෝජන ක්‍රියාකාරකම්, සඳහා නියම කරනු ලබන හෝ අවසර දෙනු ලබන ඇපවල ස්වභාවය සහ මුදල් ප්‍රමාණය ;

(උ) ඒ සමාගම් විසින් ගිණුම්, පොත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යා යුතු ආකෘතිය සහ ආකාරය ;

(ඌ) ප්‍රදානය කරනු ලැබූ ණය අයකර ගනු ලැබිය නොහැකි බවට පත්ව ඇතොත් ඒ ණය සම්බන්ධයෙන් නොගෙවන ලද පොලිය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් සමාගමේ ආදායමෙන් බැහැර කිරීම ;

(එ) ඒ සමාගම්වල ද්‍රවශීල වත්කම් සහ ඒ සමාගම්වල සම්පූර්ණ තැන්පතු බැරකම් අතර විය යුතු අවම අනුපාතය ;

(ඒ) මණ්ඩලය විසින් නියම කරනු ලැබුවහොත් මුදල් සමාගම් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග මුදල් ශේෂ පවත්වාගෙන යාම සහ ඒ මුදල් ශේෂ සහ මුදල් සමාගම්වල තැන්පතු බැකරම් අතර විය යුතු අවම අනුපාතය ;

(ඔ) තැන්පත්කරුවන් විසින් කල් පිරීමට පෙර තැන්පතු ආපසු ගැනීමට අදාළ විය යුතු කොන්දේසි ;

(ඕ) තම ණය, ණය පහසුකම් හෝ වෙනත් මූල්‍ය පිළිසරණ හෝ ආයෝජනවල මුදල් ප්‍රමාණය වැඩි කිරීමෙන් ඒ සමාගම් තහනම් කිරීම ;

(ක) මුදල් සමාගම් විසින් කරනු ලබන හෝ දෙනු ලබන යම් ණය ආයෝජන හෝ මූල්‍ය පිළිසරණවල අනුප්‍රමාණය නිශ්චිත කාලසීමාවන් ඇතුළත වැඩි කරනු ලැබිය හැකි සීමාවන් නියම කිරීම ;

(ග) නිශ්චිත කාලසීමාවන් ඇතුළත තම ණය, ආයෝජන හෝ මූල්‍ය පිළිසරණවල මුදල් ප්‍රමාණය නිශ්චිත සීමාවන්වලට අඩු කිරීමට නියම කිරීම ;

(ච) (i) සමාගමක් සංස්ථා සහ මණ්ඩලයක් හෝ පුද්ගලයකු විසින් ;

(ii) මුළුමනින්ම–

(අ) සමාගමක් සහ පහත දැක්වෙන ඒවායින් එකක් හෝ වැඩි ගණනක් විසින්–

(අඅ) එහි පාලිත සමාගම් ;

(ආආ) එහි පාලක සමාගම් ;

(ඇඇ) එහි පාලක සමාගම පාලිත සමාගමක් ; හෝ

(ඈඈ) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තාවූ සමාගමක්; හෝ

(ආ) පුද්ගලයෙක් සහ පහත දැක්වෙන අය හෝ මණ්ඩල අතුරින් එකක් හෝ වැඩි ගණනක් විසින් –

(අඅ) තමාගේ ඥාතියකු ;

(ආආ) තමාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ තමාගේ ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ ;

(ඇඇ) ඒ සමාගමේ පාලිත සමාගම ;

(ඈඈ) ඒ සමාගමේ පාලක සමාගමක් ;

(ඉඉ) ඒ සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක් ;

(ඊඊ) ඒ සමාගමේ හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති සමාගමක් ; හෝ

(උඋ) ඒ පුද්ගලයා හෝ ඔහුගේ ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක් නොවන සංස්ථාපන මණ්ඩලයක්

දරනු ලබන මුදල් සමාගමක කොටස් ප්‍රාග්ධනයේ උපරිම ප්‍රතිශතය ;

එසේ වුව ද 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ තැනැත්තකු මත පනවන ලද නියමයක් නොවන ආකාරයකින්, මේ පනත ආරම්භ වන දිනයෙහි මුදල් සමාගමක තැනැත්තකුගේ කොටස් අඩු කිරීමක් මේ විධානවලින් නියම කරනු නොලැබිය හැකිය.

10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මුදල් සමාගමකට නිකුත් කරන ලද විධානයක් අනුව කටයුතු කරනු පිණිස, මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර හෝ පසුව ඒ කොටස ඒ තැනැත්තා විසින් අත්කරගනු ලැබුවද ඒ සමාගමෙහි ඒ තැනැත්තා විසින් දරනු ලැබූ කොටස් සංඛ්‍යාව ඒ විධානයෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුළුව අඩු කිරීමට ඒ සමාගමෙහි කොටස් දරන තැනැත්තකුට මුදල් සමාගමක් විසින් විධාන කළ හැකිය. තව ද ඒ විධානය අනුව කටයුතු කිරීම ඒ තැනැත්තාගේ කාර්ය වන්නේය:

(ජ) සුරැකුම් කළ අත්තිකාරම් සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු අන්තර ;

(ට) සමාගම සහ බදුලාභියා අතර පවත්නා බදු ගිවිසුම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ;

(ඩ) මුදල් සමාගම් මගින් කර ගෙන යනු ලැබිය හැකි කටයුතු වර්ග පිළිබඳ පරිසීමාවන්.

(2) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ වූ යම් විධානයක් මගින් නියම කරනු ලබන උපරිම පොළී අනු ප්‍රමාණයන්, මණ්ඩලය විසින් එසේ තීරණය කරනු ලැබුව-හොත් භාරගනු ලැබූ යම් තැන්පතුවක් සම්බන්ධයෙන් හෝ ඒ විධානයේ දිනයට පෙර ප්‍රදානය කරනු ලැබූ යම් ණයක්, ණය පහසුවක් හෝ වෙනත් යම් මූල්‍ය පිළිසරණක් සම්-බන්ධයෙන් හෝ අදාළ විය යුතුය ;

එසේ වුව ද ඒ විධානයේ කිසිවක්–

(අ) එවැනි යම් තැන්පතුවක් හෝ ණයක්, ණය පහසුවක්, හෝ වෙනත් මූල්‍ය පිළිසරණක් සම්බන්ධයෙන් ඒ විධානය නිකුත්කළ දිනට ප්‍රථම උපචිත යම් පොළියකට අදාළ නොවිය යුතුය ; නැතහොත්

(ආ) යම් අඩු කිරීමකින් අවස්ථාවෝචිත පරිදි යම් තැන්පතුවක්, ණයක්, ණය පහසුවක් හෝ මූල්‍ය පිළිසරණක් සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත්තුව හෝ ගිවිසුම කඩකිරීමක් සංයුක්ත වන්නේ නම්, විධානයේ දිනයට පෙර භාරගනු ලැබූ යම් තැන්පතුවක් මත හෝ ප්‍රදානය කරනු ලැබූ ණයක්, ණය පහසුවක් හෝ මූල්‍ය පිළිසරණක් මත ගෙවිය යුතු පොළී අනුප්‍රමාණය අඩු කිරීමට නියම කරනු නොලැබිය යුතු ය.

(3) යම් මුදල් සමාගමකට අවශ්‍ය අවස්ථාවක, විශේෂයෙන් ම (1) වන උපවගන්තියේ සඳහන් යම් කාරණා පිළිබඳව මණ්ඩලය විසින්, මේ පනතේ කාර්ය සඳහා විධාන දෙනු ලැබිය හැකි ය:

එසේ වුව ද යම් විධානයක් බලාත්මකව පවත්නා අතරතුර යම් අවස්ථාවකදී මුදල් සමාගමක් විසින් තත් කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත, නිසි අධිකරණයක් විසින්, ඒ විධානයට යටත් නොවී ස්වකීය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට ඒ සමාගමට අවසර දෙමින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකිය. නැතහොත් අධිකරණය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට ඒ විධානය වෙනස් කිරීම හෝ ලිහිල් කිරීම කරනු ලැබිය හැකිය. තවද, මණ්ඩලය විසින් කරන ලද විධානයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇතද ඉහත කී පරිදි අධිකරණය විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් බල සහිත විය යුතුය.

(4) (ඒ) ඡේදය යටතේ මුදල් සමාගමක් වෙත නිකුත් කරන ලද විධානයක් අනුව කටයුතු කරමින් මුදල් සමාගමක් විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන යම් මුදල් ශේෂයක් මත මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් අනුප්‍රමාණයක් අනුව මණ්ඩලය විසින් ස්වකීය අභිමතය අනුව පොලියක් ගෙවිය හැකි ය.

**10.** (1) අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් මත මුදල් සමාගමක්–

(i) ස්වකීය තැන්පත්කරුවන්ගේ සම්බන්ධතාවලට හානිකරන අයහපත් හෝ අනිසි මූල්‍ය පරිචයන් අනුගමනය කරන බවට ;

(ii) ස්වකීය තැන්පත්කරුවන්ගේ සම්බන්ධතාවලට හානිකරවන ආකාරයකින් ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ඉඩ ඇති බවට ;

(iii) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් විධානයක් කඩකර ඇති බවට හෝ ඒ අනුව කටයුතු කිරීම පැහැර හැර ඇති බවට ;

මණ්ඩලයේ මතය වන අවස්ථාවක මණ්ඩලය විසින් ඒ සමාගමට–

(අ) එවැනි යම් පරිචයක් අනුගමනය කිරීම නතර කිරීමට හෝ එවැනි යම් කඩ කිරීමකින් වැලකී සිටීමට ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම ; හෝ

(ඇ) ඒ පරිචයෙන් හෝ කඩකිරීමෙන් සිදුවන තත්ත්වයන් නිරවද්‍ය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ; හෝ

(ඈ) යම් තැනැත්තකු විසින් සමාගමෙහි දරනු ලබන කොටස් සංඛ්‍යාව අඩු කිරීම ඇතිකර ගැනීමට

විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද නියමයෙකින් අතෘප්තියට පත් යම් මුදල් සමාගමක් විසින්, ඒ නියමය නිකුත් කිරීමේ දින සිට දින තිහක් ඉකුත් වීමට පෙර මණ්ඩලය වෙත ලිඛිත අභියාචනයක් කරනු ලැබිය හැකි අතර ඒ අභියාචනය ලැබී දින පහළොවක් ඇතුළත මණ්ඩලය විසින් එහි තීරණය ඉදිරිපත් කරනු ලැබිය යුතුය

**11.** (1) අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මුදල් ව්‍යාපාරික කටයුතු කරගෙන යනු ලබන බව නිසැකව දැන ගැනීමෙහිලා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට නියම කරනු ලැබිය හැකිය. තව ද,

මේ කාර්යය සඳහා එම තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට අදාළ යම් පොත් හෝ වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය මුදල් ව්‍යාපාරික කටයුතු කරගෙන යන බව ඔහුගේ මතය වේ නම්, ඒ බව මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාවක් සළකා බැලීමෙන් පසු, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් මුදල් ව්‍යාපාරික කටයුතු කරගෙන යන බව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන්නේ නම්, නිශ්චිත කාල සීමාවක් ඇතුළත පනතේ නියමවලට අනුකූලව කටයුතු කරන ලෙස එම තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට නියම කරනු ලැබිය යුතු අතර, එසේ කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක විධාන දීමේ බලය එය සතු විය යුතුය. තවද, එබඳු අවස්ථාවකදී, 18 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කෙරෙන පුද්ගලයන්ගේ හෝ පුද්ගල මණ්ඩලවල ගණන් බේරා වසා දැමීමේ බලයද ඇතුළුව තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමෙහිලා අවශ්‍ය යයි සලකන යම් පියවර ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු සැපයීමට හෝ පොත් හෝ වාර්තා කිසිවක් ඉදිරිපත් කිරීමට නියමිත යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු වෙත එම තොරතුරු සැපයීම හෝ එම පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ කරන ලද විධාන හෝ නියම කිසිවකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සාමාන්‍යත්වයට හානියක් නොමැතිව, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් භාරගනු ලැබූ, ණයට ගනු ලැබූ හෝ ඉල්ලා ගනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් තැන්පත් මුදලක්දැයි නිසැකව දැන ගැනීමෙහිලා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකිය.

**12.** (1) අධ්‍යක්ෂවරයා විසින්, කවර විටක දී වුවද, යම් මුදල් සමාගමක පොත් සහ ගිණුම් පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට බලය දීම, කරනු ලැබිය හැකි ය.

(2) එම පරීක්ෂණය සම්පූර්ණ කළ වහාම, අධ්‍යක්ෂවරයා විසින් එවැනි යම් පරීක්ෂණයක වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එවැනි පරීක්ෂණයක පිරිවැය අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගමෙන් අයකරගනු ලැබිය යුතුය.

(3) අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ පහත දැක්වෙන කටයුතු කිරීම නිත්‍යානුකූල වන්නේ ය :—

(අ) දිවුරුම් ආඥාපනතට අනුකූලව යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක්, ලේකම්වරයෙක්, සේවා නියුක්තයෙක් හෝ විගණක-වරයෙක් ලවා දිවුරුම් හෝ ප්‍රතිඥා ගැනීම ;

(ආ) මෙම පනතේ කාර්යය සඳහා සමාගමේ කටයුතුවලට අදාළ වන්නා වූ ද අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු නිසැකව දැන ගැනීමට අවශ්‍ය යයි සලකනු ලබන්නා වූ ද යම් සියලු තොරතුරු සපයන ලෙස යම් මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට, ලේකම්වරයකුට, සේවා නියුක්-තයකුට හෝ විගණකවරයකුට නියම කිරීම ;

(ඇ) එවැනි යම් තොරතුරක් ඇතුළත් විය හැකි තමා සන්තකයේ හෝ භාරයේ තිබෙන සමාගමේ කටයුතුවලට අදාළ පොත්, වාර්තා හෝ ලේඛන කිසිවක් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට, ලේකම්වරයකුට, සේවා නියුක්තයකුට හෝ විගණකවරයකුට නියම කිරීම ; සහ

(ඈ) මුදල් සමාගමක් අයථා ලෙස කළමනාකරණය කරනු ලැබ ඇති බවට සාක්ෂි ඇති අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද විගණකවරයකු විසින් විගණනය කිරීම සඳහා මුදල් සමාගමේ ගිණුම් ඉදිරිපත් කරන ලෙස එම මුදල් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට, හෝ ලේකම්වරයකුට නියම කිරීම සහ යම් තොරතුරු සපයන ලෙස හෝ යම් පොත්, වාර්තා හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැක්කා වූ හෝ බලය දෙනු ලැබිය හැක්කා වූ හෝ යම් ගාස්තු මෙම විගණකවරයාට ගෙවන ලෙස යම් මුදල් සමාගමකට නියම කිරීම.

(4) මේ වගන්තිය යටතේ තමන් වෙත නියම කරන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කිරීම සහ අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට හෝ (3) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද යම් විගණකවරයකුට හෝ ඒ මුදල් සමාගමේ මුදල් ශේෂ වත්කම් සහ බැරකම් ඇතුළු එහි සියලු පොත් සහ වාර්තා බැලීමේ මාර්ග සැලැස්වීම කළ යුතු යයි අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටිනු ලබන කවර විටක වුව ද එසේ කිරීම යම් මුදල් සමාගමක සෑම අධ්‍යක්ෂවරයකුගේම, කළමනාකාරවරයකුගේම, ලේකම්වරයකුගේම, සේවා නියුක්තයකුගේම හෝ, විගණකවරයකුගේම කාර්යය වන්නේය.

(5) අධ්‍යක්ෂවරයා විසින්, යම් මුදල් සමාගමක කටයුතු පිළිබඳ සත්‍ය තත්ත්වය නිසැකව දැනගැනීම සඳහා සහ ඒ මුදල් සමාගම එහි වර්තමාන හෝ අනාගත තැන්පත්කරුවන්ට අනර්ථදායි ලෙස ව්‍යාපාරය කරගෙන යන බව නිසැකව දැනගැනීම සඳහා අවශ්‍ය යයි, තමා සලකන අවස්ථාවක, මුදල් සමාගමට අදාළ තොරතුරු තමා වෙත හෝ තමා විසින් බලය දෙන නිලධාරියකු වෙත හෝ (3) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ තමා විසින් බලය දෙන ලද යම් විගණකවරයකු වෙත සපයන ලෙස හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මඟින් නියම කරනු ලැබිය හැකි යම් කරුණු පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය හැකි වන පරිදි ඒ දැන්වීමෙහි නියම කරනු ලබන යම් ස්ථානයකදී, යම් දිනයක සහ වේලාවක තමා ඉදිරියේ හෝ තමා විසින් බලය දෙන ලද යම් නිලධරයකු ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටින ලෙස හෝ ඒ තොරතුරු ඇතැයි සැලකෙන යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(6) මුදල් සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය තත්ත්වය නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා, අධ්‍යක්ෂවරයා විසින්, (5) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් කිරීම අවශ්‍ය යයි තමා සිතන්නේ නම් යම් අදාළ අවස්ථාවක-

(අ) පරීක්ෂණයට භාජනව පවත්නා මුදල් සමාගමේ පාලක සමාගමක් හෝ පාලිත සමාගමක් ;

(ආ) ඒ මුදල් සමාගමේ පාලක සමාගමක පාලිත සමාගමක් ; සහ

(ඇ) ඒ මුදල් සමාගමේ ආශ්‍රිත සමාගමක්

වශයෙන් පවතින්නා වූ හෝ පැවතුනා වූ යම් සමාගමක ව්‍යාපාරික කටයුතු ද පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන මගින් තමා වෙත පැවරෙන බලතල අතුරෙන් කිසිවක්, එවැනි යම් සමාගමකට අදාළව ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

මේ උපවගන්තියෙහි " ආශ්‍රිත සමාගම " යන්නෙන්, මුදල් සමාගමකට අදාළව යෙදූ විට, සමාගමේ ගෙවූ කොටස් මුදලින් සියයට විස්සකට හෝ වැඩි ගණනකට සමාන වූ, එහෙත්, සියයට පණහකට වඩා අඩු වූ සාමාන්‍ය කොටස් මුදල් සමාගම විසින් දරන්නා වූ සමාගමක් අදහස් වේ.

12. අ. 12 වන වගන්තිය හෝ 13 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක් පදනම් කරගෙන මුදල් සමාගමට එරෙහිව ක්‍රියා මාර්ගයක් ගත යුතු යයි මණ්ඩලය යෝජනා කරන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් කරන ලද, නිර්දේශ ඇතුළත් කොටස නොමැතිව ඒ වාර්තාවේ පිටපතක් මණ්ඩලය විසින් ඒ සමාගම වෙත සපයනු ලැබිය යුතු අතර, එම වාර්තාව පිළිබඳ ව එම සමාගමේ තත්ත්වය මණ්ඩලය වෙත ප්‍රකාශ කිරීමට යටත් පිරිසෙයින් සත් දවසක කාලයක් සඳහා සමාගමට ඉඩදිය යුතු ය.

තැන්පත්කරුවන්ගේ සහ මුදල් සමාගමේ යහපත තකා වහා ක්‍රියා කිරීම අවශ්‍ය යයි මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, එම වාර්තාව පිළිබඳව සමාගමේ තත්ත්වය ප්‍රකාශ කිරීම සඳහා සමාගමට අවසර නොදෙමින් වාර්තාව පිළිබඳව මුදල් මණ්ඩලය ක්‍රියා කිරීම තහනම් කෙරෙන කිසිවක් මේ උපවගන්තියේ ඇතැයි සලකනු නොලැබිය යුතු ය.

**13.** සෑම මුදල් සමාගමක් විසින් ම එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු-

(අ) එක් එක් මුදල් වර්ෂයේ අවසාන වැඩකරන දිනය තෙක් වූ ශේෂ පත්‍රයක් ; සහ

(ආ) එම වර්ෂය වෙනුවෙන් ලාභාලාභ ගිණුමක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

**14.** (1) මුදල් සමාගමක ශේෂ පත්‍රයෙහි එම ශේෂ පත්‍රය අදාළ වන මුදල් වර්ෂය අවසානයේ එම සමාගමේ කටයුතු පිළිබඳ තත්ත්වය දැක්විය යුතු ය.

(2) ශේෂ පත්‍රයෙහි හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක-

(අ) වෙන වෙන ම වූ ශීර්ෂ යටතේ ස්පර්ශ්‍ය වත්කම්වලින් නියෝජනය නොවන ප්‍රාග්ධන වියදම් කපා නොහරින ලද්දේ, නම් ඒ වියදම් ;

(ආ) ආයෝජනවල වෙළඳ අගය ;

(ඇ) මුදල් වර්ෂය තුළ ස්ථාවර වත්කම් තක්සේරු කරන්නට යෙදුනේ නම්, ඒ ස්ථාවර වත්කම් තක්සේරු කිරීමට යොදගත් ක්‍රමය ;

(ඈ) බොල් සහ සැක සහිත ණය සඳහා සලසා ඇති අඩු කිරීම්වලින් පසු අත්තිකාරම් වල මුළු මුදල ;

(ඉ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂය වීම, අලුත් කිරීම හෝ අඩු වීම සඳහා වූ ප්‍රතිපාදනයෙහි යම් වැඩි වීමක් හෝ අඩු වීමක් ;

(ඊ) අරමුදල් ප්‍රභව සහ යෙදවීම ;

(උ) සංචිත ප්‍රතිපාදන සහ එකිනෙකින් වෙනස් වූ බැරකම් ;

(ඌ) මේ පනත ආරම්භ වීමේ දිනයෙන් පසුව වූ පළමුවන ශේෂ පත්‍රය සම්බන්ධයෙන් හැරෙන්නට, ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති සියලු ශීර්ෂ සඳහා, ඊට ඉහතින් වූ මුදල් වර්ෂය අවසානයේ තිබූ අනුරූපී මුදල් ප්‍රමාණ.

**15.** ලාභාලාභ ගිණුමේ හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක-

(අ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂය වීම, අලුත් කිරීම හෝ අඩු වීම සඳහා වූ ප්‍රතිපාදනය මගින් ආදයමින් ගෙවනු ලැබූ මුදල් ;

(ආ) ලාභ මත ශ්‍රී ලංකා ආදයම් බද්ද සහ වෙනත් ශ්‍රී ලංකා බදු සඳහා ආදයමින් ගෙවූ මුදල සහ ඒ ගිණුම්වලින් වෙනස් ව පවත්නා බදු වර්ෂය හෝ පසුව එළඹෙන වර්ෂයක් වෙනුවෙන් අයවිය යුතු බදු සම්බන්ධයෙන් වූ බැරකම් සඳහා වෙන් කළ හෝ වෙන් කිරීමට යෝජිත මුදල්.

(ඇ) ගෙවන ලද හෝ ගෙවීමට යෝජිත ලාභාංශවල මුළු මුදල ;

(ඈ) විගණකවරුන්ගේ පාරිශ්‍රමික මුදල ;

(ඉ) අධ්‍යක්ෂවරයන්ගේ වේතනවල මුළු මුදල නියෝජනය වන ආදයමින් ගෙවූ මුදල ;

(ඊ) සංචිතවලට වෙන් කළ හෝ වෙන් කිරීමට යෝජිත හෝ ඉන් ආපසු ගන්නා ලද මුදල ;

(උ) මුදල් සමාගම විසින් සාමාන්‍යයෙන් භාර නොගන්නා සහ සුවිශේෂ හෝ පුනරාවර්තන නොවන ස්වභාවයේ කරුණු හේතු කොට ගෙන භාරගන්නා ගණුදෙනුවලින් පැන නගින, වෙන වෙනම වැය ශීර්ෂ යටතේ වූ ගිණුම් තැබීමේ පදනමෙහි වෙනස් කිරීමක් නිසා ඇති වන ලාභයක් හෝ පාඩුවක් සහ ආදයම සහ වියදම ;

(ඌ) මේ පනත ආරම්භ වීමේ දිනයෙන් පසු, ප්‍රථම ලාභාලාභ ගිණුම සම්බන්ධයෙන් හැර, ලාභාලාභ ගිණුමේ පෙන්වා ඇති සියලු ශීර්ෂ සඳහා ඊට ඉහතින් ම වූ මුදල් වර්ෂය අවසානයේ තිබූ අනුරූපී මුදල් ප්‍රමාණ.

**16.** (1) සෑම මුදල් සමාගමක් විසින් ම, මුදල් වර්ෂය අවසාන වී මාස හයක් ඇතුලත—

(අ) ඒ මුදල් වර්ෂය සඳහා වූ සමාගමේ ලාභාලාභ ගිණුම ;

(ආ) එම ලාභාලාභ ගිණුම සකස් කරන ලද දිනය තෙක් වූ ශේෂ පත්‍රය ;

(ඇ) එම ලාභාලාභ ගිණුමට සහ ශේෂ පත්‍රයට අමුණන ලද විගණකවරයාගේ වාර්තාව ; සහ

(ඈ) එම ශේෂ පත්‍රයට අමුණන ලද සමාගමේ කටයුතුවලට අදළ අධ්‍යක්ෂවරයන්ගේ වාර්තාව.

අධ්‍යක්ෂවරයා වෙත යවා, ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(2) සෑම මුදල් සමාගමක් විසින් ම, එම සමාගමේ ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම, එහි ව්‍යාපාරික කටයුතු කරන එක් එක් ස්ථානයෙහි ප්‍රකට කොටසක, පසුව එළඹෙන මුදල් වර්ෂයේ ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම පිළියෙල කොට ප්‍රදර්ශනය කරන තෙක්, ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින්, මේ වගන්තියෙහි සඳහන් ශේෂ පත්‍රයේ සහ ලාභාලාභ ගිණුමේ ආකෘතිය නිශ්චය කරනු ලැබිය හැකි අතර, සෑම මුදල් සමාගමක ම ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම එසේ නිශ්චිත එම ආකෘතියෙහි පිළියෙල කරනු ලැබිය යුතුය.

**17.** මුදල් සමාගමක විගණකවරයා විසින් සමාගමක ගිණුම්, මුදල්, මුදල් කළමනාකරණය සහ දේපළ පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතු ය. විගණකවරයා විසින් හැකිතාක් දුරට සහ අවශ්‍ය වන තාක් දුරට —

(අ) මුදල් සමාගම පවත්වාගෙන යාම නීති රීති සහ මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව කර ඇත්තේ ද ;

(ආ) තැන්පතු භාර ගැනීම සහ ගිණුම් පවත්වා ගෙන යාමට අදාළ වාර්තා සතුටුදායක ලෙස කර ඇත්තේ ද ;

(ඇ) ගිණුම් ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන, මුදල් පාලන කාර්යය පිළිබඳ මතය සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ මතය අනුව මුදල් සමාගමේ කටයුතු පිළිබඳ ව අඛණ්ඩ අගැයීමක් කළ හැකි වන පරිදි නිසි අයුරින් හා ප්‍රමාණවත් අයුරින් සැලසුම් කර ඇත්තේ ද යන බව සහ ඒ ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන එලදයි ලෙස ක්‍රියාත්මක වන්නේ ද ;

(ඈ) ගණකාධිකරණය, මුදල් යෙදවීම සහ තක්සේරු කිරීම පිළිබඳ මූලධර්ම කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින්, සැලකිල්ලට භාජනව ඇති කාලසීමාව සම්බන්ධයෙන් මුදල් සමාගමේ කටයුතු පිළිබඳ ව සත්‍ය සහ සාධාරණ අදහසක් ගෙන හැර දක්වන පරිදි විගණනය කරන ලද ගිණුම් සැලසුම් කර ඇත්තේ ද යන බව පරීක්ෂා කර බැලිය යුතු ය.

**18.** (1) අධ්‍යක්ෂවරයා විසින් ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ යම් මුදල් සමාගමක කටයුතු පරීක්ෂා කරනු ලැබීමෙන් පසුව හෝ සමාගමෙන් ලැබුණු තොරතුරු අනුව හෝ එම සමාගම, බුන්වත් යයි හෝ එහි තැන්පතු කරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි තත්ත්වයකට එය පත්වීමට ඉඩ තිබේ යයි හෝ එම සමාගමේ ව්‍යාපාර කටයුතුවල තවදුරටත් යෙදී සිටීම නිසා එහි තැන්පත්කරුවන්ට හෝ ණය හිමියන්ට පාඩු සිදුවීමට ඉඩ තිබේ යයි අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන යම් අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින්, මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිණිස, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ඒ අනුව වාර්තාවක් යැවිය යුතු ය ; තවද, සිද්ධීන් සහ කරුණු සමාලෝචනයට භාජනය කිරීමෙන් පසුව, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි ක්‍රියා කළ යුතු යයි මණ්ඩලය අදහස් කරතහොත්, ව්‍යාපාර කටයුතු වහාම අත් හිටුවන ලෙස සමාගමට විධාන කරමින් සහ සමාගමේ සියලු ම පොත්, වාර්තා සහ වත්කම් භාර ගන්නා ලෙසත්, සමාගම විසින් ව්‍යාපාර කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙසත් අධ්‍යක්ෂවරයාට විධාන කරමින් මණ්ඩලය විසින් නියමයක් කරනු ලැබිය හැකිය.

(2) සමාගමේ පොත්, වාර්තා හෝ වත්කම් කිසිවක් තම සන්තකයේ හෝ භාරයේ ඇත්තා වූ ද, ඒ පොත්, වාර්තා හෝ වත්කම් අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු වෙත භාර දීම පැහැර හරින්නා වූ ද, යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු හෝ යම් පොත්, වාර්තා හෝ වත්කම් භාර ගැනීමේ දී හෝ සමාගමේ ව්‍යාපාරික කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම වළක්වාලීමෙහිලා අධ්‍යක්ෂවරයා සලකන යම් වෙනත් පියවර ගැනීමේ දී අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට අවසර දීමට අවහිර කරන හෝ අවසර දීම පැහැර හරින යම් තැනැත්තකු පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

(3) වෙන යම් නීතියක කුමක් සඳහන් ව ඇතද, (1) වන උපවගන්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යම් නියමයක් සමාලෝචනය කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට සලස්වා ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ නියමය නිසා සිදු වූ හෝ සිදු වීමට ඉඩ තිබෙන හෝ සිදු වී යයි කියනු ලබන යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් හෝ කිසිම අධිකරණයක යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය හැකිය.

(4) යම් මුදල් සමාගමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරන ලද යම් නියමයක බලපෑම, එය කරන ලද දින සිට දින හැටක කාලයක් ඉකුත් වූ විට අවසාන විය යුතු අතර, හැකිතාක් ඉක්මණින්, සහ කෙසේ වුවද එකී කාලසීමාව ඉකුත් වීමට පෙර—

(අ) කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් කොන්දේසිවලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට සමාගමට අවසර දෙමින් නියමයක් කිරීම ; හෝ

(ආ) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි, නිසි බලය ඇති අධිකරණයක් වෙත අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබීමට සැලැස්වීමට අදහස් කරන බව මුදල් සමාගම වෙත දැනුම් දීම

මණ්ඩලයේ කාර්යය වන්නේය.

(අ) ඡේදය මගින් පැවරී ඇති බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව සහ වෙන යම් නීතියක හෝ සමාගමේ සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන්ව ඇත ද, මණ්ඩලය විසින්, ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට අවසර දීම සඳහා වූ කොන්දේසියක් වශයෙන් එම සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු හෝ සේවා නියුක්තයකු තවදුරටත් කටයුතු කරගෙන යාම එහි තැන්පත්කරුවන්ගේ යහපතට හානිකර යයි මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා හෝ සේවා නියුක්තයා ඉවත් කිරීම සහ ඒ සමාගමේ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා හෝ සේවා නියුක්තයා වශයෙන් යම් තැනැත්තකු පත් කිරීම කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, අධ්‍යක්ෂවරයන් වශයෙන් එසේ පත් කරන ලද තැනැත්තන්ගේ සංඛ්‍යාවෙන්, එම මුදල් සමාගමේ, මණ්ඩලයේ බහුතරයක් සංස්ථාපනය නොවිය යුතු ය.

(5) 43 වන වගන්තියට අනුකූලව මුදල් සමාගම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ නොමැති නම් හෝ ඒ වගන්තියට අනුකූලව කරන ලද මුදල් සමාගමේ ඉල්ලීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්නම් හෝ සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතුය.

(6) (1) වන උපවගන්තිය යටතේ මුදල් සමාගමක ව්‍යාපාරික කටයුතු අත්හිටුවන ලද කාලසීමාව තුළ, එකී සමාගමේ හෝ ඒ සමාගමේ පරිපාලනයට සම්බන්ධ වියදම් කිසිවක් දැරීම පොදු යහපත සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන්නේ නම්, මහ බැංකුවේ අරමුදල්වලින් ඒ වියදම් දැරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

(7) අධ්‍යක්ෂවරයා විසින් කරන ලද යම් ඉල්ලීමක් මත යම් මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමිය යුතු යයි නිසි බලය ඇති අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, 1982 අංක 17 දරන සමාගම් පනතේ සමාගම් ගණන් බේරා වසා දැමීමට අදාළ විධිවිධාන එම සමාගම ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(8) මේ පනත යටතේ පුද්ගලයකුගේ හෝ (සමාගමක් නොවන) පුද්ගල මණ්ඩලයක ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විටක, ඇවරකරු සුදුසු යයි සිතන යම් ආකාරයකට සහ පදනමක් මත පුද්ගලයකුගේ හෝ පුද්ගල මණ්ඩලයක වත්කම් සහ බැරකම්වල අගය නිසැකව දැනගත යුතුය. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමෙන් පසු කවර විටක වුවද, නිසි බලය ඇති අධිකරණය විසින්, ඇවරකරුට සියලුම වත්කම් මුදල් කර ගැනීමට බලය දිය හැකි අතර, එම පුද්ගලයාට හෝ පුද්ගල මණ්ඩලයට හිමිකම ඇත්තා වූ ද ඔහු වෙත තිබෙන්නා වූ ද යම් මුදලක්, දේපළක් හෝ පොත් සහ වෙනත් ලේඛන වහාම හෝ නිශ්චිත කාලයක් ඇතුළත ඇවරකරුට ගෙවන ලෙස, භාරදෙන ලෙස, සමර්පණය කරන ලෙස, පවාරණය කරන ලෙස හෝ පවරන ලෙස ඒ තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකිය. එම පුද්ගලයාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා වැඩ පිළිවෙලක් ඇවරකරු විසින් පිළියෙල කරනු ලැබ, ස්ථිර කිරීම සඳහා එය නිසි බලය ඇති අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම පුද්ගලයාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ගණන් බේරා වසා දැමීම ඒ වැඩ පිළිවෙල අනුව කර ගෙන යා යුතුය.

(9) යම් මුදල් සමාගමක, පුද්ගලයකුගේ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක (සමාගමක් නොවන) ගණන් බේරා වසා දැමීම සඳහා මේ වගන්තිය යටතේ හෝ අන්‍යාකාරයකින් කරන ලද ඉල්ලීමක් අනුව ආඥාවක් කරන ලද යම් අවස්ථාවක, වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද එම ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා ඇවරකරු ලෙස අධ්‍යක්ෂවරයා හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. සමාගමක් නොවන පුද්ගලයකුගේ හෝ පුද්ගල මණ්ඩලයක ගණන් බේරා වසා දැමීම සඳහා ආඥාවක් කරන ලද අවස්ථාවක, මේ යටතේ පත් කරන ලද ඇවරකරුවකුගේ පාරිශ්‍රමිකය සහ ගණන් බේරා වසා දැමීමෙහි ලා නිසි ලෙස දරන ලද සියලු පිරිවැය, ගාස්තු සහ වියදම්, වෙන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ගණන් බේරා වසා දැමීමේ දී දැරීමට සිදු වූ එම පුද්ගලයාගේ හෝ පුද්ගල මණ්ඩලයේ වත්කම්වලින්, වෙනත් සියලු හිමිකම් පෑම් වලට ඉහළින් ප්‍රමුඛත්වය දී ගෙවනු ලැබිය යුතු ය.

(10) යම් මුදල් සමාගමක් ගණන් බේරා වසාදැමීමෙහි ලා දරන ලද යම් පිරිවැය, ගාස්තු සහ වියදම් පොදු යහපත තකා මහ බැංකුවේ අරමුදල් වලින් ගෙවිය යුතු යයි මණ්ඩලය සලකන අවස්ථාවක, එසේ කරනු ලැබිය හැකිය.

(11) යම් මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීම සඳහා (4) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරන ලද යම් අවස්ථාවක—

(අ) ඉල්ලීම විනිශ්චයට භාජනව පවත්නා කාලය තුළ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමට අධිකරණය විසින් බලය දෙනු ලැබ ඇත්නම් මිස සහ අධිකරණය නියම කරනු ලබන කොන්දේසි කිසිවක් වේ නම්, ඒ කොන්දේසිවලට අනුකූලව මිස, සමාගම විසින් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන නොයා යුතුය ; තවද,

(ආ) අධිකරණය අවශ්‍ය යයි සලකන යම් විභාගයකින් පසුව සමාගම බුන්වත් නොවේ යයි අධිකරණයේ මතය වුවහොත් කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යයි අධිකරණය සලකන යම් කොන්දේසිවලට යටත් ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට මුදල් සමාගමට අවසර දෙමින් අධිකරණය විසින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකිය.

(12) නිසි බලය ඇති අධිකරණයක් විසින් මේ වගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවක්ම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කළ හැකි අභියාචනයකට යටත් විය යුතු අතර, සිවිල් නඩු පිළිබඳ අභියාචනා සම්බන්ධයෙන් (101) වන අධිකාරය වන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ දක්වෙන විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය ;

එසේ වුවද (11) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ආඥාවක් අවසානාත්මක විය යුතු ය.

(13) මේ වගන්තිය යටතේ නිසි බලය ඇති අධිකරණයක් වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම රුපියල් පන් දහසක වටිනාකමෙන් යුත් නඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(14) මේ වගන්තියේ යම් මුදල් සමාගමක් සම්බන්ධයෙන් වූ විට '' නිසි බලය ඇති අධිකරණය '' යන්නෙන්, කොළඹ දිසා අධිකරණය හෝ මුදල් සමාගමේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික්කයක හෝ දිසාඅධිකරණය අදහස් වේ.

**19.** (අ) පෞද්ගලිකව පෙනී සිටින ලෙස හෝ යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් 12 වන වගන්තිය යටතේ නියම කරන ලද විටක එසේ කිරීම පැහැර හරින හෝ 12 වන වගන්තිය යටතේ යම් පරීක්ෂණයක් කිරීමට අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට හෝ 12 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද විගණකවරයකුට බාධා කරන හෝ අවසර දීම පැහැර හරින යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය ;

(ආ) අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු වෙත හෝ 12 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද යම් විගණකවරයකු වෙත හෝ ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක අසත්‍ය යයි තමා දන්නා ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

**20.** (1) 18 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් ලැබුණු විට සිද්ධීන් සහ අවස්ථාගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසු, මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි මුදල් සමාගමක් ණය ගෙවිය හැකි ස්ථායි තත්ත්වයකට

පත් කළ හැකි යයි මණ්ඩලයේ මතය වුවහොත්, මණ්ඩලය විසින්, ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් මගින්, එම දැන්වීමේ සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය භාර ගනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තදනන්තර දැන්වීමක් මගින් මුල් දැන්වීමේ සඳහන් කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකිය. එවැනි සෑම දැන්වීමක ම පිටපතක් සමාගමේ රෙජිස්ට්‍රාර් වෙත යැවීමට මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, ඔහු විසින් ඒ බවට සමාගමට අදළ පොත්වල සටහනක් කරනු ලැබිය යුතු ය.

(2) යම් මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය භාර ගන්නා අවස්ථාවක, මණ්ඩලය විසින්—

(අ) එම මුදල් සමාගම සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් එම සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කරන ලද සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ;

(ආ) සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ යහපත සැලකිල්ලට ගනිමින් සහ පොදු යහපත තකා මණ්ඩලය සහ යම් පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් අතර එකඟ විය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මුදල් සමාගමේ කළමනාකරණය, කළමනාකරණය සඳහා ඒ පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය සමඟ යම් ගිවිසුමකට ඇතුළත් වීම ;

(ඇ) මුදල් සමාගම, වෙනත් මුදල් සමාගමක් හෝ වෙනත් යම් ආයතනයක් සමඟ ඒකාබද්ධකිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් වැඩපිළිවෙලවල් එකී වෙනත් මුදල් සමාගමේ හෝ ආයතනයේ කැමැත්ත ඇති ව සකස් කිරීම ;

(ඈ) යම් මුදල් සමාගමක ප්‍රාග්ධනය වැඩි කිරීමෙන් ද අලුත් කොටස්කරුවන් බඳවා ගැනීමේ වැඩපිළිවෙලක් යෙදීමෙන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය පුනස්ථාපනය කිරීමෙන් ද එය ප්‍රති සංවිධානය කිරීම ;

(ඉ) තැන්පතුකරුවන්ගේ යහපත සඳහා වේ යැයි මුදල් මණ්ඩලය විසින් අදහස් කරනු ලබන ආකාරයකට එම මුදල් සමාගම ප්‍රතිසංස්කරණය කළ හැකිය.

(ඊ) පහත දැක්වෙන පරිදි, එනම් : —

(i) සමාගමේ කොටස් සඳහා මිළ ගණන් කැඳවා ඇති අවස්ථාවක වෙළඳපොල අගය අනුව ; හෝ

(ii) කොටස් සඳහා එසේ මිළ ගණන් කැඳවා නොමැති අවස්ථාවක, මණ්ඩලය විසින් නම් කරන ලද ඇගයුම්කරුවකු විසින් තීරණය කරනු ලැබූ මිළ අනුව තීරණය කරනු ලබන වන්දි මුදලක් මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තකු විසින් ගෙවනු ලැබූ විට තමන්ට අයිති කොටස්වල අයිතිය ඒ තැනැත්තාට අවසතු කරන ලෙස හෝ පවරන ලෙස යම් මුදල් සමාගමක කොටස් හිමියන්ට ලිඛිත දැන්වීමක් මගින් විධාන කළ හැකි ය.

(3) යම් මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය විසින් පවරා ගන්නා ලද කාලසීමාව තුළ එම මුදල් සමාගමේ සෑම අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක් සහ ලේකම්වරයෙක් විසින් ම, එම සමාගම සම්බන්ධයෙන් වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම, මණ්ඩලය විසින් එසේ කිරීමට ප්‍රකාශිතව ම බලය දෙනු ලැබ ඇත්නම් මිස, අවසන් කරනු ලැබිය යුතු ය.

(4) මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් පවරා ගනු ලැබූ අවස්ථාවක, මහජන යහපත සඳහා වේ යයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන අවස්ථාවක —

(අ) මුදල් සමාගමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නා වූ මුදල් පහසුකම්, ප්‍රදාන වශයෙන් හැර, ණය මුදල් හෝ වෙනත් පහසුකම් වශයෙන් එම මුදල් සමාගමට පිළියෙල කරදීම හෝ ප්‍රදානය කිරීම කළ හැකි ය ; තව ද

(ආ) සමාගමේ පරිපාලනය හා කළමනාකරණය කරගෙන යාමේ දී දරන්නට සිදු වූ සියලු ගාස්තු අයකිරීම් සහ වියදම් ගෙවිය හැකි ය;

එසේ වුව ද (1) වන උපවගන්තිය යටතේ මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය පවරා ගැනීමෙන් පසුව යම් අවස්ථාවක, සමාගමේ ව්‍යාපාරය තාවකාලිකව අත්හිටුවීම, මහජනයාගේ හෝ තැන්පත්කරුවන්ගේ යහපත සඳහා වේ යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන්නේ නම්, මණ්ඩලය විසින් එම ව්‍යාපාර කටයුතු එසේ අත්හිටුවිය හැකි ය. එසේ නැතහොත් සාධාරණ කාලසීමාවක් ඇතුළත සමාගම ආර්ථික ප්‍රයෝගය ශක්තියුක්ත කිරීමට හෝ නුබුන්වත් කිරීමට හෝ නොහැකි බව අධ්‍යක්ෂවරයා විසින් හෝ මණ්ඩලයෙන් බලයලත් යම් තැනැත්තකු විසින් කරන ලද වාර්තාවක් අනුව මණ්ඩලයට පෙනී යන්නේ නම්, සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලුම් කරන ලෙසට අධ්‍යක්ෂවරයාට විධාන කළ හැකි ය. මුදල් සමාගම ගණන් බේරා වසා දමන ලෙසට මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට විධාන කළහොත්, ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 18 වන වගන්තියේ වූ විධිවිධාන අදාළ විය යුතුය.

**21.** (1) යම් මුදල් සමාගමකට තාවකාලික මුදල් පහසුකම් සලසා දීම, තැන්පත්කරුවන්ගේ යහපත සඳහා වේ යැයි, අධ්‍යක්ෂවරයා විසින් ම හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් එම සමාගමේ කටයුතු පරීක්ෂා කිරීමෙන් පසුව හෝ මුදල් සමාගමෙන් ලැබුණු තොරතුරු මත හෝ අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වූ යම් අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ බව මණ්ඩලයට වාර්තා කළ යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත ඒ මුදල් සමාගමට ණයට දීමේ කාර්යය සඳහා, (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ 88ඉ වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍ය හා දීර්ඝකාලීන ණය අර මුදලෙන් ණයක් හෝ අත්තිකාරමක් මණ්ඩලය විසින් වාණිජ බැංකුවකට ප්‍රදානය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වාණිජ බැංකුවකට ප්‍රදානය කරන ලද යම් ණයක් හෝ අත්තිකාරමක් සම්බන්ධයෙන්, මුදල් නීති පනතේ 88 අ සිට 88ඉ දක්වා වූ වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, අදාළ විය යුතු ය.

**22.** මේ පනතේ හෝ වෙනත් නීතියක විධිවිධාන කෙසේ වුව ද මණ්ඩලය විසින්—

(අ) කළමනාකරණය හා පරිපාලනය මණ්ඩලය විසින් පවරා ගනු ලැබූ මුදල් සමාගමක් සමග තැන්පතුකරුවකු විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් සමාලෝචනය කළ හැකි වන අතර තැන්පතුකරුවන් ගේ හෝ ණයහිමියන්ගේ යහපත ගැන හෝ දූරදර්ශී වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ලකින් තොරව එම ගිවිසුමට එළඹ ඇතැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, ආපසු ගෙවීම, පොළී අනුපාතික හා අයකිරීම් සම්බන්ධයෙන් වූ නියමයන් ඇතුළු ව, එම ගිවිසුමේ නියමයන් වෙනස් කළ හැකි ය.

(ආ) කළමනාකරණය හා පරිපාලනය මණ්ඩලය විසින් පවරා ගනු ලැබූ මුදල් සමාගමක් විසින් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ඇතුළත් වී ඇති යම් එකඟවීමක් හෝ ගිවිසුමක් සමාලෝචනය කළ හැකි වන අතර එවැනි සමාලෝචනයකින් පසු, තැන්පතුකරුවන්ගේ සහ ණය හිමියන්ගේ යහපත ගැන නිසි සැලකිල්ල නොදක්වා හෝ දූරදර්ශී වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ල නොදන්වා එම එකඟ වීමට හෝ ගිවිසුමට එළඹ ඇති බව මණ්ඩලයට පෙනී යන්නේ නම්, එම ගිවිසුමේ නියමයන් වෙනස් කළ හැකි ය.

**23.** මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය මණ්ඩලය විසින් 20 වන වගන්තිය යටතේ පවරා ගෙන ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් නිසා හෝ 20 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලයට පැවරුණු, නියම වුනු හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ යම් තැනැත්තකුට සිදුවූ හෝ විඳින්නට සිදු වූ හෝ සිදුවූයේ යයි හෝ විඳින්නට සිදුවූයේ යයි කියනු ලබන හෝ යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතු නොවන අතර ඒ සම්බන්ධයෙන් යම් අධිකරණයක යම් නඩුවකට හෝ නඩු කටයුත්තකට මණ්ඩලය යටත් නොවිය යුතු ය.

**24.** (1) මණ්ඩලය විසින් මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය 20 වන වගන්තිය යටතේ පවරා ගෙන ඇති අවස්ථාවක, තැන්පත්කරුවන්ගේ හෝ ණය හිමියන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීමට පියවර ගැනීම සඳහා එම මුදල් සමාගමේ පරිපාලනය හා කළමනාකරණය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ තැනැත්තකු වෙත එම ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ තැනැත්තාගේ කැමැත්ත ඇතිව සතු කළ හැකි ය. එම නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ විට, එම මුදල් සමාගමේ පරිපාලනය හා කළමනාකරණය එම ව්‍යවස්ථාපිත මණ්ඩලය හෝ තැනැත්තා වෙත සතු වන අතර එම ව්‍යවස්ථාපිත මණ්ඩලය හෝ තැනැත්තා විසින් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී, නියම වී හෝ වෙන්කර දී ඇති සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය එම මුදල් සමාගම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කළ යුතුය.

(2) මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින්, මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ තැනැත්තකු වෙත සතු කර ඇති අවස්ථාවක, පහත දැක්වෙන පරිදි, එනම් :—

(i) සමාගමේ කොටස් සඳහා මිළ ගණන් කැඳවා ඇති අවස්ථාවක, වෙළෙඳපොල අගය අනුව; හෝ

(ii) කොටස් සඳහා එසේ මිළ ගණන් කැඳවා නොමැති අවස්ථාවක, මණ්ඩලය විසින් නම් කරන ලද ඇගයුම්කරුවකු විසින් තීරණය කරනු ලැබූ මිළ අනුව

ගණන් බලනු ලබන වන්දි මුදලක් ගෙවනු ලැබූ විට තමන්ගේ කොටස් මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තකු විසින් අවසතු කරන ලෙස හෝ එකී තැනැත්තාට පවරන ලෙස යම් සමාගමක කොටස් හිමියකුට විධාන කළ හැකිය.

**25.** (1) අධ්‍යක්ෂවරයා විසින් 18 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයූ පසු සහ මණ්ඩලය විසින් කරුණු සහ අවස්ථාගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසු ද මුදල් සමාගමක යම් ආදි හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු,

සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු සමාගමට අයිති යම් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් වංචනික ලෙස ද සාවද්‍ය හෝ නීතිවිරෝධී ලෙස ද තමාම පොහොසත් වී හෝ වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් පොහොසත් කර ඇති බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන්නේ නම්, 18 වන හෝ 20 වන වගන්තිය යටතේ ද එවකටත් ක්‍රියා මාර්ගයක් ගෙන තිබුණ ද, මුදල් සමාගමට ආරෝපණය කළ හැකි මුදල් හෝ දේපළ සුදුසු යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන අනුප්‍රමාණයක වූ පොළිය ද සමග, මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් ඇතුළත ආපසු ගෙවන ලෙස හෝ ආපසු ලබාදෙන ලෙස එම තැනැත්තාට හෝ තැනැත්තන්ට නියම කළ හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු මෙහි මින් පෙර සඳහන් මුදල් හෝ දේපළ මුදල් සමාගමට නැවත ලබා දීමට පැහැර හරින අවස්ථාවක මණ්ඩලය විසින් :—

(අ) පහත දැක්වෙන ආකාරයේ වූ යම් මුදල්, දේපළ සහ වත්කම්වල වටිනාකම, ස්වභාවය සහ ඒවා පිහිටි ස්ථානය, මණ්ඩලය විසින් බලය දෙන ලද නිලධරයකුට නිශ්චිත කාල සීමාවක් ඇතුළත අනාවරණය කරන ලෙස එම තැනැත්තාට විධාන කළ හැකි ය. :—

(i) එම තැනැත්තාට අයිති යම් මුදල්, දේපළ සහ වත්කම් හෝ

(ii) එම තැනැත්තාට අර්ථදායී සම්බන්ධතාවක් ඇති යම් මුදල්, දේපළ සහ වත්කම් ; හෝ

(iii) එම තැනැත්තා සඳහා භාරයක් වශයෙන් එම තැනැත්තාගේ නෑදැයකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් අත්කරගත් හෝ මිළ දී ගත් හෝ දරනු ලබන හෝ සතුව ඇති හෝ

මුදල් සමාගමේ වත්කම්වලට යොමු කළ හැකි මුදල්වලින් අත්කරගත් හෝ මිළ දී ගත් මුදල්, දේපළ සහ වත්කම් ;

(ආ) කවර වේලාවක හෝ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වේලාවක හෝ එම තැනැත්තාගේ අයිතියේ හෝ සන්තකයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සඳහන් කර දක්වන්නා වූ ද එසේ සඳහන් කර ඇති එක් එක් දේපළ අත්කර ගත් දිනය සහ එසේ අත්කර ගැනීම සිදුවූයේ, මිළ දී ගැනීමෙන්, තෑගි දීමකින්, අන්තිම කැමති පත්‍රයක් මගින් ප්‍රදානයකින්, උරුම වීමෙන් හෝ වෙනත් ආකාරයකින් ද යන වග නිශ්චිත ව සඳහන් කෙරෙන්නා වූ ද ලිඛිත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස,ඒ තැනැත්තාට නියම කළ හැකිය.

(ඇ) පහත දැක්වෙන පරිදි වූ ලිඛිත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස වෙනත් තැනැත්තකුට නියම කළ හැකි ය :—

(i) සපයන තොරතුරු මුදල් සමාගම් කටයුතු පිළිබඳ විමර්ශනයට උපකාරී වෙතැයි විශ්වාස කිරීමට මණ්ඩලයට සාධාරණ හේතු ඇති අවස්ථාවක, යම් වේලාවක හෝ මණ්ඩලය විසින් නිශ්චිත ව සඳහන් කරනු ලබන වේලාවක හෝ එම තැනැත්තාගේ අයිතියේ හෝ සන්තකයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සඳහන් කර දක්වන්නා වූ ප්‍රකාශයක් ;

(ii) විමර්ශනයේ දී අදාළ වෙතැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් කාරණා පිළිබඳ විස්තර අඩංගු ප්‍රකාශයක්. ;

(ඇ) එම තැනැත්තාගේ ගිණුමට අදාළ සටහන් අඩංගු යම් බැංකුවේ පොතක්, ලේඛනයක් හෝ චෙක්පතක්, දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස හෝ එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි එම සටහන්වල සහතික පිටපත් සපයන ලෙස ශ්‍රී ලංකාවේ යම් බැංකුවක කළමනාකරුට නියම කළ හැකි ය.

(ඉ) එම තැනැත්තාගේ කටයුතු සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ලබා ගත හැකි සියලු තොරතුරු දැන්වීමේ නිශ්චිතව සඳහන් පරිදි, සපයන ලෙස ද එම කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ හෝ ඇත්තා වූ ද එම තැනැත්තාට අදාළ වූ ද යම් ලේඛනයක් හෝ එවැනි යම් ලේඛනයක සහතික පිටපතක් දැන්වීමේ නිශ්චිතව සඳහන් පරිදි සපයන ලෙස ද එම කොමසාරිස් ජනරාල්වරයාට නියම කළ හැකි ය.

(ඊ) (අ) ඡේදයේ සඳහන් යම් තොරතුරු මණ්ඩලය විසින් බලය දෙන ලද තැනැත්තකුට සපයන ලෙසට කවර හෝ ක්‍රමයකින් මහජනයාට ආරාධනා කළ හැකි ය.

(උ) දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් දේපළවල හෝ වත්කම්වල සන්තකය, අයිතිය හෝ එහි යම් සම්බන්ධතාවක් (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ එම සඳහන් තැනැත්තා වෙනුවෙන් භාරයක් වශයෙන් දේපළ හෝ වත්කම් දරන නෑදෑයකු හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ මුදල් සමාගමක අරමුදල්වලට ආරෝපනය කළ හැකි මුදල්වලින් මිලට ගත් දේපල හෝ වත්කම් දරන තැනැත්තකු විසින් පැවරීම තහනම් කෙරෙන දැන්වීමක් එම තැනැත්තාට, එම තැනැත්තාගේ නෑදෑයාට හෝ වෙනත් තැනැත්තාට භාර දිය හැකි ය. තව ද —

(i) මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා විසින් එම මෝටර් වාහනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය ;

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන විට එම දේපළවල හිමිකමට අදාළ ඔප්පුවල ඡායාස්ථිත පිටපත් අමාත්‍යවරයාට භාර දෙන ලෙස එම තැනැත්තාට නියම කෙරෙන දැන්වීමක් එම තැනැත්තාට නිකුත් කළ හැකි ය.

මේ ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක්ම දින අනුවක කාලයක් වලංගුව පැවතිය යුතු ය.

(ඌ) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා මෝටර් වාහන සම්බන්ධයෙන් වූ විට මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා යන යම් සමාගමක කොටස් ස්කන්ධ සහ සෘණපත්‍ර සම්බන්ධයෙන් වූ විට සමාගම් රෙජිස්ට්‍රාර්වරයකු මුදල් සමාගමේ ලේකම්වරයකු ඇතුළුව යම් අදාළ බලධරයකු වෙත (උ) ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක් භාරදිය හැකි ය.—

(එ) (ඌ) වන ඡේදයේ සඳහන් දැන්වීමක පිටපතක් භාර දෙනු ලැබූ යම් බලධරයකුට එම දැන්වීම එම බලධරයාගේ භාරයේ ඇති නිසි පොත්වල හෝ ලේඛනවල ලියාපදිංචි කරන ලෙසට නියම කළ හැකි ය.

(ඒ) (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුගේ හෝ එම තැනැත්තාගේ නෑදැයකුගේ යම් දේපළ හෝ වත්කම් සම්බන්ධයෙන් (ඌ) ඡේදයේ සඳහන් යම් බලධරයකුගේ සන්තකයේ හෝ භාරයේ ඇති යම් තොරතුරක් සපයන ලෙස එම බලධරයාට නියම කළ හැකි ය.

(ඔ) (i) (උ) ඡේදය යටතේ භාර දෙන ලද දැන්වීමක් වලංගුව පවතින දින අනූවක කාලපරිච්ඡේදය ඉකුත් වීමට පළමුව එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් දේපළක් තහනමට ගැනීමට හා විකිණීමට බලය පැවරෙන ආඥාවක් සහ එම දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා වූ ක්‍රියාවෙහි යෙදවීමේ රිට් ආඥාවක් සඳහා ලඝු කාර්ය පටිපාටිය අනුව වූ ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා විසින් එම දේපළ පිහිටි දිස්ත්‍රික්කයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(ii) (1) වන අනුඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ පසු ද, ඉල්ලුම් පත්‍රයේ සඳහන් දේපළ හෝ එහි යම් සම්බන්ධතාවක් මුදල් සමාගමකට සම්පූර්ණයෙන් ම හෝ කොටසක් අර්පණය කළ හැකි අරමුදල්වලින් කෙලින් ම වුව ද, නොඑසේ ම වුව ද, අත්කර ගෙන ඇති බවට එම අධිකරණය සෑහීමට පත් වූ පසුද එම දේපළ තහනමට ගෙන විකිණීමට පිස්කල්ට බලය දෙන සහ නියම කෙරෙන ක්‍රියාවේ යෙදවීමෙහි රිට් බලපත්‍රයක් පිස්කල්වරයාට නිකුත් කිරීමට විධාන කළ හැකි ය.

(iii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, (ii) වන අනුඡේදය යටතේ නිකුත් කරන ලද ක්‍රියාවෙහි යෙදවීමේ රිට් බලපත්‍රයක් යටතේ යම් දේපළක් තහනමට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(iv) මේ ඡේදය යටතේ යම් දේපළක් තහනමට ගෙන විකිණීමෙන් ලබාගත් යම් මුදලක් අධිකරණය විසින්—

(අ) පළමුවෙන්, එම දේපළ තහනමට ගැනීම, තබා ගැනීම හා විකිණීම සඳහා වූ වියදම් හා ගාස්තු ගෙවීම සඳහාද

(ආ) දෙවනුව, මුදල් සමාගමට ආරෝපණය කළ හැකි බවට අධිකරණය විසින් තීරණය කරන ලද (ii) වන අනුඡේදයේ සඳහන් මුදල පියවීම සඳහාද

යෙදවිය යුතු අතර, ඉතිරිය තහනමට ගත් දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

**26.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල හෝ මුදල් සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන් ව ඇත ද අධ්‍යක්ෂවරයා විසින් සපයා ඇති වාර්තාවක් මත මණ්ඩලය විසින් 18 වන වගන්තියේ (4) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ නියමයක් කර ඇති අවස්ථාවක —

(අ) **මුදල් සමාගම,** මුදල් සමාගමක් සමග හෝ වෙනත් යම් ආයතනයක් සමග ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය යයි මුදල් මණ්ඩලය විසින් සලකනු ලබන වැඩ පිළිවෙලක් එම ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ ආයතනයේ කැමැත්ත ඇති ව යෙදිය හැකි ය.

(ආ) එම මුදල් සමාගමේ ප්‍රාග්ධනය වැඩි කිරීමෙන් සහ අලුත් කොටස් හිමියන් බඳවා ගැනීමට වැඩපිළිවෙල යෙදීමෙන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංයුක්ත කිරීමෙන් එම මුදල් සමාගම සංවිධානය කළ හැකි ය.

(ඇ) තැන්පත්කරුවන්ගේ යහපත සඳහා වේ යැයි මුදල් මණ්ඩලය විසින් අදහස් කරනු ලබන ආකාරයකට එම මුදල් සමාගම ප්‍රතිසංස්කරණය කළ හැකි ය.

(ඈ) පහත දැක්වන පරිදි ; එනම්—

(i) සමාගමේ කොටස් සඳහා මිල ගණන් කැඳවා ඇති අවස්ථාවක වෙළඳපොළ අගය අනුව ; හෝ

(ii) කොටස් සඳහා එසේ මිල ගණන් කැඳවා නොමැති අවස්ථාවක මණ්ඩලය විසින් නම් කරන ලද ඇගයුම්කරුවකු විසින් තීරණය කරනු ලැබූ මිල අනුව

තීරණය කරනු ලබන වන්දි මුදලක්, මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තකු විසින් ගෙවනු ලැබූ විට තමන්ට අයිති කොටස්වල අයිතිය එම තැනැත්තාට අවසතු කරන ලෙස හෝ පවරන ලෙස යම් මුදල් සමාගමක යම් කොටස් හිමියකුට විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ තමාට දෙන ලද විධානයක් පැහැර හරින කොටස් හිමියකු වරදකට වරදකරු විය යුතුය.

**27.** මහ බැංකු විසින්—

(අ) 1961 අංක 2 දරන රක්ෂණ පනතේ 10 වන වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද මුදල් සමාගම් විසින් දරණ තැන්පතු රක්ෂණය කිරීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම, පවත්වා ගෙන යාම, කළමනාකරණය කිරීම හා පාලනය කිරීම කළ හැකි අතර එම සමාගම් විසින් දරන තැන්පතු යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කරන ලෙස නියම කළ හැකි ය ; එසේ නැතහොත්,

(ආ) මෙම පනත යටතේ ලියාපදිංචි කරන ලද මුදල් සමාගම් විසින් දරන තැන්පතු එවැනි තැන්පතු රක්ෂණය කිරීම සඳහා මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කර ඇති ආයතනයක් විසින් පිහිටුවන ලද යම් යෝජනා ක්‍රමයක් යටතේ රක්ෂණය කරන ලෙස එම සමාගම්වලට නියම කළ හැකි ය.

**28.** (1) 27 වන වගන්තියේ (අ) ඡේදය යටතේ මහ බැංකුව විසින් තැන්පතු රක්ෂණය කිරීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවා ඇති අවස්ථාවක මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති සෑම මුදල් සමාගමක් විසින්ම එම සමාගම විසින් දරන තැන්පතු මේ යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කරන ලෙස මහ බැංකුව වෙත ඉල්ලුම් කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමක් මහ බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකි අතර එවැනි ඉල්ලීමක් මහ බැංකුව විසින් පිළිගත් අවස්ථාවක අදළ අවදනම් ගැන සැලකිල්ල දක්වා මණ්ඩලය විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වාර මුදලක් එම රක්ෂණය සඳහා මහ බැංකුව වෙත ගෙවන ලෙස ඉල්ලුම්කාර මුදල් සමාගමට නියම කළ හැකි ය.

(3) මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාල පරිච්ඡේද සඳහා ද, එසේ තීරණය කරනු ලබන කාලවල දී ද, එසේ තීරණය කරනු ලබන ආකාරයට ද එම වාර මුදල් ගෙවිය යුතු ය.

(4) රක්ෂිත මුදල් සමාගමක් යම් වාර මුදලක් ගෙවීම පැහැර හැරියහොත් එම පැහැර හැරීමේ හේතුව නිසා මණ්ඩලයට සිදුවීමට ඉඩ ඇති පාඩු සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයක් අනුව එම වාර මුදලේ මුදල් ප්‍රමාණය මත එම පැහැර හැරීමේ කාලපරිච්ඡේදය සඳහා පොළිය මහ බැංකුවට ගෙවීමට එම මුදල් සමාගම යටත් විය යුතු ය.

**29.** මණ්ඩලය විසින් පහත දක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සැදිය හැකි ය :—

(අ) රක්ෂිත මුදල් සමාගමක් විසින් වාර මුදල් ගෙවීම පැහැර හල අවස්ථාවක එම මුදල් සමාගමෙන් අය කළ හැකි පොළිය ;

(ආ) මුදල් සමාගම්වල තැන්පතු රක්ෂණය කිරීමේ කාර්යය සඳහා මේ පනත යටතේ නියම කළ යුතු බවට ප්‍රකාශිත හෝ නියමිත කාරණයක් හෝ රීති සැදීමට බලය ලත් කාරණයක් ;

(ඇ) මේ පනතේ 27 සහ 28 වන වගන්ති යටතේ මහ බැංකුවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කෙරෙහි බලපාන, ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් කාරණයක්.

**30.** මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද මේ පනතේ විධිවිධාන (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ අර්ථකථනය කර ඇති පරිදි වූ යම් බැංකු ආයතනයක වෙළඳ ව්‍යාපාරයට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියකට හෝ 1979 අංක 2 දරන ජාතික සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද ජාතික සංවර්ධන බැංකුවේ ව්‍යාපාරයට හෝ (165 වන අධිකාරය වන) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවට හෝ අදළ නොවිය යුතු ය.

**31.** (1) යම් මුදල් සමාගමකට ඇති තැන්පතුවක් අක්‍රිය බවට පත්ව ඇති අවස්ථාවක, එනම්, කල් පිරීමෙන් පසු අවුරුදු දහයක කාලයක් තුළ, කල් පිරී ඇති තැන්පතුව ආපසු ගැනීම සඳහා තැන්පත්කරු නොපැමිණි අවස්ථාවක හෝ අවුරුදු දහයකට අධික කාලයක් තුළ තැන්පතුවට අදාළව, තැන්පත්කරුගෙන් හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් හෝ යම් ලියවිල්ලක් මුදල් සමාගමට නොලැබ තිබූ අවස්ථාවක, එසේ තැන්පත්ව තිබෙන මුදල්, ඊට උපචිත පොළියක් වෙතොත් එය ද සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කරන ලෙස මණ්ඩලය විධාන කළහොත් ඒ ආයතනය විසින්, වෙනත් යම් නීතියක කුමක් සඳහන් වී තිබුන ද, එසේ මාරු කළ යුතුය.

(2) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් මුදල් සමාගමක් තමාගේ බැරට, තමාගේ නමින් හෝ තමාට හිමිකම් ව්‍යුත්පන්න වන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාගේ නමින් හෝ ඇති යම් මුදලක් (1) වන උපවගන්තිය යටතේ මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කර ඇති බව මණ්ඩලය සෑහීමට පත්වන අයුරු ඔප්පු කරන යම් තැනැත්තකු යම් ලිඛිත නීතියකින් හෝ නීතියක් යටතේ ඒ මුදල් සම්බන්ධයෙන් පනවා ඇති නියමයන්ට, කොන්දේසිවලට හෝ සීමා කිරීම්වලට යටත් ව ඒ මුදල්, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණ අනුව ඒ මුදල ආපසු ගෙවනු ලැබූ දිනය දක්වා වූ පොලියත් සමග හෝ පොලිය නොගෙවන ලෙස මණ්ඩලය තීරණය කළහොත් ඒ පොලිය රහිතව මහ බැංකුව විසින් ආපසු ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ විශේෂ ගිණුමකට මාරු කරනු ලැබූ යම් මුදලක්, මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගෙන් විමසීමෙන් පසු මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගත හැකිය.

**32.** (i) යම් තැනැත්තකු—

(අ) යම් අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත් වූවකු බවට ප්‍රකාශ කර ඇත්නම්,

(ආ) චරිත දූෂණය සම්බන්ධයෙන් වූ වරදක් සඳහා යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇත්නම්,

(ඇ) මේ පනත යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ වූ යම් වරදක් සඳහා වරදකරු කරනු ලැබ ඇත්නම්,

(ඈ) මේ පනතේ 18 වන හෝ 25 වන වගන්ති යටතේ මුදල් මණ්ඩලය විසින් තමාට විරුද්ධව ක්‍රියා කරනු ලැබ ඇති තැනැත්තකු නම්,

ඒ තැනැත්තා, මුදල් සමාගමක, අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු හෝ ලේකම්වරයකු ලෙස, අවස්ථාවෝචිත පරිදි පත් කිරීමට හෝ තෝරා පත්කර ගැනීමට නැතුහොත් එවැනි ධුරයක් දැරීමට නුසුදුස්සකු විය යුතුය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් නුසුදුසුකමක් යටතේ සිටින කාලය තුළ මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ලේකම්වරයකු ලෙස ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

**33.** (1) මණ්ඩලය විසින් මේ පනත යටතේ රීති සෑදීමට බලය දෙනු ලැබ ඇති හෝ සඳහන් කරනු ලැබ හෝ නියම කරනු ලැබ ඇති යම් කරුණක් ගැන රීති සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, මණ්ඩලය විසින් විශේෂයෙන් ම පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් වෙනුවෙන් රීති සාදනු ලැබිය හැකිය.

(අ) මුදල් සමාගම ලියාපදිංචි කිරීම සහ මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා මුදල් සමාගම් විසින් මණ්ඩලයට ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තු;

(ආ) මේ පනත යටතේ භාවිතයට ගත යුතු ආකෘති,

(ඈ) මහජනයාගෙන් තැන්පත් මුදල් ඉල්ලා සිටිමින් යම් ප්‍රකාශ පත්‍රයක් හෝ වෙළඳ දැන්වීමක් යම් තැනැත්තකු විසින් හෝ තැන්පත් මණ්ඩලයක් විසින් නිකුත් කිරීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම සහ එවැනි ප්‍රකාශ පත්‍රයක් හෝ වෙළඳ දැන්වීමක් නිකුත් කළ යුත්තේ කවර කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි.

**34.** මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ ලිඛිත විශේෂ විධාන මණ්ඩලය වෙත දිය හැකි අතර, ඒ විධාන මණ්ඩලය විසින් බලාත්මක කළ යුතුය.

**35.** (1) මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු හෝ විගණකවරයකු වන යම් තැනැත්තකු විසින්—

(අ) මේ පනතේ නියමයන් මුදල් සමාගම විසින් ඉටුකිරීම සුරක්ෂිත කිරීම පිණිස සියලු සාධාරණ පියවර නොගතහොත් ;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයක් ඉටු කිරීම පැහැර හැරියහොත් ;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක නිරවද්‍යතාව සුරක්ෂිත කිරීමට සියලු සාධාරණ පියවර නොගතහොත් ;

(ඈ) යම් පොතක හෝ ලේඛනයක හෝ ඒ මුදල් සමාගමේ ව්‍යාපාරයේ, කටයුතුවල, ගණුදෙනුවල, කොන්දේසිවල, වත්කම්වල හෝ බැරකම්වල හෝ ගිණුම්වල යම් වාර්තාවක, කඩදාසි කැබෙල්ලක, ලේඛනයක හෝ ප්‍රකාශයක වුවමනා-වෙන්ම වැරදි සටහනක් කළහොත් හෝ එවැනි සටහනක් කිරීමට සැලැස්වුවහොත් නැතහොත් එවැනි සටහනක් කිරීම වුවමනාවෙන්ම අත්හැර දැමීමට සැලැස්සුව-හොත් ;

(ඉ) යම් පොතක හෝ ලේඛනයක හෝ ඒ මුදල් සමාගමේ ව්‍යාපාරයට අදාළ කටයුතු-වල, ගණුදෙනුවල, කොන්දේසිවල, වත්කම්වල හෝ බැරකම්වල හෝ ගිණුම්වල යම් වාර්තාවක, කඩදාසි කැබෙල්ලක, ලේඛනයක හෝ ප්‍රකාශයක වුවමනා-වෙන්ම, සටහනක් කිරීම අත්හැරියහොත් හෝ එවැනි යම් සටහනක් අත්හැරීමට සැලැස්වුවහොත් ; හෝ

(ඊ) යම් පොතක හෝ ලේඛනයක හෝ ඒ මුදල් සමාගමේ ව්‍යාපාරයේ කටයුතුවල ගණු-දෙනුවල, කොන්දේසිවල, වත්කම්වල හෝ බැරකම්වල හෝ ගිණුම්වල යම් වාර්තාවක, කඩදාසි කැබෙල්ලක, ලේඛනයක හෝ ප්‍රකාශයක වූ යම් සටහනක් වුවමනාවෙන් ම වෙනස් කළහොත්, වෙන් කළ හොත්, සැඟවුවහොත් හෝ විනාශ කළහොත් එවැනි යම් සටහනක් වුවමනාවෙන් ම වෙනස් කිරීමට, වෙන්කිරීමට, සැඟවීමට හෝ විනාශ කිරීමට සැලැස්වුවහොත්

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තකුට විරුද්ධව කරන ලද යම් නඩුවක දී, මේ පනතේ නියමයන් ඉටු කිරීම සුරක්ෂිත කිරීමේ කාර්යය හෝ ප්‍රශ්නයට අදාළ ප්‍රකාශ නිවැරදි බවට සහතික වීමේ කාර්යය වෙනත් තැනැත්තකු විසින් ඉටු කරන බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු තිබෙන බවත්, සහ ඒ තැනැත්තා ඒ කාර්යය ඉටු කිරීමට නිසි බලය ඇතිව සහ තත්ත්වයක සිටින බවත් ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

**36.** (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, විධානයක් හෝ නියමයකට පටහැනි වන්නා වූ හෝ එය ඉටු කිරීම පැහැර හරින්නා වූ හෝ මේ පනතේ යම් විධානයක් යටතේ තොරතුරු සපයන ලෙස නියම කළ විට අසත්‍ය තොරතුරු සපයන්නා වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් මණ්ඩලයක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) තැනැත්තන් මණ්ඩලයක් විසින් මේ පනත යටතේ යම් වරදක් කර ඇති විට—

(අ) තැනැත්තන් මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමණාකරුවකුම හෝ ලේකම්වරයකුම ; සහ

(ආ) තැනැත්තන් මණ්ඩලය සංස්ථාගත නොකළ මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම

ඒ වරදට වරදකරු වන්නේය.

එසේ වුව ද, වරද සිදු කර ඇත්තේ තමාගේ දැනුවත්කමක් නොමැතිව බව ද ඒ වරද සිදු කිරීම වළක්වා ලීමට තමා විසින් සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ද ඔප්පු කළ හොත් එවැනි තැනැත්තකු වරදකට වරදකරු යයි සලකනු නොලැබිය යුතු ය.

**37.** 2 වන වගන්තියේ විධිවිධානවලට පටහැනිව යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් මණ්ඩලයක් විසින් මුදල් ව්‍යාපාර කරගෙන යනු ලබන අවස්ථාවක ඒ පටහැනි වීම සම්බන්ධයෙන් මේ පනතේ වෙනත් යම් වගන්තියක විධිවිධාන යටතේ යම් ක්‍රියා මාර්ගයක් ගනු ලැබ හෝ ගැනීමට ඇත්තේ වී නමුදු මහජන සුභසිද්ධිය අරභයා මුදල් මණ්ඩලය විසින් කවර හෝ මාර්ගයකින්—

(අ) සමාගමක් හෝ සංස්ථාගත කරන ලද තැනැත්තන් මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි ඒ සමාගමේ නම ද එහි අධ්‍යක්ෂවරයන්ගේ නම් ද ඒ සංස්ථාගත කරන ලද මණ්ඩලයේ නම ද ඒ සංස්ථාගත කරන ලද මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන්ගේ නම් ද ;

(ආ) තැනැත්තෙක් හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන් මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තන් මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් ද

ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

**38.** මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහේස්ත්‍රාත් අධිකරණයක් හමුවේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු අවුරුදු තුනකට වැඩි නොවූ කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් මිලියනයකට වැඩි නොවූ දඩයකට හෝ යටත් විය යුතුය.

**39.** මේ පනත යටතේ වරදවල් වෙනුවෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා, මහ බැංකුවේ නිලධරයන්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තියේ අර්ථය ඇතුළත, රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

**40.** (1) මේ පනත යටතේ වරදක් කිරීමට යෙදුණු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගනිමින්, මණ්ඩලයේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂවරයා විසින්, ඒ වරද රුපියල් එක් ලක්ෂයකට සමාන මුදලක් සඳහා සමථයකට පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ යම් වරදක් සමථයකට පත් කිරීම—

(අ) පාර්ශ්වකරුවන් දෙදෙනාගේ ම අත්සන් යටතේ, වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති අධිකරණය වෙත ලියවිල්ලකින් දනුම් දිය යුතු ය :

(ආ) චූදිතයා නිදොස් කිරීමක් ලෙසින් බල සහිත විය යුතු ය.

**41.** (1) යම් මුදල් සමාගමක්—

(අ) බලපත්‍රය නිකුත් කිරීමෙන් පසු මාස නවයක් ඇතුළත ව්‍යාපාරය ආරම්භ කිරීමට නොයෙදුනහොත් ; හෝ

(ආ) එය විසින් දරන ලද යම් ණයක් ඒ ණය ගෙවිය යුතු වූ විට නොගෙවා සිටියහොත් ; හෝ

(ඇ) ඊට විරුද්ධ ව, සහන සඳහා පෙත්සමක් හෝ නඩුවක් පවරන ලදුව, යම් වස්තු භංගත්ව නීතියක් හෝ සහන සඳහා හෝ ණයකරුවන් සඳහා සහන සඳහා ඉඩ සලස්වා ඇති හෝ ණයකරුවනට අදාළ වන්නා වූ යම් නීතියක් යටතේ ඒ සමාගම වෙනුවෙන් ඍකවරණකරුවකු හෝ දේපළ භාරගන්නකු පත් කරනු ලැබ ඇති අවස්ථාවක ; හෝ

(ඈ) එය විසින් මුදල් ව්‍යාපාර කරගෙන යාම අවසන් කරනු ලැබුවහොත් ; හෝ

(ඉ) පනතේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරන ලද විධාන දිගටම උල්ලංඝනය කරතහොත් හෝ ඒවාට පටහැනි වෙතොත් ; හෝ

(ඊ) වාර්ෂික බලපත්‍ර ගාස්තුව නොගෙවුවහොත්

ඒ මුදල් සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට යෙදෙන බවට මණ්ඩලය විසින් දැන්වීමක් කරනු ලැබිය හැකි අතර ඒ දැන්වීම බලපත්‍ර ලත් මුදල් සමාගමට දනුම් දෙනු ලැබිය යුතුය.

(2) 7 වන වගන්තිය යටතේ මුදල් සමාගමක් වෙත නිකුත් කරන ලද බලපත්‍රය එලෙස අවලංගු කරනු නොලැබිය යුත්තේ කුමක් නිසා ද යන බවට හේතු සඳහන් කරමින්, (1)වන උපවගන්තිය යටතේ වූ අවලංගු කිරීමේ දැන්වීමකට විරුද්ධව ඒ දැන්වීම ලැබුනු දිනයේ සිට දින තිහක් ඇතුළත, ඒ මුදල් සමාගම විසින් මණ්ඩලය වෙත ලියවිල්ලකින් වූ විරෝධතා ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(3) අවලංගු කිරීම පිළිබඳ නිවේදනයේ දිනයේ සිට දින හැටක් ඉකුත් වීමෙන් පසු සහ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද විරෝධතා සලකා බැලීමෙන් පසු මණ්ඩලය විසින් ඒ දැන්වීම ඉල්ලා අස්කර ගැනීම හෝ මුදල් සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි අතර, ඒ අනුව මුදල් සමාගමට දන්වා සිටිය යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක්—

(අ) අවලංගු කිරීමට විරුද්ධව, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීම සඳහා වූ කාලය අවසන්වීමෙන් පසු, එවැනි ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කර නැති අවස්ථාවක, හෝ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවලංගු කිරීම ස්ථිර කිරීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක බලාත්මක විය යුතු අතර

ඒ අවලංගු කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(5) මුදල් සමාගමක බලපත්‍රය එලෙස අවලංගු කරන ලද අවස්ථා මණ්ඩලය විසින් 6 වන වගන්තිය යටතේ පවත්වාගෙන යන ලේඛනයෙන් මුදල් සමාගමේ නම ඉවත් කළ යුතු අතර ගණන් බේරා වසා දැමීම සඳහා වූ විධාන ද ඇතුළු, මණ්ඩලය අවශ්‍ය යයි සලකන විධාන මණ්ඩලය විසින් නිකුත් කිරීම හෝ ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කරන ලෙස අධ්‍යක්ෂවරයාට නියම කිරීම කරනු ලැබිය හැකිය. එවැනි කරුණක දී 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

(6) නිකුත් කිරීමෙන් දින තිහක් ඇතුළත (5) වන උපවගන්තියේ විධිවිධාන ඉටුකිරීමට මුදල් සමාගමට නොහැකි වන අවස්ථාවක, මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පවරන ලෙස මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි අතර, එසේ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**42.** තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි රීති ඇත්නම්, ඒ රීතිවලට යටත්ව හා ඒවාට අනුකූලව, මේ පනතේ යම් කාර්යයක් සඳහා මණ්ඩලය නියෝජනය කිරීම පිණිස වූ එහි අයිකාරී බලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකුට මණ්ඩලය විසින් ලියවිල්ලකින් පවරා දෙනු ලැබිය හැකි වුව ද, ඒ නිලධරයා විසින් කරන ලද හෝ නොකර අත්හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා වගකීම මණ්ඩලය වෙත රැඳී තිබිය යුතු අතර එසේ දිගටම රැඳී පැවතිය යුතුය.

**43.** (1) 2 වන වගන්තිය හෝ 10(2) වන වගන්තිය හෝ 11(2) වන වගන්තිය හෝ 18(4) වන වගන්තිය හෝ 20 වන වගන්තිය හෝ 24 වන වගන්තිය හෝ 25 වගන්තිය හෝ 26 වන වගන්තිය හෝ 40 වන වගන්තිය යටතේ කරන ලද්දා වූ හෝ කරන ලද්දේ යයි අදහස් කරන ලද්දා වූ නියමයකින් අතෘප්තියට පත් වූ කිසිදු තැනැත්තකුට හෝ ඒ වගන්තිවලින් යම් වගන්තියක් යටතේ හෝ ඒ යටතේ යයි අදහස් කරමින් ගන්නා ලද හෝ ගැනීමට යෝජනා කරන්නා වූ හෝ යම් ක්‍රියාවකින් හෝ පියවරකින් තමාට බලපෑමක් ඇති වේ යයි සැක කරන්නා වූ තැනැත්තකුට, ස්ථිර හෝ අතුරු ඉන්ජන්ෂන් තහනමකට, වාරණ නියෝගයකට, නැවැත්වීමේ ආඥාවකට හෝ මණ්ඩලය විසින් ඒ නියමය බලාත්මක කිරීමෙන් මණ්ඩලය නවත්වාලීමේ, වළක්වාලීමේ හෝ අවහිර කිරීමේ බලපෑම් ඇති වෙනත් යම් ආඥාවකට හිමිකම් නොලැබිය යුතු ය.

(2) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් අභියාචනාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලය, 2 වන වගන්තිය හෝ 10(2) වගන්තිය හෝ 11(2) වගන්තිය හෝ 18(4) (අ) වගන්තිය හෝ 20 වන වගන්තිය හෝ 24 වන වගන්තිය හෝ 25 වන වගන්තිය හෝ 26 වන වගන්තිය හෝ 40 වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ආඥාවකට අදාළව, අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කරන ලද අධිකරණ බලය අයැද සිටින සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම වෙනුවෙන් හෝ ඒ ඉල්ලීමට අදාළ වූ හෝ ක්‍රියාව සිදුකිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත කරනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලීම ගොනු කිරීමෙන් මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතුය.

(3) (1) වන උපවගන්තියෙහි ඇතුළත් වන කිසිවකින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීත්‍යානුකූලව අන්‍යාකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතලවලට හෝ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී බලපෑමක් සිදු නොවිය යුතුය.

(4) මේ වගන්තියෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, මණ්ඩලයට විරුද්ධව යම් අතුරු ආඥාවක් හෝ අවසාන ආඥාවක් කිරීමට ප්‍රථම, මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දිය යුතු ය.

**44.** මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද්දා වූ හෝ කරන ලදැයි අදහස් කරන්නා වූ හෝ යම් ක්‍රියාවක් සඳහා මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

**45.** (1) 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය පනත ඉවත් කරනු ලැබුවේ වුව ද, ඉවත් කරන ලද පනත යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක්, නියමයක්, රීතියක් හෝ විධානයක්, පනවන ලද නියමයක්, රීතියක් හෝ කරන ලද බලය පැවරීමක්, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පැවතියේ නම් සහ ඒ දැන්වීම, නියමය, විධානය නියම කිරීම, රීතිය හෝ බලය පැවරීම මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන තාක් දුරට අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ ඒ සමාන විධිවිධාන යටතේ නිකුත් කරන ලද, පනවන ලද හෝ සාදන ලද දැන්වීමක්, නියමයක්, විධානයක්, නියම කිරීමක්, රීතියක් හෝ බලය පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතුය.

(3) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද මුදල් සමාගම් පාලනය කිරීමේ නියෝග සමග කියවිය යුතු 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත යටතේ, 1988 ජූනි 16 වන දිනෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනෙන් අවසන් වන කාලසීමාව තුළ දී ගන්නා ලද යම් ක්‍රියාවක් කරන ලද නියමයක් හෝ දෙන ලද විධානයක්, එම නියෝග සෑදීමට මහජන ආරක්ෂක ආඥාපනතින් බලය දෙනු ලැබ ඇති පරිද්දෙන් වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය.

(4) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද මුදල් සමාගම් පාලනය කිරීමේ නියෝග සමහ කියවිය යුතු 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනතේ විධිවිධාන ප්‍රකාර හෝ එසේ යයි අදහස් කරන ප්‍රකාර, 1988 ජූනි මස 16 වන දිනෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනෙන් අවසන් වන කාලසීමාව තුළ දී ඔහු විසින් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවන් සඳහා හෝ නොකර හැරි යම් ක්‍රියාවන් සඳහා මණ්ඩලයට හෝ මණ්ඩලයේ යම් නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ බලධරයකුට විරුද්ධව රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාර සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ අඛණ්ඩව කරගෙන යාම නොකළ යුතුය.

**46.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

''මණ්ඩලය'' යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ.

''ප්‍රාග්ධනය'' යන්නෙන්, යම් සමාගමක ගෙවා නිමි ප්‍රාග්ධනය අදහස් වේ.

''ප්‍රාග්ධන අරමුදල්'' යන්නෙන්, ගෙවා නිමි අරමුදල් සහ ස්ථිර නිදහස් සංචිත අදහස් වන අතර, මණ්ඩලය විසින් එසේ තීරණය කරනු ලබන්නේ නම්, අනාරක්ෂිත ණයපත්‍රවල සහ වෙනත් ණය බැඳුම්කරවල මූණත වටිනාකම ඇතුළත් වේ. ඒ වටිනාකම, මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීම හෝ ප්‍රාග්ධනය ආපසු ගෙවීම හෝ අඩු කිරීම සිදුවන අවස්ථාවක, තැන්පතුවලට සහ මුදල් සමාගමේ වෙනත් ණය තුරුස්වලට පසු ස්ථානය ගත යුතු අතර ඒවාට පහළ ස්ථානයක විය යුතු ය.

''වාණිජ බැංකුව'' යන්නට (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ ඊට දී ඇති අර්ථය ඇත්තේය ;

''අධ්‍යක්ෂවරයා'' යන්නෙන්, මුදල් සමාගම් විෂයය පවරනු ලැබ ඇති මහ බැංකුවේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් වේ ,

''මුදල් ව්‍යාපාර'' යන්නෙන් තැන්පතු මාර්ගයෙන් මුදල් භාර ගැනීම, ඒ මත පොළී ගෙවීම සහ—

(අ) පොළියට මුදල් ණයට දීම ; හෝ

(ආ) යම් කවර වූ හෝ ආකාරයකින් මුදල් ආයෝජනය කිරීම ; හෝ

(ඇ) පොළියට මුදල් ණයට දීම සහ යම් කවර වූ හෝ ආකාරයකින් මුදල් ආයෝජනය කිරීම

අදහස් වේ ;

''මුදල් සමාගම'' යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ විග්‍රහ කර ඇති පරිදි වූ ද මුදල් ව්‍යාපාර කරගෙන යාම සඳහා මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද සමාගමක් අදහස් වේ ;

''කුලී ගෙවා මිලට ගැනීමේ ගිවිසුම'' යන්නෙන්, (ගිවිසුමෙන්, බද්ද, වාරිකය, කුලිය වශයෙන් විස්තර කරන්නේ සතිපතා, දෙසති හෝ මාසික ගෙවීම් වුවද අන්‍යාකාර වුව ද) මිලට ගැනීමට ඇති මනාපය සමඟ බඩු කුලියට දීම සඳහා වූ ගිවිසුමක් අදහස් වන නමුත් ඒ ගිවිසුමෙන්, එහි අන්තර්ගත වූ බඩුවල දේපළ ගිවිසුමේ වේලාවේදී හෝ ඒ මත හෝ බඩු භාර දීමට ප්‍රථම කවර හෝ වේලාවක දී නිකුත් කරනු ලබන්නා වූ යම් ගිවිසුමක් ද ඊට ඇතුළත් නොවිය යුතු ය.

''කුලියට ගන්නා'' යන්නෙන්, බඩු බද්දට ගනු ලබන, කුලියට ගනු ලබන හෝ කුලිය ගෙවා මිලට ගැනීමේ ගිවිසුමක් යටතේ විකිණීම ලැබීමට එකඟ වී සිටින තැනැත්තකු අදහස් වන අතර, එවැනි ගිවිසුමක් යටතේ වූ කුලියට ගන්නාගේ අයිතිවාසිකම් හෝ බැඳීම්, පැවරීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් ලබාගන්නා වූ තැනැත්තකු ඇතුළත් වේ ;

''පාලක සමාගම'' හා ''පාලිත සමාගම'' යන්නට 1982 අංක 17 දරන සමාගම් පනතේ 150 වන වගන්තියේ ඒවාට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

''ද්‍රවශීල වත්කම්'' යන්නෙන්—

(අ) අත ඇති මුදල් ;

(ආ) යම් බැංකුකරුවකුගේ ලියමෙන් හෝ අය කිරීමෙන් නිදහස්, වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක හෝ තැන්පත් ගිණුමක ශේෂ ;

(ඇ) යම් අයකිරීමකින් හෝ ලියමකින් නිදහස් ශ්‍රී ලංකාණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් ;

(ඈ) යම් අයකිරීමකින් හෝ ලියමකින් නිදහස් එක් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකාණ්ඩුවේ සුරැකුම්පත් ;

(ඉ) යම් අයකිරීමකින් හෝ ලියමකින් නිදහස් එක් අවුරුද්දක් තුළ කල් පිරෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් ;

(ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්වාගෙන යන මුදල් ශේෂ ඇත්නම් එකී මුදල් ශේෂ ;

''ණය'' යන්නට යම් අත්තිකාරමක් හෝ යම් විකිණීමක දී ගෙවීම කල්දැමීම හෝ කුලිය ගෙවා මිලට ගැනීමේ ගිවිසුමකට අදාළ ගණුදෙනුවක දී ගෙවීම කල්දැමීම හෝ යම් බද්දට ගැනීමේ ගණුදෙනුවක දී ගෙවීම් ගිවිසුම් ඇතුළත් වේ.

''නියමිත'' යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද රීති වලින් නියමිත බව අදහස් වේ ;

''නෑදෑයා'' යන්න පුද්ගලයකුට අදාළ වන විට ඒ පුද්ගලයාගේ භාර්යාව ස්වාමිපුරුෂයා හෝ යැපෙන දරුවකු අදහස් වේ ;

''හරවත් සම්බන්ධතා'' යන්නෙන්—

(i) සමාගමකට අදාළ කිරීමේ දී, වෙනත් සමාගමක් විසින් හෝ තැනැත්තකු විසින් හෝ ඔහුගේ ආසන්න නෑදෑයකු විසින්, තනි තනිව හෝ එක්ව ගත්විට එහි කොටස්වල ගෙවා නිමි වටිනාකම රුපියල් එක් මිලියනයක් හෝ සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයක් යන දෙකෙන් වැඩි ප්‍රමාණයක අර්ථලාභී සම්බන්ධතාවක් දැරීම හෝ ඒ සමාගම වෙනුවෙන් පුද්ගලයකු විසින් හෝ ඔහුගේ නෑදෑයා විසින් හෝ වෙනත් සමාගම විසින් දෙන ලද ඇපයක් හෝ හානිපූරණයක් පැවතීම අදහස් වේ ;

(ii) ව්‍යාපාර ආයතනයකට අදාළ කිරීමේ දී, පුද්ගලයකු විසින් හෝ ඔහුගේ නෑදෑයා විසින් තනි තනිව හෝ එක්ව ගත් විට ඒ ව්‍යාපාර ආයතනයේ සියලුම හවුල්කරුවන් විසින් දායක වී ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි ප්‍රමාණයක් නියෝජනය වන අයුරු එහි ප්‍රාග්ධනයෙහි අර්ථලාභී සම්බන්ධතාවක් දැරීම හෝ ඒ ව්‍යාපාර ආයතනය වෙනුවෙන් පුද්ගලයකු විසින් හෝ ඔහුගේ හෝ ඇගේ භාර්යාව/ ස්වාමිපුරුෂයා විසින් හෝ දෙමාපියකු විසින් හෝ දරුවකු විසින් දෙන ලද ඇපයක් හෝ හානිපූරණයක් තිබීම අදහස් වේ ;

''අඩු නොකළ ප්‍රාග්ධනය'' යන්නෙන් ලියමක් හෝ වෙනත් අයකිරීමක් නොමැති ප්‍රාග්ධනය අදහස් වේ.

# 1988 ජුනි 16 වැනි දින අංක 510/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

## මහජන ආරක්ෂක ආඥා පනත (40 වන අධිකාරය)

(40 වැනි අධිකාරය වන) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

ජේ. ආර්. ජයවර්ධන,
ජනාධිපති.

1988 ජුනි මස 16 දින,

කොළඹ දී ය.

### නියෝග

මේ නියෝග බලපවත්නා කාලසීමාව තුළදී 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත, පහත සඳහන් පරිදි සංශෝධනය වූවාක් සේ, එනම්

(1) ඒ පනතේ 15 වන වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට

"(3) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්—

(අ) යම් ආයතනයක යම් අයිතිකරුවකු, විගණකවරයකු, හවුල්කරුවකු, අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු, දිවුරුම් ආඥාපනතට අනුකූලව දිවුරවීම හෝ ඔහු ලවා සහතික ප්‍රකාශ කරවීම ;

(ආ) යම් ආයතනයක කටයුතුවල සැබෑ තත්ත්වය හා වර්තමාන හා අනාගත තැන්පත් කරුවන්ට අනර්ථදායි වන ලෙස ආයතනය පවත්වාගෙන යන්නේ ද යන වග නිශ්චිත වශයෙන් දැනගැනීම සඳහා අවශ්‍යයැයි අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සලකන සියලු තොරතුරු සපයන ලෙස ඒ ආයතනයේ යම් අයිතිකරුවකුට, හවුල් කරුවකුට, අධ්‍යක්ෂ වරයකුට, කළමණාකරුවකුට, විගණක වරයකුට, ලේකම්වරයකුට හෝ සේවා නියුක්තයකුට නියම කිරීම ;

(ඇ) යම් අවශ්‍ය තොරතුරක් ඇතුළත් හෝ ඇතුළත් විය හැකි, තම සන්තකයෙහි තිබෙන යම් පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස යම් ආයතනයක, යම් අයිතිකරුවකුට, හවුල්කරුවකුට, අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, විගණකවරයකුට, ලේකම්වරයකුට හෝ සේවා නියුක්තයකුට නියම කිරීම ; සහ

(ඈ) ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා විසින් බලය දෙනු ලද විගණකවරයකු විසින් විගණනය කිරීම සඳහා, ආයතනයක ගිණුම් ඉදිරිපත් කරන ලෙස ඒ ආයතනයේ යම් අයිතිකරුවකුට, හවුල්කරුවකුට, අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට හෝ ලේකම්වරයකුට නියම කිරීම

නීත්‍යානුකූල වන්නේ ය.

යන උපවගන්තිය ආදේශ කරනු ලැබුවාක් සේ ද,

(2) ඒ පනතේ 16 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට,

"(අ) කොන්දේසි රහිතව නැතහොත් පොදු යහපත හෝ ආයතනයේ තැන්පත්කරුවන්ගේ හෝ ණය හිමියන්ගේ යහපත පිණිස අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට අවසර දෙමින් නියමයක් කිරීම; මේ ඡේදය යටතේ නියම කරනු ලබන කොන්දේසිවලට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීමට නියම කැරෙන හෝ මණ්ඩලය විසින් බලය දෙන ලද තැනැත්තකු ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමට නියම කැරෙන හෝ කොන්දේසියක් ඇතුළත් විය හැකිය ;"

යන ඡේදය ආදේශ කරනු ලැබුවාක් සේ ද

(3) ඒ පනතේ 16 වන වගන්තියේ (3) වන උපවගන්තිය අගට

"(ඇ) (3අ) උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පියවර ගැනීම ; හෝ" යන ඡේදය එකතු කරනු ලැබුවාක් සේ ද

(4) ඒ පනතේ 16 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම,

"(3අ) (අ) මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන යම් කාලසීමාවක් සඳහා ආයතනයක පරිපාලනය සහ කළමනාකරණය පවරා ගත හැකි ය. මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ කරන තදනන්තර දැන්වීමක් මගින් මුල් දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව දීර්ඝ කළ හැකි ය.

(ආ) ආයතනයක පරිපාලනය සහ කළමනාකරණය, මණ්ඩලය වෙත පවරා ගන්නා ලද අවස්ථාවක මණ්ඩලය විසින්—

(i) එම ආයතනය සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් නම්, කිසියම් ලිඛිත නීතියක් මගින් නැතහොත් කිසියම් ලිඛිත නීතියක් යටතේ හෝ එම සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති, හෝ නියම කර ඇති හෝ වෙන්කර දී ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය එම ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම සහ නියම කිරීම කරනු ලැබිය හැකි ය.

(ii) එම ආයතනය හවුල් ව්‍යාපාරයක් නැතහොත් තනි අයිතියක් නම්, කිසියම් ලිඛිත නීතියක් මගින් නැතහොත් කිසියම් ලිඛිත නීතියක් යටතේ හෝ එම හවුල් ව්‍යාපාරයකට අදාළ හවුල් ව්‍යාපාර ඔප්පුව මගින් හෝ හවුල්කරුවකු හෝ තනි අයිතිකරුවකු හෝ වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති සියලු බලතල කාර්ය සහ කර්තව්‍ය ඒ ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම සහ කිරීම කරනු ලැබිය හැකි ය.

(iii) මහජන යහපත සැලකිල්ලට ගෙන, මණ්ඩලය හා ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය හෝ අතර එකඟත්වයක් ඇති කර ගනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, ඒ ආයතනයේ කළමනාකරණය සඳහා යම් තැනැත්තකු සමග හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුමකට ඇතුළත් විය හැකිය.

(ඇ) ආයතනයක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය විසින් පවරා ගනු ලැබ ඇති කාල පරිච්ඡේදය තුළදී මණ්ඩලය විසින් ප්‍රකාශිතවම බලය පවරනු ලැබුවහොත් මිස, එම ආයතනයේ සෑම අධ්‍යක්ෂවරයකුම, හවුල්කරුවකුම, කළමනාකරුවකුම, ලේකම්වරයකුම සහ අයිතිකරුවකුම ඒ ආයතනය සම්බන්ධයෙන් බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීම ඉටු කිරීම සහ කිරීම නතර කළ යුතු ය.

(ඈ) (i) මණ්ඩලය විසින් (අ) ඡේදය යටතේ පරිපාලනය සහ කළමනාකරණය පවරා ගනු ලැබ ඇති කිසියම් ආයතනයකට එම ආයතනයේ නිසි කළමනාකරණය සඳහා අවශ්‍ය විය හැකි ණය හෝ වෙනත් පහසුකම් මණ්ඩලය විසින් මහ බැංකුවේ අරමුදල් වලින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(ii) (අ) එසේ පාලනය පවරා ගනු ලැබූ ආයතනයක පාලනය පවරා ගැනීමෙහිලා සහ එම ආයතනය ක්‍රියාත්මක කර ගෙන යාමෙහිලා ; සහ

(ආ) ආයතනයක් (4) වන උපවගන්තිය යටතේ ගණන් බේරා වසා දැමීමෙහි ලා

දරන ලද සියලු ගාස්තු, අයකිරීම් සහ වියදම්, මහ බැංකුවේ අරමුදල් වලින් ගෙවීම පොදු යහපත පිණිස හේතු වන්නේ යයි මණ්ඩලය විසින් සලකන කිනම් අවස්ථාවක වුව ද එම ගෙවීම් එම අරමුදලින් ගෙවිය යුතු ය.

(ඉ) ආයතනයක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය විසින් පවරා ගෙන ඇති අවස්ථාවක, මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ මණ්ඩලය වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීමේ දී, මණ්ඩලය විසින් කරන ලද නැතහොත් නොකරන ලද කිසියම් ක්‍රියාවක් හෝ දෙයක් නිසා, යම් තැනැත්තකුට විඳින්නට සිදුවූ හෝ දරන්නට සිදුවූ හෝ විඳින්නට සිදුවී යැයි හෝ දරන්නට සිදුවී යැයි කියනු ලබන හෝ යම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතු හෝ යම් අධිකරණයක යම් නඩුවකට හෝ නඩු කටයුත්තකට යටත්

විය යුතු හෝ නොවන්නේ ය.''

යන උපවගන්තිය ආදේශ කරනු ලැබූවාක් සේ ද,

(5) ඒ පනතේ 16 වන වගන්තියෙන් එහි (8) වන උපවගන්තිය ඉවත් කර ඇත්තාක් සේ ද

(6) ඒ පනතේ 16 වන වගන්තියේ (13) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට

''(13) (අ) යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් හෝ ඒ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ නියම කරන ලද විටක එසේ කිරීම පැහැර හරින හෝ මේ වගන්තිය යටතේ හෝ 15 වන වගන්තිය යටතේ හෝ යම් පරීක්ෂණයක් කිරීමට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකුට හෝ බාධා කරන හෝ ඉඩ නොදෙන යම් ආයතනයක යම් අයිතිකරුවකු, හවුල්කරුවකු, අධ්‍යක්ෂවරයකු, කළමණාකරුවකු, විගණකවරයකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු වරදකට වරදකරු විය යුතු ය.

යන කොටස ආදේශ කරනු ලැබූවාක් සේ ද,

**7.** ඒ පනතේ 21 වන වගන්තියට ඉක්බිතිව ම, ඒ පනතේ IV වන කොටස ලෙස බලපැවැත්විය යුතු පහත දක්වෙන අලුත් කොටස, එනම්—

## " IV වන කොටස

## විවිධ විධිවිධාන

ආර්ථික ප්‍රරෝහන ශක්තියෙන් වියුක්ත ආයතන වලට අදාළව මුදල් මණ්ඩලයේ බලතල.

21අ. මුදල් මණ්ඩලය විසින්—

(අ) ප්‍රවෘත්ති පත්‍රවල හා වෙනත් පොදු මාධ්‍යවල ප්‍රචාරක දැන්වීම් පළ කිරීම ඇතුළුව, කවර හෝ මාර්ගයකින් පහත දක්වෙන දේ ප්‍රසිද්ධ කළ හැකි ය :—

(i) මුදල් මණ්ඩලයේ මතය අනුව, මේ පනතේ හෝ එය යටතේ නිකුත් කරන ලද යම් විධානයක හෝ රීතියක යම් විධි විධානයක් උල්ලංඝනය කර ඇති ආයතනවල නම් සහ ලිපිනය ;

(ii) යම් ආයතනයක් ආර්ථික ප්‍රරෝහණ ශක්තියෙන් වියුක්ත බවට හෝ බුන්වත් බවට පත්වීමට වගකිව යුතු යයි මුදල් මණ්ඩලය විසින් සළකනු ලබන යම් අධ්‍යක්ෂවරුන්ගේ, කොටස් හිමියන්ගේ, හවුල්කරුවන්ගේ, අයිතිකරුවන්ගේ, සේවා නියුක්තයන්ගේ, අනුයෝජිතයන්ගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ නම් සහ ලිපිනය ; එම ආයතනය ආර්ථික ප්‍රරෝහණ ශක්තියෙන් යුක්ත හෝ වියුක්ත බව හෝ බුන්වත් හෝ නුබුන්වත් බව තීරණය කිරීම, මණ්ඩලයේ පරම අභිමතය අනුව විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් යම් ආයතනයක හෝ තැනැත්තකුගේ යම් මුදල්, චංචල හෝ නිශ්චල හෝ දේපළ හෝ වෙනත් වත්කම්වල වටිනාකම, ස්වභාවය හා ඒවා ඇති තැන් ආදිය පිළිබඳ තොරතුරු හා විස්තර මහ බැංකුවට සපයන ලෙස, ප්‍රවෘත්ති පත්‍රවල හෝ වෙනත් පොදු මාධ්‍යවල ප්‍රචාරක දැන්වීම් පළකිරීම ඇතුළුව කවර හෝ ක්‍රමයකින් මහජනයාට ආරාධනා කළ හැකි ය.

(ඇ) (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් තමාගේ නමින් හෝ තමාට යම් සම්බන්ධතාවක් ඇති යම් සංස්ථාවක නමින් හෝ එම තැනැත්තාගේ යම් නාමිකයකුගේ, නෑදෑයකුගේ සේවා නියුක්තයකුගේ හෝ අනුයෝජිතයකුගේ නමින් හෝ අර්ථලාභී ලෙස සතුව සිටින යම් මුදල්, දේපළ සහ වත්කම්වල වටිනාකම, ස්වභාවය සහ ඒවා ඇති තැන් ආදිය පිළිබඳ විස්තර මහ බැංකුවට අනාවරණය කරන ලෙස එම තැනැත්තාට විධාන කළ හැකි ය ;

(ඈ) දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් දේපළවල හෝ වත්කම්වල සන්තකය, අයිතිය හෝ යම් සම්බන්ධතාවක් (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් පවරනු ලැබීම ඔහුට තහනම් කරමින් ඒ තැනැත්තා වෙත දැන්වීමක් භාරදෙනු ලැබිය හැකි ය ;

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් දැන්වීමක පිටපතක්, යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන විට ඉඩම් රෙජිස්ට්‍රාර් ද මෝටර් වාහන සම්බන්ධයෙන් වන විට මෝටර් වාහන රෙජිස්ට්‍රාර් ද ඇතුළුව, එම දේපළ හෝ වත්කම්වල අයිතියට අදාළ හෝ එම දේපළවල හෝ වත්කම්වල අයිතිය හෝ ඒවාවල යම් සම්බන්ධතාවක් අන්සතු කිරීමට අදාළ යම් ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා වූ නිසි බලධරයා වෙත භාරදිය හැකි ය.

(ඊ) මුදල් මණ්ඩලය සඳහා හෝ වෙනුවෙන් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ-වරයා විසින් අත්සන් කරන ලද තහනම් කිරීමේ දැන්වීමක පිටපතක් භාරදෙනු ලැබූ බලධරයාට, එම දැන්වීම එම බලධරයාගේ භාරයේ ඇති නිසි පොත්වල ලියාපදිංචි කරන ලෙසට නියම කළ හැකි අතර, මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය වන පරිදි කරන ලද යම් අන්සතු කිරීමක් සියලු කාර්ය සඳහා ශූන්‍ය හා බලරහිත විය යුතු ය.

(උ) (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුගේ යම් දේපළ හෝ වත්කම් සම්බන්ධයෙන් (ඉ) සහ (ඊ) ඡේදවල සඳහන් යම් බලධරයකු වෙත ඇති යම් තොරතුරක් සපයන ලෙස එම බලධරයාට නියම කළ හැකි ය ;

(ඌ) නිශ්චල දේපළ හැර, ඉහත (ආ) ඡේදයේ සඳහන් යම් වත්කම් හෝ දේපළ ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් මුදල් මණ්ඩලය වෙත සතු කරගත හැකි ය ;

(එ) (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් අර්ථදායී ලෙස අයිතිව සිටින යම් දේපළක් තහනමට ගත හැකි අතර යම් බැංකුවක හෝ ආයතනයක එම තැනැත්තාගේ බැරට ඇති යම් මුදල් තහනමට ගෙන බැහැර කිරීම ඇතුළුව, සුදුසු යයි මණ්ඩලයට පෙනී යන යම් ආකාරයකින් එම වත්කම් බැහැර කිරීම ද කළ හැකි ය.

(2) (අ) මුදල් මණ්ඩලය විසින් ලියවිල්ලක් මගින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (එ) ඡේදයේ සඳහන් යම් වත්කම් තහනමට ගෙන ඒවායේ සන්තකය ලබා ගත හැකි ය.

(ආ) (අ) අනුඡේදය යටතේ බලය දෙනු ලැබූ යම් නිලධරයකුට, යම් අවහිරයක් හෝ ප්‍රතිරෝධයක් සිදු වී ඇති නිසා හෝ සිදුවිය හැකි නිසා යම් වත්කම් තහනමට ගැනීමට නොහැකි වන්නා වූ හෝ ඔහුට නොහැකිවේ යයි බලාපොරොත්තු වන්නා වූ අවස්ථාවක, ඒ නිලධරයා විසින් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ වත්කම්වල සන්තකය ඒ නිලධරයාට ලබාදිය යුතු යයි ඒ අධිකරණයේ නිලධරයකුට විධාන කෙරෙන, ඒ අධිකරණයේ ආඥවක් ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

(ඇ) (ආ) අනුඡේදය යටතේ ආඥාවක්, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අධිකරණයේ නිලධරයකු වෙත නිකුත් කරනු ලැබූ විට, ඔහු විසින් ඒ ආඥාව වහාම ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු අතර, ඒ ආඥාව ක්‍රියාවේ යොදවනු ලැබූ ආකාරය පිළිබඳව එම අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කරනු ලැබිය යුතු ය.

(ඈ) (අ) අනුඡේදය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරන ලද ආඥාවක් ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා, ඒ ආඥාව අදාළ වන වත්කම් තහනමට ගැනීම සහ ඒ වත්කම්වල සන්තකය ලබා ගැනීමට බලය දෙනු ලැබ ඇති නිලධරයාට ඒ වත්කම්වල සන්තකය භාරදීම පිණිස, අධිකරණයේ නිලධරයා විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ අවශ්‍ය විය හැකි බලය පාවිච්චි කළ හැකි ය.

ඇතැම් ගණුදෙනු සමාලෝචනය කිරීමට මුදල් මණ්ඩලයට ඇති බලය.

21ආ. මේ වගන්තිය බලාත්මක වීම ආරම්භවීමෙන් පසු, 21 අ වගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් ඇතුළත් වූ යම් ගණුදෙනුවක් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් සමාලෝචනය කළ හැකි අතර එම ගණුදෙනුවට ඇතුළත් වී ඇත්තේ මේ නියෝගවල පරමාර්ථ නිරර්ථක කිරීමේ කාර්ය සඳහා යයි ඔහු විසින් අදහස් කරනු ලබන්නේ නම් ඔහු විසින් එම ගණුදෙනුව ගැන මුදල් මණ්ඩලයට වාර්තා කළ හැකි ය. එම ගණුදෙනුවට ඇතුළත් වී ඇත්තේ මේ වගන්තියේ පරමාර්ථ නිරර්ථක කිරීමේ කාර්ය සඳහා බව, එවැනි වාර්තාවක් ලැබීමෙන් පසු මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක එම ගණුදෙනුව සියලු කාර්ය සඳහා ශුන්‍ය හා බලරහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

තැන්පතුකරුවන් සමග වූ ගිවිසුම් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට ඇති බලය.

21ඇ. වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද මහ බැංකුව විසින් කළමනාකරණය පවරාගෙන ඇති ආයතනයක් සමග තැන්පතු කරුවකු විසින් ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් මුදල් මණ්ඩලය විසින් සමාලෝචනය කළ හැකි අතර මුදල් ආපසු ගෙවීම සහ පොළී අනුප්‍රමාණවලට අදාළ නියමයන් ඇතුළුව, එම ගිවිසුමේ නියමයක් වෙනස් කළ හැකි ය.

මහ බැංකුවේ නිලධරයන් රජයේ නිලධරයන් ලෙස සැලකෙන බව.

21ඈ. මහ බැංකුවේ නිලධරයන්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ නිලධරයන් ලෙස, මේ පනතේ කාර්ය සඳහා සළකනු ලැබිය යුතු ය.'' ;

යන කොටස ඇතුළත් කර ඇත්තාක් සේද ;

(8) එම පනතේ 22 වන වගන්තියේ අගට පහත දැක්වෙන අර්ථකථනය, එනම් :—

''නෑදෑයා'' යන්නෙන්, 21අ වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එම තැනැත්තාගේ භාර්යාව හෝ ස්වාමිපුරුෂයා, දරුවා, පියා, මව, සහෝදරයා සහ සහෝදරිය අදහස් වෙති''.

යන අර්ථකථනය එකතු කර ඇත්තාක් සේ ද බලපැවැත්විය යුතු ය.